321 වන කාණ්ඩය - 16 වන කලාපය
தொகுதி 321 - இல. 16
Volume 321 - No. 16

2025 ඔක්තෝබර් 24 වන සිකුරාදා
2025 ஒக்ரோபர் 24, வெள்ளிக்கிழமை
Friday, 24th October, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

වරප්‍රසාද: කෝප් කමිටුවේදී ලබා දුන් සාක්ෂිවලට එරෙහිව පෞද්ගලික සමාගමක් විසින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග [තීරුව 2665]

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2666]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2667]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2668-2713]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

2025 අය වැය යෝජනාවල ප්‍රගතිය [තීරුව 2713]

සියයට 5ක උද්ධමන ඉලක්කයක් පවත්වා ගෙන යාමේ තීරණය [තීරුව 2717]

**සංශෝධිත අමාත්‍යාංශ විෂයයන්ට අනුරූපව 2026 විසර්ජන පනත් කෙටුම්පතට සංශෝධන සිදු කිරීම:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2721]

**2025.10.08 දින ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය:**

ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර [තීරුව 2729]

**මැණික් කර්මාන්තය අපනයන ඉලක්කගත කර්මාන්තයක් බවට පත් කිරීම:**

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 2739]

**ශෝක ප්‍රකාශ:** [තීරු 2756-2818]

ගරු ලොහාන් රත්වත්තේ මහතා
ගරු හීන්මහත්මයා ලියනගේ මහතා
ගරු ඩික්සන් ජේ. පෙරේරා මහතා
ගරු (ආචාර්ය) මර්වින් ඩී. ද සිල්වා මහතා
ගරු වයි.ජී. පද්මසිරි මහතා
ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මහතා
ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මහතා

**කල්තැබීමේ යෝජනාව:**

දියවඩන නිලමේ තනතුර සඳහා වන ඡන්ද විමසීමේදී කාන්තා ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඡන්ද අයිතිය ලබා දීම [තීරු 2818-2830]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

சிறப்புரிமை: அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவில் அளிக்கப்பட்ட சாட்சியத்திற்கு எதிராக தனியார் நிறுவன மொன்றால் எடுக்கப்பட்ட சட்ட நடவடிக்கை [ப: 2665]

**அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை** [ப: 2666]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 2667]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2668-2713]

**தனி அறிவித்தல் மூல வினா:**

2025 வரவு செலவுத்திட்ட முன்மொழிவுகளின் முன்னேற்றம் [ப: 2713]

5 சதவீத பணவீக்க இலக்கொன்றைப் பேணுவதற்கான தீர்மானம் [ப: 2717]

**திருத்தப்பட்ட அமைச்சு விடயதானத்துக்கு ஏற்ப 2026 ஒதுக்கீட்டுச் சட்டமூலத்துக்குத் திருத்தங்கள்:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 2721]

**2025.10.08ஆம் திகதி மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்களால் கேட்கப்பட்ட வினா:**

மாண்புமிகு பிரதம அமைச்சரினது விடை [ப: 2729]

**இரத்தினக்கல் கைத்தொழிற்றுறையை ஏற்றுமதி சார்ந்த துறையாக மாற்றுதல்:**

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 2739]

**அனுதாபத் தீர்மானங்கள்:** [ப: 2756-2818]

மாண்புமிகு லொஹான் ரத்வத்தே
மாண்புமிகு ஹீன்மகத்மயா லியனகே
மாண்புமிகு டிக்சன் ஜே. பெரேரா
மாண்புமிகு (கலாநிதி) மேர்வின் டி த சில்வா
மாண்புமிகு வை.ஜீ. பத்மசிரி
மாண்புமிகு ஆர்.எம்.ஆர். சூலபண்டார
மாண்புமிகு மாணிக்கவாசகர் கனகசபாபதி ஈழவேந்தன்

**ஒத்திவைப்புப் பிரேரணை:**

தியவடன நிலமே பதவிக்கான வாக்கெடுப்பில் பெண் பிரதேச செயலாளர்களுக்கு வாக்களிக்கும் உரிமையை வழங்குதல் [ப: 2818-2830]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Privilege: Legal Action by Private Company Against Evidence Given at COPA [Col. 2665]

REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS [Col. 2666]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2667]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2668-2713]

QUESTION BY PRIVATE NOTICE:

Progress of Budget Proposals, 2025 [Col. 2713]

Decision to Maintain a 5 per cent Inflation Target [Col. 2717]

AMENDMENTS TO APPROPRIATION BILL, 2026 IN COMFORMITY WITH REVISED MINISTERIAL SUBJECTS:

Statement by Deputy Minister of Finance and Planning [Col. 2721]

QUESTION POSED BY HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM ON 08.10.2025:

Reply by Hon. Prime Minister [Col. 2729]

TRANSFORMATION OF GEM INDUSTRY TO AN EXPORT-ORIENTED INDUSTRY:

Statement by Minister of Industry and Entrepreneurship Development [Col. 2739]

VOTES OF CONDOLENCE: [Cols. 2756-2818]

Hon. Lohan Ratwatte
Hon. Heenmahatmaya Liyanage
Hon. Dixon J. Perera
Hon. (Dr.) Mervyn D. de Silva
Hon. Y.G. Padmasiri,
Hon. R.M.R. Chula Bandara
Hon. Manicavasagar Kanagasabapathy Eelaventhan

ADJOURNMENT MOTION:

Grant of Voting Rights to Female Divisional Secretaries at Election of Diyawadana Nilame [2818-2830]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ඔක්තෝබර් 24වන සිකුරාදා***
*2025 ஒக்ரோபர் 24, வெள்ளிக்கிழமை*
*Friday, 24th October, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### වරප්‍රසාද: කෝපා කමිටුවේදී ලබා දුන් සාක්ෂිවලට එරෙහිව පෞද්ගලික සමාගමක් විසින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග
### சிறப்புரிமை: அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவில் அளிக்கப்பட்ட சாட்சியத்திற்கு எதிராக தனியார் நிறுவனமொன்றால் எடுக்கப்பட்ட சட்ட நடவடிக்கை
### PRIVILEGE: LEGAL ACTION BY PRIVATE COMPANY AGAINST EVIDENCE GIVEN AT COPA

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අරවින්ද සෙනරත් මහතා විසින් 2025 සැප්තැම්බර් 11 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## II

### 2026 අයවැය ඉදිරිපත් කිරීමේ වැඩසටහන සඳහා ආරාධනා පත්‍ර
### 2026 வரவு செலவுத்திட்ட சமர்ப்பிப்பு நிகழ்ச்சித்திட்டத்துக்கான அழைப்பிதழ்கள்
### INVITATIONS FOR PRESENTATION OF BUDGET 2026

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් 2025.11.07 දින පැවැත්වීමට නියමිත 2026 වර්ෂය සඳහා වන අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාවට අදාළ ආරාධනා පත්‍ර සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ විද්‍යුත් ලිපිනයන් වෙත මේ වනවිටත් යොමු කර ඇති බව මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මා වෙත දැනුම් දී ඇති බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Report on the Deviation of Headline Inflation from the Inflation Target Set Out in the Monetary Policy Framework Agreement for the first and second Quarters of the year 2025.

I move that this Report be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරය තුළදී විදේශ ප්‍රේෂණ මත ඉපයන රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමට අදාළව 2022 මැයි 1වැනි දා සිට 2023 සැප්තැම්බර් 15වන දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳව 2025.04.02වැනි දින සිදු කරන ලද විමර්ශන ඇතුළත් කාරක සභාවේ තෙවැනි වාර්තාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (3)හි විධිවිධාන ප්‍රකාරව මම අද දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරමි.

උක්ත යෝජනා ක්‍රමය පිළිබඳව විමර්ශනය කිරීම සඳහා කාරක සභාව විසින් පවත්වන ලද විමර්ශනයෙහි පසුබිම සාකච්ඡා කරන ලද කරුණු අමාත්‍යාංශ කීපයක් නියෝජනය කරමින් පැමිණි ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් කරන ලද කරුණු පැහැදිලි කිරීම සහ කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ මෙම වාර්තාවේ අඩංගු වේ. COPA එකේ කර්තව්‍යය ඉටු කිරීමේදී විගණනය නැමැති පශ්චාත් ක්‍රියාවලියෙන් ලැබෙන දායකත්වය ඉමහත් වන අතර විගණකාධිපතිවරයාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයටත්, කාරක සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් කාරක සභාවේ ස්තුතිය හිමි විය යුතු බවද සඳහන් කරමින්, මෙම වාර්තාව ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද 2026 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, Heads වෙනස් වීම සම්බන්ධයෙන් පොඩි clarification එකක් තිබෙනවා. ඒක Committee Stage එකට කලින් ඉදිරිපත් කරනවා කියලා තිබෙනවා. ඒ නිසා වැඩ කටයුතු ඉස්සරහට අරගෙන යන්න පුළුවන්.

මේ දැන් අපට ලැබුණා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාර්ගගත වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විශේෂ විගණන වාර්තාව. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් Auditor-Generalගෙන් ඉල්ලුවා, මේක කරන්න කියලා. මේ වාර්තාවේ Audit recommendations 9ක් ඔවුන් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාර්ලිමේන්තුව වහාම ක්‍රියාත්මක විය යුතුයි කියලා කමිටුවේ සභාපති හැටියට මම යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

Hon. Speaker, I present a petition from Mrs. W.P. Erandi Lanka Weerasinghe of No.03, High Forest, Kandapola.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මුජිබුර් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු වරුණ ලියනගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සුරංග රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න 1 -19/2024- (1), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### බොරලු කැපීම: නීති සහ අනුමත අවසරය ලබාදීම
### சரளை அகழ்வு: சட்டம் மற்றும் அங்கீகாரம் வழங்கல்
### GRAVEL MINING: LAWS AND GRANT OF APPROVAL

1288/2025

**2. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බොරලු කැපීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපවත්වන නීති කවරේද;

(ii) එම නීති අනුව බොරලු කැපීම සඳහා නිර්දේශ ලබා දිය යුත්තේ කවුරුන් විසින්ද;

(iii) ඒ සඳහා අනුමතිය ලබා දිය යුත්තේ කවුරුන් විසින්ද;

(iv) කිසියම් ස්ථානයක බොරලු කැපීම සඳහා අනුමතිය ලබා දීමෙන් පසු එම ස්ථානය අධීක්ෂණය කිරීමේ වගකීම පැවරෙන්නේ කවුරුන්ටද;

(v) බොරලු කැපීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපවත්වන වර්තමාන නීති යාවත්කාලීන කිරීමට හෝ සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சரளை அகழ்வு தொடர்பாக இலங்கையில் வலுவிலுள்ள சட்டங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி சட்டங்களுக்கு அமைவாகச் சரளை அகழ்வு நடவடிக்கைகளுக்கு விதப்புரைகளை வழங்க வேண்டியவர்கள் யாவர் என்பதையும்;

(iii) அதற்கு அங்கீகாரம் வழங்க வேண்டியவர்கள் யாவர் என்பதையும்;

(iv) யாதேனுமோர் இடத்தில் சரளை அகழ்வு நடவடிக்கைகளுக்கு அங்கீகாரம் வழங்கப் பட்டதைத் தொடர்ந்து மேற்படி இடத்தை மேற்பார்வை செய்வதற்கான பொறுப்பு யாருக்கு அளிக்கப்பட்டுள்ளது என்பதையும்;

(v) சரளை அகழ்வு தொடர்பாக இலங்கையில் வலுவிலுள்ள தற்போதைய சட்டங்களை இற்றைப்படுத்துவதற்கு அல்லது திருத்துவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the laws currently in force pertaining to gravel mining in Sri Lanka;

(ii) the authority responsible for providing recommendations for gravel mining in accordance with the said laws;

(iii) the authority that grants approval for gravel mining;

(iv) the authority responsible for supervising the site after approval is given for gravel mining at a specific location; and

(v) whether steps will be taken to update or amend the existing laws regarding gravel mining in Sri Lanka?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අනුව 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 13වන වගන්තිය ප්‍රකාරව ඛනිජ සඳහා ගවේෂණ, කැණීම්, ප්‍රවාහනය, වෙළෙඳාම, ගබඩා කිරීම හා අපනයනය පිණිස බලපත්‍ර නිකුත් කිරීමේ බලතල භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සතු වේ.

තවද, උක්ත පනතේ 28 වගන්තිය ප්‍රකාරව ඉහත කාර්යයන් කාර්යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ සිදු කළ යුතුය.

(ii) බොරලු කැණීම සඳහා නිර්දේශ ලබා දීමේදී උක්ත පනතේ 30, 31 හා 61 වගන්තිවලට අනුව නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතනවල නිර්දේශ මූලික වශයෙන් ලබා ගන්නා අතර ක්ෂේත්‍ර පරීක්ෂණය අනුව නිර්දේශ ලබා ගත යුතු වෙනත් ආයතන සඳහන් වන්නේ නම් එකී නිර්දේශ ද ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

එසේම අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිකුත් කරන ලද ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිත කරන ඛනිජ කැණීම්, ප්‍රවාහනය සහ වෙළෙඳාම පිළිබඳ කාර්ය සංග්‍රහයෙහි සඳහන් පරිදි කැණීම් සඳහා බලපත්‍ර ලබා දීමේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ විමසනු ලැබේ.

(iii) බොරලු කැණීම සඳහා අනුමැතිය ලබා දීම ඉහත අංක (ii) යටතේ දක්වා ඇති නිර්දේශ සම්පූර්ණ වීමෙන් පසු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිදු කරනු ලැබේ.

(iv) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය මඟින් නිකුත් කරන කැණීම් බලපත්‍රයේ බොරලු කැණීමට අදාළ කොන්දේසි ඇතුළත් කර ඇති බැවින්, බොරලු කැපීමේදී එම කොන්දේසිවලට අනුකූලව සිදු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීමේ වගකීම එම කාර්යාංශය සතු වේ.

කැණීම් බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු කැණීම් භූමි අධීක්ෂණය කාර්යාංශයේ කැණීම් ඉංජිනේරු/ක්ෂේත්‍ර නිලධාරින් විසින් සිදු කළ යුතු ය.

ඊට අමතරව කැණීම් බලපත්‍රය ලබා දීම සඳහා නිර්දේශ ලබා දී ඇති ආයතන විසින් නිර්දේශ ලබා දී ඇති කොන්දේසිවලට අනුව එය සිදු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීම ද එම ආයතන විසින් සිදු කරනු ලැබේ.

(v) පනත සංශෝධනය කිරීම සහ අනවසර කැණීම් හා නීති විරෝධී කටයුතු වෙනුවෙන් දඩ මුදල් සංශෝධනයට ලක් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

පිළිතුරු ලබා දීම පිළිබඳව ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

2020 ඔක්තෝබර් 6 දිනැති අංක 2196/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කළ, ජනාධිපති කාර්ය සාධක බලකාය විසින්

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩා මහතා]

ඉදිරිපත් කරන ලද උපදෙස් සංග්‍රහය අනුව - ගරු අමාත්‍යතුමාත් කියපු විධියට - මෙම කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේදී රජය සතු ඉඩම්වල සහ පෞද්ගලික ඉඩම්වල මෙම කැණීම් කටයුතු කළ යුත්තේ කොයි ආකාරයෙන්ද, එය අධීක්ෂණය කළ යුත්තේ කවුද කියන එක සම්බන්ධයෙන් පැහැදිලිව සටහන් කර තිබෙනවා.

නමුත් අපි දකිනවා, ජනාධිපති කාර්ය සාධක බලකාය ලබා දී තිබෙන උපදෙස්වලට පටහැනිව, එහෙම නැත්නම් එහි ඇති උපදෙස් අවභාවිත කරමින් එම කැණීම් කටයුතු සිද්ධ වන ආකාරය. පෞද්ගලික ඉඩම් වුණත්, රජයේ ඉඩම් වුණත් ඒවායේ සිදු කරන කැණීම්වලින් පරිසරයට යම්කිසි බලපෑමක් වෙනවා නම් පොදුවේ අපි හැමෝටම එහි ප්‍රතිවිපාකවලට මුහුණ දෙන්න සිද්ධ වනවා. පෞද්ගලික ඉඩම් කියන සංකල්පය යටතේ අනුමැතිය ලබා දෙන බොහෝ ස්ථානවල පාරිසරික පද්ධතිය විනාශ වෙමින් පවතිනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම එක උදාහරණයක් කියන්නම්, මගේ අතුරු ප්‍රශ්නය අසන්න කලින්.

කුලියාපිටිය නැඟෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නහේරුව කියන ග්‍රාම නිලධාරි වසමේ පෞද්ගලික ඉඩමකට යා වෙච්ච කන්දක් කපන්න පසුගිය රජය කාලයේ ජනාධිපති කාර්ය සාධක බලකායේ ප්‍රතිපත්තිවලට අනුව අනුමැතිය ලබා දී තිබෙනවා. ජනතාවගේ විරෝධය නිසා මට සිද්ධ වුණා, ඒ කටයුතුවලට මැදිහත් වෙලා ඒක නවත්වන්න. ඒ අනුව එම කටයුත්ත දැනට නවත්වා තිබෙනවා. බොරලු කියලා ඇත්තටම පස්, වැලි හෝදන්න තමයි ඒ කන්ද කපන්නේ. ඒක ලොකු විනාශයක්. ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිකුත් කරපු ඒ උපදෙස් යාවත්කාලීන කරනවාද, එහෙම නැත්නම් ඒ නීති සංශෝධනය කරලා මේ සඳහා නිසි ක්‍රියාපටිපාටියක් අනුගමනය කරන්න සූදානම්ද කියන එක තමයි පළමුවන අතුරු ප්‍රශ්නය විධියට මම ඔබතුමාගෙන් අහන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු උදාහරණය වාගේ සිදුවීම් පාලනය කරන්න දැනට තිබෙන නීති රීති යටතේත් මැදිහත් වන්න අපට පුළුවන්. ඔබතුමා ඒ තත්ත්වයන් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වනවා. ඔය නිශ්චිත කාරණාව සම්බන්ධයෙන් මැදිහත් වෙලා, දැනට තිබෙන නීති රීති යටතේත් ඒ පරිසර හානි සහ ජනතා විරෝධතා ගැන සලකා බලා අපට යම් යම් ක්‍රියාමාර්ග ගන්න පුළුවන්.

නමුත්, කොහොමත් මේ තිබෙන නීති යථාවත් කිරීම මේ මොහොතේදී සාකච්ඡා මට්ටමේ තිබෙනවා. ඉදිරියේදී මේ හානි වළක්වන්න අපි මීට වඩා ගැළපෙන විධියේ නීති පද්ධතියකට යන්න සූදානම්.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙනකොට ප්‍රකාශ කළා, එම කටයුතු අධීක්ෂණය සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය ක්‍රියාත්මක වෙනවා කියන එක. ඇත්තටම ජනාධිපති කාර්ය සාධක බලකායේ තිබෙන ඒ ප්‍රතිපත්තිවලට අනුව පෞද්ගලික ඉඩමක කැණීම් කරනවා නම් ග්‍රාම නිලධාරි හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය අවශ්‍ය වන්නේ නැහැ. පාරිසරික අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉඳුරාම භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ අනුමැතිය පමණයි එයට අදාළ වන්නේ. එහිදී අපි දකිනවා, කිසිදු ආකාරයකින් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ අධීක්ෂණයක් සිද්ධ වෙන්නේ නැහැ කියලා. රජයේ ඉඩමක නම් ප්‍රාදේශීය ලේකම් අනුමැතිය දෙනකොට ග්‍රාම නිලධාරිවරයාගේ නිර්දේශය සහිතව තමයි එන්නේ. මේකෙදි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. මෙවැනි අධීක්ෂණ කටයුතුවලදී ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි ඇතුළත්ව යම්කිසි කණ්ඩායමක්, - "ග්‍රාම ශක්ති" වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ඒ ගමේ කිහිප දෙනෙක් ඇතුළත් කර කණ්ඩායමක් - සංවිධානයක් ඇති කරලා, ඒ අධීක්ෂණ කටයුතු කළොත් මම හිතන විධියට අපට තිබෙන ගොඩක් ප්‍රශ්නවලින්, අවදානමෙන් බේරෙන්න හැකියාව තිබෙනවා. එතකොට නිසියාකාරව අධීක්ෂණ කටයුතුත් සිද්ධ වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න පුළුවන් ද ගරු ඇමතිතුමනි?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, අපට එවැනි අවධානයක් යොමු කරන්න පුළුවන්. කිසියම් පෞද්ගලික ඉඩමක බොරලු කැණීමේදී එතැන සිදු වන හානියට සාපේක්ෂව මැදිහත් වීම් කරන්න පුළුවන්. කැණීම් කිරීම සඳහා අවසර දුන්නත් කැණීම් කරන ප්‍රමාණය පරීක්ෂා කිරීම සහ ඊට අදාළ අධීක්ෂණ කටයුතු කිරීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වගකීමක්. ඒ කටයුත්ත ඔවුන් විසින් සිදු කළ යුතුයි. කිසියම් ප්‍රමාණයකින් ප්‍රදේශයට බලපාන, විශාල පරිසර හානියක් සිදු වන, ඒ වාගේම පෞද්ගලික ඉඩමක වුවත් කිසියම් මට්ටමක ජනතා පීඩනයක් සිදු වන මට්ටමේ කැණීමක් කරනවා නම්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මට්ටමින්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මට්ටමින් ඊට වඩා වැඩි මැදිහත් වීමක් කරන්න පුළුවන්. අපට ඒ යෝජනාව ඉදිරිපත් වුණොත් එම කමිටුවල ඒවා සම්මත කර ගනිමින් මීට වඩා මැදිහත් වීමක් කරන්න පුළුවන්. ඒ වාගේම ඒ සඳහා වෙනත් ආයතනත් සම්බන්ධ කර ගනිමින් අපට ඒ මැදිහත් වීම කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1309/2025- (1), ගරු චන්දන සූරියආරච්චි මහතා.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1322/2025- (1), ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ජාත්‍යන්තර සහ පාසල් ක්‍රිකට් ක්‍රීඩාංගණ: විස්තර
சர்வதேச மற்றும் பாடசாலை கிரிக்கெட் மைதானங்கள்: விபரம்
INTERNATIONAL AND SCHOOL CRICKET STADIUMS: DETAILS

1346/2025

5. **ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

(ii) ජාත්‍යන්තර මට්ටමේ නොවන එහෙත් ලෙදර් පන්දු ක්‍රිකට් ක්‍රීඩා කළ හැකි තණතීරු සහිත මුළු ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

(iii) පාසල් සතු ලෙදර් පන්දු ක්‍රිකට් ක්‍රීඩා කළ හැකි තණතීරු සහිත ක්‍රීඩාංගණ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පාසල් ක්‍රිකට් ක්‍රීඩාව නැංවීම සඳහා අනුග්‍රහයක් ලබා දීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள சர்வதேச கிரிக்கெட் மைதானங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) சர்வதேச தரத்தில் காணப்படாத போதிலும் கடினப்பந்து (லெதர்) கிரிக்கெட் விளையாடக் கூடிய ஆடுகளங்களைக் கொண்ட மைதானங் களின் மொத்த எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) பாடசாலைகளுக்குச் சொந்தமான கடினப்பந்து கிரிக்கெட் விளையாடக்கூடிய ஆடுகளங்களைக் கொண்ட விளையாட்டு மைதானங்களின் எண்ணிக்கை மாவட்ட வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) பாடசாலைக் கிரிக்கெட் துறையை மேம்படுத்து வதற்கு அனுசரணை வழங்கக்கூடிய இயலுமை இலங்கை கிரிக்கெட் நிறுவனத்துக்கு உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) the number of international cricket stadiums in Sri Lanka;

(ii) the total number of stadiums which do not meet international standards, but are equipped with pitches suitable for leather ball cricket;

(iii) the number of school stadiums with pitches that can be used to play leather ball cricket in each district, separately; and

(iv) whether the Sri Lanka Cricket Board is able to provide sponsorship to promote school cricket?

(b) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ 07ක් පවතී.

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අයත් ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ 05ක් පවතී.
  - ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය - කොළඹ
  - ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය - ගාල්ල
  - පල්ලේකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය - පල්ලේකැලේ
  - රන්ගිරි දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය - දඹුල්ල
  - මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය - හම්බන්තොට
- ජාත්‍යන්තර ක්‍රිකට් තරග සඳහා භාවිත වන ප්‍රධාන ක්ලබ් ක්‍රීඩාංගණ 02ක් පවතී.
  - සිංහල ක්‍රීඩා සමාජ ක්‍රිකට් ක්‍රීඩාංගණය - Sinhalese Sports Club Cricket Ground

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

- පී. සරවනමුත්තු ක්‍රිකට් ක්‍රීඩාංගණය - P. Sara Oval Cricket Ground

- මීට අමතරව යෝජිත ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ 02ක් ඉදිකිරීමට නියමිතය.
  - කොළඹ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය - දියගම
  - යාපනය ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය - යාපනය

(ii) පාසල් ක්‍රීඩාපිටි සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට කිසිදු ආකාරයකින් සම්බන්ධ නොමැති පෞද්ගලික වශයෙන් පවත්වාගෙන යනු ලබන ක්‍රීඩාංගණ හැර ටර්ෆ් - turf - පිච් සහ ග්‍රේවල් තණ තීරුවලින් සමන්විත ක්‍රිකට් ක්‍රීඩාංගණ දිවයින පුරා පවතී. එයට ප්‍රධාන ක්‍රීඩා සමාජ සතු ක්‍රිකට් ක්‍රීඩාංගණ, හමුදාව සතු ක්‍රීඩාංගණ, ශ්‍රී ලංකා ක්‍රිකට් සාමාජික සමාජ සතු ක්‍රීඩාංගණ, ටර්ෆ් විකට් ඇති මහජන ක්‍රීඩාංගණ සහ ජාතික ක්‍රීඩාංගණ ඇතුළත් වේ. (ටර්ෆ් - turf - පිච් ලැයිස්තුව ඇමුණුම 01 මඟින් සහ ග්‍රැවල් තණ තීරුවලින් සමන්විත ක්‍රිකට් ක්‍රීඩාංගණ අමුණුම 02 මඟින් දක්වා ඇත.)

ඇමුණුම 01

**GROUNDS IN THE COUNTRY HAVING TURF PITCHES - Except International Grounds**

| | Colombo | Ownership Status |
|---|---|---|
| 1 | SSC | Premier Club |
| 2 | NCC | Premier Club |
| 3 | CCC | Premier Club |
| 4 | Moors | Premier Club |
| 5 | Bloomfield | Premier Club |
| 6 | Colts | Premier Club |
| 7 | P Sara - Tamil Union | Premier Club |
| 8 | BRC | Premier Club |
| 9 | Army - Panagoda | Premier Club |
| 10 | Police Grounds | Premier Club |
| 11 | Mercantile CA | SLC Member Assn |
| 12 | NSCA - Ratmalana | SLC Member Assn |
| 13 | LRDC - Kirimandala Mw | State Corporation |
| 14 | Army - Artilery Div | Army |
| 15 | Army - Volunteer Salawa | Army |
| 16 | Army - Engineers, Mattegoda | Army |
| 17 | Air Force - Col 2 | Air Force |

| | Ratnapura | |
|---|---|---|
| 1 | Monarawila Ground - DCA | DCA |
| 2 | Army - Kuruwita | Army |

| | Kandy | |
|---|---|---|
| 1 | Peradeniya Campus Ground | Higher Education Ministry |

| | Kurunegala | |
|---|---|---|
| 1 | Welagadera Ground - National | NW Province |
| 2 | Army - Boyagane | Army |

| | Anuradhapura | |
|---|---|---|
| 1 | Samadhi Ground - DCA | DCA |
| 2 | Army - Saliyapura | Army |
| 3 | Army - Puttalam jct | Army |

| | Gampaha | Ownership Status |
|---|---|---|
| 1 | Navy Grounds - Welisara | Premier Club |
| 2 | Air Force, Katunayake | Premier Club |
| 3 | BOI Grounds, Katunayake | Board of Investment |
| 4 | Kadirana Ground, PS | Katana PS |
| 5 | Army - Ambepussa | Army |

| | Kalutara | |
|---|---|---|
| 1 | Panadura SC - PS Ground | Panadura PS |
| 2 | Bandaragama - DCA | DCA Managed |
| 3 | National Ground - Surrey, Maggona | Western Province |
| 4 | Army - Dombagoda | Army |

| | Galle | |
|---|---|---|
| 1 | Army - Karandeniya Ground | Army |

| | Matara | |
|---|---|---|
| 1 | Uyanwatte Stadium - MC | Matara MC |

| | Hambantota | |
|---|---|---|
| 1 | Weeraketiya Ground - DCA | DCA |

| | Moneragala | |
|---|---|---|
| 1 | Wellassa Ground - DCA | DCA |

| | Nuwara Eliya | |
|---|---|---|
| 1 | Radella - Dickoya Club | SLC Member Club |

| | Polonnaruwa | |
|---|---|---|
| 1 | Hingurakgoda - National Ground | NCP Cricket Assn |

ඇමුණුම 02

| | | School Grounds | | | |
|---|---|---|---|---|---|
| | | Size of Ground | | | |
| | Schools District wise | 35 - 40 yds | 40 - 50 yds | Over 50 yds | Total |
| 1 | Colombo District | 25 | 14 | 18 | 57 |
| 2 | Gampaha District | 18 | 8 | 13 | 39 |
| 3 | Kalutara District | 8 | 4 | 5 | 17 |
| 4 | Galle District | 22 | 5 | 7 | 34 |
| 5 | Matara District | 4 | 0 | 2 | 6 |
| 6 | Hambantota District | 3 | 4 | 1 | 8 |
| 7 | Kandy District | 10 | 3 | 4 | 17 |
| 8 | Kegalle District | 11 | 4 | 1 | 16 |
| 9 | Nuwara Eliya District | 4 | 1 | 0 | 5 |
| 10 | Matale District | 9 | 4 | 2 | 15 |
| 11 | Polonnaruwa District | 4 | 3 | 1 | 8 |
| 12 | Anuradhapura District | 1 | 3 | 6 | 10 |
| 13 | Kurunegala District | 19 | 8 | 7 | 34 |
| 14 | Puttalam District | 3 | 7 | 3 | 13 |
| 15 | Ratnapura District | 5 | 3 | 4 | 12 |
| 16 | Badulla District | 5 | 0 | 1 | 6 |
| 17 | Moneragala District | 7 | 2 | 2 | 11 |
| 18 | Jaffna District | 4 | 4 | 8 | 16 |
| 19 | Vavuniya District | 2 | 5 | 0 | 7 |
| 20 | Mannar District | 2 | 1 | 2 | 5 |
| 21 | Killinochchi District | 0 | 2 | 4 | 6 |
| 22 | Mullativu District | 5 | 5 | 2 | 12 |
| 23 | Trincomalee District | 5 | 5 | 1 | 11 |
| 24 | Batticaloa District | 0 | 1 | 2 | 3 |
| 25 | Ampara District | 9 | 3 | 2 | 14 |
| | **Total** | **185** | **99** | **98** | **382** |

(iii) ටර්ෆ් - turf - විකට් (තණ තීරු) සහිත පාසල් ක්‍රීඩාංගණ ලැයිස්තුව ඇමුණුම 03 මඟින් දක්වා ඇති අතර, දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් සතු ක්‍රීඩාංගණ ලැයිස්තුව ඇමුණුම 04 මඟින් දක්වා ඇත.

ඇමුණුම 03

**SCHOOL GROUND HAVING TURF WICKETS**

| | Schools in Colombo District |
|---|---|
| 1 | Royal College |
| 2 | Thurstan College |
| 3 | DS Senanayake College |
| 4 | Wesley College |
| 5 | Nalanda College |
| 6 | Ananda College |
| 7 | Zahira College |
| 8 | St Benedicts College |
| 9 | St Josephs College, Col 10 |

| | |
|---|---|
| 10 | St Peters College |
| 11 | St Thomas College, Mt Lavinia |
| 12 | Prince of Wales College |
| 13 | St Sebastiens College, Moratuwa |
| 14 | Moratu Vidyalaya |
| 15 | Dharmapala College, Pannipitiya |
| | **Schools in Gampaha District** |
| 16 | St Anthonys College, Wattala |
| 17 | Lyceum, Wattala |
| 18 | De Mazenod College, Kandana |
| 19 | Gateway, Seeduwa |
| 20 | Marie Stella College, Negombo |
| 21 | Marie Stella College, Thimbirigaskatuwa |
| | **Schools in Puttalam District** |
| 22 | St Sebastiens, Katuneriya |
| | **Schools in Anuradhapura District** |
| 23 | Anuradhapura Central College |
| | **Schools in Jaffna District** |
| 24 | St Patricks College, Jaffna |
| 25 | St John's College, Jaffna |
| | **Schools in Kurunegala District** |
| 26 | Maliyadewa College |
| 27 | St Anne's College |
| 28 | Ibbagamuwa Central |
| 29 | Wickremashila National School |
| | **Schools in Kandy District** |
| 30 | St Anthonys, Katugastota |
| 31 | Vidyartha College |
| 32 | Trinity College |
| 33 | Dharmaraja College |
| 34 | Wickramabahu Central, Gampola |
| | **Schools in Kalutara District** |
| 35 | Tissa Central, Kalutara |
| | **Schools in Galle District** |
| 36 | Sri Sumangala, Hikkaduwa |
| 37 | Mahinda College, Galle |
| | **Schools in Polonnaruwa District** |
| 38 | Royal College, Polonnaruwa |

ඇමුණුම 04

**Proposed and Established District Cricket Stadiums**

| | | | | |
|---|---|---|---|---|
| 1 | Team - Colombo | WPCA | Colombo | Location Identified |
| | | | Kalutara | Pending UDA Approval |
| | | - | Gampaha | Pending Land/Requested government land and advertised for private lands |
| | | | | |
| 2 | Team - Kandy | CPCA | Kandy | Pending Land/Requested government land and advertised for private lands |
| | | | NuwaraEliya | Pending Land/Requested government land and advertised for private lands |
| | | | Kegalle | Pending Land/Requested government land and advertised for private lands |
| | | EPCA | Ampara | Government Land Allocated/Gazzet Notification Issued |
| | | | Batticaloa | Government Land Allocated/Gazzet Notification Issued |
| | | | Trincomalee | Land Allocated by Municiple Council/Pending Provincial Council Approval |
| | | | | |
| 3 | Team - Dambulla | NCPCA | Anuradhapura | Already Constructed |
| | | | Polonnaruwa | Already Constructed |
| | | | Matale | Pending Land/Requested government land and advertised for private lands |
| | | NPCA | Vavuniya | Location Identified |
| | | | Mannar | Pending Land/Requested government land and advertised for private lands |
| | | | Mullative | Pending Land/Requested government land and advertised for private lands |
| | | | Kilinochchi | Pending Land/Requested government land and advertised for private lands |
| | | | Jaffna | Pending Land/Requested government land and advertised for private lands |
| | | NWPCA | Puttalama | Pending Land/Requested government land and advertised for private lands |
| | | | Kurunegala | Pending Land/Requested government land and advertised for private lands |
| | | | | |
| 4 | Team - Galle | UVPCA | Badulla | Already Constructed |
| | | | Monaragala | Already Constructed/Pending Legal Issues |
| | | | Ratnapura | Already Constructed |
| | | SPCA | Galle | Government Land Requested and advertised for private lands |
| | | | Matara | Government Land Allocated |
| | | | Hambantota | Already Constructed/Pending Legal Issues |

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පාසල් ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය කිරීම හා උසස් කිරීම සඳහා සක්‍රිය වශයෙන් දායකත්වය ලබා දෙමින් පවතී. මෙම අරමුණ සාර්ථක කරගැනීම සඳහා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් වාර්ෂිකව ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.5ක මූල්‍යමය ප්‍රතිපාදන සලසමින් එකී ක්‍රීඩා සංවර්ධන කටයුතු, ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය හරහා සිදු කරනු ලබයි. මෙම සංවර්ධන කටයුතු පාසල් ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ යටිතල පහසුකම් දියුණු කිරීමේ සිට ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පාසල් සඳහා ක්‍රීඩා ආම්පන්න ලබා දීම, පුහුණු සැසි සහ ආධාර ලබා දීම සහ ක්‍රීඩා තරග පැවැත්වීම යනාදි පුළුල් පරාසයක පාසල් ක්‍රිකට් ක්‍රීඩාවේ සංවර්ධනයට දායක වී සිටී.

(ආ) පැන නොනඟී.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු ක්‍රීඩා ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම මම මෙය අවස්ථාවක් කර ගන්නවා, මේ මාසයේ 16 වැනි දා අප අතරින් සමුගත් ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩක, ඒ වාගේම අපේ රටේ විශේෂ පන්දු යවන්නෙකු වූ, ඒ වාගේම ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාපිටියේ තණතීරුව භාරව කටයුතු කළ, සුනාමි ව්‍යසනය වෙලාවේත් ඒ ක්‍රීඩාංගණය රැක ගැනීම සඳහා, එය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා මහඟු කාර්යභාරයක් ඉටු කළ ජයනන්ද වර්ණවීර මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පළ කරන්න.

ගරු කථානායකතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ අපේ රටේ ජනතාවගේ -බාල, තරුණ, මහලු කොයි කාගේත්- හදවත දිනා ගත්ත ක්‍රීඩාවක්; මේ ලෝක කුසලාන දෙකත් හරහාම අපට සංවේදී වූ ක්‍රීඩාවක්. ඒ නිසා තමයි ජයග්‍රහණයේදී වාගේම පරාජයේදීත් අපේ රටේ ජනතාව -ක්‍රිකට් ප්‍රේක්ෂකයෝ- ඒ ක්‍රීඩකයන් අත් නොහැර සිටින්නේ. අපි ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩා කරන්න පටන් ගන්නේ 1982දී. පළමුවැනි ජාත්‍යන්තර තරගය පැවතියේ, 1982 පෙබරවාරි මාසයේ 17වැනි දා. මේ වෙනකොට අපි ටෙස්ට් තරග 327ක පමණ ක්‍රීඩා කරලා තිබෙනවා. ඒ වාගේම -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න. ඔබතුමා දැන් විනාඩි දෙකක කාලයක් ගත්තා.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ඒ හරහා අපේ රටට ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයන් 170දෙනෙක්, ඒ වාගේම එක්දින ක්‍රීඩකයන් 217දෙනෙක් සහ T20 ක්‍රීඩකයන් 110දෙනෙක් පමණ බිහි වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. අපි ලෝක කුසලාන දෙකක් දිනා ගත්ත රටක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය යොමු කරන්න.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, ඔබතුමා මට පොඩි වේලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්න විනාඩි දෙකයි දෙන්න පුළුවන්. ඔබතුමා මේ වෙනකොටත් ඒ විනාඩි දෙක අරගෙන ඉවරයි. කරුණාකර කෙටියෙන් ප්‍රශ්නය අහන්න. ඔබතුමාගේ ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරෙන් පැන නඟින කාරණයක් තමයි අහන්න පුළුවන්.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, මට කියන්න ඕනෑ, අපේ ගම්වලටත් ක්‍රිකට් ක්‍රීඩාව ලබා දෙන්න කියන එක තමයි. අපි ජීවත් වන ඇඹිලිපිටිය ප්‍රදේශයේ ජනාධිපති විද්‍යාලයේ දරුවන් මෙවර රටක් හැටියට ජයග්‍රහණයක් ලබා ගත්තා. ගරු ඇමතිතුමනි, අපි අවුරුදු 50කට ආසන්න කාලයක් ක්‍රිකට් ක්‍රීඩාව කළාට, ගම්බද අති දක්ෂ ක්‍රීඩකයන්ට මේ වෙනකොට ක්‍රීඩාංගණයක් නැතුව, තමන්ගේ දක්ෂතා පෙන්වන්න අවස්ථාවක් නැති වෙලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ, මෙච්චර කාලයක් ක්‍රිකට් ආයතනයක් තිබිලාත් ගම්බද ක්‍රිකට් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන්, ගම්බද ප්‍රදේශවල ක්‍රීඩාව දියුණු කරන්න ක්‍රියාමාර්ග ගත්තේ නැත්තේ ඇයි කියලා. අපේ රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, ජාත්‍යන්තර මට්ටමේ එකම තණ තීරුවක්වත්, ක්‍රීඩා පිටියක්වත් නැහැ. ක්‍රිකට් ආයතනයට අධිකව මුදල් තිබෙනවා. එහෙම තිබියෙදීත් එවැනි දුෂ්කර ප්‍රදේශවල, දුෂ්කර දිස්ත්‍රික්කවල ක්‍රීඩාංගණ හදන්න ක්‍රියාමාර්ග නොගන්නේ ඇයි? ඒ ප්‍රශ්නයට ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ඇත්තටම අපි දැනටමත් ක්‍රීඩා පිටි සංවර්ධනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය එක්ක සාකච්ඡා කරලා, ස්ථාන කිහිපයකට ඒ අවස්ථාව සලසමින් තිබෙනවා.

විශේෂයෙන්ම දිස්ත්‍රික්ක කිහිපයක අපි ස්ථාන බලලා තිබෙනවා. ඒ අතර, යාපනය දිස්ත්‍රික්කයේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් හදන්න දැනටමත් අපි කටයුතු කරමින් තිබෙනවා. දියගම ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් හදන්න කටයුතු කරමින් තිබෙනවා. එ් වාගේම තවත් දිස්ත්‍රික්ක කිහිපයක අපි සැලසුම් සකස් කරමින් තිබෙනවා, ක්‍රීඩාව ගමට ගෙනියන අරමුණින්.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපි දන්නවා, ක්‍රිකට් ක්‍රීඩාවට වාගේම අනෙකුත් ක්‍රීඩාවලටත් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අපේ රටේ ඉන්න බව. විශේෂයෙන්ම ගත්තොත්, මලල ක්‍රීඩාව. ගරු ඇමතිතුමාගෙන් මම දැන ගන්න කැමැතියි, ක්‍රිකට් ක්‍රීඩාව වාගේම අනෙකුත් ක්‍රීඩා නංවන්න, විශේෂයෙන්ම මලල ක්‍රීඩා ක්ෂේත්‍රය නංවන්න මේ වනකොට ක්‍රීඩා අමාත්‍යාංශය ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගර කථානායකතුමනි, මේ වනකොටත් අපි විශේෂ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා, ලංකාවේ මලල ක්‍රීඩාව නඟා සිටුවන්න. ඒ අතර විශේෂයි, Mission Olympics 2028 වැඩසටහන සහ ක්‍රීඩා ශක්ති වැඩසටහන. ඊට අමතරව, පුහුණුකරුවන්ට දීමනා ලබා දීමේ වැඩසටහනකුත් අපි ක්‍රියාත්මක කරනවා.

ආසියානු යොවුන් ක්‍රීඩා උළෙලේදී රන් පදක්කමක් දිනා ගත් ලහිරු අචින්ත ක්‍රීඩකයාට සහ ලෝකඩ පදක්කමක් දිනා ගත් නෙත්මි ගිම්හානි ක්‍රීඩිකාවටත් මේ අවස්ථාවේදී මම සුබ පතනවා. මොකද, ලහිරු අචින්ත ක්‍රීඩකයාත් අපේ ක්‍රීඩා ශක්ති වැඩසටහන යටතේ ක්‍රීඩා කරන ක්‍රීඩකයෙක්. අපි විශාල වැඩ කොටසක් මලල ක්‍රීඩාව වෙනුවෙන් මේ වෙලාවේ කරමින් ඉන්නවා. ඒ ධෛර්යවන්තභාවයට අපි දෙන ශක්තිය තුළින් තමයි ක්‍රීඩකයෝ දැන් ඉදිරියට ඇවිල්ලා තිබෙන්නේ, අපේ රටේ ක්‍රීඩාව ඉස්සරහට ගෙනියන්න පුළුවන් විධියට.

## තල් වගාව සහ තල් ආශ්‍රිත නිෂ්පාදන: ප්‍රවර්ධනය
### பனைச் செய்கையும் பனைசார் உற்பத்திகளும்: மேம்படுத்தல்
### PALMYRAH CULTIVATION AND PALMYRAH BASED PRODUCTS: PROMOTION

1351/2025

**6. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උතුරු පළාතේ ජනතාවගේ ජීවනෝපායට මහත් රුකුලක් වන තල් ගස ශ්‍රී ලංකාවේ වැදගත් ශාකයක් ලෙස පිළිගැනීමට පියවර ගෙන තිබේද;

(ii) නොසැලකිලිමත්කම, නාගරීකරණය හා වන විනාශය හේතුවෙන් තල් ගස් විනාශ වීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) උතුරු පළාතේ තල් වගා කිරීම ව්‍යාප්ත කිරීමට විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේද;

(iv) සෙසු පළාත්වලද තල් වගා කිරීමට කටයුතු කරන්නේද;

(v) තල් වගාව ව්‍යාප්ත කිරීමට පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාමූල සංවිධාන සම්බන්ධ කර ගන්නේද;

(vi) තල් වගා කිරීමට ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද;

(vii) තල් සම්බන්ධයෙන් සංවර්ධන කොමිසමක් පිහිටුවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) තල් ආශ්‍රිත කුඩා කර්මාන්ත, ග්‍රාමීය ආයතන හා කාන්තා සමුපකාර සමිති දිරිගැන්වීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) තල් ආශ්‍රිත නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳ පොළේ අළෙවි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) එමඟින් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ආදායම ඉහළ නැංවීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடக்கு மாகாண மக்களின் வாழ்வாதாரத்துக்குப் பெரும் உந்துசக்தியாக அமையும் பனை மரத்தை இலங்கையின் முக்கியத்துவம் வாய்ந்த ஒரு

மூலவளமாக ஏற்றுக்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) கவனயீனம், நகரமயமாக்கல் மற்றும் காடழிப்பு போன்ற காரணங்களால் பனை மரங்கள் அழிவடைவதைத் தடுப்பதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) வட மாகாணத்தில் பனைச் செய்கையை விரிவாக்குவதற்கான சிறப்புக் கருத்திட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஏனைய மாகாணங்களிலும் பனைச் செய்கையை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(v) பனைச் செய்கையை விரிவாக்குவதற்கு மாகாண சபைகள், உள்ளூராட்சி மன்றங்கள் மற்றும் சமுதாயமட்ட அமைப்புகளும் இணைத்துக் கொள்ளப்படுமா என்பதையும்;

(vi) பனைச் செய்கைக்கான நிதி ஒதுக்கீடுகளை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(vii) பனை தொடர்பிலான அபிவிருத்தி ஆணைக்குழு வொன்று தாபிக்கப்படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பனை சார்ந்த சிறு கைத்தொழில்கள், கிராமிய நிறுவனங்கள் மற்றும் மகளிர் கூட்டுறவுச் சங்கங்களை வலுவூட்டுவதற்காக மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) பனை சார்ந்த உற்பத்திகளை சர்வதேச சந்தையில் விற்பனை செய்வதற்காக எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) அதனூடாக இலங்கையின் அந்நியச்செலாவணி வருமானத்தை அதிகரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he state -

(i) whether steps have been taken to recognize the palmyrah tree, which significantly supports the livelihoods of the people of the Northern Province, as an important tree in Sri Lanka;

(ii) the measures that have been taken to prevent the destruction of palmyrah trees due to negligence, urbanization and deforestation;

(iii) whether special projects have been implemented to promote palmyrah cultivation in the Northern Province;

(iv) whether steps will be taken to cultivate Palmyrah in other provinces as well;

(v) whether the provincial councils, local authorities, and community-based organizations will be coordinated to promote palmyrah cultivation;

(vi) whether allocations will be made for palmyrah cultivation; and

(vii) whether a Development Commission will be established regarding palmyrah?

(b) Will he also state -

(i) the steps that have been taken to encourage palmyrah-based small industries, rural institutes and Women's Co-operative Societies;

(ii) the steps that have been taken to sell palmyrah-based products in the international market; and

(iii) whether steps will be taken to increase the foreign exchange revenue of Sri Lanka by that?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

රජයේ කෘෂි කර්මාන්ත සහ කාර්මික සංවර්ධන උපාය මාර්ගයන්ට අනුකූලව තල් ගස ශ්‍රී ලංකාවේ වැදගත් ආර්ථික වටිනාමක් සහිත භෝගයක් ලෙස පිළිගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. කුඩා සහ සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්හට සහාය වීමෙන් තල් මත පදනම් වූ කර්මාන්තය ශක්තිමත් කිරීමට කටයුතු කරමින් ඇත. ඒ වාගේම මේ වන විට තල් සංවර්ධන මණ්ඩලයට අවශ්‍ය ධාරිතාව සහ අධිකාරි බලය ලබා දෙමින් තල් ක්ෂේත්‍රයේ තාක්ෂණික දියුණුව, නවෝත්පාදන නිෂ්පාදන ක්‍රම සහ අගය වැඩි කිරීම අරමුණු කරගෙන කටයුතු කරමින් තිබේ. මෙමඟින් තල් ගස ශ්‍රී ලංකාවේ වැදගත් ශාකයක් ලෙස පිළිගැනීමට හැකි වනු ඇත.

(ii) 1951 අංක 9 දරන ගස් හෙළීම (පාලනය කිරීමේ) පනත ප්‍රකාරව නිකුත් කරන ලද ගැසට් පත්‍රය හා ඊට අදාළ සංශෝධන මඟින් තල් ගස් කැපීම තහනම් කර ඇත.

a. එසේ වුවද, විශේෂ හේතු මත තල් ගස් කැපීම සඳහා එම නියෝග ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකර්ම විෂය භාර ලේකම්තුමා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරින් මඟින් බලපත්‍ර ලබා ගැනීම සිදු කළ යුතුය.

b. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ එක්ව තල් සංවර්ධන මණ්ඩලයේ ක්ෂේත්‍ර පරීක්ෂකවරුන් මඟින් තල් ගස් කැපීම සඳහා ලැබී ඇති අයදුම් පත්‍ර නීතිමය ප්‍රතිපාදනයන්ට අනුකූලව පරීක්ෂා කර අවශ්‍ය නිර්දේශ ලබා දීම සිදු කරයි.

c. නීති විරෝධීව හා අනවශ්‍ය ලෙස තල් ගස් කැපීම වැළැක්වීම සඳහා දැනට පවතින නීතිමය රාමුව ප්‍රමාණවත් නොවන බවට

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

අවධානය යොමු වී ඇති අතර, නව නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම හෝ පවතින නීති ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම තුළින් තිරසර කළමනාකරණය හා යහපත් ආරක්ෂණයක් ලබා දීමට පියවර ගනු ඇත.

(iii) ඔව්.

a. 2025 වර්ෂයේදී උතුරු සහ නැඟෙනහිර පළාත්වල සුදුසු භූමි තෝරාගෙන එහි තල් බීජ 120,000ක් රෝපණය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මේ සඳහා රුපියල් මිලියනයක් වෙන් කර ඇත.

b. තවදුරටත් තල් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඔක්තෝබර් මාසය "තල් වගා මාසය" ලෙස නම් කර ඇත. ඒ අනුව, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධ කර ගනිමින් නව වගා වැඩසටහන් විවිධ ප්‍රජාවන්ගේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරමින් තිබේ.

c. ඉහළ වැවිලි හැකියාවක් හා නිවැරදි වගා ක්‍රම තහවුරු කිරීම සඳහා තල් සංවර්ධන මණ්ඩලය විසින් තාක්ෂණික මාර්ගෝපදේශන සහ උසස් ගුණාත්මක බීජ සැපයීම සිදු කරයි.

(iv) ඔව්.

උතුරු පළාතට අමතරව නැඟෙනහිර පළාතේ ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර යන දිස්ත්‍රික්කයන්හිද, වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හා උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේද, දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේද තල් ගස් වගා කිරීමේ කටයුතු සිදු කරයි.

(v) ඔව්.

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධ කර ගනිමින් නව වගා වැඩසටහන් පහත ප්‍රජාවගේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කෙරේ.

- ප්‍රජා මූලික සංවිධාන (CBOs)
- පාසල් හා විශ්වවිද්‍යාල
- පෞද්ගලික ආයතන
- අස්වැසුම ප්‍රතිලාභීන්

(vi) ඔව්.

2025 වර්ෂය සඳහා රුපියල් මිලියනයක මුදලක් වෙන් කර ඇත.

2026 වර්ෂයට මේ සඳහා රුපියල් මිලියන 1.5ක මුදලක් යෝජනා කර ඇත.

(vii) නැත.

දැනට 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත සහ ඊට අදාළ සංශෝධනයන්ට අනුව තල් සංවර්ධන මණ්ඩලය ලෙස ක්‍රියාත්මක වනු ලැබේ.

(ආ) (i) a. ග්‍රාමීය කාන්තා හා තරුණ පිරිස්වල හැකියාවන් ඉහළ නැංවීමට තල් ආශ්‍රිත විවිධ නිෂ්පාදන සිදු කිරීම සඳහා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

b. පුහුණු වැඩසටහන සඳහා සහභාගිවන්නන්හට මූල්‍යමය දිරි දීමනාවන් ලබා දීම හා නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය උපකරණ සැපයීම.

c. තල් පර්යේෂණ ආයතනය මඟින් තල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික සහ පර්යේෂණ සහාය ලබා දීම.

(ii) a. තල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් ලියාපදිංචි කිරීම සහ සම්බන්ධීකරණය කිරීම තුළින් විශ්වාසදායී ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන සැපයුම් ජාලයක් තහවුරු කිරීම.

b. අමාත්‍යාංශය සහ තල් සංවර්ධන මණ්ඩලය එක්ව අපනයනකරුවන්හට අපනයන ක්‍රියාවලිය දිරිගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

c. මෙම වසරේ සිට වාර්ෂික අපනයනකරුවන්ගේ සම්මේලනය සංවිධානය කිරීම සඳහා තල් සංවර්ධන මණ්ඩලය මඟින් කටයුතු ආරම්භ කර ඇත.

(iii) ඔව්.

මෙම වැඩ පිළිවෙළ ගෝලීය වෙළෙඳපොළ තුළ තල් නිෂ්පාදන ප්‍රමුඛ, තිරසර හා සංස්කෘතික නිෂ්පාදනයක් බවට පත්කිරීමේ උපාය මාර්ගයක් වේ. එමෙන්ම තල් කර්මාන්තය ශ්‍රී ලංකාවේ අපනයන ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන තෙක් අඛණ්ඩ සහයෝගයක් ලබා දෙනු ඇත.

තල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම තුළින් 2023 වර්ෂය තුළ රුපියල් මිලියන 57.83ක වාර්ෂික අපනයන ආදායමක් ලබාගෙන ඇති අතර, 2024 වර්ෂය -ඒ කියන්නේ පසුගිය වර්ෂය- වන විට රුපියල් මිලියන 228.69ක අපනයන ආදායමක් උපයාගෙන ඇත.

2025 වර්ෂයේ පළමුවැනි මාස හතර, එනම් ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය වන විට රුපියල් මිලියන 203.19ක අපනයන ආදායමක් වාර්තා වී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, உண்மையிலேயே கௌரவ அமைச்சர் அவர்கள் வழங்கிய பதில் திருப்தி கரமானதாக இருக்கின்றது. பனை சார் உற்பத்திகளை விற்பனை செய்வதற்கான நடவடிக்கைகளையும் ஏனைய விடயங்களையும் காத்திரமாக மேற்கொண்டு இருப்பதனால், அவருக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

பனை என்பது, தமிழர்களின் வாழ்வியல் மற்றும் பண்பாட்டு, கலாசார விழுமியங்களோடு வரலாற்று ரீதியாக

முக்கியத்துவம் வாய்ந்தது. அதுமட்டுமன்றி, பனைக்கு 'கற்பகத்தரு' என்று தனித்துவமான பெயரும் உண்டு. மேலும், நிலத்தடி நீரைத் தக்கவைக்கும் திறனும் அதற்கு உண்டு. பனைசார் உற்பத்திகளை ஊக்குவிக்கும் பொருட்டு விளம்பரப்படுத்தும் திட்டங்கள் ஏதேனும் உள்ளனவா? வடக்கு, கிழக்கு மாகாணங்கள் தவிர்ந்த ஏனைய மாகாணங்களிலுள்ள அரசுடன் இணைந்த நிறுவனங்களினூடாக இவற்றின் விற்பனையை அதிகரிக்க ஏதேனும் நடவடிக்கை எடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නයට පිළිතුර අපේ පැහැදිලි කිරීම ඇතුළේත් යම් ප්‍රමාණයකට තිබුණා. ඇත්තටම අපි එක පැත්තකින් සතුටු වෙනවා, මෙම කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට හැකිවීම පිළිබඳව. උතුරේ ජනතාවගේ ජීවිත එක්ක බැඳුණු ශාකයක් තමයි තල්ගස. ඒ ප්‍රදේශයේ පවතින සංස්කෘතිය එක්කත් බැඳුණු ගසක් හැටියට අපි තල්ගස හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසා මේ කර්මාන්තයේ ප්‍රවර්ධනය ටිකක් වේගයෙන් සිදු වෙනවා. රුපියල් මිලියන 57.83ක් පමණයි, 2023 අවුරුද්දේ තල් ආශ්‍රිත අපනයන ආදායම වශයෙන් තිබුණේ. හැබැයි, අපි මේ අවුරුද්දේ මුල් මාස 4 තුළ විතරක් රුපියල් මිලියන 203.19ක් දක්වා එය වර්ධනය කරගෙන තිබෙනවා.

දැන් මේ කර්මාන්තය සාම්ප්‍රදායික ප්‍රදේශවලින් ඔබ්බට ගිහිල්ලා තිබෙනවා, ඔබතුමා අහන පරිදිම. දැන් ත්‍රිකුණාමලය, අනුරාධපුරය සහ අම්පාර දිස්ත්‍රික්කවල වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේත් තල් වගාව ප්‍රවර්ධනය කිරීමටත්, ඒ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කරමින් තිබෙනවා. ඒ වාගේම අපි දැනට සාකච්ඡා කරමින් සහ සැලසුම් කරමින් පවතිනවා, තල් ආශ්‍රිත නිෂ්පාදන සංචාරක ව්‍යාපාරයත් එක්ක බද්ධ කරලා සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනයටත්, ලෝකයට තල් ගස ආශ්‍රිත සංස්කෘතිය හඳුන්වා දීමටත් අවශ්‍ය කටයුතු කරන්න. විශේෂයෙන්ම අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රදේශයේ තල් ආශ්‍රිත නිෂ්පාදන පුහුණු වැඩසටහනක් ඒ ප්‍රදේශයේ දරිද්‍රතාවෙන් පෙළෙන, නැත්නම් අඩු ආදායම්ලාභී පවුල් සමඟ පවත්වාගෙන යනවා. අපි ඔවුන්ට නව කර්මාන්තයක් හඳුන්වා දීමට කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, මේ කර්මාන්තය තවදුරටත් සංචාරක ව්‍යාපාරයත් එක්ක බද්ධ කරන්නත්, සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල ජනප්‍රිය කරන්නත් අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

பனைசார் உற்பத்திகளை ஊக்குவிப்பதற்கு உற்பத்தியாளர்களுக்கு கடன் உதவி வழங்குதல் மற்றும் தொழில்நுட்பப் பயிற்சிகளை வழங்குதல் முக்கியமானது. குறிப்பாக, பனைசார் உற்பத்திகளை நீண்ட காலம் பேணிப் பாதுகாப்பதற்கு ஏற்ற வகையில், அவற்றைப் பதப்படுத்துவதற்கான தொழில்நுட்பம் சார்ந்த ஆலோசனைகள் அல்லது அறிவுரைகளையும் அவற்றை அழகாக அல்லது நேர்த்தியாக பொதி செய்வதற்குரிய ஆலோசனைகளையும் வழங்கும் திட்டங்கள் ஏதேனும் நடைமுறையில் உள்ளனவா? எனக் கேட்க விரும்புகின்றேன்.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වෙලා, මේ රටේ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට මේ වාගේ කර්මාන්තවල යෙදීම සඳහා අවශ්‍ය ආධාර ක්‍රම සහ ණය වැඩසටහන් සකස් කරලා තිබෙනවා. ඒ හරහා අපට තල් වගාවටත් ආධාර ලබා දෙන්න පුළුවන් වාගේම, අපි දැනටමත් ආධාර ලබා දෙමින් සිටිනවා. ඔබතුමා අසන ලද ප්‍රශ්නය ගැන මම තව පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි.

මම ආරාධනා කරනවා, ආයෝජකයන්ට. විශේෂයෙන්ම දෙස් විදෙස් වාසය කරන ලාංකිකයන්ට. ඔවුන් තල් කර්මාන්තය ආශ්‍රිතව ආයෝජනය කරනවා නම්, අපි සූදානම් ඊට ඉඩ පහසුකම් ලබා දෙන්න. රටේ තේ, පොල්, රබර් වගා කරන මහා පරිමාණ ඉඩම් තිබෙනවා. නමුත් තල් කැළෑවල තිබෙනවා, සමහර රක්ෂිතවල තිබෙනවා, සමහර ගෙවතුවල තිබෙනවා. ගරු කථානායකතුමනි, ලංකාවේ තල් ගස් මිලියන 11.1ක වාගේ ප්‍රමාණයක් තිබෙන බවට වාර්තා වෙනවා. මේ තල් ගස් තේ, පොල්, රබර් වාගේ එක භූමියක නැහැ. විසිරිලා තිබෙන්නේ. අපි දැනටමත් සාකච්ඡා කරමින් ඉන්නවා, මේ සඳහා ආයෝජකයෙක් එනවා නම්, යම්කිසි භූමි ප්‍රදේශයක තිබෙන තල් ගස් ප්‍රමාණය නීත්‍යනුකූල ලෙස ඔවුන්ට ලබා දීලා, තල් ආශ්‍රිත නිෂ්පාදනයට අවශ්‍ය ඉඩකඩ ලබා දෙන්න. ඒ සඳහා අපි සූදානම්. ඒ සඳහා අපි අයෝජකයන්ට ආරාධනා කරනවා. අපි ඒ සඳහා අවශ්‍ය පහසුකම් රජය හැටියට ලබා දෙන්න සූදානම් කියන පණිවුඩයත් මේ මොහොතේ ලබා දෙනවා.

## දුර ගමන් බස් රථවල ගමන් කරන්නන් සඳහා පහසුකම් සපයන අවන්හල්/හෝටල්: ලියාපදිංචිය

### தூர பயண பேருந்துகளில் பயணிப்பவர்களுக்கான வசதிகளை வழங்கும் உணவகங்கள்/ ஹோட்டல்கள்: பதிவுசெய்தல்

### RESTAURANTS/HOTELS PROVIDING FACILITIES FOR PASSENGERS OF LONG-DISTANCE BUSES: REGISTRATION

1353/2025

**7. ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දුර ගමන් සේවා බස්රථවල මගීන්ට ආහාරපාන හා සනීපාරක්ෂක පහසුකම් සපයන ආපන ශාලා/හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආපන ශාලා/හෝටල් සඳහා ලියාපදිංචියක් හෝ අවසරයක් තිබිය යුතුද;

(iii) එසේ නම්, ලියාපදිංචිය/අවසරය සහිත ආපන ශාලා/හෝටල් සංඛ්‍යාව කොපමණද;

(iv) ලියාපදිංචි කළ ආපන ශාලා/හෝටල් විසින් පිළිපැදිය යුතු නීති රීති පද්ධතියක් හෝ කොන්දේසි මාලාවක් තිබේද;

(v) එසේ නම්, ඒවා කවරේද;

(vi) එම ආපන ශාලා/හෝටල් ලියාපදිංචි කිරීමේදී ගාස්තුවක්/බද්දක් අය කරන්නේද;

(vii) එසේ නම්, එම ගාස්තුව/බද්ද කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා]

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தூரப் பயணச் சேவைகளில் ஈடுபடும் பேருந்துப் பயணிகளுக்கு உணவு, பானங்கள் மற்றும் உடல்நலவியல் வசதிகளை வழங்கும் உணவகங்கள்/ ஹோட்டல்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி உணவகங்கள்/ஹோட்டல்கள் பதிவு செய்யப்பட்டிருக்க அல்லது அனுமதி பெற்றிருக்க வேண்டுமா என்பதையும்;

(iii) ஆமெனில், பதிவு செய்யப்பட்ட/அனுமதி பெற்ற உணவகங்கள்/ஹோட்டல்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) பதிவு செய்யப்பட்ட உணவகங்கள்/ஹோட்டல்கள் பின்பற்றவேண்டிய விதிமுறைகள் அல்லது நிபந்தனைகள் ஏதேனும் உள்ளனவா என்பதையும்;

(v) ஆமெனில், அவை யாவை என்பதையும்;

(vi) மேற்படி உணவகங்களை / ஹோட்டல்களை பதிவு செய்கையில் கட்டணம்/வரி அறவிடப் படுகின்றதா என்பதையும்;

(vii) ஆமெனில், அக்கட்டணம்/வரித்தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the number of restaurants/hotels which provide food, beverages and sanitary facilities for passengers on long-distance buses in Sri Lanka;

(ii) whether the restaurants/hotels mentioned above are required to have a registration or permission to operate;

(iii) if so, the number of restaurants/hotels operating with a registration/permission;

(iv) whether there is a set of rules and regulations or conditions that must be followed by registered restaurants/hotels;

(v) if so, of those;

(vi) whether a fee/tax is charged for the registration of those restaurants/hotels; and

(vii) if so, the amount of the fee/tax?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (වැඩබලන ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பதில் அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Acting Minister of Transport and Highways)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංගම දුර ගමන් සේවා : ආපණ ශාලා 73යි.

පෞද්ගලික අංශයේ දුර ගමන් සේවා : පුත්තලම් කොරිඩෝව (කොළඹ - යාපනය) 14යි.

හයිලෙවල් ලෝලෙවල් කොරිඩෝව (කොළඹ-බදුල්ල, පැල්මඩුල්ල-අම්පාර, අවිස්සාවේල්ල-හැටන්) 19යි. අනෙකුත් මාර්ගවල (කොරිඩෝවල) ආපණ ශාලා හඳුනා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

(ii) අංක 1742/26 - 2012 ජනවාරි 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ ආපණ ශාලා පවත්වා ගත යුතුය.

මේ වන විට ආපණ ශාලා ලියාපදිංචිය සඳහා වන කොන්දේසි මාලාවක් ශ්‍රී ලංගම විසින්ද සකස් කර ඇති අතර දැනට ආපණ ශාලා පවත්වා ගෙන යෑම සඳහා ආපණ ශාලා හිමියන්ගේ ඉල්ලීම පරිදි ලිඛිත අවසරයක් ලබා දී ඇත.

තවද, ආපණ ශාලා අදාළ පළාත් පාලන ආයතනයේ ලියාපදිංචි විය යුතුය.

(iii) ශ්‍රී ලංගම දුර ගමන් සේවා සඳහා සේවා සපයන ආපණ ශාලා 73ක් ශ්‍රී ලංගම යටතේ දැනට ලියාපදිංචි වී නොමැත.

පෞද්ගලික අංශයේ දුර ගමන් සේවා සඳහා අදාළ ආපණ ශාලා සම්බන්ධ තොරතුරු ඉදිරියේදී ජාතික ගමනාගමන කොමිසම හරහා එක්රැස් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

(iv) ඔව්.

(v) සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති අංක 1742/26-2012 ජනවාරි 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය (1980 අංක 26 දරන ආහාර පනත) ඇමුණුම 01හි දක්වා ඇත.

දුර ගමන් සේවා බස් රථ නතර කරන ආපණ ශාලා ශ්‍රී ලංගම තුළ ලියාපදිංචිය සඳහා වන කොන්දේසි ඇමුණුම 02හි දක්වා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති "ආහාර පරිහරණ ආයතන ශ්‍රේණිගත කිරීම - H 800 (සංශෝධිත) 2011" ආකෘතිය ඇමුණුම 03හි දක්වා ඇත.

H 800 ආකෘතිය මඟින් ආවරණය නොවන, එහෙත් මඟීන්ට බස් රථ කාර්ය මණ්ඩලවලට හා බස් රථවලට අවශ්‍ය අනෙකුත් පහසුකම් සැලසීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සකස් කර ඇති පිරිවිතර මාලාව ඇමුණුම 04හි දක්වා ඇත.

ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරමි.

(vi) මෙතෙක් ගාස්තු අය කර නොමැත. නමුත්, ආපණ ශාලාව අයත් ප්‍රාදේශීය සභාවෙන් වෙළඳ බලපත්‍රය සඳහා ගාස්තුවක් අය කෙරේ.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(vii) ශ්‍රී ලංගම විසින් සකස් කර ඇති ආපණ ශාලා ලියාපදිංචිය සඳහා වන කොන්දේසි යටතේ ලියාපදිංචි ගාස්තුව ලෙස නැවත නොගෙවන රුපියල් 25,000ක තැන්පතු මුදලක්ද, මාසික ගාස්තුව ලෙස රුපියල් 3,000ක මුදලක් ද දක්වා ඇත.

ප්‍රාදේශීය සභාවෙන් වෙළඳ බලපත්‍රය සඳහා අය කරන ගාස්තුව රුපියල් 1,100යි.

(ආ) අදාළ නොවේ.

**ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මමත් අනුරාධපුරයේ ජීවත් වෙන කෙනෙක්. ඔබතුමා හොඳින්ම දන්නවා, මේ රටේ බහුතර ජනතාව දුර ගමන් සේවා සඳහා පාවිච්චි කරන්නේ බස් රථය බව. ඉතින් මේ බස් රථවල ගමන් කරද්දී, මගීන්ට විඳින්නට සිද්ධ වෙන පීඩාවන් අතිශය ඛේදජනකයි. වාසනාවකට, අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරෙන යම් යම් ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ නිසා මේ ප්‍රශ්න තරමක්දුරට මඟ හැරිලා තිබෙනවා කියලා ප්‍රශංසාත්මකව අපේ ගරු ඇමතිතුමාට දැනුම් දෙන්න කැමැතියි. ඒ වාගේම යම් තැනක අපි නොහිතන විධියට මේ ප්‍රශ්නය දුරදිග ගිහින් ජනතාවට දැඩි පීඩාවට පත් වෙන්න සිදු වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම බස් එකක ඇඹරිලා, මිරිකිලා, වද විඳලා, වේදනාවෙන් ගිහිල්ලා, බස් රථයෙන් බැහැලා මහ තැනක යම් ආකාරයක විවේකයක් ගන්න, තේ එකක් බොන්න නතර කළාම, ජනතාව ඉතාම පැහැදිලි අපහසුතාවන්ට ලක් වෙනවා. මොකද, නිසි ආහාරයක් නැහැ; තිබුණත් පිරිසිදු බවක් නැහැ; සනීපාරක්ෂක පහසුකම් දුර්වලයි; නොසලකා හැරීම් බහුලයි. මේ වාගේ තත්ත්වයන් උඩ මගේ පළමු අතුරු ප්‍රශ්නය ඔබතුමාට යොමු කරනවා. ගරු ඇමතිතුමනි, නව පරිපාලන ක්‍රමවේදයක් අනුව රජයේ ඍජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කෙරෙන ආපණ ශාලා හෝ බොජුන්හල් පිහිටුවීම පිළිබඳ යෝජනාව ගැන ඔබතුමාගේ අදහස කුමක්ද?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, මේක අපි පටන් ගත්තේ පුත්තලම කොරිඩෝ එකෙන්. පුත්තලම ප්‍රවේශ මාර්ගයේ ඒකාබද්ධ කාලසටහන පටන් අරගෙන එතැන නිශ්චිත ගමනාන්තය දක්වා ගතවන කාලය, එකම තැනකින් බස් රථ ආරම්භ කරන වැඩ පිළිවෙළත් එක්ක තමයි අපි මේ ආපණ ශාලා නිරීක්ෂණයට ලක් කළේ; ප්‍රමිතිකරණයට ලක් කළේ. මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේත් උදවු ඇතිව අදාළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ බල ප්‍රදේශවල, MOH areasවල, ඒ මහජන පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණය සහ ඒ guidance එක ඇතුව තමයි මේ ආපණ ශාලා ප්‍රමිතිකරණය කරගෙන යන්නේ. ඉතින් මේ වැඩ පිළිවෙළ ඒකාබද්ධ කාලසටහනට අනුව එකින් එක, කොරිඩෝ එකෙන් කොරිඩෝවට, ප්‍රවේශ මාර්ගයෙන් ප්‍රවේශ මාර්ගයට මාරු වෙනවාත් එක්කම, රට පුරා සියලු දුර ගමන් බස් රථ නවත්වන ස්ථානවල ප්‍රමිතියක් තිබෙන ආපණ ශාලා නියාමනය කරන තත්ත්වයට ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක කොරිඩෝ එකෙන් කොරිඩෝ එකට, ප්‍රවේශ මාර්ගයෙන් ප්‍රවේශ මාර්ගයට අපි ඉදිරියේදී සැලසුම් කරලා තිබෙනවා.

**ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

ගරු අමාත්‍යතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, අපිරිසිදුභාවය, එහෙම නැත්නම් නිසි ප්‍රමිතියකින් තොරවීම කියන තත්ත්වයන්ට අමතරව, මේ ඇතුළත ක්‍රියාත්මක කෙරෙන වැරදි කිහිපයක් තිබෙනවා. සමහර හෝටල් හිමියෝ, ආපණ ශාලා හිමියෝ පෞද්ගලික බස් රථ හිමියන්ට, සමහර විට කොන්දොස්තරවරුන්ට, රියැදුරන්ට මත්ද්‍රව්‍ය සැපයීම් කරනවා මගේ දැනට දැකලා තිබෙනවා. එහෙම නැත්නම් යම් ආකාරයක අනියම් මුදල් සම්පාදනය කිරීම් කරනවා. ඒ නිසාම තමයි සමහර විට ඒ අදාළ සුදුසුකම්, පහසුකම් නොතිබුණත් ඒ තැන්වලට ජනතාව ගෙනිහිල්ලා බස්සවන්නේ.

මේක එක්තරා ආකාරයක අනියම් අල්ලසක් විධියට තමයි ක්‍රියාත්මක වෙන්නේ. අපේ රටේ ඉතාම හොඳින් කටයුතු කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, පොලිස් නිලධාරින් ඉන්නවා. නමුත් ඉඳලා හිටලා හරි මේවාට උඩ ගෙඩි දෙන, මේ සම්බන්ධයෙන් අයුතු බලපෑම් කරන නිලධාරිනුත් ඉන්නවා. ඒ නිසා රට පුරා මේ පිළිබඳ සැබෑ විමර්ශනයක් කරන්න අමාත්‍යාංශයට පියවර ගන්න පුළුවන් නම් ඒක වඩාත් වැදගත් කියන කාරණාව කියන ගමන්, මේ සම්බන්ධයෙන් ඇත්ත විමර්ශනයක් කරන්න බැරිද කියන ප්‍රශ්නය මම අහනවා.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, මත්ද්‍රව්‍ය උවදුර කියන එක දුර ගමන් සේවා බස් රථ සඳහා පමණක්ම ඇති වෙච්ච ගැටලුවක් නොවෙයි. මේ සම්බන්ධයෙන් රටේ තිබෙන තත්ත්වය මොකක්ද කියන එක පිළිබඳව දැන් අපි හැමෝටම අවබෝධයක් තිබෙනවා. දුර ගමන් සේවා බස් රථ සහ අනෙකුත් බස් රථවල රියැදුරු මහත්වරු, කොන්දොස්තර මහත්වරු මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අපි අවධානය යොමු කර තිබෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ NTMI - National Transport Medical Institute - එක තිබෙනවා. ඒ කියන්නේ, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය. සෞඛ්‍ය අමාත්‍යාංශයේත් උදවු ඇතුව මේ මඟින් අපි සැලසුම් සකස් කර තිබෙනවා, වාචික මට්ටමින් සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒ රථ භාරයට ගන්න පුළුවන් නම් අපිට තැන් තැන්වල on-the-spot පරීක්ෂණ කරන්න පුළුවන් හැකියාව තිබෙනවා. NTMI එකට ඒ හැකියාව තිබෙනවා. ඒක ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම රටේ සමස්ත මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම හරහා බස් රථවල මත්ද්‍රව්‍ය පාවිච්චියත් අවම කිරීම තමයි සැලසුම්ගත වෙන්නේ. නමුත් එක තැනක් විතරක් අල්ලාගෙන අපිට මේක විසඳන්න බැහැ. මේක රටේම තිබෙන ගැටලුවක්, ඔඩුදුවපු ගැටලුවක්. ඒක විසඳනවාත් එක්ක බස් රථවල මත්ද්‍රව්‍ය පාවිච්චියත් අවම කරන්න අපිට පුළුවන් වෙයි කියලා හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -1358/2025- (1), ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## පොතුවිල් ප්‍රා.ලේ. කොට්ඨාසයේ ශ්‍රීලංගම බස් ඩිපෝව: බස් රථ ඇණිය
### பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள இபோச பஸ் டிப்போ: பேருந்துத் தொகுதி
### SLTB BUS DEPOT IN POTTUVIL DS DIVISION: BUS FLEET

1359/2025

**9. ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ඩිපෝවක් තිබෙන බවත්;

(ii) එම බස් ඩිපෝව සංචාරක කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ආරුගම්බේ ප්‍රදේශයේ පිහිටුවා ඇති බවත්;

(iii) මේ වනවිට එම ඩිපෝව මඟින් බස් රථ 10ක් පමණක් ධාවනයේ යොදවා ඇති බවත්; එතුමා දන්නේද?

(ආ) (i) ඉහත ඩිපෝව මඟින් ආරුගම්බේ සිට කටුනායක සහ ඇල්ල වැනි ගමනාන්ත වෙත නව බස් රථ සේවා ආරම්භ කරන්නේද;

(ii) එම ඩිපෝව සඳහා ඉන්ධන පිරවුම්හලක්, නඩත්තු ඒකකයක් ඇතුළු මූලික පහසුකම් ලබා දෙන්නේද;

(iii) එම ඩිපෝව සඳහා නව බස් රථ ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தின், பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில், இலங்கை போக்குவரத்துச் சபையின் பஸ் டிப்போ ஒன்று உள்ளது என்பதையும்;

(ii) மேற்படி பஸ் டிப்போ சுற்றுலாக் கைத் தொழிலுக்குப் பிரபல்யமான அறுகம்பைப் பிரதேசத்தில் அமைந்துள்ளது என்பதையும்;

(iii) தற்பொழுது மேற்படி பஸ் டிப்போவால் 10 பேருந்துகள் சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பஸ் டிப்போவால் அறுகம்பை தொடக்கம் கட்டுநாயக்க மற்றும் எல்ல போன்ற பயண முடிவிடங்களுக்குப் புதிய பேருந்துச் சேவைகள் ஆரம்பிக்கப்படுமா என்பதையும்;

(ii) மேற்படி பஸ் டிப்போவுக்கு எரிபொருள் நிரப்பு நிலையம், பராமரிப்புப் பிரிவு உள்ளிட்ட அடிப்படை வசதிகள் வழங்கப்படுமா என்பதையும்;

(iii) மேற்படி பஸ் டிப்போவுக்குப் புதிய பேருந்துகள் வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Is he aware that -

(i) there is a bus depot of the Sri Lanka Transport Board in the Pottuvil Divisional Secretary's Division of the Ampara District;

(ii) the said bus depot is located in the Arugam Bay area, which is famous for tourism industry; and

(iii) only 10 buses are in operation under the said bus depot by now?

(b) Will he inform this House whether -

(i) the said bus depot is starting new bus services from Arugam Bay to destinations such as Katunayake and Ella;

(ii) the basic facilities including a filling station and a maintenance unit will be provided for the said bus depot; and

(iii) new buses will be provided for the said bus depot?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් ඩිපෝවක් තිබේ.

(ii) එම බස් ඩිපෝව සංචාරක කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ආරුගම්බේ ප්‍රදේශයේ පිහිටුවා ඇත.

(iii) මුළු බස් රථ ඇණිය 17ක් වන අතර දැනට බස් රථ 7ක් පමණක් ධාවනය වේ.

(ආ) (i) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම පවත්නා රජයේ ප්‍රමුඛ කාර්යයක් බැවින් ඉදිරියේදී නව බස් රථ ලැබීමත් සමඟ මගී අවශ්‍යතාව අනුව බස් රථ යෙදවීමට සැලසුම් කර ඇත.

මේ යටතේ සුඛෝපභෝගී ආසන 49-54 බස් රථ 200ක් ද, සාමාන්‍ය සේවා සඳහා ආසන 49-54 බස් රථ 600ක් ද මිලදී ගැනීමට සැලසුම් කර ඇත.

(ii) නඩත්තු ඒකකයක් ඇතුළු මූලික පහසුකම් ලබා දී ඇත. සැලසුම් කර ඇති පරිදි බස් රථ ප්‍රමාණය වැඩිවීමත් සමඟ ඉන්ධන පිරවුම්හලක් ලබා දීමට පියවර ගැනේ.

(iii) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට අදාළව හා ප්‍රදේශයේ මගී ඉල්ලුමට සරිලන පරිදි ඉදිරියේදී බස් රථ ලබා දීමට කටයුතු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே! என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ முன்னாள் அமைச்சர் பேரியல் அஷ்ரப் அவர்களால் திறந்துவைக்கப்பட்ட பொத்துவில் பஸ் டிப்போவானது, அதிகாரமில்லாத காலத்தில் யாருக்கும் தெரியாமல் உப டிப்போவாக மாற்றப்பட்டு மிகவும் சிறப்பாக இயங்கி வந்த நிலையில், கடந்த அரசாங்கத்தின் இறுதிக் காலகட்டத்தில் முன்னாள் பாராளுமன்ற உறுப்பினர் எஸ்.எம்.எம். முஷாரப் அவர்களது முயற்சியால் மீண்டும் டிப்போவாகத் தரமுயர்த்தப்பட்டு, சுமார் ஆறு கோடி ரூபாய் நிதியும் அரசாங்கத்தால் அடிப்படை வசதிகளை ஏற்படுத்துவதற்காக ஒதுக்கப்பட்டது. அது ஆண்டின் இறுதிக்

காலமாக இருந்ததால் குறித்த நிதியைப் பயன்படுத்த முடியாமல் போய்விட்டது.

கௌரவ அமைச்சர் அவர்களே, இந்த ஆண்டின் வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டில், உல்லாசத்துறைக்குப் பெயர்போன அறுகம்பைப் பிரதேசத்தில், உல்லாசப் பிரயாணிகளின் நலன்கருதி புதிய கட்டிடமொன்றில், புதிய பஸ்களை வழங்கியும் அடிப்படை வசதிகளை ஏற்படுத்திக் கொடுத்தும் வெற்றிடமாகவுள்ள 5 சாரதி பதவிக்கு ஆட்களை நியமித்தும் குறித்த டிப்போவை சிறந்த முறையில் இயங்க வைக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

අනිවාර්යයෙන් අපි ඒ දේ කරන්න බලාපොරොත්තු වනවා. දැනටත් ඒක සැලසුම්ගතව තිබෙනවා. මේ බස් රථ ලබා දීම රජය මඟින් විතරක්ම කරනවා කියන මතයේ අපේ රජය නැහැ. මේ සඳහා අපි පුළුවන් තරම් පෞද්ගලික ආයෝජකයන් කැඳවා ගන්නවා. අපි මුදල් අමාත්‍යාංශය සමඟත්, අනිල් ජයන්ත අමාත්‍යතුමා සමඟත් මේ සම්බන්ධව සාකච්ඡා වට කිහිපයක්ම පැවැත්වූවා. විදේශ ආයෝජකයන්ට electric bus ගෙනැල්ලා සංචාරක ව්‍යාපාරය සඳහා යොදවන්න පුළුවන්ද කියන හැකියාව අපි explore කරලා බැලුවා. මේ සඳහා කටයුතු කිරීමේදී යම් කිසි කාලයක් ගත වෙයි. ඒ සඳහා අවුරුද්දක පමණ කාලයක් ගත වෙන්න පුළුවන්. නමුත්, අපි ඉදිරියේදී ඒ දේ කරන්න බලාපොරොත්තු වනවා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே! என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

1998ஆம் ஆண்டு எமது கட்சியின் தேசியத் தலைவர் மர்ஹூம் எம்.எச்.எம் அஷ்ரப் அவர்களால் முன்னாள் பாராளுமன்ற உறுப்பினர் யு.எல்.எம். முகைதீன் அவர்களது வேண்டுகோளின் பேரில் திறந்துவைக்கப்பட்ட சம்மாந்துறை உப பஸ் டிப்போவானது, கடந்த அரசாங்கத்தால் 2021ஆம் ஆண்டு மூடப்பட்டது. அப்போது மிகவும் இலாபத்தில் இயங்கி வந்த நிலைமையைக் கருத்திற்கொள்ளாது, அங்கிருந்த 17 பஸ் வண்டிகளும் கல்முனை பஸ் டிப்போவுக்கு வழங்கப்பட்டது. இன்றுவரை அந்த உப பஸ் டிப்போ திறக்கப்படாமல் இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, தற்போது சம்மாந்துறை பிரதேசத்தில் 5 ஏக்கர் காணி பஸ் டிப்போவுக்காக ஒதுக்கப்பட்டு இருப்பதால், சம்மாந்துறை உப பஸ் டிப்போவை மீளவும் திறக்க வேண்டுமென சம்மாந்துறை பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழு கூட்டத்திலும் முன்னாள் பாராளுமன்ற உறுப்பினர் எம்.ஐ.எம். மன்சூர் அவர்கள் வேண்டுகோள் விடுத்திருக்கிறார். இந்த உப பஸ் டிப்போவை திறந்து வைக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු කථානායකතුමනි, සමන්තුරේ උප ඩිපෝව ගැනයි මන්ත්‍රීතුමා අහන්නේ. මෙතැනදී අපි බලන්න ඕනෑ වනවා, bus service එක අඛණ්ඩව අපට ලබා දෙන්න පුළුවන්ද, බැරිද කියන එක ගැන. අපේ ප්‍රමුඛතාව වන්නේ අලුතින් ඩිපෝ විවෘත කරන එක නොවෙයි, එතැන ඉන්න ජනතාවට අඛණ්ඩ සේවාවක් ලබා දීමයි. එහෙම නම්, සමන්තුරේ බස් ඩිපෝව ගැන අපි බලන්න ඕනෑ කාරණා තුනක් තිබෙනවා.

මෙහිදී අපි එකින් එක යන්න ඕනෑ. පළමුවෙනි කාරණය මෙයයි. සමන්තුරේ අලුතෙන් ඩිපෝවක් ආරම්භ කරලා එතැනට සේවක මණ්ඩලයක් අනුයුක්ත කරලා එතැන ඉඳලා බස් ටික operate කරනකොට කොච්චර වියදමක් යනවාද කියන එක අපි බලන්න ඕනෑ. මොකද, ඒකට අමතර වියදමක් යනවා. සමන්තුරේ ඉඳලා කල්මුනේ ඩිපෝවට මම දන්නා විධියට කිලෝමීටර 12ක්, 13ක් වාගේ තිබෙනවා. ඒ බස්වලට තෙල් ගහන්න එන්න වෙනවා, කල්මුනේ ඩිපෝවට. එතකොට කිලෝමීටර 12ක, 13ක වාගේ lost mileage එකක් එතැන තිබෙනවා. ඒ කියන්නේ, මිනිස්සු නැතිව ප්‍රවාහනය වීමක් -තෙල් ගැසීමට- සිද්ධ වනවා. එතකොට අපට අමතර වැය බරක් දරන්න සිද්ධ වනවා. ඒක දෙවැනි කාරණය.

තුන්වැනි කාරණය තමයි, එතැන තිබෙන පෞද්ගලික සහ SLTB ඒකාබද්ධ කාලසටහන හරියට ක්‍රියාත්මක නොවීම. ඒ නිසා අපි අවධානය යොමු කර තිබෙනවා, පළමුවෙන්ම ඒ ඒකාබද්ධ කාලසටහන නියමාකාරයෙන් ක්‍රියාත්මක කරන්න. එහෙම කරලා කල්මුනේ ඩිපෝවේ ඉඳලාම ඒ ප්‍රදේශයේ ජනතාවට ප්‍රවාහන පහසුකම් දෙන්න පුළුවන් නම් ඒක තමයි ideal. අංක එක වන්නේ එයයි. මොකද වියදම අඩුයි, ආදායම වැඩියි. ඒක අමාරු නම් සමන්තුරේ ඩිපෝවක් ආරම්භ කරලා අවම කාර්ය මණ්ඩලයකින් ඒ පහසුකම දෙන්න පුළුවන්ද කියලා බලනවා. ඒක තමයි, දෙවැනි option එක. නමුත්, ඔය options දෙකෙන් මොන option එකට යන්නත් ඉස්සෙල්ලා දැනට තිබෙන ඒකාබද්ධ කාලසටහන නියමාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ කටයුත්ත අපි ආරම්භ කර තිබෙන්නේ. නමුත් තවම ඒක හරියට organize වෙලා නැහැ. ඒක *ad hoc* විධියට යන්නේ. ඒ නිසා ඒක ක්‍රමානුකූලව හැදීමේ කටයුත්ත අපි ආරම්භ කර තිබෙනවා. ඒක හදලා මාසයක දෙකක විතර කාලයක් අපි බලනවා, ඒ service එක ඔබතුමන්ලා තෘප්තිමත් - satisfy - වන විධියට, ජනතාව තෘප්තිමත් වන විධියට ලබා දෙන්න පුළුවන් ද කියලා. එහෙම වුණොත් සමන්තුරේ ඩිපෝව නැතිව කල්මුනේ ඩිපෝවෙන්ම වුණත් මේ ප්‍රශ්නය ගොඩ දමන්න පුළුවන්. එහෙම බැරි නම් අපි දෙවැනි option එකට අනිවාර්යයෙන්ම යනවා, කල්මුනේ ඩිපෝව ආරම්භ කරලා. වැඩිපුර වැය බරක් ගියත්, අපි ඒ දේ කරනවා.

බොහොම ස්තුතියි.

## ත්‍රිකුණාමලය මහ රෝහල, මුතූර්, කින්නියා සහ කන්තලේ මූලික රෝහල්: සංවර්ධනය

திருகோணமலை பொது மருத்துவமனை, மூதூர், கிண்ணியா மற்றும் கந்தளாய் ஆதார மருத்துவமனைகள்: அபிவிருத்தி

TRINCOMALEE GENERAL HOSPITAL AND BASE HOSPITALS IN MUTUR, KINNIYA AND KANTALE: DEVELOPMENT

1405/2025

**10.** ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 වර්ෂයේ සිට මේ දක්වා ත්‍රිකුණාමලය මහ රෝහල, මුතූර්, කින්නියා සහ කන්තලේ මූලික රෝහල් තුළ සිදුවූ මාසික දරු උපත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

(ii) එම උපත් සංඛ්‍යාවට සාපේක්ෂව එම රෝහල්වල සිටිය යුතු වෛද්‍යවරුන් සංඛ්‍යාව, වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව සහ වෙනත් පහසුකම් සම්බන්ධයෙන් සමාලෝචනය කර එම රෝහල් සංවර්ධනය කිරීමට කටයුතු කර තිබේද;

(iii) ත්‍රිකුණාමලය රෝහලේ සිට මඩකලපුව, අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි ප්‍රධාන රෝහල් වෙත යොමු කරනු ලබන රෝගීන් මුහුණ දෙන දුෂ්කරතා සම්බන්ධයෙන් දන්නේද;

(iv) එයට පිළියමක් ලෙස ත්‍රිකුණාමලය මහ රෝහල සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේද;

(v) ඉහත රෝහල් අතරින් මධ්‍යම රජය සහ පළාත් සභාව විසින් පාලනය කරනු ලබන රෝහල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) 2024 සහ 2025 වර්ෂයේ මේ දක්වා ඉහත එක් එක් රෝහලෙන් ප්‍රතිකාර ලැබූ නේවාසික සහ බාහිර රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024ஆம் ஆண்டு தொடக்கம் இதுவரை, திருகோணமலை பொது மருத்துவமனை, மூதூர், கிண்ணியா மற்றும் கந்தளாய் ஆதார மருத்துவ மனைகளில் மாதாந்தம் நிகழ்ந்த மகப்பேறுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(ii) அத்தகைய மகப்பேறுகளுக்கு ஒப்பீட்டளவில் அந்தந்த மருத்துவமனைகளில் பணியாற்ற வேண்டிய மருத்துவர்களின் எண்ணிக்கை, பிற பணியாட்டொகுதி அங்கத்தவர்களின் எண்ணிக்கை மற்றும் பிற வசதிகள் குறித்து மீளாய்வு செய்து, மேற்படி மருத்துவமனைகளை அபிவிருத்தி செய்ய நடவடிக்கை எடுக்கப் பட்டுள்ளதா;

(iii) திருகோணமலை மருத்துவமனையிலிருந்து மட்டக்களப்பு, அநுராதபுரம் மற்றும் பொலன் னறுவையிலுள்ள பிரதான மருத்துவ மனைகளுக்கு அனுப்பி வைக்கப்படுகின்ற நோயாளர்கள் எதிர்நோக்கும் சிரமங்களை அறிவாரா;

(iv) இந்நிலைமைக்குத் தீர்வாக திருகோணமலைப் பொது மருத்துவமனையை அபிவிருத்தி செய்ய நடவடிக்கை எடுக்கப்படுமா;

(v) மேற்படி மருத்துவமனைகளில், மத்திய அரசாங்கம் மற்றும் மாகாணசபையால் நிருவகிக் கப்படுகின்ற மருத்துவமனைகள் வெவ்வேறாக யாவை;

(vi) 2024 மற்றும் 2025ஆம் ஆண்டுகளில் இதுவரை, மேற்படி மருத்துவமனைகள் ஒவ்வொன்றிலும் சிகிச்சை பெற்ற வதிவிட மற்றும் வெளி நோயாளர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

asked the Minister of Health and Mass Media:

(a) Will he state -

(i) the number of child births that had occurred at Trincomalee General Hospital as well as at the Base Hospitals in Mutur, Kinniya and Kantale, separately in each month from 2024 to date, separately;

(ii) whether steps have been taken to develop the said hospitals by reviewing the required number of doctors, other staff members and other facilities in relation to the number of child births referred to above;

(iii) whether he is aware of the difficulties faced by patients who are transferred from Trincomalee Hospital to major hospitals such as Batticaloa, Anuradhapura and Polonnaruwa;

(iv) whether steps will be taken to develop the Trincomalee General Hospital to address the aforementioned difficulties;

(v) the names of the hospitals governed by the Central Government and the provincial council, separately, among the above hospitals; and

(vi) the number of inpatients and outpatients treated at each of the above hospitals, separately in 2024 and till now in 2025?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2024 වර්ෂයේ සිට මේ දක්වා ත්‍රිකුණාමලය මහ රෝහල, මුතූර්, කින්නියා සහ කන්තලේ මූලික රෝහල තුළ සිදු වූ මාසික දරු උපත් සංඛ්‍යාව වෙන් වෙන්ව කියන්න ගියොත් ලොකු වෙලාවක් යන නිසා මම ඔබතුමාට එකතුව විතරක් කියන්නම්.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ 2024 වර්ෂය තුළ දරු උපත් 3,353ක් සිදුවෙලා තිබෙනවා; 2025 වර්ෂය තුළ මේ දක්වා දරු උපත් 2,438ක් සිදු කර තිබෙනවා. මුතූර් මූලික රෝහලේ 2024 වර්ෂය තුළ දරු උපත් 1,007ක් සිදුවෙලා තිබෙනවා; 2025 වර්ෂය තුළ මේ දක්වා දරු උපත් 880ක් සිදු කර තිබෙනවා. කින්නියා මූලික රෝහලේ 2024 වර්ෂය තුළ දරු උපත් 1,417ක් සිදුවෙලා තිබෙනවා; 2025 වර්ෂය තුළ මේ දක්වා දරු උපත් 1,134ක් සිදු කර තිබෙනවා. ඒ වාගේම කන්තලේ මූලික රෝහලේ 2024 වර්ෂය තුළ දරු උපත් 502ක් සිදු වෙලා තිබෙනවා; 2025 වර්ෂය තුළ මේ දක්වා දරු උපත් 391ක් සිදු කර තිබෙනවා.

මේ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇමුණුම 01හි දක්වා තිබෙනවා.

ඇමුණුම 01:

| Institution | Year | Jan | Feb | Mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DGH Trincomalee | **2024** | 269 | 249 | 256 | 307 | 300 | 280 | 295 | 252 | 269 | 300 | 326 | 250 | 3353 |
| | **2025** | 191 | 197 | 252 | 304 | 295 | 298 | 293 | 286 | 322 | - | - | - | 2438 |
| | | | | | | | | | | | | | | |
| BH Mutur | **2024** | 82 | 45 | 72 | 95 | 115 | 110 | 126 | 101 | 103 | 54 | 24 | 80 | 1007 |
| | **2025** | 51 | 84 | 80 | 102 | 100 | 108 | 111 | 112 | 132 | - | - | - | 880 |
| | | | | | | | | | | | | | | |
| BH Kinniya | **2024** | 120 | 84 | 103 | 143 | 90 | 123 | 132 | 126 | 128 | 128 | 120 | 120 | 1417 |
| | **2025** | 68 | 108 | 134 | 151 | 140 | 121 | 153 | 126 | 133 | - | - | - | 1134 |
| | | | | | | | | | | | | | | |
| BH Kantale | **2024** | 30 | 28 | 48 | 54 | 48 | 34 | 48 | 38 | 45 | 38 | 45 | 46 | 502 |
| | **2025** | 41 | 38 | 34 | 58 | 46 | 27 | 51 | 44 | 52 | - | - | - | 391 |

(ii) 2017-2018 cadre එක අනුව තමයි ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ කටයුතු කරමින් යන්නේ. නව තනතුරු ඇති කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය කරන ඉල්ලීම අපි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. දැන් අපි සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පැත්තෙන් මේ ගැන කටයුතු කරගෙන යනවා.

ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ හෙද කාර්ය මණ්ඩලය ගත්තොත්, අපේ cadre එක තිබුණේ 300යි. මේ වනකොට අපි 270ක් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය මාස කිහිපය ඇතුළතදී අපි හෙද නිලධාරින් 73ක් ත්‍රිකුණාමලය මහ රෝහලට පමණක් ලබා දුන්නා. ඊට අමතරව දැන් අපි ආරම්භ කරනවා, හෙද උපාධිධාරින් සඳහා සය මාසික පුහුණුවක් ලබා දීම. පුහුණුව කියලා කියන්නේ, ඒ අය එම රෝහලේම කටයුතු කරමින් ඉන්නේ. එතැනිනුත් උපාධිධාරින් 15දෙනෙක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලට ලබා දෙනවා. ඊට අමතරව මෑත මාස කිහිපයේදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලට අපි වෛද්‍ය නිලධාරින් 25ක් ලබා දුන්නා. ඊට අමතරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අනෙකුත් රෝහල් සඳහාත් වෛද්‍යවරුන් 52ක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව මේ මෑත මාස කිහිපය ඇතුළත වෛද්‍යවරුන්77ක් අපි ලබා දුන්නා.

ඊට අමතරව කන්තලේ මූලික රෝහල සඳහා වාග් චිකිත්සක - Speech Therapist - තනතුර සඳහා කරන ලද ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබෙනවා. රෝහල් සංවර්ධනය කිරීමට අදාළවත් කටයුතු කිහිපයක්ම තිබෙනවා. මම ඊළඟ ප්‍රශ්නයේදී ඒකට උත්තර දෙන්නම්.

ඊළඟට, මූතූර් සහ කින්නියා මූලික රෝහල් සඳහා අපට දැන් ඉන්න විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව මම කියන්නම්. අපට ඒ රෝහල් දෙකටම නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන් ඉන්නවා. එම රෝහල් දෙකේම ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන් එක් අයෙක් බැගින් දෙදෙනෙක් ඉන්නවා. මූතූර් මූලික රෝහලට අපි වෛද්‍ය නිලධාරින් දෙදෙනෙක් යොමු කර තිබෙනවා. කින්නියා මූලික රෝහලට එක් වෛද්‍ය නිලධාරියෙක් යොමු කර තිබෙනවා. මූතූර් මූලික රෝහලේ සෞඛ්‍ය කාර්ය සහායකයන් 5දෙනෙක් ඉන්නවා. ඊට අමතරව, මේ රෝහල් දෙකේ විශේෂිත ළමා සත්කාර ඒකක ස්ථාපිත කිරීමටත් අපි ඉල්ලීමක් ඉදිරිපත් කර තිබෙනවා.

(iii) පවත්නා ප්‍රතිපාදන තුළ එක් රෝහලක් සඳහා සියලු වෛද්‍ය පහසුකම් ලබා දීමේදී මතුවන ගැටලු නිසා රෝහල් ශ්‍රේණිගත කරලා, ඒ අනුව ලබා දිය හැකි රසායනාගාර පහසුකම්, විශේෂඥ වෛද්‍ය සේවා ඇතුළු විවිධ පහසුකම් අපි ලබා දෙනවා.

සමස්ත රෝහල් පද්ධතිය තුළ පවත්නා සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගන්න පුළුවන් වන පරිදි තමයි එම පහසුකම් ලබා දෙන්නේ. ඔබතුමා අහන ප්‍රශ්නය මට පැහැදිලියි. නමුත්, දැන් තිබෙන සමහර අධිතාක්ෂණික උපකරණ, සියලු විශේෂඥ වෛද්‍ය සේවා එකම රෝහලකටම ලබා දෙන්න බැරි නිසා අපි ඒවා ක්‍රමානුකූලව ලබා දෙමින් සිටිනවා.

(iv) ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමලය රෝහල කියන්නේ, සාමාන්‍යයෙන් දැනට ඇඳන් ධාරිතාව 550ක් තිබෙන, සාමාන්‍යයෙන් ගත්තොත් අවුරුද්දකට admissions 55,000ක්, 60,000ක් පමණ සිදු වන, දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, පළාතේම තිබෙන වැදගත්ම රෝහලක්. එම රෝහලේ බාහිර රෝගී අංශයට සාමාන්‍යයෙන් අවුරුද්දකට රෝගීන් 135,000ක් පමණ එනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ක්ලිනික් එකටත් 160,000ක්, 175,000ක් විතර එනවා. ඒ සියලු දේවල් සලකා බලා අපි එහි Emergency and Accident Unit එක සඳහා තට්ටු තුනක ගොඩනැඟිල්ලක් ඉදිකරන්න කටයුතු කරනවා. ඒ සඳහා වන ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කරන්න නියමිත වෙලා තිබෙනවා. 2026 වර්ෂයේ අග වෙනකොට එහි වැඩ අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි රුපියල් මිලියන 1,200ක් පමණ යොදවන්න බලාපොරොත්තු වනවා. අපට ඒ කටයුතු අවසන් කරන්න පුළුවන්. ඇත්තටම මේක මීට කලින් ආරම්භ කළත්, කොන්ත්‍රාත්කරුවා අතරමඟ දාලා ගිය නිසා තමයි මේ දේ සිද්ධ වුණේ.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලට තට්ටු 8ක විශේෂ හෘදය රෝග ඒකකයක් සහිත ගොඩනැඟිල්ලක් අපි ජපන් රජය හරහා JICA ව්‍යාපෘතියක් හැටියට ලබා දෙනවා. අපට ඒක මේ අවුරුද්දේ ආරම්භ කරන්න පුළුවන්. ඇත්තටම අවුරුදු දෙකහමාරක් යනකොට එම කටයුත්ත අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා. එතකොට ත්‍රිකුණාමලයට පමණක් නොවෙයි, එම කලාපයටම හෘදය රෝග සම්බන්ධ වැදගත් ආයතනයක් බවට ඒක පත් වනවා.

අපි ළඟදී JICA ව්‍යාපෘතියක් යටතේම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලට incinerator එකක් ලබා දුන්නා. සාමාන්‍යයෙන් පැයකට කිලෝග්‍රෑම් 160ක පමණ සායනික අපද්‍රව්‍ය ප්‍රමාණයක් දහනය කරන්න පුළුවන් අතිනවීන දාහකයක් ඒ අනුව අපි ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම එහි තවත් අඩුපාඩුවක් තිබුණා. මම එහි ගිය වෙලාවේත් ඒක දැක්කා. එතැනට mortuary coolers 4ක් ලබා දෙන්න අපි දැන් ටෙන්ඩර් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. අපි ලබා දෙන හෙද නිලධාරින් සහ වෛද්‍ය නිලධාරින් ප්‍රමාණය ගැනත් මම ඔබතුමාට කිව්වා. ඒ වාගේම අවශ්‍ය කරන සෞඛ්‍ය කාර්ය සහායකයන් ප්‍රමාණයේ අඩු පාඩුවත් අපි ඉතාම කෙටි කාලයක් තුළදී නිවැරදි කරනවා. ඇත්තටම රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් එක්ක කළ යුතු වැඩ කටයුතු කිහිපයක් අපට තිබෙනවා. එම වැඩ කටයුතු අවසන් වුණු ගමන් දෙසැම්බර් මාසයට කලින් අවශ්‍ය කරන සෞඛ්‍ය කාර්ය සහායකයන් ප්‍රමාණය ලබා දෙන්න අපට පුළුවන්.

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලත්, කන්තලේ මූලික රෝහලත් මධ්‍යම රජය යටතේ තිබෙනවා. පළාත් සභාව විසින් පාලනය කරන මූලික රෝහල් හැටියට මූතූර් සහ කින්නියා රෝහල් පවතිනවා.

(vi) මම දළ වශයෙන් ඒ ගැන ඉස්සෙල්ලා ඔබතුමාට කිව්වා. වෙන් වෙන්ව කියන්න ගියොත් ලොකු වෙලාවක් යන නිසා මම ඔබතුමාට එකතුව කියන්නම්. ඒ අනුව 2024 වර්ෂයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ OPD එකට පැමිණි රෝගීන් සංඛ්‍යාව 134,917යි; 2025 මේ දක්වා පැමිණි සංඛ්‍යාව 101,867යි. 2024 වර්ෂයේ මූතූර් මූලික රෝහලේ OPD එකට පැමිණි රෝගීන් සංඛ්‍යාව 75,570යි; 2025 මේ වෙනකොට පැමිණි සංඛ්‍යාව 58,843යි. 2024 වර්ෂයේ කින්නියා මූලික රෝහලේ OPD එකට පැමිණි රෝගීන් සංඛ්‍යාව 99,038යි; 2025 වර්ෂයේ මේ වෙනකොට පැමිණි සංඛ්‍යාව 91,689යි. 2024 වර්ෂයේ කන්තලේ මූලික රෝහලේ OPD එකට පැමිණි රෝගීන් සංඛ්‍යාව 88,888යි; 2025 වර්ෂයේ මේ වෙනකොට පැමිණි සංඛ්‍යාව 68,203යි.

ඒ වාගේම 2024 වර්ෂයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ OPD admissions 59,253යි; 2025 වර්ෂයේ මේ දක්වා 47,045යි. 2024 වර්ෂයේ මූතූර් මූලික රෝහලේ OPD admissions 19,733යි; 2025 වර්ෂයේ මේ දක්වා 17,251යි. 2024 වර්ෂයේ කින්නියා මූලික රෝහලේ OPD admissions 22,615යි; 2025 වර්ෂයේ මේ දක්වා 19,210යි. 2024 වර්ෂයේ කන්තලේ මූලික රෝහලේ OPD admissions 23,188යි; 2025 වර්ෂයේ මේ දක්වා 16,955යි.

මේ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇමුණුම 02 මඟින් දක්වා තිබෙනවා.

**ඇමුණුම 02**

**2024 සහ 2025 වර්ෂයේ සිට මේ දක්වා ත්‍රිකුණාමලය මහ රෝහල, මූතූර්, කින්නියා සහ කන්තලේ මූලික රෝහල්වලින් ප්‍රතිකාර ලැබූ නේවාසික සහ බාහිර රෝගීන් සංඛ්‍යාව.**

**No of OPD Attendance**

| Institution | Year | Jan | Feb | Mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DGH Trincomalee | **2024** | 11658 | 10109 | 11697 | 10082 | 10779 | 12097 | 12262 | 11736 | 9463 | 12161 | 11559 | 11314 | 134917 |
| | **2025** | 12724 | 12173 | 10675 | 11117 | 11570 | 11007 | 10901 | 10258 | 11442 | - | - | - | 101867 |
| | | | | | | | | | | | | | | |
| BH Muthur | **2024** | 8489 | 6331 | 6011 | 4876 | 5954 | 6070 | 6153 | 6052 | 5825 | 6154 | 5967 | 7688 | 75570 |
| | **2025** | 6587 | 6270 | 5357 | 7591 | 7942 | 6304 | 5943 | 6037 | 6812 | - | - | - | 58843 |
| | | | | | | | | | | | | | | |
| BH Kinniya | **2024** | 9185 | 7618 | 7233 | 7472 | 8387 | 8537 | 8615 | 8253 | 7693 | 9528 | 8824 | 7693 | 99038 |
| | **2025** | 11971 | 11047 | 9177 | 11592 | 10691 | 9963 | 10962 | 10015 | 6271 | - | - | - | 91689 |
| | | | | | | | | | | | | | | |
| BH Kanthale | **2024** | 7425 | 6468 | 7132 | 6324 | 7285 | 7768 | 7801 | 7184 | 6767 | 8435 | 7894 | 8405 | 88888 |
| | **2025** | 8757 | 8300 | 7566 | 7665 | 8211 | 6857 | 7452 | 6587 | 6808 | - | - | - | 68203 |

**No of OPD Admission**

| Institution | Year | Jan | Feb | Mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DGH Trincomalee | **2024** | 4920 | 4730 | 4416 | 4839 | 4904 | 5136 | 4888 | 4907 | 4857 | 5291 | 5059 | 5306 | 59253 |
| | **2025** | 5112 | 4914 | 5088 | 5338 | 5392 | 5034 | 5275 | 5390 | 5502 | - | - | - | 47045 |
| | | | | | | | | | | | | | | |
| BH Muthur | **2024** | 1721 | 1307 | 1339 | 1480 | 2074 | 1443 | 1689 | 1724 | 1700 | 1661 | 1723 | 1872 | 19733 |
| | **2025** | 1937 | 1837 | 1904 | 2110 | 2019 | 1892 | 1836 | 1836 | 1880 | - | - | - | 17251 |
| | | | | | | | | | | | | | | |
| BH Kinniya | **2024** | 1831 | 1531 | 1700 | 1888 | 1924 | 1970 | 2099 | 1964 | 1949 | 1790 | 1762 | 2207 | 22615 |
| | **2025** | 1954 | 2296 | 1925 | 2158 | 2133 | 2100 | 2365 | 2155 | 2124 | - | - | - | 19210 |
| | | | | | | | | | | | | | | |
| BH Kanthale | **2024** | 1911 | 1566 | 1835 | 1932 | 2027 | 2033 | 2050 | 2044 | 2038 | 1958 | 1821 | 1973 | 23188 |
| | **2025** | 1916 | 1792 | 1947 | 2022 | 1957 | 1803 | 1898 | 1824 | 1796 | - | - | - | 16955 |

(ආ) පැන නොනඟී.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්න දෙකින් පළමුවන අතුරු ප්‍රශ්නය අපේ විපක්ෂ නායකතුමා අහනවා. දෙවන අතුරු ප්‍රශ්නය අපේ ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු අමාත්‍යතුමාගේ පිළිතුර තුළින් පැන නැඟෙන කාරණාවක් තමයි විශේෂයෙන්ම භෞතික සම්පත් සංවර්ධනය කිරීම සහ මානව සම්පත් හිඟතාවට විසඳුම් ලබා දීම වැදගත් කියන එක. ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණා, හෙද ක්ෂේත්‍රය ගැන. මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමතියි. විශේෂයෙන්ම සම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ, ඒ කියන්නේ හෙද ක්ෂේත්‍රය, වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධිය, ඖෂධවේදී උපාධිය යන ඔක්කොම ලබා දෙන්නේ දැනට පේරාදෙණිය, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, නැඟෙනහිර, යාපනය කියන විශ්වවිද්‍යාල පහෙන්. 2025 ජනවාරි මාසයේ ඒවාට බඳවා ගැනීම් සිදු කරලා තිබෙනවා. හැබැයි, රුහුණ විශ්වවිද්‍යාලයේ 17වැනි batch එක, 2023 A/L කරපු දරුවෝ තවමත් බඳවාගෙන නැහැ. ඒ සඳහා තිබෙන ප්‍රධාන ගැටලුව තමයි, - *[බාධා කිරීමක්]* මම එතැනට එනවා. මේක වැදගත් ප්‍රශ්නයක්. ප්‍රධාන ගැටලුව මේකයි, ගරු ඇමතිතුමනි. දැන් සම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිසුන් ඔක්කොම 10,053ක් ඉන්නවා.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශිෂ්‍ය, ආචාර්ය අනුපාතය 10:1යි. 105ක් ඉන්න ඕනෑ තැන අනුමත කාර්ය මණ්ඩලය ඉන්නේ 43යි. ඒ 43දෙනාගෙනුත්, 26දෙනායි ඒ කාර්යභාරය කරන්නේ. හෙද ක්ෂේත්‍රය පමණක් ගත්තොත්, ශිෂ්‍යයන් - students - 663ක් ඉන්නවා. අධ්‍යයන කාර්ය මණ්ඩලය 66ක් ඉන්න ඕනෑ තැන 10යි ඉන්නේ. *[බාධා කිරීමක්]* මම අතුරු ප්‍රශ්නයට එනවා. විනාඩියක් ඉන්න. මම අතුරු ප්‍රශ්නයට එනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඔබතුමා අහන්නේ සම සෞඛ්‍ය විද්‍යා සිසුන් පිළිබඳවද, නැත්නම් NTS එකේ ඉගෙන ගන්නා සිසුන් පිළිබඳවද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට විනාඩියක් දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල හිඟතාව ගැන කථා කරනකොට, මේ කාරණයත් ඊට අදාළ බව. මොකද, මේක මේ මුල් ප්‍රශ්නයෙන් උද්ගත වන කාරණයක්. අද අපේ රටේ ඖෂධවේදීන්ගේ හිඟයක් තිබෙනවා. ඒක ඔබතුමා හොඳින්ම දන්නවා. ඒ වාගේම වෛද්‍ය රසායනාගාර සේවාවල - medical laboratory servicesවල - MLTs ඇතුළු ක්ෂේත්‍රවල හිඟතාවක් තිබෙනවා; nursing ක්ෂේත්‍රයේ හිඟතාවක් තිබෙනවා. ඉතින් මේ හෙද උපාධිය, වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධිය, ඖෂධවේදී උපාධිය යන උපාධි ලබා දෙන්නේ සම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිසුන්ට. විශ්වවිද්‍යාල හයෙන් පහක බඳවා ගැනීම් ඔක්කෝම කරලා තිබෙනවා. රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඒ බඳවා ගැනීම් සිදු වෙලා නැහැ. 2023දී A/L කරපු දරුවන් 250ක් බලාගෙන ඉන්නවා. තවමත් ඒ අය බඳවාගෙන නැහැ. ප්‍රශ්නය කොච්චර බරපතළද කිව්වොත්, අනෙක් විශ්වවිද්‍යාල පහේ දරුවෝ 2026 ජනවාරි වනකොට පළමු වසරේ අධ්‍යයන කටයුතු අවසන් කරනවා; අර දරුවෝ තවමත් බලාගෙන ඉන්නවා. මම පිළිගන්නවා, අධ්‍යයන, අනධ්‍යයන අංශවල අඩුපාඩු රැසක් තිබෙන බව. නමුත් මම මේ අවස්ථාවේදී යෝජනාවක් කරන්න කැමැතියි, අඩුම ගණනේ ඒ දූ දරුවන් 250දෙනාත් බඳවාගෙන ඒ අධ්‍යාපන වැඩ පිළිවෙළ ආරම්භ කරන්න කියලා. කොන්ත්‍රාත් පදනමෙන් හරි ඒ අධ්‍යයන සහ අනධ්‍යයන අංශයේ බඳවා ගැනීම් ටික කරලා ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න. නමුත්, ඒක ස්ථිරසාර විසඳුමක් නොවෙයි.

ඊළඟට මම ඔබතුමාට තවත් අවදානම් තත්ත්වයක් ගැන කියන්න කැමැතියි. පශ්චාත් උපාධිය සඳහා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, එක අතුරු ප්‍රශ්නයක් අහන්න. ඔබතුමා දැන් විනාඩි හතරක් ගත්තා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

පශ්චාත් උපාධිය සඳහා සම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අධ්‍යයන කණ්ඩායම් විදේශගත වෙලා තිබෙනවා. ඒ අයගෙන් යම් ප්‍රමාණයක් අවුරුදු හතරක පශ්චාත් උපාධි අධ්‍යයනයෙන් පස්සේ ආයෙත් එන පාටක් නැහැ. ඒක බරපතළ ප්‍රශ්නයක්.

ගරු ඇමතිතුමනි, මේ දූ දරුවෝ 250දෙනා වෙනුවෙන් ඔබතුමාගෙනුත්, අධ්‍යාපන ඇමතිතුමිය වන ගරු අගමැතිතුමියගෙනුත් විසඳුමක් බලාපොරොත්තු වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා නිසා මම අහගෙන හිටියේ. ඇත්තටම ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ සහ ත්‍රිකුණාමලයේ රෝහල් සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් හැටියට ඉදිරිපත් කළාට, ඒකට උත්තර ලබා දෙන්න ඕනෑ සෞඛ්‍ය අමාත්‍යාංශය නොවෙයි. ඒ ප්‍රශ්නය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කරන්න ඕනෑ ප්‍රශ්නයක්. ගරු විපක්ෂ නායකතුමනි, හෙද විදුහල්වල ප්‍රශ්නයක් නම් මට මේ අවස්ථාවේදී උත්තර දෙන්න පුළුවන්කමක් තිබෙනවා. නමුත්, සම සෞඛ්‍ය උපාධිධාරීන් ගොඩනගන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන විශ්වවිද්‍යාල ඇතුළේ. ඔබතුමා ඉදිරිපත් කරපු අතුරු ප්‍රශ්නය අපි සලකා බලන්නම්. ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යතුමිය ඒ ගැන උත්තර දෙයි. මගෙන් දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවා නම් හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු ඇමතිතුමනි, මේක ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අදාළ කාරණයක්. Transfers සම්බන්ධ එකක්. එතකොට ඒක ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයටත් අදාළයි. ඔබතුමා කැමැති නම් පිළිතුරු ලබා දෙන්න. ගරු ඇමතිතුමනි, Secretary, Ministry of Health විසින් ජනවාරි 04වැනි දා issue කරපු ලිපියෙහි සඳහන් වන ආකාරයට, සෑම රෝහලකම Medical Officersලාගේ transfers සම්බන්ධයෙන් "..effective from 31st of January.." කියලා දන්වා තිබෙනවා. එහි "....unimplemented transfer orders from 2022 and earlier would be withheld.." කියලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙතැන තිබෙන ගැටලුව මේකයි. Health Ministry එකේ Secretary හරහා මේ ලියුම ජනවාරි 04වැනි දා යවන්නේ මේ transfer කරන්න කියලා. යම් කාලයක් ඇතුළත මේ ටික කරන්න ඕනෑ, 2022 අවුරුද්දේ සිට unimplemented ඒවාත් කරන්න කියලා තිබෙනවා. හැබැයි, ඒ transfer orders ටික යනකොට, සමහර දොස්තර මහත්වරුන්ගේ transfer orders සවස 3.30 - 4.00 වනකොට එනවා. උදේට ගිහිල්ලා අලුත් station එකේ duty report කරන්නත් ඕනෑ. ඒක අපේ ප්‍රදේශයේ ලොකු ගැටලුවක් වෙලා තිබෙනවා. හැබැයි, සමහර දොස්තර මහත්වරුන්ට විතරක් replacement එකක් නැති නිසා transfer යවන්න අවශ්‍ය නැහැ. අවුරුදු 10ක් වාගේ වැඩිපුර කාලයක් එකම තැන ඉන්න අයත් ඉන්නවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් මේ වාගේ සිදුවීම් වෙනවා. ඒකෙන් සමහර දොස්තර මහත්වරුන්ට අසාධාරණයක් වෙනවා. මොකද, ඒ වැඩ පිළිවෙළ ඇතුළේ මොනවා හරි favouritisms කරනවා කියලා චෝදනා එල්ල වෙනවා. මම දන්නේ නැහැ, Health Ministry එකේ ඇත්ත තත්ත්වය. ඒ ගැන ඔබතුමා පොඩ්ඩක් හොයා බලන්න. ඒකත් එක්ක අනෙක් කාරණය තමයි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා අතුරු ප්‍රශ්න ඇසීමේදී ස්ථාවර නියෝග 33 (1) කෙරෙහි අවධානය යොමු කරන්න. ස්ථාවර නියෝග 33 (1) යටතේ මෙසේ සඳහන් වනවා:

> "එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මගින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නඟින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය."

එය ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානයට මම යොමු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහලා අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ඔබතුමා දැන් මෙතැනදී පැහැදිලි කිරීමක් කළා නේ. ඔබතුමා ඒ අනවශ්‍ය පැහැදිලි කිරීමක් කළේ. මගේ අතුරු ප්‍රශ්නය අහලා අවසන් වනතුරු ඉන්න.

මුල් ප්‍රශ්නයේ (අ)(i) යටතේ අහන්නේ 2024 සිට ත්‍රිකුණාමලය මහ රෝහල, මූතූර්, කින්නියා සහ කන්තලේ මූලික රෝහල් තුළ සිදු වූ මාසික දරු උපත් සංඛ්‍යාව ගැන. ගරු කථානායකතුමනි, දරු උපත් සම්බන්ධ කටයුතු කරන්නේ දොස්තර මහත්වරුන් නේ. එතකොට දොස්තර මහත්වරුන් ගැන අහන්න පුළුවන්. ඒ නිසා ඔබතුමා මට ප්‍රශ්නය අහන්න දෙන්න.

ගරු ඇමතිතුමනි, ඒ දොස්තර මහත්වරුන්ගේ transfers සම්බන්ධව තමයි මේ අහන්නේ. නැඟෙනහිර පළාතේ PDHS Dr. Purnimaගේ තිබෙන බලතල ආණ්ඩුකාරතුමා විසින් ලේකම්ට දීලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මුල් ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්න විතරක් අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ඒ ප්‍රශ්නයට අදාළයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මුල් ප්‍රශ්නයට අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

අදාළයි, ගරු කථානායකතුමනි. දොස්තරවරු transfer කරන්න ඕනෑ PDHS නේ. *[බාධා කිරීමක්]* මම මේ කාරණා දෙක ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඔබතුමා පුළුවන් නම් මේ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. එහෙම නැත්නම් මේ පිළිබඳව වාර්තාවක් හොයලා බලලා දෙන්න කියලා කියනවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, ඔබතුමා අවසානයට සඳහන් කළ කරුණ සම්බන්ධයෙන් පෞද්ගලිකවත් මට කථා කරලා කිව්වා. අපි ඒක නිවැරදි කරනවා. ඇත්තටම PDට තිබෙන බලතල PDට ලබා දෙන්න ඕනෑ. ඒක වෙන තැනකට ලබා දීලා හරියන්නේ නැහැ. ඒ ගැන මම අපේ ලේකම්තුමාට කියලා තිබෙන්නේ. ඒ ගැන කටයුතු කරාවි.

දෙවැනි කාරණය මේකයි. ඇත්තටම අපි ස්ථාන මාරුවීම් සම්බන්ධ ප්‍රතිපත්තියක් හරියට ක්‍රියාත්මක කරනවා නම් ඒක

කොතැනක හරි සිට ආරම්භ කරන්න ඕනෑ. මේක chain එකක් නේ. ඒ නිසා එක තැනක release කළේ නැත්නම්, කවර හෝ හේතුවක් මත සම්පූර්ණ දාමය බිඳ වැටෙනවා. සමහර රෝහල්වල යම් යම් ගැටලු පැන නඟින්න ඉඩ තිබෙනවා. නමුත්, හොයලා බැලුවොත්', 2016, 2017 ඉඳලා එහෙම transfers implement නොවුණු ස්ථාන තිබෙනවා. මම විශේෂඥ වෛද්‍යවරුන්ගෙනුත් ඉල්ලීමක් කළා, ඒ අය ඉන්න තැන්වල සහ ආයතන ප්‍රධානීන්ට ඒ මොහොතේ ඒ රෝහලට පැන නඟින අපහසුතාව මදක් පැත්තක තියලා මේ transfers implement කරන්න පටන් ගනිමු කියලා. මොකද, එතකොට අපට මේ ක්‍රියාවලිය හරියට යොදලා අලුතින් එන අය ඒ තැන්වලට යොදවන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා. නැත්නම්, කොතැනක හරි තැනක ඔබතුමා කිව්වා වාගේ අවුරුදු 10ක්, 12ක් තියාගෙන හිටියාම තව තැනකට ඒකේ බාධාවක් ඇති වනවා.

ඊළඟ කාරණය මෙයයි. ඒ අස්සේ සමහර විට විවිධාකාර හේතු ප්‍රකාශයට පත් කරලා අයථා ලෙස රැඳී ඉන්න උත්සාහ කරන කිහිප දෙනෙකුත් ඉන්නවා. ඒ අයටත් මේකෙන් අවස්ථාවක් හැදෙනවා. මම වැඩිය කථා කරන්න ගියේ නැති වුණාට, දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහල් ඇති වෙච්ච ප්‍රශ්නයටත් හේතුව වුණේ එවැනි කාරණයක්. දීර්ඝ කාලයක ඉඳලා -2007 ඉඳලා- එක දිගට ඒ රෝහලේ හිටපු කෙනෙකු transfer කළාට පස්සේ තමයි ඒ ප්‍රශ්නය ආවේ. මම ඒ කාරණයත් එක්ක වැඩිය හැප්පෙන්න ගියේ නැහැ. නමුත්, එවැනි ආකාරයේ අයට හැංගෙන්න ඉඩ දෙන්නේ නැතිව මේ ටික අපි කරගෙන යමු. මේ අවුරුද්දේ annual transfers implement කරනකොට මේක සැලකිය යුතු ප්‍රමාණයක් අපට කරගන්න පුළුවන්කම ලැබෙයි. නැත්නම්, අවුරුද්දෙන් අවුරුද්ද, අවුරුද්දෙන් අවුරුද්ද එකතු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි, ප්‍රශ්නය ඉදිරිපත් කළාට. *[බාධා කිරීමක්]* හොඳයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## "ලක්හඬ" ගුවන් විදුලි සේවය: 2018 වසරේ සිට ලාභය/අලාභය
## "லக்ஹண்ட" வானொலி சேவை: 2018ஆம் ஆண்டு முதல் இலாபம்/நட்டம்
"LAKHANDA" RADIO SERVICE: PROFIT/LOSS SINCE 2018

19/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) "ලක්හඬ" ගුවන් විදුලි සේවය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එය ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(iii) 2018 වර්ෂයේ සිට මේ දක්වා එම සේවයේ ආදායම/වියදම සහ ලාභ/අලාභ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාලසීමාව තුළදී එම ගුවන් විදුලි සේවයේ වෙළඳපොළ ස්ථානය (rating) එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම කාලසීමාව තුළ ඉහත ගුවන් විදුලි සේවයට බඳවාගන්නා ලද සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ගුවන් විදුලි සේවය මේ වනවිට ස්වාධීන රූපවාහිනී සේවයට විශාල බරක්ව ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "லக்ஹண்ட" வானொலி சேவை ஆரம்பிக்கப் பட்ட திகதி யாது;

(ii) இச்சேவை ஆரம்பிக்கப்பட்டதன் நோக்கங்கள் யாவை;

(iii) 2018ஆம் ஆண்டு முதல் இதுவரை இந்தச் சேவையின் வருமானம்/ செலவு மற்றும் இலாபம்/நட்டம் ஆகியன ஆண்டுவாரியாக வெவ்வேறாக யாது;

(iv) மேற்படி காலப்பகுதியில் இந்த வானொலி சேவையின் சந்தை தரவரிசைப்படுத்தல் (rating) ஆண்டுவாரியாக வெவ்வேறாக யாது;

(v) குறித்த காலப்பகுதியில் மேற்படி வானொலி சேவைக்கு ஆட்சேர்க்கப்பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் பதவிப் பெயர்கள் ஆகியவை வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வானொலி சேவையானது தற்போது சுயாதீன தொலைக்காட்சி சேவைக்குப் பாரிய சுமையாக அமைந்துள்ளமையை அறிவாரா;

(ii) ஆமெனில், இது தொடர்பில் எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) date on which the Lakhanda radio service was commenced;

(ii) objectives for which it was established;

(iii) income/expenditure and the profits/losses of Lakhanda in each of the years from 2018 up to now, separately;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iv) rating which Lakhanda secured in the market in each of the years in the above-mentioned period, separately; and

(v) number of employees recruited to Lakhanda during the period referred to above together with their names, addresses and designations, separately?

(b) Will he also inform this House -

(i) whether he is aware that this radio service has become a huge burden to the Independent Television Network (ITN); and

(ii) if so, the action that will be taken in this regard?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1996 නොවැම්බර් 15.

(ii) රජයේ ගුවන්විදුලි නාළිකාව වශයෙන් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සතු නාළිකාවන් වෙතින් මෙරට ශ්‍රාවකයන් ඉවත්ව, පෞද්ගලික ගුවන්විදුලි නාළිකා වෙත ආකර්ෂණය වීමේ ප්‍රවණතාව ඉහළ යාම තුළ වගකීම් සහිත රාජ්‍ය මාධ්‍යයේ ස්වරූපය ද ආරක්ෂා කර ගනිමින් ජනප්‍රිය පෞද්ගලික නාළිකා ආකෘතිය ද අනුගමනය කරමින් නව ප්‍රවේශයකින් ශ්‍රාවකයන් වෙත ළඟා වීම,

මෙහිදී, එම නාළිකාව මඟින් උසස් රසවින්දනය සහිත වැඩසටහන් විකාශය කිරීම මෙන්ම කාලීන වශයෙන් වැදගත් සමාජ, ආර්ථික හා දෙස් විදෙස් තොරතුරු ශ්‍රාවකයා වෙත පිරිනැමීම අරමුණ විය.

(iii) Lakhanda Radio

Income, Expenses and profit (loss) from 2018 to August, 2025

| Year | Income | Expenses | Profit/(Loss) |
|---|---|---|---|
| 2018 | 87,150,810 | 130,118,245 | (42,967,435) |
| 2019 | 62,087,920 | 117,135,978 | (55,048,058) |
| 2020 | 58,711,285 | 113,099,333 | (54,388,048) |
| 2021 | 62,433,077 | 103,758,596 | (41,325,519) |
| 2022 | 65,026,493 | 109,618,708 | (44,592,215) |
| 2023 | 79,414,455 | 107,231,122 | (27,816,667) |
| 2024 | 88,173,993 | 110,800,543 | (22,626,550) |
| 2025 | 49,069,854 | 65,372,957 | (16,303,103) |

(iv) 2018 වසරේ සිට 2021 දක්වා ලක්හඬ ගුවන්විදුලිය LMRB Ratingsවල 07වන ස්ථානයේ රැඳී සිට ඇත. එහි වෙළඳපළ කොටස (Market share) සියයට 1.3ක අගයක පැවතිණ. 2021 වසරේ සිට LMRB Ratings භාවිත නොවූ අතර 2025 වසරේ සිට SRL ආයතනය හරහා අදාළ Ratings ලබා ගැනීම සිදු කරයි.

2025 වසරේ ජුලි මස දක්වා SRL ආයතනය මඟින් ලබා දී ඇති Ratings අනුව ලක්හඬ ගුවන්විදුලිය 08වන ස්ථානයේ පසු වේ.

(v) 2018 සිට මේ දක්වා ලක්හඬ ගුවන්විදුලි සේවයට බඳවා ගන්නා ලද සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු නාම:

| | නම | තනතුර | බඳවාගෙන ඇති දිනය | ලිපිනය | වෙනත් |
|---|---|---|---|---|---|
| 1. | ටී.යූ. ලංකාතිලක මහතා | කළමනාකරු අළෙවි (කොන්ත්‍රාත්) | 2018.07.02 | නො 61/1, සංඝාරාම, සිද්දමුල්ල, පිළියන්දල | 2019.05.06 දින සිට සේවයෙන් ඉල්ලා අස් වී ඇත. |
| 2. | ඩබ්ලිව්.එම්.කේ. ගිරිබාව මහතා | උපදේශක | 2016.01.01 | නො 16158/07, නදුන්ගමුව පාර, නදුන්ගමුව | 2018.11.06 දින සිට කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර ඇත. |
| 3. | ඒ.යූ. කරුණාරත්න මිය | සහකාර කළමනාකරු අළෙවි | 2019.05.29 | 43/5, මකුලුදූව, පිළියන්දල | 2020.01.14 දින සිට කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර ඇත. |
| 4. | ආර්.ඒ. නිලමුනි මිය | කළමනාකරු අළෙවි ලක්හඬ (කොන්ත්‍රාත්) | 2019.07.01 | නො 156, 2/10, මෙට්රෝ උද්‍යානය, 02 වන පටුමග, අස්වැද්දුම, කුරුණෑගල | 2019.10.22 දින සිට කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර ඇත. |
| 5. | කේ.එම්.ඩී.පී. සරත්චන්ද්‍ර මහතා | ප්‍රහුණු වන අළෙවි විධායක | 2019.07.29 | 281, වෙන්න වත්ත, වැල්ලම්පිටිය | 2024.04.01 දින සිට සේවයෙන් ඉල්ලා අස් වී ඇත. |
| 6. | ටී.එස්.බී. පීරිස් මහතා | කාර්මික නිලධාරි | 2020.02.01 | 47/9ඒ, අනුරා පාර, පාමංකඩ, වැල්ලවත්ත | |

(ආ) (i) මේ වන විට ලාභ නොලබන තත්ත්වයෙන් ක්‍රියාත්මක වේ.

ලක්හඬ ගුවන්විදුලියේ මාසික ආදායම ආසන්න වශයෙන් රුපියල් මිලියන 5.5ක් වන අතර, සමායන ලක්ෂ්‍යය (Break -even Point) ළඟාවීමට ආසන්න වශයෙන් රුපියල් මිලියන 8.5ක මාසික ආදායමක් ලැබිය යුතුය.

(ii) 1. ප්‍රචාරය වන වැඩසටහන්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු කිරීම.

2. අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉහළ නැංවීමට කටයුතු කිරීම.

3. අනුග්‍රාහකයින් ඉලක්ක කර නව වැඩසටහන් හඳුන්වා දීම.

4. සමාජ මාධ්‍ය ඉලක්ක කර ගුවන්විදුලි වැඩසටහන් නිර්මාණය කිරීම ප්‍රවර්ධනය.

5. ශ්‍රාවක ආකර්ෂණයට බාහිර ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.

(ඇ) අදාළ නොවේ.

## සමාජ සේවා දෙපාර්තමේන්තුව: ආබාධිතයන් සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
## சமூக சேவைகள் திணைக்களம்: மாற்றுத்திறனாளிகளுக்கான தொழிற் கல்வி நிலையங்கள்
## DEPARTMENT OF SOCIAL SERVICES: VOCATIONAL TRAINING CENTRES FOR THE DISABLED

1358/2025

**8. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. (Dr.) Najith Indika)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආබාධිත පුද්ගලයන්ට වෘත්තීය අධ්‍යාපනය ලබා දීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවල මේ වනවිට පුහුණුව ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත මධ්‍යස්ථානවලට සිසුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iv) එම මධ්‍යස්ථාන සඳහා වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව කොපමණද;

(v) වෘත්තීය පුහුණුව ලබා ගැනීම සඳහා එම මධ්‍යස්ථානවලට වාර්ෂිකව ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(vi) එම අයදුම්පත්‍ර අනුව බඳවා ගනු ලබන සිසුන් හැර ඉතිරි සිසුන් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත මධ්‍යස්ථානවල ප්‍රමාණවත් පරිදි පුහුණුකරුවන් සිටින්නේද;

(ii) නොඑසේ නම්, නව පුහුණුකරුවන් බඳවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉහත මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாற்றுத்திறனாளிகளுக்கு தொழிற் கல்வியை வழங்குவதற்கு சமூக சேவைகள் திணைக் களத்தின்கீழ் காணப்படும் பயிற்சி நிலையங் களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி நிலையங்களில் தற்போது பயிற்சி பெறும் மாணவர்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி நிலையங்களுக்கு மாணவர்களை இணைத்துக்கொள்ளும் நடைமுறை யாது;

(iv) மேற்படி நிலையத்துக்கு வருடாந்தம் இணைத்துக் கொள்ளப்படும் மாணவர்களின் எண்ணிக்கை யாது;

(v) தொழில் பயிற்சியைப் பெற்றுக்கொள்வதற்காக மேற்படி நிலையங்களுக்கு வருடாந்தம் கிடைக்கப்பெறும் விண்ணப்பப் படிவங்களின் எண்ணிக்கை யாது;

(vi) மேற்படி விண்ணப்பப் படிவங்களுக்கமைய இணைத்துக் கொள்ளப்படும் மாணவர்களைத் தவிர, எஞ்சிய மாணவர்கள் தொடர்பில் பின்பற்றப்படும் நடைமுறை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நிலையங்களில் போதியளவு பயிற்சி யாளர்கள் பணிபுரிகின்றார்களா;

(ii) இன்றேல், புதிய பயிற்சியாளர்களை ஆட்சேர்ப் பதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(iii) மேற்படி நிலையங்களைப் பேணி வருவதற்கு வருடாந்தம் செலவிடப்படும் பணத்தொகை யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House the -

(i) number of training centres available under the Department of Social Services for providing vocational education to persons with disabilities;

(ii) number of students currently receiving training in these centres;

(ii) method of recruiting students to these centres;

(iv) number of students recruited annually to these centres;

(v) number of applications received by these centres for vocational training, annually; and

(vi) measures taken in respect of the students other than those recruited from the aforesaid applications?

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

(b) Will he also inform this House -

(i) whether there are sufficient trainers at these centres;

(ii) if not, the measures that have been taken to recruit new trainers; and

(iii) the annual expenditure for maintaining these centres?

(c) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වෘත්තීය පුහුණු ආයතන එකොළහක් ක්‍රියාත්මක වේ.

(ii)

| අනු අංකය | වෘත්තීය පුහුණු ආයතනය | 2025 වර්ෂයේ අගෝස්තු මාසය වන විට ඉගෙනුම ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අමුණුකුඹුර | 64 |
| 2 | කලවාන | 23 |
| 3 | කැටවල | 47 |
| 4 | මඩකලපුව | 20 |
| 5 | කිලිනොච්චි | 27 |
| 6 | තෙළඹියාය | 82 |
| 7 | සීදූව | 83 |
| 8 | වත්තේගම | 94 |
| 9 | තෝලංගමුව | 6 |
| 10 | රාගම | 30 |
| 11 | මාදම්පෙ | 20 |
| | එකතුව | 496 |

(iii) අයදුම්පත් කැඳවීම සහ බඳවා ගැනීම් සම්බන්ධ තොරතුරු, පුවත්පත් දැන්වීමක් ලෙස සිංහල, ඉංග්‍රීසි හා දමිළ මාධ්‍යවලින් තිනකරන්, සන්ඩේ ඔබ්සර්වර් සහ සිළුමිණ යන පුවත්පත්වල පළ කිරීමට කටයුතු කෙරේ.

බඳවා ගැනීම සඳහා අදාළ චක්‍රලේඛය දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වෘත්තීය පුහුණු ආයතන, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු, උපකෘත පාසල් හා ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ස්වේච්ඡා සංවිධාන ඇතුළු අදාළ ආයතන වෙත යොමු කිරීමත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස දැනුම් දීමත් සිදු කෙරෙනු ලැබේ.

ඉන් පසුව, ලැබෙන අයදුම්පත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ලේඛනගත කරන අතර, අයදුම්කරුවන් සඳහා එක් එක් දිස්ත්‍රික්ක අනුව තෝරා ගත් මධ්‍යස්ථානවලදී යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබයි. යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු හා ආයතනවල ධාරිතාව අනුව තේරීම් කමිටුවක් හරහා අභ්‍යාසලාභීන් තෝරා ගැනීම සිදු කෙරෙන අතර, තෝරාගත් අභ්‍යාසලාභීන් සඳහා වර්ෂ ආරම්භයේදී දිශානති වැඩසටහනක් පවත්වා පාඨමාලා ආරම්භ කරනු ලැබේ.

(iv)

| අනු අංකය | වෘත්තීය පුහුණු ආයතනය | ධාරිතාව |
|---|---|---|
| 1 | අමුණුකුඹුර | 90 |
| 2 | කලවාන | 26 |
| 3 | කැටවල | 60 |
| 4 | මඩකලපුව | 40 |
| 5 | කිලිනොච්චිය | 45 |
| 6 | තෙළඹියාය | 128 |
| 7 | සීදූව | 130 |
| 8 | වත්තේගම | 100 |
| 9 | තෝලංගමුව | 15 |
| 10 | රාගම | 45 |
| 11 | මාදම්පෙ | 40 |
| | එකතුව | 719 |

(v)

| අනු අංකය | වර්ෂය | ලැබුණු අයදුම්පත්‍ර සංඛ්‍යාව | යෝග්‍යතා පරීක්ෂණය සඳහා සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | 2023 | 1409 | 1287 |
| 2 | 2024 | 2038 | 1294 |
| 3 | 2025 | 1898 | 1341 |

(vi) බඳවා ගනු ලබන අභ්‍යාසලාභීන් හැර ඉතිරි අයදුම්කරුවන්ගේ පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධනය කර ඔවුන් නැවත වෘත්තීය පුහුණුව ලැබීම සඳහා සංවර්ධනය කිරීමේ අමුණින් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන කොට්ටාව පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

එමෙන්ම, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව හා සමාජ සේවා නිලධාරින්ගේ මැදිහත්වීම මත ආරම්භ කර පවත්වාගෙන යනු ලබන කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන වෙත ද මොවුන් යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු වේ.

එමෙන්ම, ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන යටතේ මොවුන් සඳහා වෙන් වෙන් වශයෙන් පුනරුත්ථාපන සැලසුම් සකස් කර අවශ්‍ය සේවාවන් වෙත යොමු කිරීමට ද මේ වන විට කටයුතු කෙරෙමින් පවතී.

(ආ) (i) ප්‍රමාණවත් නොමැත.

(ii) වෘත්තීය පුහුණු උපදේශකරුවන් බඳවා ගැනීමට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කර අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

පවතින බඳවා ගැනීමේ පටිපාටියෙහි නව පාඨමාලා ඇතුළත් නොවීම, වර්තමාන රැකියා වෙළෙඳ පළට ගැළපෙන නව වෘත්තීය පුහුණු පාඨමාලා අරම්භ කිරීමට සිදුවීම යන කරුණු මත මේ වන විට පාඨමාලා නවීකරණය කරමින් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු සිදු කෙරෙන අතර, පාඨමාලා අනුව වෘත්තීය පුහුණු උපදේශකවරුන් බඳවා ගැනීමක් සිදු නොකිරීම සඳහා (උදා:

වෘත්තිය පුහුණු උපදේශක - බතික්, වෘත්තිය පුහුණු උපදේශක - වෙලරින් ශිල්පය) වෘත්තිය උපදේශක යන පොදු නාමයකින් බඳවා ගැනීමට අවශ්‍ය පරිදි බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කෙරේ.

(iii) වෘත්තිය පුහුණු ආයතන එකොළහ සඳහා 2025 වර්ෂයට අදාළ දළ ඇස්තමේන්තුගත වියදම රු. 512,460,399.32කි.

(ඈ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ගරු සජිත් ප්‍රේමදාස මහතා

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

## 2025 අය වැය යෝජනාවල ප්‍රගතිය
2025 வரவு செலவுத்திட்ட முன்மொழிவுகளின் முன்னேற்றம்
PROGRESS OF BUDGET PROPOSALS, 2025

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා විසින් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වැනි ව්‍යවස්ථාවට අනුව රජය විසින් වාර්ෂිකව ඒකාබද්ධ අරමුදලෙන් මුදල් භාවිත කිරීම සඳහා විසර්ජන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබනවා. එම පනත් කෙටුම්පතට පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමෙන් පසු, එහි අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීම හා ඒවායේ ප්‍රගතිය පිළිබඳව වගකීම රජයට හා අදාළ රාජ්‍ය ආයතනවලට අයත් වනවා. ඒ අනුව, රජය විසින් ඉදිරිපත් කරන ලද 2025 අය වැය යෝජනා ප්‍රායෝගිකව ඉටු වූයේ කෙතරම්ද, අනුමත කළ ප්‍රතිපාදන කෙසේ භාවිත කළේ ද සහ ඒ මඟින් ප්‍රතිඵල ලබාගෙන ඇති ආකාරය කෙබඳු ද යන්න දැන ගැනීම වැදගත් කරුණක් වනවා. එමඟින් රජයේ ආර්ථික කළමනාකරණය, මුදල් පරිහරණයේ පාරදෘශ්‍යභාවය සහ අය වැය ක්‍රියාත්මක වීමේ සාර්ථකත්වය සම්බන්ධයෙන් නිවැරදි ඇගැයීමක් සිදු කළ හැකි වනවා.

ඒ අනුව, මා පහත සඳහන් ප්‍රශ්න යොමු කරන අතර, ඒ සඳහා රජයේ නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් බලාපොරොත්තු වෙමි.

01. රජය 2025 වර්ෂය සඳහා කොපමණ අය වැය යෝජනා සංඛ්‍යාවක් ඉදිරිපත් කරනු ලැබුවේද? එම එක් එක් යෝජනා සහ ඒ සඳහා අනුමත කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද? එම අය වැය යෝජනාවල ප්‍රගතිය මැන බැලීම සඳහා වගකීම් දරන නිශ්චිත රාජ්‍ය ආයතනය කුමක්ද? 2025 අය වැය යෝජනාවල මේ වන විට ප්‍රගතිය මූල්‍ය සහ භෞතික ලෙස, වගකීම් දරන අමාත්‍යාංශ ලෙස වාර්තාවක් අය වැයට පෙර සභාගත කළ හැකිද?

02. 2025 වසර සඳහා වූ අය වැයේ ඉදිරිපත් කළ යෝජනා තුළින් මේ වන විට අපේක්ෂිත ඉලක්ක සපුරා ඇති යෝජනා කවරේද? එම එක් එක් යෝජනා සඳහා වැය වූ සමස්ත මුදල කොපමණද? එය සමස්ත අය වැයෙන් කොපමණ ප්‍රතිශතයක්ද?

03. දැනට කිසිදු අයුරකින් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුණු යෝජනා තිබේද? එම යෝජනා ආරම්භ නොකිරීමට හේතු මොනවාද?

04. මෙරට ජංගම ගිණුමේ හිඟය - Current Account deficit, මූල්‍ය හිඟය - fiscal deficit - සහ වෙළෙඳ හිඟය - trade deficit - කොපමණද? එය පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමක්ද? වැඩිවීමක්ද? එය මෙරට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන්ව දක්වන්නේද?

05. මේ වසර සඳහා විදේශ ආධාර සහ ණය යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතීන්හි මේ වන විට ලබා ඇති ප්‍රගතිය වෙන් වෙන්ව සභාගත කළ හැකිද?

06. රජය බලාපොරොත්තු වූ පරිදි සෘජු විදේශ ආයෝජන - FDIs - 2025 වසරේදී ලබාගත හැකි වූයේද? ඒ කොපමණ ප්‍රමාණයක්ද?

ඒ කියන්නේ, අපි දැනගන්න කැමැතියි ඉලක්කය වුණේ කොපමණද, ලබා ගත්තේ කොපමණද කියලා.

2026 වසර සඳහා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී රජයේ වැඩ පිළිවෙළ පිළිබඳව මෙම සභාවට පැහැදිලි කළ හැකිද?

ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම කල් ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කෙටියෙන් කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් ප්‍රශ්නයක් අහලා ඒකට පිළිතුරු දෙන්න කල් ඉල්ලනකොට අපි සම්ප්‍රදායානුකූලව ඒකට අවස්ථාව දෙනවා. නමුත් ඔබතුමාගේ අවධානයට කාරණයක් යොමු කරන්න කැමැතියි. ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට නොවැම්බර් 07වෙනි දාට අපි දන්නා විධියට අය වැය කථාව ඉදිරිපත් කරනවා. මම ඇහුවේ බොහෝම සරල ප්‍රශ්න ටිකක්. මේ ප්‍රශ්නවලට පිළිතුරු ටික මේ වන විට මුදල් අමාත්‍යාංශය සතුව තිබෙන්නට ඕනෑ. එහෙම නැතිව කොහොමද අය වැයක් හදන්නේ? මේක බරපතළ ප්‍රශ්නයක්.

මම බොහෝම සරල ප්‍රශ්න ටිකක් ඇහුවේ. මේ දත්තවත් මුදල් අමාත්‍යාංශය සතුව නැත්නම් මේ මොහොතේ, කොහොමද අය වැයක් හදන්නේ? එක්කෝ දත්ත ටික නැහැ, සංඛ්‍යාලේඛන ටික නැහැ, තමුන්නාන්සේලා සංඛ්‍යාලේඛන ටික ගොනු කරලා නැහැ. මොකක්ද ඒකට ඔබතුමා දෙන උත්තරය? ගරු ඇමතිතුමනි,මේ basic questions නේ; මේ සරල ප්‍රශ්න අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න විපක්ෂ නායකතුමනි. ඔබතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සමාවෙන්න. මම කවදාවත් මෙහෙම මැදට පැනලා බලපෑම් කරලා නැහැ. කවදාද ඉදිරි දිනය? මට පොඞ්ඩක් කියන්න. ඊළඟ දිනයේ අය වැය කථාව නේ. මොකක්ද, ඉදිරි දිනය? ගරු කථානායකතුමනි, මොනවාද මම අහලා තිබෙන්නේ?

2025 අය වැය යෝජනා මොනවාද, කොච්චරක් වියදම් කරලා තිබෙනවාද, ඒ වියදම් කරපු ප්‍රතිශතය කුමක්ද කියන සරල ප්‍රශ්න නේ අහලා තිබෙන්නේ. මේ තොරතුරුවත් නැතිව කොහොමද 07වැනි දාට අය වැය කථාව ඉදිරිපත් කරන්නේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, නොවැම්බර් 07වැනි දා අය වැය කථාව ඉදිරිපත් කරලා 08වැනි දායින් පස්සේ පවත්වන අය වැය විවාදයේදීත් අපි ඕවාට උත්තර දෙනවා. ඊට අමතරව, අපි එකඟතාවකටත් ඇවිල්ලා තිබෙනවා, ඒ කාල සීමාව තුළ හැම දාම උදේට ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න එකක් පමණක් ගන්න. ඉතින්, ඒවාටත් උත්තර ලබා දෙනවා. ඒ අවස්ථාවත් අපට තිබෙනවා. ඒ මුළු විවාදය තුළම අපි ඒවාට උත්තර දෙනවා. අපි කරපු ඒවාට අදාළවත් උත්තර දෙනවා. අපේ සැලසුම් ටිකත් ඉදිරිපත් කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අහපු ප්‍රශ්නයකට උත්තර දෙන්න කල් ඉල්ලපු කිසිම අවස්ථාවක අපි බාධා කරලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. මට මේකට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමාත් පැහැදිලි කළා; ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාත් පැහැදිලි කළා. ඔය සම්බන්ධයෙන් විවාදයකට යන්න විධියක් නැහැ.

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මැතිතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, fiscal පැත්ත පිළිබඳ එම ප්‍රශ්නයට ඒ උත්තරය ලැබුණාම, මට බයයි මේ අහන මූල්‍යමය පැත්තේ ප්‍රශ්නයටත් ඒ වාගේම උත්තරයක් ලැබේවිද කියලා. කිව්වොත් එහෙම මේකට, අය වැයට පස්සේ උත්තර දෙනවා කියලා? ගරු කථානායකතුමනි, අපේ මේ විපක්ෂය අකර්මණ්‍ය කරන වැඩ පිළිවෙළක් ලෙසයි මම මෙය දකින්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගේ විතරක් නොවෙයි, අපේ වරප්‍රසාද ආරක්ෂා කරන්න ඕනෑත් ඔබතුමායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක නිසා තමයි මම ගරු විපක්ෂ නායකතුමාට අවස්ථාව ලබා දුන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ වරදක් නොවෙයි. මහ බැංකුවේ ප්‍රශ්නයක් නිසා තමයි මෙහෙම වෙනවා ඇත්තේ. කොයි ආකාරයකින් හරි මට මේකට- *[බාධා කිරීමක්]* මෙතුමාගේ නොවෙයි, මහ බැංකුවේ ප්‍රශ්නයක් නිසා තමයි මට පෙනෙන්නේ ඒ උත්තරය- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔන්න මම ප්‍රශ්නය අහනවා. නමුත් ගරු ඇමතිතුමා උත්තරයත් ලබා දෙන්න ඕනෑ කියන පදනමේයි මම ඉන්නේ.

## II

## සියයට 5ක උද්ධමන ඉලක්කයක් පවත්වා ගෙන යාමේ තීරණය
### 5 சதவீத பணவீக்க இலக்கொன்றைப் பேணுவதற்கான தீர்மானம்
### DECISION TO MAINTAIN A 5 PER CENT INFLATION TARGET

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I seek your permission to raise this Question under Standing Order No. 27(2).

2022 ආර්ථික අර්බුදයට පසුව ශ්‍රී ලංකාවේ මුල්‍ය පිරිහීම නවතා ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා එකල නායකත්වය විශාල කැපවීමක් කර ඇත. එම අභියෝගයට මුහුණ දීමට ගත් උත්සාහය සම්මානයට ලක් වුවද, සියයට 5ක උද්ධමන ඉලක්කයක් නියම කර තිබීමෙන් අපේ ආර්ථිකයේ යථාර්ථ ආදායම්, ඉතිරිකිරීම් හා තරගකාරිත්වය ක්‍රමයෙන් අඩු වන චක්‍රයක සිර වෙමින් පවතී. **ද්‍රවශීලතාව** පිරිහීම සියයට 5ක පවත්වා ගත් විට අවුරුදු 4ක කාලයක් තුළ රුපියලේ අගය සාමාන්‍යයෙන් සියයට 25කින් පමණ අඩු වෙයි. මෙය අප ජනතාවගේ ආර්ථික ආරක්ෂාවට දැඩි බලපෑමක් සිදු කරයි.

එය සියයට 5ක උද්ධමන ඉලක්කයක් වන නිසා - Sir, that is, an inflation target of 5 per cent - නාමික දළ දේශීය නිෂ්පාදිතය - nominal GDP - සංඛ්‍යාත්මකව වැඩි වුවද, එය ඵලදායිතාව මත පදනම් වූ සැබෑ වර්ධනයක් සඳහා සහාය නොදක්වයි. මෙය ණය ගාස්තු වැඩි කරමින් ආයෝජන අවස්ථා අඩු කරමින්, විදේශගත වීමේ අවස්ථාව බලාපොරොත්තුව සිටින වෘත්තිකයන්ට ඒ සඳහා මඟ පෙන්වයි.

මේ අතර පොලී අනුපාතය ඉහළ යන සෑම සියයට 1කින්ම රජයේ අය වැය සඳහා රුපියල් බිලියන 160ක පමණ පිරිවැයක් සහ සෑම රුපියලකම කල්පිත අගය අඩුවීමෙන් රජයේ අයවැයට රුපියල් බිලියන 45ක බලපෑමක් සිදු වෙයි.

ලෝකයේ බොහෝ කුඩා විවෘත ආර්ථිකයන් උද්ධමනය සියයට 2ක පමණ තබා ගනිමින් එය පාලනය කරයි. එය පෙනී යන්නේ ප්‍රචලිත පුරුද්දක් ලෙස කරන්නක් නොව, ගෘහස්ථ මිල අගය ආරක්ෂා කිරීම, ණය ගාස්තු අඩු කිරීම සහ ආයෝජක විශ්වාසය තහවුරු කිරීම සඳහා කරන්නක් ලෙසය. එකී සියයට 2 ඉලක්කයක් පැනවීමෙන් ජනතාවගේ ඉතිරි කිරීම් ආරක්ෂා වීමත්, රුපියල ශක්තිමත් වීමත්, ශ්‍රී ලංකාව ස්ථාවරත්වය හා විශ්වසනීයත්වය වෙනුවෙන් බැඳී සිටින රටක් බව පෙන්වීමක් සිදු වෙයි.

මේ ප්‍රශ්නය අසා අවසන් වෙන්න ඉස්සර වෙලා මා ගරු ඇමතිතුමාට කිව යුතු කාරණයක් තිබෙනවා. ඊයේ මහ බැංකුවේ අධිපතිතුමා කථා කරපු විධියට ආණ්ඩුවට පරිබාහිරව යනවාද, නැද්ද කියන එක මේ කියන ස්වාධීනත්වයෙන් කොච්චර දුරකට සිදු වෙලා තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. මම ගරු කථානායකතුමාට එම කාරණය පෙන්වා දෙන්න කැමැතියි.

රජයේ වත්මන් ප්‍රතිපත්තිය අංක පමණක් අලංකාර කරන නමුත් සැබෑ වටිනාකම හීන කරන සෞන්දර්යාත්මක ප්‍රයත්නයක් බවට පත් වී ඇත. ජනතාවගේ වැටුප් සහ ඉතිරිකිරීම් වියදමට අනුකූලව පවත්වා ගැනීමට නොහැකි වන්නේ නම් සහ අපේ වෘත්තික පිරිස විදේශගත වීම තවදුරටත් වේගවත් වන්නේ නම් කිසිදු සංඛ්‍යාත්මක ඉලක්කයකට අපව බේරීමට නොහැකිය. ශ්‍රී ලංකාවට දැන් අවශ්‍ය වන්නේ උද්ධමන ඉලක්කය සියයට 2-3 පරාසයට අනුකූලව පවත්වා ගැනීමක් සමඟ සැපයුම් පාර්ශ්ව ආර්ථික ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීමයි. That is, economic reinvigoration.

ශ්‍රී ලංකාව ඉතා ඉහළ උද්ධමන ඉලක්කයක් පවත්වාගෙන යාමට හේතු මොනවාදැයි ගරු අමාත්‍යතුමාගෙන් විමසීමට මම බලාපොරොත්තු වෙමි. තවද සියයට 2 උද්ධමන ඉලක්කයක් මඟින් ජනතාවට ආශාව හා විශ්වාසය නැවත ලබා දිය හැකි බව ද මම සඳහන් කරමි.

ගරු කථානායකතුමනි, ඒ අනුව මා ගරු ඇමතිතුමාගෙන් අසන ප්‍රශ්න මේවායි.

1. බොහෝ සාර්ථක ආර්ථිකයන් සියයට 2ක උද්ධමන ඉලක්කයක් පවත්වා ගන්නා විට රජය සහ මහ බැංකුව සියයට 5ක ඉලක්කයක් තෝරා ගත්තේ මක් නිසාද?
2. පොලී අනුපාතය ඉහළ යන සෑම සියයට 1කින්ම රජයේ අය වැය සඳහා රුපියල් බිලියන 160ක පමණ අමතර පිරිවැයක් ඇති කරයිද?
3. එක් රුපියලක අගය අඩුවීමක් නිසා අය වැයට රුපියල් බිලියන 45ක පමණ බලපෑමක් ඇති කරන බව අමාත්‍යතුමන් විසින් තහවුරු කරනු ලබනවාද? Every one-rupee depreciation has an impact of Rs. 45 billion on the Government coffers. එවිට සියයට 5 උද්ධමන ඉලක්කය මූල්‍ය ස්ථාවරත්වයට අනුරූපද?
4. රජය අනුමත කරන උද්ධමන ඉලක්කය සියයට 5ක පවත්වාගෙන යෑමේ ප්‍රතිපත්තිය යථාර්ථවත් වර්ධනයකට හේතු නොවන, නාමිකව සංඛ්‍යාත්මක වර්ධනයකට පමණක් හේතු වන සෞන්දර්යාත්මක පියවරක් බව පිළිගන්නේද?

   There is a nominal growth of 5 per cent, but the real growth is only 2 per cent. Therefore, there is a depreciation in the overall position. If you allow the inflationary target of 5e per cent to take effect, it will be counterproductive to the development of the country. I am sure the Hon. Deputy Minister can lecture me on that.

5. උද්ධමනය සියයට 5ක ඉහළ අගයක පවත්වා ගැනීමෙන් ජනතාවගේ ඉතිරි කිරීම් කෙරෙහි ඇති කරන බලපෑම මැන ගැනීමට මුදල් අමාත්‍යාංශය විසින් අධ්‍යයනයක් සිදු කර තිබේද?
6. ශ්‍රී ලංකාව ඉහළ උද්ධමන අගයක් තාවකාලිකව පිළිගන්නා රටක් ලෙස විදේශ ආයෝජකයන්ට පෙන්වීම දිගු කාලීන ආයෝජන විශ්වාසයට හානිදායක බව රජය පිළිගන්නවාද?

   Sir, if you are targeting for the export earnings to be Rs. 36 billion and FDIs to be Rs. 15 billion by 2030, there is no way you can have an anticipated inflationary target of 5 per cent and still expect investors to come to this country. I am sure the Hon. Prime Minister would have experienced this in India. When she was there, she invited them saying, "Come and invest in our country." But, without tax holidays and without protecting the

[ගරු රවි කරුණානායක මහතා]

rupee, you would never have those investments coming in. I am sure the Hon. Deputy Minister will respond adequately when answering the Question.

7. මහ බැංකුව හා රජය අතර ඇති Monetary Policy Framework Agreement එක යළි සකස් කරමින් සියයට 2-3 උද්ධමන පරාසයක් පිහිටුවීම ගැන ගරු ඇමතිතුමා සිතා බලනවාද?

8. නිත්‍ය සියයට 5ක උද්ධමන ඉලක්කය නිසා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට නැඟිටින්න බැහැ; small and medium enterprises are being crushed today. එක පැත්තකින්, සියයට 10ක් වූ ණය පොලී අනුපාතය සියයට 30ක් දක්වා ගෙනිහිල්ලා. එම ව්‍යාපාර ආරක්ෂා කරනවා කියලා ලොකුවට සද්ද කරලා කියපු අය අද ඒ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. කරුණාකරලා non-performing loans ලෙස යවන්න දෙන්න එපා, ගරු ඇමතිතුමනි. සියයට 5 උද්ධමන ඉලක්කයක් ඇති කිරීම තුළ මේ ප්‍රශ්නය තවත් උග්‍ර වෙනවා. එමඟින් එම ව්‍යාපාරවල යෙදවුම් පිරිවැය වැඩි වී, අපනයන තරගකාරිත්වය අඩු වී, දිගු කාලීන ආයෝජන විශ්වාසය බිඳෙන බව රජය පිළිගන්නවාද?

9. අන්තර්ජාතික මූල්‍ය අරමුදල - IMF එක - මෙම සියයට 5 ඉලක්කය පිළිබඳව කෙසේ ප්‍රතිචාර දැක්වීද? එය ණය තිරසාර ගිවිසුම තුළ සඳහන් කර තිබේද? අනෙකුත් බහු පාර්ශ්ව ආයතන - multilateral agencies - මෙය කෙසේ පෙන්වා ඇත්ද?

10. ගරු ඇමතිතුමනි, ජනතාවගේ ඉතිරි කිරීම් ආරක්ෂා කරමින්, රාජ්‍ය මූල්‍ය භාරය අඩු කරමින්, විදේශ ආයෝජන සහ කුසලතා ආපසු ගෙන ඒමට උපකාරී වන සියයට 2ක උද්ධමන ඉලක්කයක් පිහිටුවීම සඳහා රජය යළි සිතා බැලිය යුතු කාලය එළඹ තිබේද; නැද්ද? මේ කාරණා පිළිබඳව දැනුවත් කරන්න.

I am sure the Hon. Deputy Minister will give a very comprehensive Answer to the complex issues I have raised relating to the monetary policy.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த )
(The Hon. (Dr.) Anil Jayantha )

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයෙන් මතු කළේ, සංකීර්ණ ප්‍රශ්න ගණනාවක්. ඒකත් එක්ක විශේෂයෙන්ම ගැට ගැහිලා තිබෙනවා, මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ කාරණය. ඒ නිසාම මීට අදාළ තාක්ෂණික තොරතුරු ලබා ගන්නත් ආයතන ගණනාවක් එක්ක සම්බන්ධ වෙන්න අපට සිදු වෙනවා. මේකට අදාළව තොරතුරු ලබා ගන්න මහ බැංකුවේ ආයතන ගණනාවක් සම්බන්ධ කර ගන්නත් උත්සාහයක් ගත්තා. මම මේ ප්‍රශ්නයට පිළිතුර ඉදිරියේදී ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. නමුත් ගරු කථානායකතුමනි, මෙහි මූලික කාරණා කිහිපයක් මම ඉදිරිපත් කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අද උත්තරය දෙන්න වෙන්නේ නැද්ද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

අද උත්තරය දෙන්න වෙන්නේ නැහැ. ඔබතුමා මතු කරන කාරණයත් එක්ක මූල්‍ය ස්ථාවරත්වය ගැට ගැහිලා තිබෙනවා. මූල්‍ය ස්ථාවරත්වය ඇතුළේ ප්‍රධාන විචල්‍යයන් කිහිපයක් තිබෙනවා. එකක් තමයි ඔබතුමා සඳහන් කරපු උද්ධමනය. තවත් විචල්‍යයන් දෙකක් තමයි පොලී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය. මේ මොහොත වන කොට ආණ්ඩුව විධියට අපට පුළුවන් වෙලා තිබෙනවා, මූල්‍ය ස්ථාවරත්වය අත්පත් කරගෙන අනවශ්‍ය විචල්‍යයකට යන්නේ නැතිව තබා ගන්න. විශේෂයෙන් flexible inflation target එකකටයි අප වැඩ කරන්නේ. අපි ආණ්ඩුව ගන්න කොටම තිබුණු Framework එකේදී මුදල් අමාත්‍යාංශයත්, මහ බැංකුවත් ඒ target එක සම්බන්ධයෙන් එකඟ වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ලැබුණු ආණ්ඩුව ක්‍රියාකාරීව ගෙනියන්න මේ ආණ්ඩුව බැඳී සිටිනවා කියනවා නම්, අවුරුදු 76ක සාපයක් නැහැ නේ.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ඒක නොවෙයි කියන්නේ. අප එය වෙනස් කරගැනීමට හේතු වුණු වැදගත් කාරණය තමයි, ස්ථාවරත්වය. මම උදාහරණයකින් ඒ inflation ඉලක්කය ගැන පැහැදිලි කරන්නම්. ඒ Framework එකේ සිටිද්දී ඒ target එක ලෙස සියයට 5 තීරණය කරපු එක හරිද, වැරැදිද, තව ඕනෑද, නැද්ද කියන එක පිළිබඳ තොරතුරු ඊළඟ review එකේදී තමයි ගන්න වෙන්නේ. මම ඒ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගන්නම්.

මොකද, ඒක ඉවර වෙන්නේ 2026 මාර්තුවලදී. අපි දැනට වැඩ කරන්නේ ඒ සියයට 5 target එක ඇතුළේ. මහ බැංකුව සහ ආණ්ඩුව විධියට ගත්තාම ඒ target එක පැනලා ගිහින් නැහැ. අපි තවමත් එතැනට ළඟා වෙලා නැහැ. ඒ කියන්නේ inflation එක arrest කරලා තිබෙන්නේ. මේ වාගේ අස්ථාවර තත්ත්වයකදී උද්ධමනය අනවශ්‍ය විධියට පිම්මි පැනලා යන්න ගත්තොත්, ආර්ථිකය recover කරන වැඩේ කරන්න බැහැ. ඒ කෙසේ වෙතත්, මම මූලික පැහැදිලි කිරීමක් තමයි කළේ ගරු මන්ත්‍රීතුමනි. මේ ප්‍රශ්නයට විස්තරාත්මක, පැහැදිලි පිළිතුරක් ඉදිරියේදී ලබාදෙන්න මම බලාපොරොත්තු වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, අගමැතිතුමිය සහ කැබිනට් මණ්ඩලය මේ සභාවේ ඉන්නකොට අපි ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න අහන්නේ, අපි නොදැනුවත් කරුණු ටික හෙළිදරව් කරලා, බලයට ඇවිල්ලා තිබෙන අලුත් ආණ්ඩුව අවුරුදු 76ක ශාපය නැති කරන්නේ කොහොමද කියලා ජනතාවට පෙන්වා දෙන්නයි. දැන් අපට පෙනෙන විධියට ඒ ශාපය නොවෙයි තිබෙන ප්‍රශ්නය. දැන් ඒ ප්‍රතිපත්තිම ගෙන යනවා. මහ බැංකුවේ හිටපු එක්කෙනාම දැනටත් ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, කාරණාවට අදාළ point of Order එකක් නේ ඉදිරිපත් කරන්න ඕනෑ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ තිබෙන දැවෙන ප්‍රශ්නවලට උත්තර දෙන්න කියලායි. මීට ඉස්සෙල්ලා fiscal situation එක සම්බන්ධව අහපු ප්‍රශ්නයටත් කනට පහරක් දුන්නා. මම දැන් අහන මූල්‍ය පැත්ත සම්බන්ධ ප්‍රශ්නවලට උත්තර දෙන්න. මොකද, ආයෝජනය කරන්න කට්ටිය ඉල්ලනවා. අගමැතිතුමිය ගිහිල්ලා මෝදිට කිව්වා, ඇවිල්ලා ආයෝජනය කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා මූලික කරුණු පැහැදිලි කිරීමක් කළා. විස්තර වාර්තාවක් ලබා දෙනවා කියලා කිව්වා නේ, ගරු මන්ත්‍රීතුමනි. අපට කාලය පිළිබඳව ගැටලුවක් තිබෙනවා නේ.

අමාත්‍යාංශ නිවේදන, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

## සංශෝධිත අමාත්‍යාංශ විෂයයන්ට අනුරූපව 2026 විසර්ජන පනත් කෙටුම්පතට සංශෝධන සිදු කිරීම: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## திருத்தப்பட்ட அமைச்சு விடயதானத்துக்கு ஏற்ப 2026 ஒதுக்கீட்டுச் சட்டமூலத்துக்குத் திருத்தங்கள்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## AMENDMENTS TO APPROPRIATION BILL, 2026 IN COMFORMITY WITH REVISED MINISTERIAL SUBJECTS: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත ප්‍රකාශය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඊයේ විසර්ජන පනත් කෙටුම්පතේ වැය ශීර්ෂ සම්බන්ධව කාරණයක් මතු කළා. අමාත්‍යාංශ නිවේදන යටතේ ඒ පිළිබඳ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නයි මා බලාපොරොත්තු වෙන්නේ.

අංක 2458/65 දරන 2025.10.18 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අමාත්‍යාංශවල විෂයන් වෙනස් වීමට අනුරූප වන පරිදි අය වැය සඳහා කළ යුතු ගැළපීම් සම්බන්ධයෙන් තමයි ඒ කරුණු මතු කිරීම සිද්ධ වුණේ.

වාර්ෂික විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව විෂයන් වෙනස් කිරීම සිදු වූ ප්‍රථම අවස්ථාව මේක නොවෙයි. ඒ වාගේම වරින් වර මෙවැනි විෂය සංශෝධන සිදු කිරීම සාමාන්‍ය තත්ත්වයක්.

ඉහත ගැසට් පත්‍රයට ආනුෂංගිකව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල වෙනස්වීම් <u>මේ නිවේදනයට අනුව</u> පහත පරිදි සාරාංශගත කරන්න පුළුවන්.

1. නව අමාත්‍යාංශයක් ඇති කිරීම

   මෙතෙක් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කොටසක් වශයෙන් ක්‍රියාත්මක වූ වරාය සහ සිවිල් ගුවන් සේවා විෂය සඳහා නව අමාත්‍යාංශයක් ඇති කිරීම.

2. අමාත්‍යාංශවල නාමය සංශෝධනය කිරීම

   මෙතෙක් පැවති අමාත්‍යාංශ දෙකක නාමය එයට අයත් වන විෂයන් අනුව සංශෝධනය වී තිබෙනවා.

   ඒ අනුව පෙර පැවති නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය කියන නාමය, දැන් නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය විධියට වෙනස් - සංශෝධනය - වෙනවා.

   ප්‍රවාහන, මහාමාර්ග වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය වශයෙන් වෙනස් වෙනවා.

3. අමාත්‍යාංශවල විෂයන් සංශෝධනය වීම

   පහත පළමු තීරුවේ දැක්වෙන අමාත්‍යාංශ යටතේ මෙතෙක් ක්‍රියාත්මක වූ විෂයයන් කීපයක් දෙවන තීරුවේ දැක්වෙන අමාත්‍යාංශ යටතට පවරා තිබෙනවා.

   පළමුවැනි තීරුවේ දැනට තිබෙන අමාත්‍යාංශය වන නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය තිබෙනවා. දෙවැනි තීරුවේ තිබෙන්නේ ගැසට් පත්‍රයට අනුව සිදු වූ සංශෝධනයයි. ඒ අනුව එම අමාත්‍යාංශයෙන් නාගරික සංවර්ධන විෂය ඉවත් කරනවා.

   ඊළඟට, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයෙන් වරාය සහ සිවිල් ගුවන් සේවා විෂය ඉවත් වෙනවා වාගේම, නාගරික සංවර්ධන විෂය ඇතුළත් වෙනවා.

4. දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ යටතේ වර්ගීකරණය වීම

   දෙපාර්තමේන්තු කිහිපයක් ඒවායේ විෂය පථය මෙතෙක් පැවරී ඇති අමාත්‍යාංශ වෙනුවට වෙනත් අමාත්‍යාංශ යටතේ වර්ගීකරණය කර තිබෙනවා.

   ඒ අනුව, වැය ශීර්ෂ 336 - වෙළඳ නාවික ලේකම් කාර්යාලය. එය කලින් පැවති අමාත්‍යාංශය තමයි ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය. එය අලුත් අමාත්‍යාංශය වන වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට මාරු වෙනවා.

ඊළඟට, වැය ශීර්ෂ 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව. එය මීට පෙර පැවතුණේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය යටතට. නව වෙනස්වීම අනුව එය ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතට වැටෙනවා.

ඊළඟට, වැය ශීර්ෂ 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව. එය මීට පෙර පැවතුණේ ආරක්ෂක අමාත්‍යාංශය යටතට. එය මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට මාරු වෙනවා.

වැය ශීර්ෂ 337 - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව. එය පෙර පැවතුණේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතට. එය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට යටතට වැටෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

5. රාජ්‍ය ආයතන වෙනස්වීම.

මෙම ගැසට් පත්‍රය අනුව වෙනත් අමාත්‍යාංශ වෙත පවරා ඇති ආයතන ලැයිස්තුව ඇමුණුම 01 මඟින් දක්වා තිබෙනවා.

මේකේ දළ වශයෙන් තොරතුරු දක්වා තිබෙනවා. මේවා රාජ්‍ය ආයතන. ඒවා අයත්ව තිබූ අමාත්‍යාංශය වෙනුවට දැන් වෙනත් අමාත්‍යාංශ යටතේ වර්ගීකරණය වෙනවා. මෙහි ඇතැම් ආයතන වාණිජ පරමාර්ථයෙන් පිහිටුවා ඇති, භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොකරන ආයතන වේ. තවත් ඒවා නව පනත් ගැසට්වීමත් සමඟ අලුතින් ඇති වූ සමාගම් හෝ ආයතන වේ. මෙම වෙනස්වීම්වලට සමගාමීව අය වැය ඇස්තමේන්තුවල සහ විසර්ජන පනතේ සිදු කළ යුතු වෙනස්වීම් පහත පරිදි වේ. මෙම සංශෝධන මීට පෙර මේ හා සමාන අවස්ථාවල සිදු කළ ආකාරයටම සිදු කරනු ලැබේ.

(අ) විෂයයන් සංශෝධනයට අනුකූලව 2025 වර්ෂයේ අදාළ කාලය තුළ කටයුතු කිරීමට හැකි වන පරිදි 2025 අය වැය ප්‍රතිපාදන උපයෝජනය කරගන්නේ කෙසේද යන්න පිළිබඳව අදාළ අමාත්‍යාංශවලට උපදෙස් නිකුත් කිරීම.

වර්ෂයක් මැද දී මෙලෙස අමාත්‍යාංශවල විෂයයන් විශාල ලෙස වෙනස් වන්නේ නම්, අදාළ වර්ෂයේ විසර්ජන පනත සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ. නමුත් පූර්වාදර්ශ අනුව අමාත්‍යාංශවල විෂයයන් සැලකිය යුතු ලෙස වෙනස් නොවන්නේ නම්, චක්‍රලේඛයක් මඟින් හෝ උපදෙස් ලිපියක් මඟින් ඒ වන විට ඉතිරිව පවතින අය වැය ප්‍රතිපාදන විෂයයන් අතර බෙදී ගොස් ඇති ආකාරය අනුව මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව අදාළ අමාත්‍යාංශ වෙත පැවරීම සිදු කළ හැකි වේ. අය වැය චක්‍රලේඛ අංක 03/2024 ඒ සඳහා පූර්වාදර්ශ සපයයි.

ගරු කථානායකතුමනි, මෙතැනදී අවධාරණය කරන්නට ඕනෑ, 2025 විසර්ජන පනතින් වෙන් වෙලා තිබුණු සමස්ත වියදම් කිසිවක් වෙනස් වෙන්නේ නැති බව. ඒ රාමුව ඇතුළේම තමයි මේ අදාළ අමාත්‍යාංශ වෙන් වුණාට පසු තාක්ෂණික වශයෙන් ඒ යොමු කිරීම වෙන්නේ. ඒක වෙනස් වෙලා නැහැ. ඒ වාගේම, අමාත්‍යාංශ ප්‍රමාණයත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව කිසිම ආකාරයකට වැඩි වෙලා හෝ වෙනස් වෙලා නැහැ. ඒ අමාත්‍යාංශ යටතේමයි සිද්ධ වෙලා තිබෙන්නේ.

(ආ) විෂයයන් සංශෝධනයට අනුකූලව 2026 විසර්ජන පනත් කෙටුම්පතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම.

2026 විසර්ජන පනත් කෙටුම්පතට අදාළ ගැළපීම්, අය වැය කාරක සභා අවස්ථා සංශෝධන මඟින් සිදු කරනු ලැබේ. එලෙස සංශෝධන සිදු කරන ආකාරය පිළිබඳ නිදසුනක් ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර තිබෙනවා.

අමාත්‍යාංශ විෂය සංශෝධනයක් මේ හා සමානවම අංක 2412/05 දරන 2024.11.25 දිනැති ගැසට් පත්‍රය මඟින් සිදු කළ අතර, ඒ සම්බන්ධයෙන්ද ඉහත (අ) හා (ආ) යටතේ දැක්වෙන ක්‍රමය අනුගමනය කරනවා.

ඒ වාගේම සාකච්ඡාවකදී මතු වුණා, අලුතින් අමාත්‍යාංශයක් නිර්මාණය වෙනවා, ඒ අමාත්‍යාංශයට වෙන් වෙන ශීර්ෂය 176. එතකොට ඒ ශීර්ෂ 176 අපි 2026 වසරට ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතේ තිබුණේ නැහැ කියලා. නමුත් අපි ආණ්ඩුව ලබා ගන්න කලින් ශීර්ෂ 176 කියන්නේ වරාය සහ නාවික අමාත්‍යාංශය - Ministry of Ports and Shipping - විධියට තිබිච්ච ශීර්ෂය, Head එක. නමුත් එවැනි වෙනම අමාත්‍යාංශයක් අපි ආණ්ඩුව පිහිටෙව්වාට පසුව පවතින්නේ නැති නිසා ශීර්ෂ 176 ඊට පසුව භාවිත වුණේ නැහැ. අපි 2026 පනත් කෙටුම්පත ඉදිරිපත් කරද්දී, මෙහෙම අමාත්‍යාංශයක් හදලා තිබුණේ නැති නිසා ශීර්ෂ 176 allocate වෙන්නේ නැහැ. නමුත් කාරක සභා අවස්ථාවේදී ඒ ශීර්ෂ 176 ඒ අමාත්‍යාංශය වෙනුවෙන් යොදා ගැනීමේ ඉඩකඩ අපට තිබෙනවා.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

**ගරු (ආචාර්ය) හර්ෂද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, we appreciate the Statement made by the Hon. Deputy Minister. Hon. Deputy Minister, just make sure that we get a copy of what you tabled.

We were told yesterday that it would be a temporary arrangement. But, if assets are going to be shifted between Ministries, it has to be legislatively provided for. That is what I have to say here.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා විසින් සිදු කරපු ඒ වැදගත් ප්‍රකාශය සම්බන්ධයෙන් විරුද්ධ පක්ෂයේ අදහසත් ප්‍රකාශ කරන්න විනාඩි 2ක කාලයක් මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මෑතකදී සිදු වෙච්ච අමාත්‍ය මණ්ඩල සංශෝධනයේදී අමාත්‍යාංශ දෙකක විෂයන් වෙනස් වෙලා අමාත්‍යාංශ තුනකට බෙදුණා. විසර්ජන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනකොට තිබුණේ අමාත්‍යාංශ 24යි. මේ සංශෝධනයෙන් පස්සේ ඒක කැබිනට් අමාත්‍යාංශ 25 දක්වා වැඩි වුණා. අමාත්‍යාංශ සශෝධනයත් සමඟ විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධව ඇති විය හැකි ගැටලු පිළිබඳව අදාළ නිලධාරින් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම යෝග්‍යයි කියලා මම ගරු සභානායකතුමාට ලිඛිතව දැනුම් දුන්නා. ඊට අමතරව ඊයේ මේ සභාවේදී හිටපු මුදල් ඇමතිවරයෙක් වූ රවි කරුණානායක මැතිතුමාත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාත් ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කළා.

මම මේ කාරණයත් කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සියලු නිලධාරින් කැඳවලා ඊයේ හවස සභානායක කාර්යාලයේදී රැස්වීමක් පැවැත්වූවා. මමත්, රවි කරුණානායක

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මන්ත්‍රීතුමාත්, විපක්ෂ නායක ලේකම්තුමාත් විපක්ෂය වෙනුවෙන් ඒකට සහභාගි වුණා. කැබිනට් සංශෝධනයත් එක්ක විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සම්බන්ධව නෛතික හා තාක්ෂණික ගැටලු ඇති වෙන්න පුළුවන් කියන එක එහිදී අපි පෙන්වා දුන්නා. ඒකෙදි තාක්ෂණික කාරණා සම්බන්ධයෙන් අපි යම් යම් එකඟතාවලට ආවා. දැනට කැබිනට් අනුමැතිය හිමි වෙලා තිබෙන අය වැය කාරක සභා අවස්ථාවේ වැඩසටහන එලෙසම ක්‍රියාත්මක කරන්න පුළුවන් බවට අපට එකඟතාව පළ කළා.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (3) ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුව තුළ දී යෝජනා කරනු ලබන යම් සංශෝධනයක් ඒ පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේ ය."

ඒ නිසා අපි නෛතික ගැටලුවක් ඇතිවීමට ඇති ඉඩකඩ පිළිබඳව අපේ නිරීක්ෂණ ඒ සාකච්ඡාවට ඉදිරිපත් කළා. එහි නෛතික පසුබිම පිළිබඳව වගකීම රජය විසින් භාර ගන්න බව සඳහන් කළා. අදත් ඒක තමයි රජය ස්ථාපනය කළේ. එහි නෛතික වගකීම තිබෙන්නේ විරුද්ධ පක්ෂයේ අපිට නොවෙයි, ආණ්ඩුවටයි කියන එක මම ප්‍රකාශ කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමාත්, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඊයේ දවසේදී මතු කරපු මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගයන්ත කරුණාතිලක විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සඳහන් කරපු ආකාරයටම අපි මුදල් අමාත්‍යාංශ නිලධාරින් ගෙන්වලා, ඒ වාගේම පාර්ලිමේන්තුවේ මේ සම්බන්ධ නිලධාරින් ගෙන්වලා ඊයේ සාකච්ඡා කළා. ගරු කථානායකතුමනි, අපි මේ ප්‍රශ්නය පැහැදිලි කර ගත්තොත් අනාගතයටත් ඒක වටිනවා කියලා මම හිතනවා. මෙවැනි ආකාරයේ විසර්ජන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබියදී කැබිනට් සංශෝධනයක් වුණොත් කටයුතු කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අපිට පූර්වාදර්ශ කිහිපයක්ම තිබෙනවා. මම ඉන් ආසන්නතම පූර්වාදර්ශයක් කියන්නම්.

2024 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් 27වැනි දා ගැසට් කරලා 2023 ඔක්තෝබර් 05වැනි දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. 2023 ඔක්තෝබර් 05වැනි දා විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කළාට පස්සේ 2023 ඔක්තෝබර් මාසයේ 23වැනි දා එවකට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා කැබිනට් සංශෝධනයක් කළා. ජනාධිපති ලේකම්වරයා නිකුත් කරන ගැසට් නිවේදනය අනුව සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට හිටපු කෙහෙළිය රඹුක්වැල්ල, කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට හිටපු මහින්ද අමරවීර, වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා හැටියට හිටපු රමේෂ් පතිරණ කියන අය ඉවත් වෙලා මෙන්න මේ සංශෝධනය සිදු කරනවා. ඒ, කෙහෙළිය රඹුක්වැල්ල පරිසර අමාත්‍ය, මහින්ද අමරවීර කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය, රමේෂ් පතිරණ සෞඛ්‍ය අමාත්‍ය ලෙසයි. කලින්; විසර්ජන පනත් කෙටුම්පත ගෙනෙනකොට කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය කියලා අමාත්‍යාංශයක් තිබුණේ නැහැ. ඒ අමාත්‍යාංශ තිබුණේ වෙන වෙනම. නමුත් දැන් මේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව තමයි කැබිනට් සංශෝධනය සිදු වෙන්නේ. ඒ අවස්ථාවේදී මේ වැය ශීර්ෂ; වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 135, 289, 293, පරිසර අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 160, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 118, 281, 285, 292 සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 111, 220 ගැන සාකච්ඡා කරනවා. ඒ නිසා ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

අනෙක් එක, අපි යෝජනා කරලා තිබෙන හැටියට අපේ විපක්ෂය විසින් හදපු අය වැය කාලසටහන අනුව මේ අමාත්‍යාංශ දෙකම විවාදයට ගැනීමට නියමිත වෙලා තිබුණේ එක දවසකදී. එතකොට ඒ අමාත්‍යාංශ දෙකේ තිබුණ විෂය පථයන් තමයි අමාත්‍යාංශ තුනකට කැඩෙන්නේ. ඒ නිසා අපිට එකඟ වෙන්න පුළුවන්, ඒ දවසේදී ඒ අමාත්‍යාංශ තුනටම අදාළව කලින් අමාත්‍යාංශ දෙකකට අදාළව තිබුණු වැය ශීර්ෂ සියල්ලම එදාට සාකච්ඡා කරන්න. සාමාන්‍යයෙන් විපක්ෂයෙන් උදේ විවාදය ආරම්භ කිරීම සඳහා රුපියල් 10කින් වැය ශීර්ෂ කපා හැරීමේ යෝජනාවේ දී වැය ශීර්ෂවල අංක සඳහන් කරනවා. ඒ අනුව ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, වැඩිමනත් වශයෙන් කියනවා නම් 2023 වසර සඳහා අය වැය සාකච්ඡාව වෙනකොට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳව සාකච්ඡා කරලා තිබෙන්නේ, 2022.11.30 දින. පරිසර අමාත්‍යාංශය ගැන සාකච්ඡා කරන්නේ වෙනත් දවසකදී. එහෙමත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒකේ ගැටලුවක් වෙන්නේ නැහැ.

දෙවැනි කාරණය මේකයි. අපි අලුත් වැය ශීර්ෂය 176 හැටියට ඉදිරිපත් කරනකොට ඒක කලින් මේ විෂය යටතේම වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය හැටියට තිබුණු එක. නමුත්, 2023දී පූර්වාදර්ශයක් තිබෙනවා. එහිදී අලුත් වැය ශීර්ෂයක් 501 හැටියට එකතු වුණා. ඒ තමයි එවකට ජනාධිපතිවරයා රංජිත් සියඹලාපිටිය මන්ත්‍රීවරයාව නම් කළා, රාජ්‍ය ඇමතිවරයෙක් හැටියට. එතුමාට විෂයයක් භාර දුන්නා, වැවිලි කර්මාන්ත කියලා. වෙනම ආයතන ප්‍රමාණයක් ගැසට් කරනවා. ඒ ආයතන තමයි ජනතා වතු සංවර්ධන මණ්ඩලය, සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ඇල්කඩුව වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම, හලාවත වැවිලි සමාගම. එහෙම ආයතන ප්‍රමාණයක් ගැසට් කළා. එතකොට රාජ්‍ය අමාත්‍යවරයාට වෙනම විෂය කොටසක් පවරනවා. නියෝජ්‍ය ඇමතිවරු වාගේ නොවෙයි. එහෙම කළාම අලුත් වැය ශීර්ෂයක් ඕනෑ. අන්න ඒ වැය ශීර්ෂය 501 හැටියට කාරක සභා අවස්ථාවේ දී ඉදිරිපත් කරනවා. ඒකේ තිබෙන්නේ අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, පුනරාවර්තන වියදම බිලියන 138ක්, මූලධන වියදම බිලියන 24ක් ලෙස වෙනම ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, මේ අලුත්ම එකක්. 501 කියන එක කලින් තිබුණු එකක් නොවෙයි. අලුත් එකක්. අපි යළි ඉදිරිපත් කරලා තිබෙන්නේ කලින් 171 හැටියට තිබුණු එකක්. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ තිබෙන පූර්වාදර්ශය සහ සම්ප්‍රදාය හැටියට මෙවැනි අවස්ථාවක දී විසර්ජන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා මේ ආකාරයේ අමාත්‍ය මණ්ඩලයේ යම් සංශෝධනයක් සිදු වුණොත්, වැය ශීර්ෂයක් වෙන අමාත්‍යාංශයකට ගියොත් ඒක සාකච්ඡා කිරීම් හැකියාවක් පවතිනවා. පූර්වාදර්ශයක් පවතිනවා. ඒකට නීතිමය බාධාවක් නැහැ. මොකද, මේකේ සමස්ත වියදම් ප්‍රමාණය වෙනස් වෙලා නැහැ. ඒ නිසා ගැටලුවකින් තොරව මේක සාකච්ඡා කරන්න පුළුවන්. මම මේක විස්තර වශයෙන් කිව්වේ අනාගතයේ මෙවැනි අවස්ථාවක් ආවොත් අපිට මේ පූර්වාදර්ශයන් අනුගමනය කරන්න පුළුවන්කම තිබෙන නිසා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මම කලින් කිව්වා වාගේ තාක්ෂණික ප්‍රශ්නයකුත් නැහැ; මුදල් ප්‍රමාණයේ වෙනසක් වෙන්නේත් නැහැ. නමුත්, නෛතිකමය වශයෙන් දැන් බොහෝ වෙලාවල සාකච්ඡා වෙනවා, "ට්‍රිලියන 8ක් ණය ගත්තා. ට්‍රිලියන 2යි assets තිබෙන්නේ. ට්‍රිලියන 6කට මොකද වුණේ?" වාගේ කථාවක්. මෙතැන දී ලොකු අනවබෝධයකින් බොහෝ දෙනා කථා කරනවා, මම දැක්කා. ඇමතිවරයෙකුත් මේ සම්බන්ධයෙන් කථා කළා. උදාහරණයක් හැටියට Maritime Facilitation Centre එක සහ Port Access Elevated Highway එක ගැන කියනවා නම්, මේක තිබෙන්නේ Transport and Highways and Ports and Civil Aviation Ministry එක යටතේ. එතකොට දැන් මේ මාස දෙක ඇතුළේ මෙවැනි exchange එකක් වෙනවා නම්, Maritime Facilitation Centre එක යනවා නම් Ports and Shipping Ministry එකට සහ Port Access Elevated Highway එක Transport and Highways Ministry එකට යනවා නම්, මේ assetsවල අවුලක් එනවා. එහෙම වෙන්නේ නැති වෙන විධියට නෛතික වශයෙන් මේ separation එක මේ කාලපරිච්ඡේදය ඇතුළේ කරන්න සිද්ධ වෙනවා. එවැනි නෛතික ගැටලු තිබෙනවා. ඒ නෛතික ගැටලු විසඳා ගත්තේ නැත්නම් පසු දවසක කවුරු හෝ මේ ගැන ප්‍රශ්න කරන්න පුළුවන්, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. ඒ ගැන කල්පනාවෙන් වැඩ කළ යුතුයි කියන යෝජනාව මම ඔබතුමාට ඉතාම ඕනෑකමින් ඉදිරිපත් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න. මේ කාරණය විවාදයකට ලක් කර ගැනීමේ අවශ්‍යතාවක් නැහැ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි මේක විවාදයකට ලක් කර ගැනීමට අවශ්‍ය නැහැ. දැන් වෙනත් කාරණාවක්,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට මේ උත්තරය පැහැදිලි කර ගන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ ප්‍රශ්නයේ එකින් එකට උත්තරයක් ලැබුණේ නැහැ. මේ වර්ෂයේ කැබිනට් අමාත්‍යාංශ වෙනස්කමක් ඇතිවීම නිසා මේකට පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනෙන්න අවශ්‍යයි, ඒ වෙනසට නෛතිකභාවයක් ඇති කරන්න. ඒ සම්බන්ධයෙන් කොයි ආකාරයෙන්, කොයි වෙලාවේද කටයුතු කරන්නේ? ඒ කියන්නේ මේ අවුරුද්දේ වෙනස්වීම් තිබෙනවා. ඒකට මුදල් නීත්‍යනුකූල කරන්න අවශ්‍යයි. මේක අය වැයට පස්සේද, අය වැය තුළින්ද, කොයි අවස්ථාවේද කරන්න තිබෙන්නේ කියලා කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීමක්]* මේ පිළිතුරෙන් අපි මේක අවසන් කරමු.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I was explaining. Give me just 15 seconds. I am the Chairman of the Committee on Public Finance.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Minister, the issue is really not for next year, but for these two months. That is why the Hon. Member is asking whether you have to bring in a -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Please shorten it.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

So, the issue is not for next year, but for these two months. That is all.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

The Hon. (Dr.) Anil Jayantha. You have two Ministerial Statements.

Hon. Members on both sides of the House, I would like to remind you that there are Votes of Condolences on seven late Hon. Members to be taken up today. We are far behind time. So, can you please restrict your explanations and questions too, please?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා සහ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කලින් අවස්ථාවක ස්ථාවර නියෝග 27 (2) යටතේ මතු කළ ප්‍රශ්න දෙකකට පිළිතුරු තමයි මේ Ministerial Statements දෙකේ තිබෙන්නේ. හැබැයි, විනාඩි දෙකකින් ඒ පිළිතුරු ලබා දීමේ හැකියාවක් නැහැ. එක ප්‍රශ්නයකට තිබෙනවා ප්‍රශ්න 10ක්. ඒ සඳහා සැලකිය යුතු කාලයක් යනවා. ඉතින්, කුමක්ද කළ යුතු වන්නේ කියලා පොඩ්ඩක් කිව්වොත් හොඳයි. *[බාධා කිරීමක්]*

මේ විනාඩි දෙක මම ප්‍රයෝජනයට ගන්නවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන්-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ශෝක යෝජනා ආරම්භ කිරීමේ වෙලාව පහුවෙලා තිබෙන නිසා මම ඉල්ලා සිටිනවා, ඊළඟ අවස්ථාවේදී ඒ පිළිතුරු ඉදිරිපත් කරන්න කියලා, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේත් විරුද්ධත්වයක් නැත්තම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිතුරු 08වැනි දා ඉදිරිපත් කරන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් හා අමාත්‍යාංශ වෙනස්වීමෙන් ඇති වුණු තත්ත්වය සම්බන්ධයෙන් යම් කාරණයක් කියන්න කැමැතියි. මොකද, ඒ සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත ප්‍රශ්නයක්, නීත්‍යනුකූල ප්‍රශ්නයක් එනවා කියලා කිව්වා. නමුත් ඇත්ත වශයෙන්ම එහෙම ප්‍රශ්නයක් එන්නේ නැහැ. එතැනදී ප්‍රධාන වශයෙන්ම සිදු වුණේ අමාත්‍යාංශ දෙකක් අමාත්‍යාංශ තුනක් බවට පත්වීමයි. ඒ නිසා ඒ අමාත්‍යාංශ දෙකට ඒ ඒ ශීර්ෂ යටතේ, වැඩසටහන් යටතේ වෙන් වෙලා තිබුණු මුදල් තමයි නැවත අලුත් අමාත්‍යාංශයට වෙන් වෙන්නේ. එතැනදී වෙච්ච එකම දේ තමයි තවත් අලුත් අමාත්‍යාංශයක් නිර්මාණය වුණු එක. ඒ අමාත්‍යාංශයටත් වෙන් වෙන්නේ තිබුණු ශීර්ෂ යටතේ වෙන් වෙච්ච ප්‍රතිපාදනමයි. හැබැයි, එක් කොටසක් එනවා. ඒ තමයි, අලුත් අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ වැය ශීර්ෂය විධියට එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැය වෙන අතිරේක මුදලක් එන එක. නමුත්, ඒ අතිරේක මුදලට Supplementary Estimate එකක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒකට හේතුව, අපේ විසර්ජන පනත් කෙටුම්පතේ 6 (1) වගන්තිය යටතේ තිබෙනවා, වෙන් වෙලා තිබෙන Treasury miscellaneous expenses හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගන්න පුළුවන් කියලා. ඒ නිසා එතැනදී සුළු මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වන්නේ. ඒ මුදල් ප්‍රමාණය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම අවශ්‍ය වෙන්නේ නැහැ. විසර්ජන පනත් කෙටුම්පතේ 6 (1) වගන්තිය යටතේ ඇති Treasury miscellaneous expenses යටතේ ඒ කාරණය සිද්ධ කරන්න පුළුවන්. කෙසේ වෙතත්, විසර්ජන පනත් කෙටුම්පතින් වෙන් කරලා තිබුණු ආණ්ඩුවේ සමස්ත වියදම වන රුපියල් බිලියන 7,190 කිසි ලෙසකින්වත් වෙනස් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition. Please economize your time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වැඩි වේලාවක් ගන්නේ නැහැ. පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා අපි දෙපොළගේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න දෙකට, ඊළඟට අවස්ථාවේදී පිළිතුරු ලබා දෙනවා. එහෙම නේද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊයේ මතු කරපු ප්‍රශ්නයක් ගැන මේ කියන්නේ. ඇත්ත වශයෙන්ම ඒක අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක්. මම ඒකට වැඩි

වේලාවක් ගන්නේ නැහැ. අද උද්ගත වී තිබෙන තත්ත්වය තුළ පළාත් පාලන ආයතනවල සභාපතිවරයාගේ සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දක්වා, ඒ අයගේ රාජකාරි ඉෂ්ට කිරීමේදී, මහජන සේවාව ඉෂ්ට සිද්ධ කිරීමේදී දැඩි අනාරක්ෂිත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද රාජ්‍ය පාතාලය, රාජ්‍ය ත්‍රස්තවාදය සමාජය ගිලගෙන තිබෙන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මීට මාස ගණනාවකට පෙර කරුණු ඉදිරිපත් කළා, පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ගේ ඉඳලා, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ගේ ඉඳලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දක්වා ආරක්ෂාව පිළිබඳ තක්සේරුවක් කරනවා කියලා. මේ වාගේ තත්ත්වයක් තුළ අපි අහන්න කැමැතියි, කවදාද ඒ තක්සේරුව කරන්නේ, කවදාද ඒ නිසි ආරක්ෂාව ලබා දෙන්නේ කියලා.

ඒ වාගේම, මහජන දිනයේ ඝාතනයට ලක් වුණු ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ ඒ මිනී මරුවන් අල්ලා ගන්නේ කවදාද කියලා අපි දැන ගන්න කැමැතියි. මොකද, එතුමා පොලිස්පතිතුමාට ලිඛිතව දන්වලා ආරක්ෂාව ඉල්ලා තිබෙනවා. ඒ නිසා පැහැදිලිව අද පාතාලය මේ රටේ ජන සමාජය ගිල ගෙන තිබෙනවා. රාජ්‍ය ත්‍රස්තවාදයක්, රාජ්‍ය පාතාලයක් ක්‍රියාත්මක වන තත්ත්වයක් තුළ කොහොමද මහජන නියෝජිතයෝ තමන්ගේ රාජකාරි ඉෂ්ට කරන්නේ? ඒ නිසා ඒ පිළිබඳව කරුණාකර පොලිස්පතිවරයාට කථා කරලා, ලක්ෂ 220ක් වූ රටේ ජනතාවටත්, මහජන නියෝජිතයන්ටත් ඒ නිසි ආරක්ෂාව ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා මතු කරපු,-

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

What is your point of Order, Hon. M.S. Uthumalebbe?

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டில் மக்களால் தெரிவு செய்யப்பட்ட 225 பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கிறார்கள். அவர்களில் நானும் ஒருவன். எங்களுடைய பாதுகாப்புத் தொடர்பான விஷயங்களை பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரிடம் முன்வைத்தோம். எனக்கு அம்பாறை மாவட்டத்தில் பாரிய உயிர் அச்சுறுத்தல் இருந்தது. அது சம்பந்தமான முறைப்பாடுகளை நான் பொலிஸ்மா அதிபரிடம் கொடுத்தேன்; பொது மக்கள் பாதுகாப்பு அமைச்சரிடம் கொடுத்தேன். மாண்புமிகு சனாதிபதி அவர்கள் தலைமையில் நடைபெற்ற கூட்டத்தில் கூட, பாராளுமன்ற உறுப்பினர்களின் உயிரைப் பாதுகாக்குமாறு நாங்கள் சொன்னோம். நேற்றையதினம் நடைபெற்ற விடயம் எங்களுக்குக் கவலை அளிக்கின்றது. மக்கள் பிரதிநிதிகளான எங்களுடைய பாதுகாப்புத் தொடர்பில் கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்கள் முன்வைத்த விடயம் தொடர்பில் நீங்கள் உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ඝාතනය පිළිබඳ විමර්ශනය කිරීම සඳහා දැන් පොලීසිය පැත්තෙනුත් පරීක්ෂණ කණ්ඩායම් යොදවා තිබෙනවා, ඔවුන් විමර්ශන කරමින් ඉන්නවා. ඒ වාගේම, මේ සම්බන්ධයෙන් හුවමාරු වුණු දුරකථන දත්ත පිළිබඳව පොලීසිය පැත්තෙන් විමර්ශන කරමින් ඉන්නවා කියන එක මහජන ආරක්ෂක අමාත්‍යතුමාත්, අපිත් සඳහන් කළා. ඒ නිසා, ඉතා ඉක්මනින් ඒ වෙඩික්කරුවන් වාගේම මේක මෙහෙයවපු අයත් අත්අඩංගුවට ගන්න පුළුවන්කම ලැබෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ජීවිත තර්ජන තිබෙන මහජන නියෝජිතයන් සම්බන්ධයෙන් ඇවිල්ලා තිබෙන වාර්තා අනුව කවර ආකාරයකට ද ඒ ආරක්ෂාව ලබා දීලා තිබෙන්නේ කියන එක හෝ එහෙම නැත්නම් ආරක්ෂාව ලබා දෙන්න යන්නේ කියන එක මහජන ආරක්ෂක ඇමතිතුමා පාර්ලිමේන්තුවට හෙළිදරව් කරාවි. විශේෂයෙන්ම පාතාල සබඳකම් තිබෙන පළාත් පාලන මන්ත්‍රීවරු, එහෙම නැත්නම් සංවිධානාත්මක අපරාධ කල්ලි සමඟ යම් යම් සබඳකම් තිබෙන අය පිළිබඳවත් මහජන ආරක්ෂක අමාත්‍යාංශය පැත්තෙන් ඉදිරියේදී හෙළිදරව් කිරීම කරාවි. මොකද, ඒ පරීක්ෂණ දියත් වෙමින් පවතිනවා. ඒ නිසා, එම විමර්ශන කණ්ඩායම්වල කාර්යක්ෂමතාව අනුව අපට ඉතා ඉක්මනට මේ කටයුතු හෙළිදරව් කර ගන්න පුළුවන්කම ලැබෙයි කියා මම ඔබතුමාට කියන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next will be a personal explanation by the Hon. Chathuranga Abeysinghe. Hon. Chathuranga Abeysinghe, with the time factor, do you want to take it up today or do you want to-

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

Hon. Deputy Speaker, give me just two minutes, please.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(8) යටතේ, වරප්‍රසාද කඩවීමක් සම්බන්ධයෙනුයි මා මෙම කාරණය මතු කරන්නේ. 22වැනි දා මම මේ සභාවේ නොසිටි වේලාවක ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉතාම සාවද්‍ය ප්‍රකාශයක් මා පිළිබඳව කර තිබුණා. අපි මහජන නියෝජිතවරු සහ නියෝජ්‍ය අමාත්‍යවරු විධියට interest එකක් තිබෙන අය ඕනෑ තරම් දෛනිකව හමු වෙනවා. මේ කියන නිශ්චිත කාරණයේදී එදා කිංග්ස්බරි හෝටලයේදී එහෙම සාකච්ඡාවක් මම කළෙත් නැහැ, එහෙම ලියුමක් මට ලැබුණේත් නැහැ, රාසමාණික්කම් මන්ත්‍රීතුමනි. YouTube එකේ යන දේවල් ජනගත කරන්න පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න එපා කියලා මම මුලින්ම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපි මේ දේශපාලනයට ආවේ වංචාව, දූෂණය සහ ඩීල් දේශපාලනය නවත්වන්නයි. අපි වෘත්තිය වගකීමක් සහිතව දේශපාලනයට ආපු මිනිස්සු. ඒ නිසා අපි ඒ වෘත්තිය වගකීම සහ විනිවිදභාවය රකිනවා වාගේම අපව මුණ ගැහෙන්න එන ඕනෑම කෙනෙකුව අදාළ ආයතනවලට යොමු කිරීම තමයි කරන්නේ. ඒ, මම පුංචි පැහැදිලි කිරීමක් කළේ.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සභාවේ නොසිටි අවස්ථාවක ඔක්තෝබර් 22වැනි දා පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් අතිශය සාවද්‍ය ප්‍රකාශයක් කරන ලද අතර, එම ප්‍රකාශයට අනුව මා ඉස්කාගාරයක් පිළිබඳ අයුතු ගනුදෙනුවක් කර ඇති බවත්, එතුමා ළඟ සාක්ෂි ඇති බවත් ප්‍රකාශ කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් වෙනත් මාධ්‍යවලත් පළවූවා. මෙම ප්‍රකාශය මා තරයේ හෙළා දකින අතර, මෙම සාවද්‍ය ප්‍රකාශය හේතුවෙන් මාගේ වරප්‍රසාද කඩ වී ඇති බවත්, එම නිසා මේ වරප්‍රසාද කඩවීම පිළිබඳ සාධාරණ විමර්ශනයක් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chathuranga Abeysinghe, your matter of Privilege will be referred to the Speaker.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rasamanickam. Please do not make this a point of debate. I will give you a few seconds to clarify.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, a few seconds will not do. Hear me out, Sir. It is an important matter. Otherwise, the Deputy Minister would not have taken it up today. Now, he took it up today. So, now give me the opportunity.

First, is this a Personal Statement or a Privilege matter? Hon. Deputy Speaker, you were saying it is a Personal Statement and the Hon. Deputy Minister was saying it is a violation of Privileges. Then, you were saying that it will be referred to the Committee on Ethics and Privileges. First, what is this?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
It is a Personal Explanation.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Then, there is no referral to the Committee. So, you said incorrect facts.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chathuranga Abeysinghe, you take this as a Personal Explanation or a matter of Privilege?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
That is what he said.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
I have the letter with me that I have given to the Speaker in writing.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Minister, that is not an issue. I just want to get it clarified. So, Hon. Deputy Speaker, this is a Personal Statement, not a Privilege matter. That is clarification number one.

Number two, what I said was, I told the Government to conduct an investigation.

ගරු නියෝජ්‍ය ඇමතිතුමායි, ඒ මන්ත්‍රීතුමායි කිංග්ස්බරි හෝටලයට ගිහිල්ලා සාකච්ඡාවක් තිබුණා. ඒ CCTV පරීක්ෂා කරන්න. මෙන්න ලියුමක් තිබෙනවා. ඕනෑ නම් මම ඒ ලියුම අද සභාගත කරන්නම්, මිලියන 100කට බදු ගන්න එවපු ලියුම. ඇමතිතුමාට දුන්න ලියුම. ඒක ගැන ආණ්ඩුව පරීක්ෂණයක් කරන්න. මෙතැන Personal Statements දෙන්න ඕනෑ නැහැ. ආණ්ඩු පක්ෂයේ ඇමතිතුමන්ලා මේකට මැදිහත් වෙලා පරීක්ෂණයක් පවත්වන්න, මේ ගැන රටට කියන්න. එහෙම නැතිව Personal Statements දීලා මේවායින් පැනලා යන්න උත්සාහ කරන්න එපා.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Hon. Deputy Speaker,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chathuranga Abeysinghe. Make it short, please.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
කිසිම සාක්ෂියක්, නීතිමය තත්ත්වයක් නැති ඒවාට validity එකක් දෙන්න තමයි මෙතුමන්ලා පාර්ලිමේන්තුවේදී මේ කථා කරන්නේ. ඊට පසුව මේවා තමයි මාධ්‍යවල ප්‍රචාර වෙන්නේ. එම නිසා තමයි මේ සඳහා පරීක්ෂණයක් සිද්ධ කරන්න කියලා මම ඉල්ලා සිටින්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

Next, we have to move to the Votes of Condolence.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, please give me one second.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Rasamanickam, I have given you enough time and he has also replied. So, this is not going to be a Debate, please.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ලිපිය table කරන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන පරීක්ෂණයක් පවත්වන්න. මේ ලිපිය මත පදනම් වෙලා පරීක්ෂණයක් පවත්වන්න කියලා ඉල්ලමින් එම ලිපිය මම **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay.

Now, we have to move on to the Votes of Condolence.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, can we please proceed?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමාට තමන්ගේ ආරක්ෂාව පිළිබඳව මතු වී ඇති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, we have discussed about this matter of personal security. Is this the same?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, this is a very serious inversion.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, I will give you a minute or two. Hon. Member, we are far behind the time. Please, understand the plight of the relatives of the late Hon. Members of Parliament. They have travelled from very far away.

Make it short, please!

***** **පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කළුතර නියෝජ්‍ය පොලිස්පතිතුමියට පොලිස්පතිතුමාගෙන් නිවේදනයක් ඇවිල්ලා තිබෙනවා, පුද්ගලයෙකුගේ නමක් සඳහන් කරලා. මම ගෙදරින් වාහනයෙන් එළියට බහිනකොට මාව ඝාතනය කිරීම සඳහා එම පුද්ගලයා විසින් කටයුතු කරනවා කියලා එහි සඳහන් වෙනවා. ඒ ගැන විමර්ශනයක් කරන්න කියලා කළුතර නියෝජ්‍ය පොලිස් අධිකාරිතුමියට වාර්තාවක් එවලා තිබෙනවා.

මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න මට වැඩි කාලයක් ගන්න එපා කියා ඔබතුමා කියන නිසා, මම කෙටියෙන් සඳහන් කරන්නම්. මාව වෙඩි තබා මරනවා කියලා තිබෙනවා. පොලිස්පතිතුමාගේ නිවේදනය තමයි මේ මගේ අතේ තිබෙන්නේ. මෙය රහස් නිවේදනයක්. මම මෙය **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ගරු කථානායකතුමා දැනුවත් කර අපේ සහෝදර මන්ත්‍රීවරුන් සම්බන්ධයෙනුත් ගත හැකි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, I will bring this to the notice of the Hon. Speaker.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Sajith Premadasa.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කරන්නේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකුගේ ජීවිතයට එල්ල වී තිබෙන තර්ජනයක් පිළිබඳ බරපතළ කාරණාවක්. වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිටත් මේ වාගේ තර්ජනයක් තිබිලා පොලිස්පතිවරයාට ලියලා, දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරලාත් ආරක්ෂාව ලැබුණේ නැහැ. දැන් මෙම ගරු මන්ත්‍රීවරයා ඇතුළු විපක්ෂයේ සහ පාර්ලිමේන්තුවේ ඉන්න අනෙක් මන්ත්‍රීවරුන්ටත් කිසිම ආරක්ෂාවක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, this will definitely be made-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට විනාඩියක් දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ වගකීම මෙතුමන්ලාගේ ආරක්ෂාව රැක ගන්න එක. මේ අයට ආරක්ෂාව ලබා දෙන එක.

***** **පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, I will bring this to the notice of the Hon. Speaker.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පැහැදිලිව ඉල්ලීමක් කරනවා, මේ අවස්ථාවේ කරුණාකරලා මේ ප්‍රශ්නය පිළිබඳව දැඩි අවධානය යොමු කරලා මෙතුමාට ආරක්ෂාව ලබා දෙන්නට කටයුතු කරන්න කියලා. ඒ යුතුකම කරන්න. මේක කල් දමන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේ ප්‍රශ්නය බොහෝ මන්ත්‍රීවරුන්ට තිබෙනවා. මේක විහිළුවක් නොවෙයි. ජීවිතය අහිමි වුණාට පසුව මොන ආරක්ෂාවක් දෙන්නද?

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට සිදු වූ දෙයින් අපි පාඩමක් ඉගෙන ගන්න ඕනෑ. එම නිසා කරුණාකරලා මෙතුමාට ආරක්ෂාව ලබා දීමට කටයුතු කරන්න. අවධානය යොමු කරනවා කියලා හරියන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව අපි මාස ගණනක් තිස්සේ අවධානය යොමු කෙරෙව්වා. මේක මේ රටේ ලක්ෂ 220ක් සිවිල් පුරවැසියන්ගේ ඉඳලා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්ගේ ඉඳලා, සභාපතිවරුන්ගේ ඉඳලා බලපාන ප්‍රශ්නයක්. දැන් ඔබතුමන්ලා කියනවා නේ, ජාතික ආරක්ෂාව සුරක්ෂිතයි කියලා. කරුණාකරලා මේකට උත්තරයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ ගැන ලිඛිතව දැනුම් දීලා තිබෙනවාද?

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
Police report එකක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එම නිවේදනය සභාගත කරනවා කිව්වා නේද? ගරු කථානායකතුමාට මේ කාරණය සම්බන්ධයෙන් ලිඛිතව දැනුම් දීලාද තිබෙන්නේ?

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ගරු කථානායකතුමාට දැනුම් දෙන්න අවස්ථාවක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට ඊයේ තමයි හම්බ වුණේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please, එහෙම නම් අද ලිඛිතව දෙන්න.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
පොලිස්පතිතුමාගේ නිවේදනය සභාගත කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්. එය සභාගත කරලා, එතුමාට දැනුම් දෙමු.

Now, Notice of Motions at the Commencement of Public Business.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2025 නොවැම්බර් 07 සිකුරාදා අ.භා. 1.30 වනතෙක් කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, we will take up the Votes of Condolence on the late Hon. Lohan Ratwatte, the late Hon. Heenmahatmaya Liyanage, the late Hon. Dixon J. Perera, the late Hon. (Dr.) Mervyn D. de Silva, the late Hon. Y.G. Padmasiri, the late Hon. R.M.R. Chula Bandara, and the late Hon. Manicavasagar Kanagasabapathy Eelaventhan.

## ශෝක ප්‍රකාශ: ගරු ලොහාන් රත්වත්තේ මහතා, ගරු හීන්මහත්මයා ලියනගේ මහතා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මහතා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මහතා, ගරු වයි.ජී. පද්මසිරි මහතා, ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මහතා සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මහතා
## அனுதாபத் தீர்மானங்கள்: மாண்புமிகு லொஹான் ரத்வத்தே, மாண்புமிகு ஹீன்மகத்மயா லியனகே, மாண்புமிகு டிக்சன் ஜே. பெரேரா, மாண்புமிகு (கலாநிதி) மேர்வின் டி த சில்வா, மாண்புமிகு வை.ஜீ. பத்மசிரி, மாண்புமிகு ஆர்.எம்.ஆர். சூலபண்டார மற்றும் மாண்புமிகு மாணிக்கவாசகர் கனகசபாபதி ஈழவேந்தன்
## VOTES OF CONDOLENCE: HON. LOHAN RATWATTE, HON. HEENMAHATMAYA LIYANAGE, HON. DIXON J. PERERA, HON. (DR.) MERVYN D. DE SILVA, HON. Y.G. PADMASIRI, HON. R.M.R. CHULA BANDARA AND HON. MANICAVASAGAR KANAGASABAPATHY EELAVENTHAN

[අ.භා. 12.16]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හත්දෙනෙකුගේ අභාවය සම්බන්ධයෙන් වූ ශෝක යෝජනා මා මේ වෙලාවේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් 2010 වසරේදී මහනුවර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මා මුලින්ම මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

හිටපු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයෙකු වූ ජෙනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාට සහ කාමන් රත්වත්තේ මැතිනියට දාව ලොහාන් රත්වත්තේ මැතිතුමා 1968 වසරේදී මහනුවරදී ජන්ම ලාභය ලැබුවා. මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් සිය අධ්‍යාපන කටයුතු හැදෑරූ රත්වත්තේ මහතා දේශපාලනයට පිවිසීමට පෙර සමාගම් අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කළා. 2009 වසරේදී මධ්‍යම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස මුලින්ම දේශපාලනයට පිවිසි ඒ මහතා පාර්ලිමේන්තුවට තේරී පත්වීමෙන් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් 2013 වසරේදී මහනුවර දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති ධුරය හොබවනු ලැබුවා. වැවිලි රාජ්‍ය අමාත්‍ය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය සහ මැණික් හා ස්වර්ණාභරණ කටයුතු රාජ්‍ය අමාත්‍ය ධුර හෙබවූ ඒ මහතා ආරක්ෂක කටයුතු, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා කටයුතු, පාර්ලිමේන්තු කටයුතු, ආපදා කළමනාකරණ කටයුතු සහ වැවිලි කර්මාන්ත කටයුතු යන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සාමාජිකත්වය දරමින් ක්‍රියාකාරීව කටයුතු කළා. එතුමා දියණියන් දෙදෙනෙකුගේ සහ පුතණුවෙකුගේ දයාබර පියෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 14කට ආසන්න කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වටිනා මෙහෙවරක් ඉටු කළ එතුමා අවුරුදු 57ක් ආයු වළඳා 2025 අගෝස්තු මස 15වන දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ, දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙසද මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් 1989 වසරේදී රත්නපුර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව ඊළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

1942 වසරේදී ජන්ම ලාභය ලැබූ එතුමා පැල්මඩුල්ල ගන්කන්ද විදුහලෙන් අධ්‍යාපනය හැදෑරුවා. 1967 වසරේදී රජයේ ගුරු සේවයට එක්ව ගුරුවරයෙකු වශයෙන් වසර 13ක් පාසල් කිහිපයකම සේවය කළ ඒ මහතාට 1980 වසරේදී පැවති ජූලි වැඩ වර්ජනයට සහභාගිවීම හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීමට සිදුවුවා. 1982 වසරේදී දේශපාලනයට පිවිසි ඒ මහතා රක්වාන හා පැල්මඩුල්ල ආසනවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කළා. වතු යටිතල පහසුකම් සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍ය ධුරය දැරූ ඒ මහතා ලංකා කජු සංස්ථාවේ සභාපති ලෙසද කටයුතු කළා. සිරිමා ඉන්ද්‍රානි මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවන් දෙදෙනෙකුගේ සහ දියණියකගේ දයාබර පියෙක්. වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය හොබවනු ලබන වරුණ ලියනගේ මැතිතුමා එතුමාගේ දයාබර පුතණුවන් කෙනෙකු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 12කට ආසන්න කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වටිනා මෙහෙවරක් ඉටු කළ එතුමා අවුරුදු 82ක් ආයු වළඳා 2024 ඔක්තෝබර් මස 14වන දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ, දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් 1989 වසරේදී කොළඹ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාවයි ඊළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

කේ.ජී. ඩග්ලස් ජස්ටස් පෙරේරා මැතිතුමාට සහ එල්. මියුලින් පෙරේරා මැතිනියට දාව ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා 1946 වසරේ පිළියන්දල දී ජන්ම ලාභය ලැබුවා. මහරගම විද්‍යාකර මහා විද්‍යාලයෙන් අධ්‍යාපන කටයුතු හැදෑරූ එතුමා ඇක්වයිනාස් විදුහලෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ද හදාරා ඉන්පසුව සිය උසස් අධ්‍යාපනය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව මූලික උපාධිය හිමිකර ගැනීමට සමත්වුවා. දෙහිවල-ගල්කිස්ස නගර සභාවේ සාමාජිකයෙකු වශයෙන් දේශපාලනයට පිවිස 1974 සිට 2001 දක්වා කැස්බෑව ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරය දැරූ ඒ මහතා කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තරුණ සංගමයේ සභාපති ධුරයේත් කටයුතු කළා. 1974දී ජර්මනියේ බර්ලින්හි පැවති ලෝක තරුණ සංගමයේ සමුළුවට සහභාගි වූ එතුමා ඕස්ට්‍රේලියාවේ කැන්බරාහි පළමු බෞද්ධාගමික සිද්ධස්ථානය ඉදිකිරීමට මුල්ව කටයුතු කළා. ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ පළමු ලේකම් සහ නේපාලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නියෝජ්‍ය තානාපති ලෙස ද කටයුතු කළ එතුමා එම කාලය තුළ ශ්‍රී ලාංකීය ජනතාව වෙනුවෙන් සුවිශේෂ කාර්යභාරයක් ඉටු කිරීමට සමත්වුවා. මම නේපාලයට ගිය අවස්ථාවකදී එතුමා එහි නියෝජ්‍ය තානාපති ලෙස කටයුතු කරමින් අපේ කණ්ඩායම මුණ ගැහෙන්නත් ආවා.

1986දී නාලිනී අබේධීර ජයවික්‍රම පෙරේරා මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවෙකුගේ සහ දියණියකගේ දයාබර පියෙක් ද වුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු අටක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වටිනා මෙහෙවරක් ඉටු කළ එතුමා අවුරුදු 79ක් ආයු වළඳා 2025 ඔක්තෝබර් මස 04වන දින අප අතරින් සදහටම සමුගත්තා. අභාවප්‍රාප්ත ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාට නිවන්සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද මා ඉල්ලා සිටිනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් 1989 වසරේදී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ ගරු මර්වින් ඩී. ද සිල්වා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාවයි මීළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

ජෝර්ජ් ලෙනාඩ් ද සිල්වා මැතිතුමාට සහ මේබල් තෙරේසා ද සිල්වා මැතිනියට දාව මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා 1930 වසරේදී මහනුවර දී ජන්ම ලාභය ලැබුවා. මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයෙන් සහ කොළඹ ශාන්ත ජෝසප් විද්‍යාලයෙන් සිය අධ්‍යාපන කටයුතු හැදෑරූ එතුමා ඉන්පසුව සිය උසස් අධ්‍යාපනය සඳහා ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළත්ව විද්‍යාවේදී උපාධිය හිමිකර ගත්තා. අනතුරුව එතුමා ඇමෙරිකා එක්සත් ජනපදයේ රොකෆෙලර් පදනම මඟින් ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්වයක් මත කැලිෆෝනියා සරසවියට ඇතුළත්ව සිය පශ්චාත් හා ආචාර්ය උපාධි සම්පූර්ණ කළා. මෙරට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා විවිධ තනතුරු දරමින් සේවය කළ එතුමා අන්තර් පාර්ලිමේන්තු සංගමයේ සහ පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සංගමයේ සාමාජිකත්වය දරමින් ක්‍රියාකාරීව කටයුතු කළා.

1957දී වෛද්‍ය රීටා ඇන්ටනට් ද සිල්වා මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතණුවෙකුගේ දයාබර පියෙක් ද වූවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු පහක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වටිනා මෙහෙවරක් ඉටු කළ එතුමා අවුරුදු 95ක් ආයු වළඳා 2024 අගෝස්තු මස 30වන දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු මර්වින් ඩී. ද සිල්වා මැතිතුමාට මොක් සුවය ප්‍රාර්ථනා කරන අතර එතුමාගේ දයාබර බිරිඳ, දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් 2010 වසරේදී කෑගල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාවයි මීළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

වයි.ජී. විලියම් සිංඤෝ මැතිතුමාට සහ කේ.ඒ.එච්. ඇසිලින් නෝනා මැතිනියට දාව වයි.ජී. පද්මසිරි මැතිතුමා 1950 වසරේදී කරවනැල්ලේදී ජන්ම ලාභය ලැබුවා. සිය ප්‍රාථමික අධ්‍යාපනය රුවන්වැල්ල මහා විද්‍යාලයෙන් ද, ද්විතීයික අධ්‍යාපනය දෙහිඕවිට රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයෙන් ද හැදෑරූ එතුමා වෘත්තියෙන් මහජන නොතාරිස්වරයෙකු ද වූවා. පාසල් සමයේ සිටම ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා සමඟ දේශපාලන කටයුතුවල නිරත වුණු පද්මසිරි මහතා 1970දී ලංකා සමසමාජ පක්ෂ රුවන්වැල්ල තරුණ බල මණ්ඩල ලේකම් සහ සභාපති ධුර ද දැරුවා. පසුව එම පක්ෂයේ මධ්‍යම කාරක සභික, දේශපාලන මණ්ඩල සභික සහ ජාතික සංවිධායක යන ධුර දැරූ එතුමා 1988දී එම පක්ෂයෙන් ප්‍රථම පළාත් සභා මැතිවරණයට ඉදිරිපත්ව ජයග්‍රහණය කළා. ඉන්පසුව, 2010 වසර දක්වා සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස අඛණ්ඩව වසර 22ක් කටයුතු කළ ඒ මහතා 1999දී සබරගමුව පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍ය සහ 2004දී කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍ය ධුර දැරුවා.

ඉන්පසුව 2010දී පාර්ලිමේන්තුවට තේරී පත් වුණු ඒ මහතා නියෝජ්‍ය කෘෂිකර්ම අමාත්‍ය ධුරය හොබවනු ලැබුවා. 1985දී කේ.ජී. සුමනාවතී මැණිකේ මහත්මිය සමඟ විවාහ වුණු එතුමා එක් දියණියකගේ දයාබර පියෙක් වූවා.ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 5ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වටිනා මෙහෙවරක් ඉටු කළ එතුමා අවුරුදු 75ක් ආයු වළඳා 2025 සැප්තැම්බර් මස 26වන දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ, දියණිය ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් 1991 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාවයි, ඊළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

ආර්.එම්. කලුබණ්ඩා රත්නායක මැතිතුමාට සහ සී.එම්.එම්. චන්ද්‍රසේකර මැතිනියට දාව ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමා 1949 වසරේ කුරුණෑගලදී ජන්ම ලාභය ලැබුවා. ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් සිප් සතර හැදෑරූ එතුමා සිය උසස් අධ්‍යාපනය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව එම විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ගත්තා. මුල් කාලයේ රසායන හා භෞතික විද්‍යා ගුරුවරයෙකු වශයෙන් කටයුතු කළ එතුමා පසුව කොළඹ නීති විද්‍යාලයට ඇතුළත්ව නීතිය හදාරා නීතිඥයෙකු වශයෙන් සිය වෘත්තීය ජීවිතය ගත කළා.

1991 වර්ෂයේදී පළමු වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීමෙන් පසුව ඒ මහතා 1998 වර්ෂයේදී දෙවන වරටත් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඉන් අනතුරුව 2003 සිට 2005 දක්වා පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති ලෙස ද කටයුතු කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පොදු මහජනතාවටත්, රාජ්‍ය තාන්ත්‍රිකයෙකු ලෙස පෝලන්තයේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ටත් එතුමා විශාල කාර්ය භාරයක් ඉටු කළා.

1979දී ඩබ්ලිව්.එම්. රෝහිණී පුෂ්පා බණ්ඩාර මහත්මිය සමඟ විවාහ වූ එතුමා දියණියන් දෙදෙනෙකුගේ සහ එක් පුතණුවෙකුගේ දයාබර පියෙක් ද වූවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 4ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වටිනා මෙහෙවරක් ඉටු කළ එතුමා අවුරුදු 75ක් ආයු වළඳා 2024 දෙසැම්බර් මස 22වන දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ, දූ දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා.

Hon. Deputy Speaker, now, with a sense of profound loss, I move the Vote of Condolence on the death of the late Hon. M. K. Eelaventhan, former Member of Parliament who represented the National List of the Ilankai Tamil Arasu Kachchi - ITAK - from 2004 to 2007.

The late Hon. Eelaventhan was born in Jaffna in 1932 to Mr. Manicavasagar Kanagasabapathy and Mrs. Sivayogam. He studied at St. John’s College, Jaffna and Wesley College, Colombo. Hon. Eelaventhan served as a senior translator and as an economic analyst at the Central Bank of Sri Lanka.

He developed a keen interest in politics during his late teens and began his political career in 1952 by joining the Ilankai Tamil Arasu Kachchi - ITAK. In the 1970s, he became a member of the Tamil United Liberation Front - TULF - and was subsequently, appointed President of its Colombo branch.

In 1986, he was married to Mrs. K. Arulambigai and was a loving father of two daughters.

Sir, the Hon. M. K. Eelaventhan served his party and the public with great dedication and sincerity during his nearly four-year tenure in Parliament. He passed away on 28th April 2024 at the age of 91.

We pray that the late Hon. M. K. Eelaventhan attain the state he aspired, in accordance with his religious belief, and request that this august Assembly convey its condolences to his beloved wife, children and relatives.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Proceedings of this House will be suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

[අ.භා. 1.00]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු සම්බන්ධව ශෝක යෝජනා ඉදිරිපත් කරන අද දිනයේ ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා පිළිබඳව මුලින්ම අදහස් දක්වන්නට මා කැමැතියි.

ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා විශේෂයෙන්ම වසර 13ක් පුහුණු ගුරුවරයෙකු හැටියට සේවය කොට, ඒ ගුරු සේවය තුළින් ලැබූ අත්දැකීම් සම්භාරයත් එකතු කරගෙන සමාජ සේවයට - ජනතා සේවයට- ප්‍රවේශ වන්නේ 1982 වර්ෂයේ රක්වාන සහ පැල්මඩුල්ල ආසනවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙසටයි. තුන් වතාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වුණු එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වසර 13ක පමණ කාලයක් තිස්සේ සිදු කළ එම විශිෂ්ට සේවාව ආරම්භ කරන්නේ 1989 වසරේදීයි. ඒ වාගේම එතුමා වතු යටිතල පහසුකම් සහ පශු සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසට කළ හැකි උපරිම ජනතා සේවාවක් විශිෂ්ට ආකාරයෙන් ඉෂ්ට සිද්ධ කළා. 2003 වසරේ සිට 2006 වසර දක්වා පැල්මඩුල්ල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා හැටියටත්, 2006 වසරේදී කජු සංස්ථාවේ සභාපතිවරයා හැටියටත් කටයුතු කරමින් එතුමා කළ මහජන සේවාව විශිෂ්ට සේවාවක් හැටියට අපට හඳුන්වන්නට පුළුවන්.

විශේෂයෙන්ම රුවන්පුර විද්‍යා පීඨය ස්ථාපනය කිරීමේදී එවකට අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය ධුරයේ කටයුතු කළ ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමාත් සමඟ එක්ව එය සාර්ථක කරගන්නට ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා දැවැන්ත කාර්ය භාරයක් ඉෂ්ට සිද්ධ කළාය කියන එක මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

එතුමාගේ ජනතා සේවාව ගත්තාම, මහත්මා ගුණාංගවලින් යුක්තව, නිහතමානීව, සංවේදීව, ජනතා හඬට සවන් දෙමින්, පොදු ජනයාගේ දුක, කඳුළ, වේදනාවට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් රත්නපුර දිස්ත්‍රික්කයේ නිර්මල සේවාවක් ඉෂ්ට කරපු, ඒ වාගේම අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කරපු දේශපාලන විශිෂ්ටයෙක් හැටියට අපට එතුමාව හඳුන්වන්න පුළුවන්.

මා විශේෂයෙන් මතක් කරන්නට කැමැතියි, එතුමාගේ පුත් ගරු වරුණ ලියනගේ මැතිතුමා සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරයෙක් හැටියට ජන වරමින් පත් වෙලා පියා කළ උතුම් සේවාව ඉදිරියට ගෙනයන්නට කටයුතු කරන බව. ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාගේ හදිසි වියෝව; අභාවය පිළිබඳ අප සියලු දෙනාගේම සාතිශය සංවේගය - බලවත් ශෝකය - ගරු වරුණ ලියනගේ මැතිතුමා, ලියනගමගේ සිරිමා ඉන්ද්‍රානි මැතිනිය ඇතුළු පවුලේ සියලුම දෙනාට මේ අවස්ථාවේ පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමා පිළිබඳවත් මා කථා කරන්න ඕනෑ. ගරු චූල බණ්ඩාර මැතිතුමා ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ ඉගෙනුම ලබා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේත්, කොළඹ නීති විද්‍යාලයේත්, කොළඹ විශ්වවිද්‍යාලයේත්, නීති ක්ෂේත්‍රය ප්‍රමුඛ කරගෙන අධ්‍යාපන ගමනේ ඉහළම තලයට ගිය වෘත්තීයවේදියෙක්, විද්වතෙක්, ඉතාම ඉහළ දේශපාලන සාක්ෂරතාවකින් යුක්තව තමන්ගේ ජනතා සේවාව පරිණත ආකාරයට පොදු ජන සුබසිද්ධිය උදෙසා ඉෂ්ට සිද්ධ කරපු දැවැන්ත ජනහිතකාමී නායකයෙක්. මට මතක් වෙනවා, ගරු චූල බණ්ඩාර මැතිතුමාගේ දයාබර පියාණන් වන කලුබණ්ඩා රත්නායක මැතිතුමා මගේ පියා සමඟ බොහොම සමීපව කටයුතු කළ බව. පඩුවස්නුවර මැතිවරණ කොට්ඨාසය කේන්ද්‍ර කරගෙන කුරුණෑගල දිස්ත්‍රික්කයටත්, වයඹ පළාතටත් දැවැන්ත සේවාවක් ඉෂ්ට සිද්ධ කරපු ඒ යුග පුරුෂයාගේ පුත් ගරු චූල බණ්ඩාර මැතිතුමාගේ හදිසි වියෝව පිළිබඳව අපගේ සාතිශය සංවේගය මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

අභාවප්‍රාප්ත ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා පිළිබඳවත් මා කථා කරන්න කැමැතියි. එතුමා මහරගම විද්‍යාකර මහා විද්‍යාලයේ ඉගෙනුම ලබා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය, ඒ වාගේම කොළඹ ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනයේ කෘෂිකර්ම ඩිප්ලෝමාව හදාරමින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගමනක් ගිය, ජනතාවාදී, ජනහිතකාමී නායකයෙක්. 1975-1980 කාල වකවානුව තුළ කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යෞවන බලමණ්ඩලයේ සභාපති හැටියටත්, 1978 සිට 1983 දක්වා දෙහිවල-ගල්කිස්ස නගර සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියටත්, 1989-2001 කාල වකවානුව තුළ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියටත්, 2002 වර්ෂයේ බස්නාහිර පළාත් සභාවේ සභානායක හැටියටත් තමන්ගේ ජනතා සේවාව ඉටු කරපු, ජනතාවාදී, ජනහිතකාමී නායකයෙක්. ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාගේ හදිසි වියෝව පිළිබඳව අප සියලු දෙනාගේම සාතිශය සංවේගය; බලවත් ශෝකය මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා මහනුවර ශාන්ත සිල්වෙස්තර විද්‍යාලයේ ඉගෙනුම ලබමින් කොළඹ ලංකා විශ්වවිද්‍යාලයෙන් සත්ත්ව විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධිය සහ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයෙන් විද්‍යාපති සහ ආචාර්ය උපාධි ලබා ගනිමින් උසස් අධ්‍යාපනයෙන් ඉහළ ගමනක් ගොස් 1989-1994 කාල වකවානුව තුළ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් කටයුතු කළා.

එතුමා විද්වතෙකු හැටියට ආර්ථික විද්‍යාව පිළිබඳව, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව, දේශපාලන විද්‍යාව පිළිබඳව තමන්ගේ අදහස් උදහස් රැසක් ලිපි රචනා හරහා, පුවත්පත් හරහා ඉදිරිපත් කරමින් රටේ ජනතාව දැනුවත් කරන්නට උනන්දු වුණා. ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමාගේ හදිසි වියෝගය පිළිබඳව අපගේ බලවත් ශෝකය - සාතිශය සංවේගය - මේ අවස්ථාවේදී පුද කර සිටින අතරම, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා රුවන්වැල්ල මහා විද්‍යාලයෙන්, ශ්‍රී වික්‍රම කනිෂ්ඨ විද්‍යාලයෙන් සහ දෙහිඕවිට රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයෙන් ප්‍රාථමික, කනිෂ්ඨ සහ ද්විතීයික අධ්‍යාපනය ලැබුවා. අනතුරුව එතුමා බලපත්‍රලාභී මහජන නොතාරිස්වරයෙකු ලෙස කටයුතු කරන්නට යෙදුණා. පාසල් අවධියේ සිටම ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා සමඟ දේශපාලන කටයුතුවල නියැළුණු එතුමා 1970 ලංකා සමසමාජ පක්ෂ රුවන්වැල්ල තරුණ බලමණ්ඩලයේ ලේකම් සහ සභාපති ධුර දැරුවා. පසුව ලංකා සමසමාජ පක්ෂ කෑගල්ල දිස්ත්‍රික් බලමණ්ඩලයේ ලේකම් සහ සභාපති ධුර දැරුවා. ඒ වාගේම රුවන්වැල්ල බලමණ්ඩලයේ ලේකම් ධුරය දරමින්, සමසමාජ පක්ෂ දිස්ත්‍රික් බලමණ්ඩලයේ ලේකම් ධුරය දරමින්, සමසමාජ පක්ෂ මධ්‍යම කාරක සභික ධුරය ලබමින් 1988දී ප්‍රථම පළාත් සභා මැතිවරණයට සහභාගි වී ජයග්‍රහණය කළා. සබරගමුව පළාත් සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලෙස වසර 11ක් සහ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලෙස වසර 11ක් කටයුතු කළා. ඒ වාගේම එතුමා සබරගමුව පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යවරයා හැටියට 1999දී පත් වුණා. 2004දී කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යවරයා ලෙස පළාත් සභාවේ වැඩ කටයුතු කළා. 2009, 2010 කාල වකවානුවේ පළාත් සභාවේ සභානායකවරයා ලෙසත් කටයුතු කළා. ඒ වාගේම එතුමා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රජයේ -ආණ්ඩු පක්ෂයේ- මන්ත්‍රීවරයෙකු ලෙසත්; 2013දී කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත් කටයුතු කළා.

විශේෂයෙන්ම එතුමාගේ සමාජ සත්කාර ක්ෂේත්‍රය ගත්තොත්, වසර 25ක දහම් පාසල් ගුරුවරයෙකු හැටියටත් එතුමා සේවය කළා. සබරගමුව පෙර පාසල් ප්‍රඥප්තිය නිර්මාණය කොට එය සම්මත කර ගන්නට, පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය සම්මත කර ගන්නට, අඩි 555ක් දිග, ලංකාවේ දිගම සංගිලි පාලම සකස් කිරීම සඳහා කටයුතු කිරීම, රුවන්වැල්ල එන්.එම්. අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම වැනි සංවර්ධන වැඩ කටයුතුවල නියැළුණු ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා ජනතාවාදී, ජනහිතකාමී නායකයෙකු හැටියට බොහෝ දෙනා හඳුන්වනවා. එතුමාගේ හදිසි වියෝව පිළිබඳව අපගේ බලවත් ශෝකය සහ සාතිශය සංවේගය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.

මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ඉගෙනුම ලබමින් එක්සත් ජනතා නිදහස් සන්ධානය, පොදු ජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා 2009-2010 කාල වකවානුවේ මධ්‍යම පළාත් සභා මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කළා. 2013-2015 කාල වකවානුවේ මහනුවර දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති හැටියටත්, 2010-2024 කාල වකවානුව තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියටත් කටයුතු කළ ලොහාන් රත්වත්තේ මැතිතුමා විටෙක මහාමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, වරාය හා නාවික කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා හැටියටත්, ඒ වාගේම පාතදුම්බර ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායකවරයා හැටියටත් කටයුතු කළා. ලොහන් රත්වත්තේ මැතිතුමාගේ හදිසි අභාවය පිළිබඳව අපගේ බලවත් ශෝකය සහ සාතිශය සංවේගය මේ අවස්ථාවේ පුද කර සිටිනවා.

The late Hon. Manicavasagar Kanagasabapathy Eelaventhan, as a Member of Parliament, served his people with efficiency and dedication. He was always a people’s person. At all times, he diligently listened to the grievances, aspirations and shortcomings of those he represented. He represented a community that had to go through many challenges - challenges ranging from the political sphere, economic sphere and social sphere - that were at times virtually insurmountable.

However, the late Hon. Manicavasagar Kanagasabapathy Eelaventhan was astute as a people-oriented politician in inquiring into the needs, wants, and rights of the members of his community. At all times, he wanted to promote and protect human rights- not only human rights in their much restricted defined arena ; he did not confine himself to mere protection and promotion of civic and political rights, but he had a broader interpretation of rights. He was smart enough to include economic, social, cultural, religious, educational, health and other rights as well as the right to live and the right to life. He recognized all these rights as integral to the protection of human beings and human life.

So, at this particular juncture, I would like to take this opportunity to convey our deepest sorrow, heartfelt condolences and sympathies on the sudden demise of the late Hon. Manicavasagar Kanagasabapathy Eelaventhan. We express our sorrow and extend our condolences to all the members of his family.

Thank you.

[பி.ப. 1.18]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற அனுதாபப் பிரேரணையில் பலருடைய பெயர்கள் குறிப்பிடப்பட்டு இருக்கின்றன. அவர்கள் எல்லோரையும் பற்றி எனக்குத் தெரியாது. ஆகையால், தமிழ்த் தேசிய அரசியலோடு நீண்ட காலம் பயணம் செய்த, தமிழ் மக்களுடைய விடுதலைக்காகத் தன்னுடைய காலத்தை அர்ப்பணித்த ஈழவேந்தன் ஐயா பற்றிய சில குறிப்புகளை மட்டும் நான் இங்கு பதிவுசெய்ய விரும்புகின்றேன்.

'ஈழவேந்தன்' என்று தனக்குப் புனைப்பெயரை வைத்துக் கொண்ட தமிழ்த் தேசியவாத அரசியல் செயற்பாட்டாளரான

மா.க. கனகேந்திரன் அவர்கள், இலங்கைப் பாராளுமன்றத்தில் 2004ஆம் ஆண்டு தொடக்கம் 2007ஆம் ஆண்டுவரை மட்டுமே உறுப்பினராக இருந்தார். தமிழ்த் தேசிய அரசியலில் ஏழு தசாப்தங்களுக்கும் அதிகமான காலம் தன்னை ஈடுபடுத்திக் கொண்ட அவர், 90 வயதைக் கடந்து தீர்க்க ஆயுளுடன் 2024 ஏப்பிரல் 28இல் கனடாவின் ரொறண்டோ நகரில் காலமானார்.

மாணிக்கவாசகர் கனகசபாபதி கனகேந்திரன் என்ற முழுப்பெயரைக் கொண்ட ஈழவேந்தன், 1932 செப்ரெம்பர் 14ஆம் திகதி யாழ்ப்பாணத்தில் பிறந்தார். அவரின் தந்தையார் கனகசபாபதி புகையிரத திணைக்களத்தில் புகையிரத நிலைய அதிபராகப் பணியாற்றினார். தாயார் சிவயோக அம்மையார், அவரை வளர்த்தெடுப்பதில் மிக முக்கிய பங்குவகித்தார். யாழ்ப்பாணத்தின் கொழும்புத்துறையைப் பிறப்பிடமாகவும் நல்லூரை வசிப்பிடமாகவும் கொண்ட ஈழவேந்தன் அவர்கள், யாழ்ப்பாணம் சென். ஜோன்ஸ் கல்லூரியிலும் கொழும்பு வெஸ்லி கல்லூரியிலும் கல்வி பயின்றுள்ளார்.

யாழ்ப்பாணத்தின் மிகப் பெரிய தீவுகளின் தலைத்தீவாக இருக்கின்ற, பல பத்திரிகையாளர்களை, அறிவாளிகளை, நிருவாகிகளை உருவாக்கித் தருக்கின்ற மண்டைதீவு மண்ணின் Chairmanஆக இருந்த கைலாச பிள்ளையின் மூத்த மகளான அருளாம்பிகையை 1962இல் இவர் திருமணம் செய்தார். இதனால் இவருடைய கொழும்புத்துறைக்கும் மண்டைதீவுக்குமான தொடர்பு அதிகமாக இருந்தது. இத்திருமண உறவால் மண்டைதீவில் இவருக்கு காணிகளும் தோட்டங்களும் உண்டு. இவருக்கு யாழினி, எழிலினி என இரண்டு பிள்ளைகளும் உண்டு. தமிழிலும் ஆங்கிலத்திலும் புலமை மிகுந்தவராகக் காணப்பட்ட இவர், இலங்கை மத்திய வங்கியில் மொழிபெயர்ப்பாளராக இணைந்து, பின்னர் தமிழ் மொழிபெயர்ப்புப் பிரிவின் தலைவராகி, 1980ஆம் ஆண்டு சேவையிலிருந்து ஓய்வுபெற்றார்.

பதினைந்து வயதிலேயே தமிழ்த் தேசிய அரசியலால் கவரப்பட்ட ஈழவேந்தன் ஐயா அவர்கள், 1952ஆம் ஆண்டு இலங்கை தமிழரசுக் கட்சியில் இணைந்தார். அக்கட்சியுடன் தீவிர பற்றுக்கொண்டு தமிழ்த் தேசியவாதியாக மாறிய அவர், தனிச் சிங்களச் சட்டம் கொண்டுவரப்பட்ட பிறகு தீவிரமான அரசியல் செயற்பாட்டாளராக மாறினார். தமிழரசுக் கட்சியின் 'சுதந்திரன்' பத்திரிகையில் ஈழவேந்தன் என்ற புனைப்பெயரில் அரசியல் கட்டுரைகளை எழுதத் தொடங்கிய அவர், ஈழவேந்தன் என்ற பெயரிலேயே அரசியல் கூட்டங்களிலும் உரையாற்றினார். காலப்போக்கில் 'எம்.கே. ஈழவேந்தன்' என்று அவர் அழைக்கப்பட்டாலும், உத்தியோகபூர்வமாக தனது பெயரை அவ்வாறு மாற்றிக்கொள்ளவில்லை. ஈழவேந்தன் அவர்கள் படிப்படியாக தமிழ் அரசியலில் பிரபல்யமான ஒருவராக வளர்ச்சி கண்டார். சிறந்த பேச்சாளரான அவர், பல்வேறு மூலங்களில் இருந்து மேற்கோள்களை எடுத்துக்கூறி, சபையோரைப் பரவசப் படுத்தக்கூடிய மிகப் பெரியதோர் அறிவாளியாக இருந்தார்.

1976 மே 14இல் தந்தை செல்வா அவர்கள் தமிழர் விடுதலைக் கூட்டணி மூலமாக "வட்டுக்கோட்டைத் தீர்மானம்" எடுப்பதற்கு ஒரு மாதத்துக்கு முன்னர், 1976 ஏப்பிரல் மாதம் அவரால் எழுதப்பட்ட "தமிழ் மண் காப்போம்; தாயகம் மீட்போம்" என்ற தலைப்பிலான சிறிய நூலில் அதுபற்றி சுருக்கமாக விளக்கப்பட்டு இருக்கின்றது. அதன் பின்னர், 1976 மே 14இல் வட்டுக்கோட்டையில் தந்தை செல்வா அவர்கள் சுதந்திர தமிழீழ பிரகடனம் எடுக்கும்போது, இவரும் அந்தக் கூட்டத்தில் கலந்துகொண்டு முழு ஆதரவு கொடுத்தார். அதன் பின்னர், 1977 யூலை 21இல் பாராளுமன்றத் தேர்தல் இடம்பெற்றபோது, வட, கிழக்கு முழுவதும் சென்று தமிழர் விடுதலைக் கூட்டணியின் வெற்றிக்காக உணர்வுபூர்வமாகப் பேசி தமிழ் மக்களின் அபிமானத்தைப் பெற்றார். கிழக்கு மாகாணத்தில் குறிப்பாக, மட்டக்களப்பு மாவட்டதில் கவிஞர் காசி ஆனந்தனுடன் இணைந்து தேர்தல் பிரசாரத்தை அப்போது இவர் முன்னெடுத்திருந்தார்.

2004ஆம் ஆண்டு தமிழ்த் தேசியக் கூட்டமைப்பு வேட்பாளர்களை தமிழீழ விடுதலைப் புலிகள் நிறுத்தியபோது, ஈழவேந்தன் அவர்கள் தேசியப் பட்டியலுக்குப் பரிந்துரைக் கப்பட்டு இருந்தார். அதன்படி, 20 பாராளுமன்ற உறுப்பினர்கள் வட, கிழக்கிலிருந்து மக்களால் நேரடியாகத் தெரிவானார்கள். தேசியப்பட்டியல் ஊடாக இருவர் நியமிக்கப் பட்டார்கள். யாழ்ப்பாணத்தில் இருந்து ஈழவேந்தனும் மட்டக்களப்பில் இருந்து மாமனிதர் ஜோசப் பரராஜசிங்கமுமாக 22 பாராளுமன்ற உறுப்பினர்கள் அப்போது பதவி வகித்தனர். இவர் 2010இல் ருத்ரகுமாரன் தலைமையிலான நாடு கடந்த தமிழீழ அரசிலும் ஓர் உறுப்பினராக இருந்து சர்வதேச ரீதியாகத் தன்னை அடையாளப்படுத்திக்கொண்டார்.

ஈழவேந்தன் அவர்கள், ஏன் ஈழத் தமிழினத்துக்கு விடுதலை அவசியம், கடந்த காலங்களில் ஆட்சி செய்த சிங்களத் தலைமைகள் எவ்வாறு தமிழர்களை அடிமையாக வாழ வைத்தனர் என்பதை ஆதாரபூர்வமாகத் தனது ஒவ்வொரு பாராளுமன்ற உரையிலும் பதிவுசெய்துள்ளார். இலங்கையில் வரலாற்று ரீதியாக தமிழரின் வாழ்விடங்கள் எவ்வாறு திட்டமிட்ட முறையில் சிங்கள மயப்படுத்தப்பட்டன, அதைத் தடுக்க வட மாகாணத்தையும் கிழக்கு மாகாணத்தையும் உள்ளடக்கிய "தனித் தமிழ் நாடு" ஒன்று உருவாக்கப்பட வேண்டியதன் அவசியம் என்பன பற்றியதாகவே அவருடைய பேச்சும் உரைகளும் இருந்தன.

அவர் இலங்கைத் தமிழரசுக் கட்சியின் உறுப்பினராக இருந்த காலத்தில் - 1965ஆம் ஆண்டில் பிரதமர் டட்லி சேனாநாயக்க தலைமையிலான தேசிய அரசாங்கத்தில் இலங்கைத் தமிழரசுக் கட்சி இணைந்தபோது, அதை விரும்பாத தீவிரப்போக்குடைய இளைஞர் குழுவினரில் ஈழவேந்தனும் ஒருவர்! இந்த அதிருப்தியாளர்கள் "தமிழ்த் தாய் மன்றம்" என்ற ஓர் இயக்கத்தை ஆரம்பித்தார்கள். இலங்கைத் தமிழரசுக் கட்சியின் தலைமைத்துவம்மீது நெருக்குதலைப் பிரயோகிக்கும் ஒரு குழுவாக அது செயற்பட்டது. 1968ஆம் ஆண்டு அன்றைய ஊர்காவற்றுறைப் பாராளுமன்ற உறுப்பினரும் தமிழரசுக் கட்சியுடைய 'தங்கமூளை' என்று வர்ணிக்கப்பட்டவருமான வி. நவரத்தினம் அவர்களுடைய தலைமையில் இவர்கள் இணைந்து "தமிழர் சுயாட்சிக் கழகம்" என்ற பெயரில் புதியதொரு கட்சியை அமைத்தார்கள். தனியான தமிழரசு ஒன்றே அதன் கோரிக்கையாக இருந்தது. தமிழரசுக் கட்சியில் இருந்து வெளியேறிய ஈழவேந்தன் புதிய கட்சியில் இணைந்துகொண்டார். அந்தக் கட்சியின் 'விடுதலை' என்ற பத்திரிகையில் அவர் கிரமமாகக் கட்டுரைகளை எழுதினார். 2007ஆம் ஆண்டில் நீண்ட விஜயமொன்றை மேற்கொண்டு அவர் கனடா சென்றிருந்தார். இந்தக் காலப் பகுதியிலே அவருடைய பாராளுமன்றப் பதவி இல்லாமல்போனது. அவ்விடத்துக்கு, முஸ்லிம் மக்கள் சார்பாகத் தமிழ்த் தேசிய அரசியலில் ஈடுபாடு கொண்டிருந்த இமாம் அவர்கள் பாராளுமன்ற உறுப்பினராக நியமிக்கப் பட்டார்.

ஈழவேந்தன் அவர்களுடைய இழப்பானது, தமிழ் மக்களுக்குப் பாரிய இழப்பாகும். குறிப்பிட்டுக் கூறுவ

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

தென்றால், மிகப் பெரியதொரு கலைக்களஞ்சியத்தை, ஒரு பொக்கிஷத்தை தமிழர்கள் இழந்திருக்கிறார்கள். அவர் தனது உரைகளுக்கு முதலில் எப்பொழுதும், "என்னை நன்றாக இறைவன் படைத்தனன் தன்னை நன்றாகத் தமிழ் செய்யுமாறே", "ஈழம் வெல்லும் அதைக் காலம் சொல்லும்" என்று சொல்வார். நீண்ட காலம் இந்த மண்ணில் தமிழ்த் தேசிய அரசியலுக்காகத் தன்னை அர்ப்பணித்துச் செயற்பட்ட ஈழவேந்தன் ஐயா அவர்கள், எப்பொழுதும் தமிழர்களால் நேசிக்கப்படுகின்ற ஒரு பெருந்தலைவராகவே இருக்கிறார்.

2014ஆம் ஆண்டு கனடாவில் நடைபெற்ற ஓர் அமர்வில் எனக்கு அவரோடு ஒன்றாக இருந்து பேசுவதற்கு வாய்ப்புக் கிடைத்தது. தனது முதிர்ந்த வயதிலும்கூட தமிழ்த் தேசிய அரசியலிலும் தமிழ் மக்கள் மீதான பற்றுறுதி கொண்ட செயற்பாடுகளிலும் அவர் மிகத் தெளிவான பார்வை உடையவராக இருந்தார். தமிழ் மக்களைப் பொறுத்தவரையில், அவருடைய இழப்பானது காலத்தால் ஈடுசெய்ய முடியாதது. அவர் எப்பொழுதும் தமிழர்களின் மனங்களில் வாழ்ந்துகொண்டு இருக்கின்ற ஒருவர். தமிழ்த் தேசிய அரசியலை தமிழ் மக்களுடைய அடுத்த தலைமுறைக்குக் கடத்திச் செல்வதில் வரலாற்றைத் தந்த ஒரு நாயகன்! நான் இந்த இடத்தில் அவரை நினைவுகூர்கின்றேன். அன்னாருடைய குடும்பத்தினருக்கும் இன்றைய தினம் இங்கு நினைவுகூரப்படுகின்ற ஏனைய முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களின் குடும்பத்தினருக்கும் என்னுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்து, விடை பெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Mayilvaganam Jegatheeswaran, please.

[பி.ப. 1.26]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி!

இன்றைய தினம் நடைபெறுகின்ற அனுதாபப் பிரேரணையில் முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான காலஞ்சென்ற கௌரவ லொஹான் ரத்வத்தே, காலஞ்சென்ற கௌரவ ஹீன்மகத்மயா லியனகே, காலஞ்சென்ற கௌரவ டிக்சன் ஜே. பெரேரா, காலஞ்சென்ற கௌரவ (கலாநிதி) மேர்வின் டி த சில்வா, காலஞ்சென்ற கௌரவ வை.ஜீ. பத்மசிரி, காலஞ்சென்ற கௌரவ ஆர்.எம்.ஆர். சூலபண்டார, காலஞ்சென்ற கௌரவ மாணிக்கவாசகர் கனகசபாபதி ஈழவேந்தன் ஆகியோரின் சேவைகள் நினைவுகூரப்படு கின்றன. இவர்கள் இந்தப் பாராளுமன்றத்தில் இருந்த காலப் பகுதியில் தங்களுடைய பிரதேசத்துக்கும் நாட்டுக்கும் பல்வேறு கோணங்களில் சேவைகளை வழங்கி இருக்கிறார்கள். இவர்களுடைய இழப்பால் துயருறும் குடும்பத்தினருக்கு என்னுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

வடக்கு மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்திய அமரர் மாணிக்கவாசகர் கனகசபாபதி ஈழவேந்தன் தொடர்பாக ஓரிரு வார்த்தைகள் கூறலாமென நினைக்கின்றேன். இவர் 1932ஆம் ஆண்டு செப்ரெம்பர் 14ஆம் திகதி யாழ்ப்பாணம் நல்லூரில் பிறந்தார். இவர் பாராளுமன்ற உறுப்பினராக வருவதற்கு முன்னர் இலங்கை மத்திய வங்கியில் கடமைபுரிந்து இருக்கிறார். இவருடைய மனைவியின் பெயர் அருளாம்பிகை. இவருக்கு யாழினி, எழிலினி என இரண்டு பிள்ளைகள் உண்டு. இவர் யாழ்ப்பாணம் பரியோவான் கல்லூரியிலும் கொழும்பு வெஸ்லி கல்லூரியிலும் கல்வி கற்றிருக்கிறார்.

இவர் உண்மையிலேயே தமிழிலும் ஆங்கிலத்திலும் புலமை பெற்ற ஒரு பாராளுமன்ற உறுப்பினராகக் காணப் பட்டார். இவருடைய அரசியல் பயணத்தை எடுத்து நோக்கினால், இவர் 1952ஆம் ஆண்டு இலங்கை தமிழரசுக் கட்சியில் இணைந்திருக்கிறார். 'ஈழவேந்தன்' என்ற புனைப் பெயரில் அக்கட்சியின் 'சுதந்திரன்' பத்திரிகையில் அரசியல் கட்டுரைகளை எழுதி பிரபலமானவராக இருந்திருக்கிறார். அதுமட்டுமல்லாமல், இவர் தமிழ்த் தேசியவாதக் கொள்கையில் உறுதியாக இருந்திருக்கிறார். இவர் இறுதிவரைக்கும் அந்தக் கொள்கையிலிருந்து விலகாமல் இருந்தார் என்பது இங்கு குறிப்பிடத்தக்க விடயமாகும். இவர் 1968ஆம் ஆண்டு தமிழர் சுயாட்சிக் கழகத்தில் இணைந்தார். 1970ஆம் ஆண்டு தேர்தலில் போட்டியிட்டு தோல்வியுற்ற இவர், பின்னர் தமிழர் விடுதலைக் கூட்டணியில் உறுப்பினராக இணைந்து கொண்டார். 1977ஆம் ஆண்டு தமிழர் விடுதலை கூட்டணியின் வெற்றிக்கு முக்கிய பங்காற்றியவராக காலஞ்சென்ற ஈழவேந்தன் அவர்கள் காணப்பட்டார்.

இலங்கை மத்திய வங்கியில் சேவை புரிந்த இவர், 1980ஆம் ஆண்டு சேவையிலிருந்து ஓய்வு பெற்றார். சிறந்த எழுத்தாளராகக் காணப்பட்ட இவர், "தமிழ்மண் காப்போம், தாயகம் மீட்போம்" என்ற நூலை எழுதியிருக்கிறார். இவருடைய செயற்பாடுகள் உள்நாட்டில் மட்டுமல்லாமல், வெளிநாட்டிலும் பரந்துபட்டுக் காணப்பட்டன. 1983இல் தமிழ் நாட்டில் அரசியல் தஞ்சம் கோரிய இவர், பல தமிழ் இதழ்கள் மற்றும் ஊடகங்களுடன் இணைந்து செயற்பட்டார். 1997ஆம் ஆண்டில் தமிழ் நாட்டில் கைது செய்யப்பட்ட இவர், 2000ஆம் ஆண்டு இலங்கைக்கு நாடு கடத்தப்பட்டார்.

2004ஆம் ஆண்டு தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தேசியப்பட்டியல் நாடாளுமன்ற உறுப்பினராக நியமிக்கப் பட்டு, தமிழ் பிரதிநிதித்துவத்தை உறுதிப்படுத்திய இவர், தமிழ் மக்களின் உரிமைக்காகவும் பல்வேறுபட்ட தேவைகளுக் காகவும் இச்சபையில் தொடர்ச்சியாகக் குரல்கொடுத்து வந்திருக்கிறார். 2007ஆம் ஆண்டு இவர் அறிவிக்காமல் கனடா சென்றதன் காரணமாக தன்னுடைய பாராளுமன்ற உறுப்பினர் பதவியை இழந்தார். இவர் 2009ஆம் ஆண்டு கனடாவில் அரசியல் தஞ்சம் கோரியிருந்தார். 2022இல் தனது 90ஆவது பிறந்த நாளை சிறப்பாகக் கொண்டாடியிருந்தார்.

இவருடைய பெருமைகளை எடுத்துநோக்கினால், இவர் மிகுந்த அரசியல் அனுபவம் கொண்ட தமிழ்த் தேசியவாதி யாகக் காணப்பட்டார். இவர் பேச்சாற்றல் மிகுந்தவராகக் காணப்பட்டதுடன், 'ஆவணங்களின் புதையல்' எனவும் மதிப்பிடப்பட்டார். ஈழவேந்தன் அவர்கள் ஒரு கல்வி யியலாளர்! இவர் தீவிர தமிழ்த் தேசிய அரசியல்வாதியாகச் செயற்பட்டார். இவருடைய அரசியல் வாழ்க்கை 7 தசாப்தங்களைக் கொண்டது. இவருடைய வாழ்க்கைப் பாதை அரசியலும் இலக்கியமும் தேசிய உணர்வும் இணைந்த ஒரு வரலாற்றுப் பாதையாக இருந்திருக்கிறது. ஈழவேந்தன் அவர்கள் பதவிகளுக்கோ, சுகபோகங்களுக்கோ அடிமைப் பட்டவராகக் காணப்படவில்லை. தான் கொண்ட கொள்கை யில் உறுதியாக இருந்தார். இறுதிவரையும் அந்தக் கொள்கைக்காகப் பணியாற்றியவராகவும் தமிழ் மக்களது

அபிலாஷைகளை உலகுக்கு எடுத்துக்கூறக்கூடிய சிறந்த தமிழ்ப் பற்றுள்ள பாராளுமன்ற உறுப்பினராகவும் இவர் இருந்தார். இவருடைய இழப்பால் துயருறும் பிள்ளைகளுக்கும் குடும்பத்தவர்களுக்கும் எமது கட்சியினதும் அரசாங்கத்தினதும் சார்பாக எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். இவருடைய ஆத்மா சாந்தியடைய எல்லாம் வல்ல இறைவனைப் பிரார்த்தித்து விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa.

[අ.භා. 1.34]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් මේ රටේ ජනතාවට සේවය කළ අප අතරින් වෙන්ව ගිය හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හත්දෙනෙකු වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේදී අභාවප්‍රාප්ත අපේ මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ගැන මම මුලින්ම කියන්න ඕනෑ. එතුමා අවුරුදු 3කට වැඩි කාලයක් උතුරු පළාත නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට ඇවිල්ලා, තමන්ගේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කළ මෙහෙවර සහ ඔවුන් වෙනුවෙන් පෙනී සිටිමින් තමන් විශ්වාස කරන දේශපාලන මතය නියෝජනය කරපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. එතුමා වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලුදෙනාට මා ඇතුළු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම, අභාවප්‍රාප්ත ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමා ගැනත් මම කියන්න ඕනෑ. එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් 1989 ඉඳන් තුන් වතාවක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ හැම අවස්ථාවකම එතුමා තමන්ගේ පක්ෂය වෙනුවෙන් කැපවීම් කරලා තමන්ගේ ප්‍රදේශයට විශාල මෙහෙවරක් සිදු කළා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විධියට අපි එතුමා වෙනුවෙනුත් එතුමාගේ පවුලේ සියලුදෙනා වෙත ශෝකය පළ කරන අතර, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වයි.ජී. පද්මසිරි මැතිතුමා ගැනත් මම කියන්න ඕනෑ. එතුමා එක්ක දේශපාලන කටයුතුවල නියැළෙන්න මටත් අවකාශය ලැබුණා. විශේෂයෙන්ම එතුමා කෑගල්ල ප්‍රදේශයේ රුවන්වැල්ල ආසනය නියෝජනය කරමින් කෑගල්ල දිස්ත්‍රික්කයට වාගේම වමේ දේශපාලනයටත් විශාල කැපවීමක් කරපු දේශපාලන නායකයෙක්. දීර්ඝ කාලයක් තිස්සේ තමන්ගේ ප්‍රදේශයේ ජනතාව සහ තමන් විශ්වාස කරන දේශපාලන කඳවුර ආරක්ෂා කර ගනිමින් වයි.ජී. පද්මසිරි හිටපු පාර්ලිමේන්තු ඇමතිතුමා කටයුතු කළා. අද එතුමාගේ දියණිය වන වත්සලා ජනාදරී පද්මසිරි හිටපු පළාත් සභා මන්ත්‍රීතුමියත් ඒ අඩි පාරේ යමින් දේශපාලනික වශයෙන් තමන්ගේ පියා නියෝජනය කරපු මතවාදය ආරක්ෂා කරගෙන ඉදිරියට යනවා. ඇයටත් සුභ පතන ගමන්, එතුමා වෙනුවෙන් ඇය ඇතුළු එතුමාගේ පවුලේ සියලුදෙනා වෙත මා ඇතුළු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශෝකය ප්‍රකාශ කරනවා. ඒ වාගේම වයි.ජී. පද්මසිරි මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම, අභාවප්‍රාප්ත අපේ ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා ගැනත් මම කියන්න ඕනෑ. එතුමා 1989 ඉඳලා 1994 දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පැමිණියා. උගත්, බුද්ධිමත් දේශපාලනඥයකු විධියට එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් එතුමා විශාල මෙහෙවරක් කළා. එතුමාගේ පවුලේ අයටත් මා ඇතුළු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශෝකය පළ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට, අභාවප්‍රාප්ත ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා ගැනත් මම කියන්නට ඕනෑ. එතුමා විශේෂයෙන් අපේ පවුලේ අය ඉතාම ළඟින් ඇසුරු කරපු පවුලේ හිතවතෙක්. එතුමා එදා මගේ පියා එක්ක දේශපාලන ගමනක් ආරම්භ කරලා තමන් නියෝජනය කරපු ප්‍රදේශය වෙනුවෙන්, කඳවුර වෙනුවෙන් නිරන්තරයෙන් පෙනී සිටියා. ඒ වාගේම තමයි එතුමා පසුකාලීනව දේශපාලනික වශයෙන් මොන මතවාදය, මොන පක්ෂය නියෝජනය කළත්, නිරන්තරයෙන් තමන්ගේ දේශපාලන සගයන් සමඟ ඉතාම ළඟින් ආශ්‍රය කරපු දේශපාලන නායකයෙක්. එතුමාගේ පවුලේ අය අදටත් ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා නියෝජනය කරපු ජන කොට්ඨාසය; ඡන්ද දායකයන් ඉතාම ළඟින් ඇසුරු කරමින් ඒ සේවාවන් තමන්ට හැකි ආකාරයෙන් ඉදිරියට අරගෙන යන්න කටයුතු කරන බව අපි දන්නවා. ඒ එක්කම එම ඥාති හිතමිත්‍රයන්; දරුවන්, මුනුපුරන්, මිනිපිරියන් අපේ පවුල එක්ක; මගේ පියා එක්ක, මාත් එක්ක අදටත් ඉතාම සමීපව ආශ්‍රය කරමින්, එතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක තිබිච්ච ඒ ළබැඳියාව, සබඳතාව තවදුරටත් ශක්තිමත් කරමින් ඉදිරියට අරගෙන යනවා. එතුමාටත් නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතර, ඒ පවුලේ සියලුදෙනා එක්ක අපි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශෝකය බෙදා ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා කියන්නේ අපේ වරුණ ලියනගේ මැතිතුමාගේ පියා. එතුමාත් එදා මගේ තාත්තා එක්ක දේශපාලනය කළා. ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා එදාත් අදත් අපි එක්කයි දේශපාලනය කරන්නේ. ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට මහත් කැපවීමකින් යුතුව විශාල සේවයක් කරපු දේශපාලන නායකයෙක්. ඒ වාගේම නිරන්තරයෙන් තමන් විශ්වාස කරපු දේශපාලන මතය සහ තමන්ගේ කඳවුර වෙනුවෙන් පෙනී හිටපු නායකයෙක්. අදටත් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව එතුමා කෙරෙහි තැබූ විශ්වාසය තවදුරටත් තහවුරු කර තිබෙනවා. ඒ වරුණ ලියනගේ මැතිතුමා තරුණ දේශපාලනඥයෙකු විධියට ඒ කඳවුර ආරක්ෂා කරමින් ඉස්සරහට යන නිසා. එතුමාටත් මම සුබ පතනවා. ඒ වාගේම ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර අපේ වරුණ ලියනගේ මන්ත්‍රීතුමා ඇතුළු පවුලේ සියලුදෙනා එක්ක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශෝකය බෙදා ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා සහ අපි සමකාලීනව එකට දේශපාලනයට ආවේ; ඒ වාගේම පාර්ලිමේන්තුවට ආවේ. එතුමා ඊට පෙර පළාත් සභාව නියෝජනය කරමින් මහනුවර දිස්ත්‍රික්කයට විශාල වැඩ කොටසක් කරපු කෙනෙක්. ඒ වාගේම රත්වත්තේ මැතිතුමාගෙන් හිස් වෙච්ච ඒ අඩුව මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් පුරවමින් එතුමා පළාත් සභාවෙන් දේශපාලනයට ඇවිල්ලා, පසුකාලීනව පාර්ලිමේන්තුවට ඇවිල්ලා අමාත්‍යාංශ කිහිපයක තනතුරු දරමින් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටු කළා. ඒ වාගේම තමයි ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා දක්ෂ ක්‍රීඩකයෙක්. ත්‍රිත්ව විද්‍යාලය නියෝජනය කරමින් රගර් ක්‍රීඩාවේ නියැළිච්ච එතුමා

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

පුහුණුකරුවෙකු විධියටත්, දක්ෂ ක්‍රීඩකයෙකු විධියටත් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව වාගේම රටේම ජනතාව හඳුනාගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා තමන්ගේ හිතට එන අදහස් අවංකව ප්‍රකාශ කරපු කෙනෙක්. තමන්ගේ අදහස් අවංකව ප්‍රකාශ කරපු නිසා බොහෝ අය ලොහාන්ව වැරදියට කියවා ගත් අවස්ථාත් තිබෙනවා. හැබැයි, එතුමා තමන්ට දැනෙන දේ තමන්ට හිතෙන දේ අවංකව, නිර්භයව ප්‍රකාශ කළා වාගේම නිරන්තරයෙන් තමන් විශ්වාස කරපු, තමන් පෙනී හිටපු කඳවුර ආරක්ෂා කරන්න කොන්දේසි විරහිතව කටයුතු කරපු තරුණ දේශපාලනඥයෙක්. එතුමා අද අප අතර නොසිටියත්, ඉතාම අඩු වයසින් අප අතරින් වෙන්ව ගියත්, එතුමා තව කාලයක් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවට වාගේම මේ රටේ ජනතාවට සේවය කළ යුතු තරුණ දේශපාලනඥයෙක් කියා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ බිරිඳ, දරුවන්, සහෝදරයන් ඇතුළු සියලුදෙනා එක්ක ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේත්, මාගේත් ශෝකය මේ අවස්ථාවේදී බෙදා ගන්නවා. ඒ වාගේම ගරු ලොහාන් රත්වත්තේ සහෝදරයාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Gayantha Karunathilleka.

[අ.භා. 1.41]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් මේ සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරුන් හත්දෙනෙකු පිළිබඳව අද දින ශෝකය ප්‍රකාශ කරද්දි මම කැමැතියි, පළමුවෙන්ම ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාගෙන් මගේ අදහස් දැක්වීම ආරම්භ කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව විවෘත කළාට පසු, ඒ මුල් කාලයේ අලුත් පාර්ලිමේන්තුව මහජනතාවටත් විවෘත කළා. එතකොට හීන්මහත්මයා ලියනගේ මැතිතුමා ගුරුවරයෙකු හැටියට, සාමාන්‍ය පුරවැසියෙකු හැටියට පෝලිමේ ඇවිල්ලා මේ පාර්ලිමේන්තුව බැලුවා. එදා පෝලිමේ ඇවිල්ලා බලපු පාර්ලිමේන්තුව, අඛණ්ඩව දහතුන් වසරක් රත්නපුරයේ ජනතාවගේ කැමැත්තෙන් මන්ත්‍රීවරයෙකු හැටියට -අවස්ථා තුනකදී මැතිවරණවලින් දිනලා- නියෝජනය කරන්න එතුමාට අවස්ථාව ලැබුණා. එතුමා ගුරුවරයෙකු හැටියට තමයි තමන්ගේ ජීවන වෘත්තිය ආරම්භ කළේ. එතුමා පාසල් ගණනාවක කටයුතු කළා පමණක් නොවෙයි, හම්බන්තොට වාගේ දිස්ත්‍රික්කවල, විතාරන්දෙණිය වාගේ ප්‍රදේශවල තිබෙන ඉස්කෝලවල දුෂ්කර සේවයේත් නිරත වුණා. සමහර කාලවලදී ඒ ප්‍රදේශවලට ගිහින් නතර වෙලා දරුවන්ට උගන්වපු විශිෂ්ට ගුරුවරයෙකු හැටියටත් එතුමාව අපි දකිනවා.

එතුමා බොහොම පිරිසිදු, කිසිම චෝදනාවක් නොලබපු, තමන්ගේ කාර්යභාරය නිහඬව ඉෂ්ට කරපු ජනතා පුත්‍රයෙක්. හැබැයි, එතුමා විප්ලවකාරී චරිතයක් හැටියටත් නොයෙක් අවස්ථාවලදී ක්‍රියා කළා. මම දන්නා එවැනි අවස්ථා දෙකක් විතර මතක් කරන්න කැමැතියි. ඒ කාලයේ එතුමා විපක්ෂයේ ඉන්නකොට, විමධ්‍යගත මුදල් නොලැබීම නිසා එතුමාත්, තවත් මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුත් ඒ වෙනුවෙන් සටන් කරලා, මේ සභාවේ උපවාස කරලා අන්තිමට එතුමාට කෙටි කාලයකට පාර්ලිමේන්තුවේ සභා වාර තහනමකටත් ලක් වෙන්න සිද්ධ වුණා. ඒ වාගේම 1989දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නතර වෙන්න සිද්ධ වුණේ ශ්‍රාවස්තියේ එහෙම නැත්නම් තැප්‍රොබේන් හෝටලයේ. ඒ වෙලාවේ එතුමා තවත් මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් එක්ක එකතු වෙලා මේ සභා ගර්භයට ඇවිල්ලා පැදුරක් දාගෙන නිදාගෙන, අපට -මන්ත්‍රීවරුන්ට- කොළඹ ආවාම ඉන්න හරි තැනක් ලබා දෙන්න කියලා උද්ඝෝෂණය කළා. එහි ප්‍රතිඵලයක් හැටියට මාදිවෙල නිවාස සංකීර්ණය මන්ත්‍රීවරුන් වෙනුවෙන් ලබා දෙන්න එවකට පැවති රජය කටයුතු කළා. ඒ වාගේම එතුමා රක්වාන ආසනයේ තිබෙන රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඇති කරන්නත් පුරෝගාමී මෙහෙවරක් ඉෂ්ට කළා.

එතුමාටත්, මටත් පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරුන් හැටියට එකට ක්‍රියා කරන්න නොලැබුණත්, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට ඉන්නකොට, මම ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපති හැටියට කටයුතු කළා. රත්නපුරයේ කුඩා තේ වතු හිමියන්ගේ කටයුතුවලදී, නියං ආධාර බෙදන උත්සවවලදී අපි දෙදෙනා හමු වුණා. ඒ කාලයේ ඉඳලා අපි හිතවත්ව කටයුතු කළා. නමුත් මට පසු කාලයක භාග්‍ය ලැබුණා, එතුමාගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය වන වරුණ ලියනගේ මන්ත්‍රීතුමාත් එක්ක වර්තමානයේ එකට පාර්ලිමේන්තුවේ ඉන්නත්, දේශපාලනය කරන්නත්.

ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාට හොඳ භාර්යාවක් ලැබුණා. ඒ තමයි, සිරිමා ඉන්ද්‍රානි මැතිනිය. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ පුත්‍රයා වරුණ ලියනගේ මහතා පියාගේ අඩි පාරේ යනවා. එතුමා බොහොම නිහතමානීව පොදු ජනතාව අතර සිටිමින්, ජනතාවගේ ආදරය දිනා ගත් තරුණ මන්ත්‍රීවරයෙකු හැටියට අද ක්‍රියා කරනවා. ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාගේ අනෙක් පුත්‍රයා වන දමිත මහේෂ් ලියනගේ මහත්මයා ව්‍යාපාරිකයෙකු ලෙස කටයුතු කරනවා.

නුෂාරි නිර්මිතා ලියනගේ කියන්නේ එතුමාගේ එකම දියණිය. එවැනි හොඳ දරුවන් එතුමා සමාජයට දායාද කළා. එතුමා සම්බන්ධව අදහස් දක්වන්න මම මීට වැඩි වෙලාවක් ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඉතා නිහතමානී හොඳ මන්ත්‍රීවරයෙකු හැටියට තමයි ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාව අපි දකින්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ අභාවය ගැන ඒ මැතිනියටත්, වරුණ ලියනගේ මැතිතුමා ඇතුළු සහෝදර පිරිසටත් අපේ සංවේගය පළ කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාව ශෝභාවත් කරපු තවත් විශිෂ්ට චරිතයක් තමයි, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළා. කලක් එක්සත් ජාතික පක්ෂයටත් සම්බන්ධව සිටියා. රට, ජාතිය, ආගම ගැන අවංක කැක්කුමක් තිබුණු නායකයෙකු හැටියට තමයි ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාව අපි දකින්නේ. එතුමා කුඩා කාලයේ ඉඳලාම දේශපාලනයට උනන්දුවක් දැක්වුවා. මහරගම විද්‍යාකර මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබද්දි විවාද කණ්ඩායමේ කැපී පෙනෙන කථිකයෙකු හැටියට එතුමා කටයුතු කළා. එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙක් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දේශපාලනඥයන් ගැන කථා කරනකොට බොහෝදෙනෙක් කියන්නේ කිසිම දෙයක් නැතිව දේශපාලනයට ඇවිල්ලා මහා ප්‍රකෝටිපතියෝ හැටියට

ජීවත් වෙන හැටි බලන්න කියලායි. ඒකට හාත්පසින්ම වෙනස් චරිතයක් තමයි, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාගේ චරිතය. ඉතාම ධනවත් පවුලක ඉඩම් හිමි, අලි ඇතුන් පවා හිමි පවුලක සාමාජිකයෙකු හැටියට ඉපදිලා, එතුමා දේශපාලනයට බොහෝ මුදල් වියදම් කරලා, තම දේශපාලන පක්ෂයට මුදල් වියදම් කරලා දූෂිත පුද්ගලයෙකු හැටියට කිසිම තැනක නමක් කියවෙන්නේ නැති චරිතයක් හැටියට බොහොම අවංකව කටයුතු කරපු, දේශපාලනය නිසා බොහෝ දේවල් නැති කර ගත් පුද්ගලයෙකු හැටියට තමයි ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාව අපි දකින්නේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව තිබෙනකොට පරණ පාර්ලිමේන්තුව තිබෙන තැන -දැන් ජනාධිපති ලේකම් කාර්යාලය තිබෙන තැන- තමයි පාර්ලිමේන්තුව රැස් වුණේ. එතුමා හැමෝගේම හොඳ මිත්‍රයෙක්. ඒ කාලයේ මන්ත්‍රීවරුන් බොහෝදෙනෙක් නතර වුණේ ශ්‍රාවස්ති මන්දිරයේ. එතුමාගේ පියාට කොම්පඤ්ඤවීදියේ තිබුණා, "කාසල්" කියලා හෝටලයක්. මන්ත්‍රීවරුන් කාගේත් හොඳ මිත්‍රයෙක් වූ ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා පියාගේ කාසල් හෝටලයෙන් තමයි ශ්‍රාවස්තියේ හිටපු සහෝදර මන්ත්‍රීවරුන්ට දවල්ට, රෑට කෑම දුන්නේ. එතුමා ඒ තරමටම මිත්‍රත්වයෙන් හැමෝම එක්ක ආශ්‍රය කළා.

ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාට තිබුණා, හෘදය සාක්ෂියට අනුව කටයුතු කිරීමේ හොඳ ලක්ෂණයක්. කොයිම වෙලාවකවත් තමන්ගේ හදවතට විරුද්ධව එතුමා තීන්දු ගත්තේ නැහැ. තමන්ගේ පක්ෂයෙන් වුණත් මොන බලපෑමක් ආවත්, වැරදි තීරණයකදී එතුමා කෙළින් හිටගත්තා. වී අලෙවි මණ්ඩලය අහෝසි කරන්න යනවා කිව්වාම ඊට විරුද්ධව විනය පරීක්ෂණ පිට විනය පරීක්ෂණ පවත්වනකොට එතුමා ඒ වෙනුවෙන් පෙනී සිටියා. මට මතකයි, එක්තරා අවස්ථාවකදී පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ඉඳලා විරුද්ධ පක්ෂයට එතුමා cross over කළා. එතුමා ඒ වාගේ කටයුතු කරපු පුද්ගලයෙක්. හිටපු ජනාධිපතිවරුන් වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එක්ක, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය එක්ක, මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක, රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්ක ඉතාම කිට්ටුවෙන් එතුමා වැඩ කළා.

එතුමා මේ ගරු සභාවේ හිටපු ඉතා දක්ෂ චතුර කථිකයෙක්. මට මතකයි, එතුමා කැස්බෑවේ අතුරු මැතිවරණයට ඉල්ලනකොට තරුණ වයසේ හිටියේ. එතුමා ඒ කාලයේ බොහොම ප්‍රියමනාප තරුණයෙකු හැටියට, ජනතා ආකර්ෂණය දිනා ගත් දේශපාලනඥයෙකු හැටියට සිටියා. නිතරම එතුමාගේ මුහුණේ සුන්දර හිනාවක් දකින්න තිබුණා. අපි දැක්කාම, හමු වුණාම බොහොම ළෙන්ගතුව අතින් අල්ලාගෙන, සුහදශීලීව අපේ තිබෙන විවිධ සම්බන්ධකම් මතක් කරමින් එතුමා හැමතිස්සේම කටයුතු කළා. කලක් ඕස්ට්‍රේලියාවේ First Secretary හැටියටත්, නේපාලයේ නියෝජ්‍ය තානාපති ලෙසත් රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලත් නිරත වෙන්න ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාට පුළුවන්කම ලැබුණා.

ඒ නිසා වටිනා දේශපාලනඥයෙකුගේ අභාවය ගැන මේ අවස්ථාවේ අපේ සංවේගය පළ කර සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාලිනී අබේධීර ජයවික්‍රම පෙරේරා මැතිනිය වන එතුමාගේ භාර්යාවට, සුධීර පෙරේරා පුතණුවන්ට, චතුර ජයනිකා පෙරේරා දියණියට ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මේ අවස්ථාවේදී අපේ සංවේගය පළ කරන හැටියට ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාව නියෝජනය කරපු අභාවප්‍රාප්ත තවත් වැදගත් මන්ත්‍රීවරයෙක් තමයි, ගරු වූල බණ්ඩාර මැතිතුමා. එතුමා කුරුණෑගල දිස්ත්‍රික්කය තමයි නියෝජනය කළේ. එතුමා ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවා. ඒ වාගේම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේත්, කොළඹ නීති විද්‍යාලයේත් අධ්‍යාපනය ලබා නීතිඥවරයෙක් හැටියට පත් වුණා.

ගරු වූල බණ්ඩාර මැතිතුමා පිරිමි හතරදෙනෙක් සහ ගැහැනු හයදෙනෙක් -සහෝදර සහෝදරියන් දහ දෙනෙක්- අතර වැඩිමලා හැටියට තමයි ඒ පවුලට නායකත්වය දුන්නේ. එතුමාගේ පියාත් මේ සභාව නියෝජනය කළා. 1977දී ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව පිහිටුවනකොට එතුමාගේ පියා වූ කලුබණ්ඩා රත්නායක මැතිතුමා පඩුවස්නුවර මන්ත්‍රීවරයා හැටියට පත් වුණා. ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව දීර්ඝ කාලයකට පසුව රාජ්‍ය වප් මඟුල් උත්සවයක් සංවිධානය කරන්න කටයුතු කළා. අපට මතකයි, අපි පාසල් ශිෂ්‍යයෝ හැටියට ඒ දේවල් දැකපු හැටි. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාත්, ප්‍රේමදාස අගමැතිතුමාත්, ඊ.එල්. සේනානායක කෘෂිකර්ම ඇමතිතුමා ඇතුළු මැති ඇමතිවරු ඔක්කොම පඩුවස් නුවරට ගිහිල්ලා, එතුමා සංවිධානය කරපු ඒ වප් මඟුල් උත්සවයට සම්බන්ධ වුණා. පඩුවස් නුවර ඒ වප් මඟුල් උත්සවය එතුමා සංවිධානය කළාට පසුව එතුමාට නමක් පටබැඳුණා, "පඩුවස් නුවර රජ්ජුරුවෝ" කියලා. ඊටපසුව එතුමාගේ සහෝදර මන්ත්‍රීවරු එතුමාට ආමන්ත්‍රණය කළේ "රජ්ජුරුවෝ" කියායි.

ගරු වූල බණ්ඩාර මැතිතුමා නීති විද්‍යාලයේ ඉගෙන ගත්ත කාලයේ නීති ශිෂ්‍ය සංගමයේ සභාපති හැටියටත් පත් වුණා. මම අහලා තිබෙනවා, එතුමා නීති විද්‍යාලයේ ඉන්නකොට එතුමාගේ සමකාලීන මිත්‍රයෙකු ලෙස එවකට බෙලිඅත්ත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමාත් නීති විද්‍යාලයේ හිටපු බව. එතුමා රසායන විද්‍යාව පිළිබඳව උපකාරක පන්ති පැවැත්වූවා. අපට මතකයි, ඒ කාලයේ බම්බලපිටිය ටෙම්පල් ලේන් එකේ තිබුණු ස්ථානයක රසායන විද්‍යා tuition ගුරුවරයෙක් හැටියට එතුමා කටයුතු කළ ආකාරය. පසු කාලයක පෞද්ගලික බැංකුවක නීති කළමනාකරු ලෙසත් එතුමා ක්‍රියා කළා. එතුමාගේ පවුලේ තවත් සාමාජිකයෙක් පසුව වයඹ පළාතේ මහ ඇමතිවරයා හැටියටත් ක්‍රියා කළා. ඒ, නිමල් බණ්ඩාර මැතිතුමා.

ඒ නිසා එතුමා වටිනා සේවයක් කරපු ගරු මන්ත්‍රීවරයෙක් හැටියට අපි දකිනවා. එතුමාගේ අභාවය ගැන රෝහිණී පුෂ්පා බණ්ඩාර මැතිනියටත්, ප්‍රබෝධිනී සහ තුලානි කියන දියණියන් දෙපළටත්, සිදත් බණ්ඩාර පුතණුවන්ටත් අපේ සංවේගය අපි මේ වෙලාවේදී පළ කරන්නට අවශ්‍යයි.

ඒ වාගේම අපේ සභාව මෑතක් වනතුරුම නියෝජනය කරපු, අපි කවුරුවත් නොහිතපු වෙලාවක අවුරුදු 57ක් ආයු වින්දනය කරලා අභාවයට පත් වෙච්ච ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා ගැනත් වචන කීපයක් මා කිව යුතුයි. එතුමා මහනුවර සම්භාවනීය පවුලක උපත ලැබුවා. මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයෙක් හැටියටත්, විශේෂයෙන්ම රගර් ක්‍රීඩාවේ කැපී පෙනෙන පුද්ගලයෙක් හැටියටත් එතුමා පාසල් අධ්‍යාපනය ලැබුවා. පසුව එතුමා සමාගම් අධ්‍යක්ෂවරයෙක් හැටියට රැකියාවක් කළා. අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ අභාවයෙන් පසුව ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ වෙලා එතුමා විවිධ තනතුරු දැරුවා.

ජීවත් වුණේ අවුරුදු 57ක් වුණාට, අමාත්‍යාංශ හතක රාජ්‍ය ඇමති හැටියට එතුමා ක්‍රියා කර තිබෙනවා. ඒ අනුව, විෂයයන් ගණනාවක රාජ්‍ය අමාත්‍යවරයෙක් හැටියට ක්‍රියා කරන්න එතුමා භාග්‍ය ලැබුවා. එතුමා විටෙක මහාමාර්ග සංවර්ධන රාජ්‍ය ඇමති හැටියටත්, තවත් විටෙක මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය ඇමති හැටියටත්, බන්ධනාගාර කළමනාකරණ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය ඇමති හැටියටත්, වරාය හා නාවික කටයුතු රාජ්‍ය ඇමති හැටියටත්, නාගරික සංවර්ධන රාජ්‍ය ඇමති හැටියට වාගේම වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය ඇමති හැටියටත් කටයුතු කළා. ඒ නිසා එතුමා මේ සභාවේ කටයුතු කරන හැටි අපි දැකලා තිබෙනවා.

මගේ මතකයේ තිබෙන එක කාරණයක් විතරක් මම මේ අවස්ථාවේදී කියන්නම්. එතුමා තුළ තමන්ගේ නායකත්වයට ලොකු ගෞරවයක් තිබුණා.

එතුමාට වැඩිහිටියන් පිළිබඳව හැඟීමක් තිබුණා. මට මතකයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ සභාවේ ඉදිරිපස පේළියේ කෙළවරේ ආසනයක තමයි අන්තිමට හිටියේ කියන එක. ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා හැම තිස්සේම කණ්ණාඩිය හරි අතින් අරගෙන එතුමාගේ පිටුපසින් ඇවිත් තමන්ගේ නායකයා අසුන් ගන්න තුරු එතැනට වෙලා හිටගෙන හිටියා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට සභාවෙන් එළියට යන්න අවශ්‍ය වෙලා පිටුපස බලනකොටම ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා ටක් ගාලා එතැනට දුවගෙන ඇවිත් එතුමා පිටුපස දොරෙන් එක්ක ගෙන ගියා. කැන්ටිමට ගියත් සෙවණැල්ල වාගේ එතුමා එක්ක හිටියා. ඒ වාගේ ගතිගුණ අපි එතුමා තුළින් දැක්කා. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් එම මැතිනියටත්, දරුවන්ටත්, පවුලේ අයටත් අපේ සංවේගය අපි පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාව නියෝජනය කළ තවත් වටිනා පුද්ගලයෙක් තමයි, අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා. එතුමා හිටපු නියෝජ්‍ය ඇමතිතුමෙක්. ඒ වාගේම එතුමා ලංකා සමසමාජ පක්ෂයේ විවිධ තනතුරු හොබවපු, පාසල් ගිය කාලයේ ඉඳලාම ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාගේ ආශ්‍රය ලබපු, දේශපාලන කටයුතුවල නිරත වුණු, සබරගමුවෙන් බිහි වුණු විශිෂ්ට දේශපාලනඥයෙක්. එතුමා අවුරුදු 20ක් වැනි ඉතාම තරුණ වියේදී ලංකා සමසමාජ පක්ෂ රුවන්වැල්ල තරුණ බලමණ්ඩලයේ ලේකම් සහ සභාපති තනතුරු දැරුවා. ඒ වාගේම ලංකා සමසමාජ පක්ෂ රුවන්වැල්ල තරුණ බලමණ්ඩලයේත්, ලංකා සමසමාජ පක්ෂ කෑගල්ල දිස්ත්‍රික් බලමණ්ඩලයේත්, සමසමාජ පක්ෂ මධ්‍යම කාරක සභිකයෙකු හැටියටත්, සමසමාජ පක්ෂයේ දේශපාලන මණ්ඩල සභිකයෙකු ලෙසත් ලංකා සමසමාජ පක්ෂයේ ජාතික සංවිධායක ධුරයත් දැරූ එතුමා ජාතික දේශපාලනයේ නිරත වෙච්ච ප්‍රබල චරිතයක්. එතුමා 1988 වර්ෂයේදී ප්‍රථම පළාත් සභා මැතිවරණයට තරග කළා. එවකට රටේ පැවැති දේශපාලන තත්ත්වය ගැනත් නොතකා භීෂණ කාලයකදී එතුමා සබරගමුව පළාත් සභාවට තම පක්ෂයෙන් ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කළා. එතැන් පටන් අවුරුදු 11ක් පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේත්, තවත් අවුරුදු 11ක් විරුද්ධ පක්ෂයේත් වශයෙන් අඛණ්ඩව අවුරුදු 22ක් පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක්, සභානායකවරයෙක් වැනි තනතුරු දරමින් පළාතට ලොකු සේවයක් කළා.

2010දී පැවැති පාර්ලිමේන්තු මැතිවරණය ජයගෙන එතුමා පාර්ලිමේන්තුවට ආවා. රාජපක්ෂ ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් ලෙසත්, 2013 සිට 2015 දක්වා ඒ ආණ්ඩුවේ කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයා ලෙසත් එතුමා කටයුතු කළා. 2015 ජනවාරි මස 09වැනි දා යහ පාලන ආණ්ඩුව බලයට ආවට පසුව එතුමා විපක්ෂයට ඇවිත් විපක්ෂයේ කාර්ය භාරය ඉටු කරමින් විපක්ෂ මන්ත්‍රීවරයෙක් ලෙසත් කටයුතු කළා. ඒ වාගේම එතුමා නොතාරිස්වරයෙක් ලෙස දිගටම හිටියා. අවුරුදු 25ක් දහම් පාසල් ගුරුවරයෙක් ලෙස කටයුතු කළා පමණක් නොවෙයි, ප්‍රදේශයේ පෙර පාසල් දියුණු කිරීමටත්, පාරවල් සහ පාලම් රැසක් ඉදිකිරීමටත්, රුවන්වැල්ල එන්.එම්. පෙරේරා අනුස්මරණ සම්මන්ත්‍රණශාලාව ඉදිකිරීම වැනි වැඩකටයුතු රාශියක් ඉටු කිරීමටත් ගරු වයි.ජී. පද්මසිරි හිටපු මන්ත්‍රීතුමා සමත් වෙලා තිබෙනවා. එතුමාගේ අභාවයෙන් සංවේගයට පත් භාර්යාවටත්, එතුමාගේ දියණිය වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපරාධ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිධාරිනියක් මෙන්ම හිටපු සබරගමුව පළාත් සභා මන්ත්‍රීවරියක් වන වත්සලා ජනාදරී පද්මසිරිටත් අපේ සංවේගය අපි මේ වෙලාවේදී පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා 1989-1994 කාලයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක් හැටියටයි කටයුතු කරලා තිබෙන්නේ. අපට එතුමාව ආශ්‍රය කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් තමයි එතුමා කටයුතු කළේ. එතුමා හොඳ උගත් මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම එතුමා මහනුවර ශාන්ත සිල්වෙස්තර විද්‍යාලයේ සහ කොළඹ ශාන්ත ජෝසප් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්. එතුමා ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධිය සමත් වුණා. ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ විද්‍යාපති සහ ආචාර්ය උපාධි ලබා ගත් එතුමා උගත් මන්ත්‍රීවරයෙක් විධියට තමන්ගේ දැනුමෙන්, ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයෙන් රටට විශාල මෙහෙරවක් ඉෂ්ට කරන්න උත්සාහ කරපු මන්ත්‍රීවරයෙක්. එතුමා පුවත් පත්වලට බොහෝ ලිපි රචනා කරලා තිබෙනවා. ඊට අමතරව එතුමා ආර්ථික සංවර්ධනය, කෘෂිකර්මය, විද්‍යාව හා දේශපාලන විද්‍යාවට අදාළ පොත් ගණනාවක් රචනා කරපු පුද්ගලයෙක්. ඒ වාගේම එතුමා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා උපදේශන සේවා රාශියකුත් ඉටු කළ පුද්ගලයෙක්. ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමාගේ අභාවය පිළිබඳ අපේ සංවේගය එතුමාගේ පවුලේ සියලුදෙනා වෙත අපි මේ වෙලාවේදී පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාව නියෝජනය කළ අභාවප්‍රාප්ත ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමා පිළිබඳවත් අවසාන වශයෙන් වචනයක් දෙකක් හරි කිව යුතුව තිබෙනවා. එතුමා යාපනය ශාන්ත ජෝශප් විද්‍යාලයේත්, කොළඹ වෙස්ලි විද්‍යාලයේත් ආදි ශිෂ්‍යයෙක්. එතුමාගේ පියා දුම්රිය ස්ථානාධිපතිවරයෙක්. එතුමා දේශපාලනයට එන්න ඉස්සෙල්ලා ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ අංශයේ දෙමළ භාෂා පරිවර්තන අංශයේ ප්‍රධානියා හැටියටත් කටයුතු කරලා තිබෙනවා. ඊට පසුව එතුමා දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ කොළඹ ශාඛාවේ සභාපති ලෙස කාලයක් කටයුතු කළා.

1983දී ඉන්දියාවට ගිය ගරු ඊලවේන්දන් මැතිතුමා නැවත ලංකාවට ආවේ 2000 වර්ෂයේදී. එතුමා 2004දී ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවට ආවා. 2007 වසරේදී මාස 3ක් විදේශගත වෙලා හිටියා. එහිදී නිවාඩු ගැනීමට බැරිවීම නිසා එතුමාගේ මන්ත්‍රී ධුරය අහෝසි වුණා කියන එක තමයි අපි අහලා තිබෙන්නේ.

අපට මතකයි, එතුමා මේ සභාවේ ඉන්න කාලයේ අපිව දැක්කත් ඉතා සුහදව හිනාවෙලා, වචනයක් දෙකක් කථා කරන පුරුද්දක් තිබුණු, ඉතා සරල චරිතයක් ලෙස අපි වටහාගෙන සිටි පුද්ගලයෙක්. එතුමාගේ අභාවය පිළිබඳව මේ අවස්ථාවේ අපේ ශෝකය එම පවුලේ උදවිය වෙත පළ කර සිටිනවා.

ඒ වාගේම, අද දින ශෝක ප්‍රකාශ යෝජනාවලට ඇතුළත් අනෙකුත් සියලුම ගරු මන්ත්‍රීවරුන් ගැනත් අපේ සාතිශය සංවේගය පළ කරමින්, එම පවුල්වල උදවිය වෙත එය දන්වා යවන හැටියට ඉල්ලා සිටිනවා. අභාවප්‍රාප්ත ඒ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම බෞද්ධයින් හැටියට අප නිවන් සුව ලැබේවා

කියාත්, එතුමන්ලා අදහනු ලැබූ ආගම් අනුව ඒ ඒ බලාපොරොත්තු ඉෂ්ට වේවා කියාත් ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Major General (Rtd.) G.D. Sooriyabandara. Order, please! Before that, will an Hon. Member propose the Hon. (Mrs.) Rohini Kumari Wijerathna to the Chair?

**ගරු (ආචාර්ය)හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA took the Chair.*

[අ.භා. 2.02]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ උත්තරීතර සභාව නියෝජනය කළ, හිටපු ගරු මන්ත්‍රීවරුන් හත්දෙනෙකුගේ අභාවය වෙනුවෙන් අද දින ශෝක ප්‍රකාශ යෝජනා ගෙනැවිත් තිබෙනවා. අභාවප්‍රාප්ත ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා, ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා, ගරු ආර්.එම්.ආර්. වූල බණ්ඩාර මැතිතුමා සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමා සම්බන්ධවයි අද දවසේ කථා කරන්නේ. ප්‍රථමයෙන්ම මා අභාවප්‍රාප්ත එම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම නිවන් සුවයත්, එතුමන්ලා අදහනු ලැබූ ආගම අනුව එතුමන්ලාගේ ආත්මයට සැනසීම ලැබේවා! කියාත් ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම, එම පවුල්වල දූවා දරුවන්, භාර්යාවන් ඇතුළු ඥාතීන් සියලු දෙනාට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ශෝකය පළ කරන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුලින්ම මා කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කළ, අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.එම්.ආර්. වූල බණ්ඩාර මැතිතුමා පිළිබඳව කෙටි අදහසක් පළ කරන්නට බලාපොරොත්තු වෙනවා. 1977 ඉඳලා 1988 දක්වා කාලසීමාව තුළ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් මේ උත්තරීතර සභාව නියෝජනය කළ ගරු වූල බණ්ඩාර මැතිතුමා, ආර්.එම්. කළුබණ්ඩා රත්නායක මහත්මයාට සහ සී.එම්. චන්ද්‍රසේකර මහත්මියට දාව 1949 වර්ෂයේ කුරුණෑගලදී ජන්ම ලාභය ලබා තිබෙනවා. එතුමා මූලික අධ්‍යාපනය හදාරා තිබෙන්නේ ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන්. පසුව උසස් අධ්‍යාපනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් හදාරා විද්‍යාවේදී උපාධිය ලබාගෙන තිබෙනවා. එතුමාගේ වෘත්තීය ජීවිතය එතුමා ආරම්භ කර තිබෙන්නේ රසායන හා භෞතික විද්‍යා ගුරුවරයෙක් වශයෙන්. ඊට පස්සේ කොළඹ නීති විද්‍යාලයට ඇතුළත් වෙලා නීතිය හදාරා නීතිඥයකු වශයෙන් එතුමාගේ වෘත්තීය ජීවිතය ආරම්භ කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා පළමුවෙන්ම පාර්ලිමේන්තුවට තේරී පත් වෙන්නේ 1991 වර්ෂයේදී. ඊටපස්සේ දෙවැනි වතාවටත් 1998 වර්ෂයේදී පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට එතුමා අවස්ථාව උදා කර ගන්නවා. පසුව දේශපාලන කටයුතුවලින් ඉවත්වෙලා එතුමා 2003 වර්ෂයේ ඉඳලා 2005 වර්ෂය දක්වා පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති වශයෙන් කටයුතු කර තිබෙනවා. එතුමා 1979 වර්ෂයේදී වෘත්තියෙන් ගණකාධිකාරිවරියක් වශයෙන් කටයුතු කළ ඩබ්ලිව්.එම්. රෝහිණී පුෂ්පා විජේරත්න මැතිනිය සමඟ විවාහ වෙලා දියණියන් දෙදෙනෙකුගේ සහ එක් පුතෙකුගේ පියෙකු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි, දේශපාලන පවුල් පසුබිමක් තිබෙන එතුමාගේ පියා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කළ බව. ඒ වාගේම, එතුමාගේ සොහොයුරෙකු වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයකු වශයෙන් කටයුතු කළා. ඒ වාගේම, තවත් සොහොයුරෙකු ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කරලා මේජර් ජනරාල්වරයකු වශයෙන් විශ්‍රාම ලබා තිබෙනවා.

ගරු වූල බණ්ඩාර මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තමන්ගේ පළාතට, දිස්ත්‍රික්කයට විශාල සේවාවක් ඉටු කළා. ඒ වාගේම, රාජ්‍ය තාන්ත්‍රිකයකු වශයෙන් පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපතිවරයා විධියට කටයුතු කරමින් එරට ජීවත් වන ශ්‍රී ලාංකික ජනතාවට තානාපතිවරයකු වශයෙන් ඉටු විය යුතු සේවාව නොපිරිහෙළා ඉටු කර තිබෙනවා.

එතුමා 2024 වර්ෂයේ දෙසැම්බර් මස 22වැනි දින අභාවප්‍රාප්ත වුණා. අභාවප්‍රාප්ත වන විට එතුමාගේ වයස අවුරුදු 75යි. එතුමාගේ අඩුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවට දැනෙනවා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මම, අභාවප්‍රාප්ත ගරු ආර්.එම්.ආර්. වූල බණ්ඩාර මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ දයාබර බිරිඳ, දරුවන් දෙදෙනා ඇතුළු පවුලේ ඥාතීන් සියලුදෙනාටම ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. G. G. Poonambalam, please.

[ 2.07 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Madam Presiding Member, we are gathered today to share our condolences with regard to seven former Members of Parliament. It is customary that regardless of

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

our political differences that we share the condolence events with all Members whom we are remembering today. In that sense, I would like to associate myself with the very pleasant comments that have been made with regard to all the Members so far.

I wish in particular, Hon. Madam Presiding Member, to say a few words with regard to the late Hon. Manicavasagar Kanagasabapathy Eelaventhan. I say this because I knew the Hon. Eelaventhan from the year, 2004. I first became a Member of Parliament in 2001 as a Member of the TNA representing the Jaffna Electoral District and the late Hon. Eelaventhan became an appointed Member of the National List through the TNA in 2004 and he remained a very active Member until he lost his seat in 2007.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திரு. எம்.கே. ஈழவேந்தன் அவர்கள் St John's College, Jaffnaஇலும் Wesley College, Colomboஇலும் தன்னுடைய படிப்பை மேற்கொண்டு, பிற்பாடு இலங்கை மத்திய வங்கியிலே சேவை ஆற்றினார். 1980ஆம் ஆண்டு சேவையிலிருந்து ஓய்வு பெற்றபொழுதும், அவர் மிகத் தீவிர தமிழ்த் தேசியவாதியாகத் தன்னை அடையாளப்படுத்தி இருந்தார். சேவையில் இருக்கும்பொழுதே அவருடைய அரசியல் நிலைப்பாடுகள் மிகத் தீவிரமாகப் பிரதிபலித்தன. அடிப்படையிலே ஒரு தமிழ்த் தேசியவாதி என்ற வகையிலே, ஆரம்பத்திலே அவர் இலங்கைத் தமிழரசுக் கட்சியைச் சார்ந்திருந்தார். ஆனால், ஈழவேந்தன் அவர்கள் மற்றைய அரசியல்வாதிகள் போன்றவர் அல்லர். கொள்ளை சார்ந்த பார்வையிலே அவர் மிகவும் இறுக்கமானவர். கட்சிக்கு விசுவாசமாக இருந்ததைவிட, கொள்கைக்கு விசுவாசமாகச் செயற்பட்ட ஒரு நபர் அவர். அந்த வகையிலே, தமிழரசுக் கட்சியினுடைய மிகவும் தீவிரமான ஒரு செயற்பாட்டாளராக ஈடுபட்டிருந்தாலும்கூட, காலப்போக்கிலே - 1960களிலே - கட்சியினுடைய அரசியல் பாதை தொடர்பான கொள்கையை எட்டுவது தொடர்பாக தமிழரசுக் கட்சிக்குள்ளேயே பலத்த விவாதங்கள் நடைபெற்ற பொழுது, தன்னுடைய கொள்கையை அடைவதற்கு, தான் அறிந்த விசுவாசமான பாதையில் இருக்க வேண்டும் என்பதற்காக அவர் கட்சியை விட்டு விலகி, தமிழரசுக் கட்சியினுடைய மூளையாகக் கருதப்பட்ட வி. நவரட்ணம் ஐயாவுடன் சேர்ந்து கொண்டார். அதற்குப் பிற்பாடு, 1977ஆம் ஆண்டு தமிழ்க் கட்சிகள் விசேடமாக, தமிழரசுக் கட்சியும் அகில இலங்கைத் தமிழ்க் காங்கிரஸும் ஒன்றுசேர்ந்து தமிழர் விடுதலைக் கூட்டணி என்ற ஒரு விடுதலை அரசியலை நோக்கிய ஒரு கட்சியை ஸ்தாபித்த பொழுது, திரு. ஈழவேந்தன் அவர்கள் அந்த அமைப்புடன் சேர்ந்தார்.

அவருடைய அரசியல் வாழ்க்கையைப் பார்த்தால், தன்னுடைய கொள்கையில் மிகவும் நேராகப் பயணித்தவர். அந்தப் பாதையில் சூழல் மாறி, நட்பு சக்திகளும் எதிரிகளும் உருவாகியதே தவிர, அவர் பாதையை மாற்றியதனால் அவ்வகையான நிலைமைகளை உருவாக்கவில்லை. அந்த வகையிலே, நான் ஒன்றைக் குறிப்பிட வேண்டும். திரு. ஈழவேந்தன் அவர்கள் மிகத் தீவிரமான ஒரு தமிழ்த் தேசியவாதியாக, தமிழரசுக் கட்சியுடைய மிகவும் தீவிர உறுப்பினராக, இளைஞராகச் செயற்பட்ட பொழுதிலும், அவர் விரும்பிக் கலியாணம் முடித்த அம்மையார் அகில இலங்கைத் தமிழ்க் காங்கிரஸ் கட்சியைச் சார்ந்தவராக இருந்தார். அன்றைக்குத் தமிழரசுக் கட்சியினரும் தமிழ்க் காங்கிரஸினரும் பரம விரோதிகளாகப் பார்க்கப்பட்டார்கள். அத்தகைய ஒரு காலகட்டத்திலே, தமிழ்க் காங்கிரஸினுடைய மண்டைதீவு, அல்லைப்பிட்டி, மண்கும்பான் Village Councilsஇன் தவிசாளருடைய மகளை அவர் விரும்பிக் கலியாணம் முடித்தார். நான் எதைக் குறிப்பிடுகின்றேன் என்றால், திரு. ஈழவேந்தன் அவர்கள் தனது கொள்கையிலே மிகவும் இறுக்கமாக இருந்தாலும்கூட, அவருடைய அந்தக் கொள்கைக்கு வித்தியாசமாகச் சிந்திக்கின்றவர்களோடு பழகுவதற்கு அவருடைய கொள்கை ஒரு தடையாக ஒருபோதும் இருக்கவில்லை என்பதைத்தான். எந்தளவு தூரத்துக்கு அவர் முற்போக்குவாதி என்றால், முற்றிலும் வித்தியாசமாகப் பார்க்கக்கூடிய ஓர் அரசியல் சித்தாந்தத்தில் இருந்து வருகின்ற ஒரு நபரை முழுமையாக அரவணைப் பதற்குத் தயாராக இருந்தவர் அவர். தன்னுடைய வாழ்நாளை அவருடன் கழிப்பதற்குத் தீர்மானித்தார்.

காலஞ்சென்ற திரு. ஈழவேந்தன் அவர்களுடன் 2004ஆம் ஆண்டு முதல் மிகவும் நெருங்கிப் பழகக்கூடிய வாய்ப்பு எனக்குக் கிடைத்தது. தமிழ்த் தேசியக் கூட்டமைப்பு அப்பொழுது ஒற்றுமையின் அடையாளமாகத் திகழ்ந்தது. தமிழ்க் கட்சிகள் பல வருடங்களுக்குப் பிறகு அரசியலில் ஒற்றுமையின் அடையாளமாகத் திகழ்வதற்கு திரு. ஈழவேந்தன் அவர்களின் பங்களிப்பானது மிகவும் ஆரோக்கியமானதாக இருந்தது. தலைமைத்துவத்துக்குப் பயந்து தன்னுடைய மனசாட்சிக்கு நேர்மையான கருத்தைச் சொல்வதற்கு அவர் எந்தவிதத்திலும் தயங்கவில்லை. மனிதர்களுடன் அவர் மிகவும் அன்னியோன்னியமாகத்தான் பழகுவார்; முரண்படுவதில்லை. ஆனாலும், அரசியல் ரீதியாகச் சொல்ல வேண்டிய கருத்துகளை அவர் எந்தவொரு சந்தர்ப்பத்திலும் சொல்வதற்குத் தயங்கவில்லை. அவருடைய அந்தப் பண்பு என்னை மிகவும் கவர்ந்தது.

நான் 25 வயதில் அரசியலுக்குள் நுழைந்தேன். என்னுடைய அரசியல் காலத்தில் எனது தந்தையாரை இழந்திருந்தேன். அந்த நேரத்தில், எவ்வகையானதோர் அரசியல் கலாசாரத்தை நான் கடைப்பிடிப்பதற்கு விரும்புகின்றேன் என்ற பலமான விவாதம் என் மனதுக்குள்ளே நடைபெற்றுக்கொண்டிருந்தது. அந்தக் காலகட்டத்தில் திரு. ஈழவேந்தன் அவர்களுடைய செயற்பாடுகள், அவருடைய பண்புகள், விசேடமாக அவர் தனது மனசாட்சிக்கு நேர்மைத் தன்மையுடன் செயற்படுவது என்னை மிகப் பெரியளவில் கவர்ந்தது.

பாராளுமன்றத்தில் நடைபெறுகின்ற நினைவஞ்சலி நிகழ்வில் நான் நிச்சயமாக அவர் தொடர்பான என்னுடைய கருத்துகளையும் அவர்மீது எனக்கிருந்த மரியாதையையும் பதிவு செய்ய வேண்டும் என்ற அடிப்படையிலே நான் மிகவும் விரும்பிக் கலந்துகொள்கின்றேன். திரு. ஈழவேந்தன் அவர்கள் கடனாவுக்குச் சென்று asylum கேட்டு, அங்கு தனது வாழ்நாளின் கடைசி நாட்களைக் கழித்தார். அவர் கடனாவுக்குச் சென்றிருந்தாலும்கூட, தன்னுடைய தாயகத்தை, தன்னுடைய மக்களை அவர் மறக்கவில்லை. வயது முதிர்ந்து, கஷ்டப்பட்ட காலத்திலும்கூட தொடர்சியாக விசேடமாக, இலங்கையில் இருக்கின்ற தமிழ் மக்கள் தொடர்பாகத் தன்னுடைய கருத்துகளைத் தெரிவித்தது மட்டுமல்லாமல், அங்கு ஓர் அரசியல் செயற்பாட்டாளராக தனது கடைசிக்கால வாழ்க்கையை முழுமையாக அவர் ஈடுபடுத்தினார். அவர் அரசியல் கோணத்திலே செயற்பட்டபோதிலும், திரு. ஈழவேந்தன் அவர்களை அழைக்காமல் புலம்பெயர்ந்த தமிழ் மக்கள் கனடாவில் கலாசார ரீதியான நிகழ்வுகளை நடாத்துவது இல்லை. அந்த அளவுக்கு அவர் மரியாதைக்கு

உரியவராக கனடாவில் புலம்பெயர்ந்து வாழ்ந்த தமிழ் மக்களால் மட்டுமன்றி, அங்கு பிறந்து வளர்ந்தவர்களாலும்கூட நேசிக்கப்பட்டார். அவரது பண்புகள் மக்களால் மிகவும் கவரப்பட்டன. அத்தகைய ஒருவராகத்தான் அவர் தனது இறுதி மூச்சை விட்டார்.

இன்று பாராளுமன்றத்தில் இருக்கின்ற தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்களை எடுத்துக்கொண்டால், திரு. ஈழவேந்தன் அவர்களோடு இணைந்து பாராளுமன்றத்தில் செயற்பட எனக்கு மட்டும்தான் வாய்ப்புக் கிடைத்திருந்தது. அவருடைய அரசியல் பயணம் குடும்பத்தினருடைய பங்களிப்பு இல்லாமல் நடைபெற்றிருக்க முடியாது. அவரை மிகப்பெரிய ஒரு சொத்தாக நாங்கள் கருத வேண்டும். அந்த வகையில், தமிழ்த் தேசிய அரசியலில் அவர் முழுமையாக ஈடுபடுவதற்கு உதவிய அவரது குடும்பத்தினருக்குத் தலைவணங்கி, அவருக்கு இந்த இடத்தில் அஞ்சலி செலுத்துகின்றேன். If I just mention in English a sentence to depict the late (Hon.) Eelaventhan, I would say: "You can take the late (Hon.) Eelaventhan out of politics, but you cannot take politics out of the late (Hon.) Eelaventhan."

Thank you

[අ.භා. 2.19]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පාර්ලිමේන්තුවේ අපිත් එක්ක, මාත් එක්ක එකට වැඩ කරපු, එකට ජනතා සේවය කරපු මන්ත්‍රීවරු 7දෙනෙක් වෙනුවෙන් තමයි අද දින ශෝක ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ.

මට මතකයි, 1989දී අපිත් එක්කම පාර්ලිමේන්තුවට ආපු හීන්මහත්මයා ලියනගේ මන්ත්‍රීතුමා. එතුමා එදා සිටියේ විපක්ෂයේ, අපි සිටියේ ආණ්ඩු පක්ෂයේ. අපි පක්ෂ දෙකක සිටියත් අපේ මිත්‍රත්වයට ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ. එතුමා අප සමඟ බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළා. එතුමා ගුරුවරයකු විධියට රාජකාරි ආරම්භ කරලා, 1980 ජූලි වර්ජනයේදී තම පක්ෂය වෙනුවෙන්, තම අයිතීන් වෙනුවෙන් වර්ජනය කරන්න ගිහිල්ලා එතුමාගේ රැකියාව නැති වුණා. නමුත් ඒක එතුමාට ප්‍රශ්නයක් වුණේ නැහැ. මොකද, එතුමා යමක් කමක් තිබෙන පවුලක, ප්‍රදේශයේ ගෞරවනීය පවුලක සාමාජිකයෙක් වූ නිසා.

ඊළඟට එතුමා දේශපාලන කඳවුර ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තෝරා ගත්තා. 1989දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් රත්නපුර දිස්ත්‍රික්කයෙන් මන්ත්‍රීවරු දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් තමයි පාර්ලිමේන්තුවට ආවේ. එතුමාත් එදා මන්ත්‍රීවරයකු විධියට පාර්ලිමේන්තුවට ආවා. එතුමාට පුළුවන්කම ලැබුණා පිට පිට වාර තුනක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට තේරී පත් වෙන්න. ඒක තමයි එතුමාගේ ප්‍රදේශයේ, එතුමාගේ ගමේ එතුමාට තිබුණු ජනප්‍රියතාව. එතුමා වතු යටිතල පහසුකම් සහ පශු සම්පත් නියෝජ්‍ය ඇමතිවරයා විධියට කටයුතු කළා. එතුමා මැතිවරණයෙන් පරාජය වෙනකල් සිටියේ නැහැ, දේශපාලනයෙන් අයින් වුණා. එතුමා කොච්චර ගෞරවනීය, වැදගත්, ජනතාවගේ කැමැත්ත ගත් දේශපාලනඥයෙක්ද කියතොත්, එතුමාගේ පුත්‍රයා වන වරුණ ලියනගේ මන්ත්‍රීතුමා දේශපාලනයට යොමු කළා. වරුණ ලියනගේ මැතිතුමා අපේ කඳවුරට එකතු වුණා. එතුමා අද රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවත් එක්ක වැඩ කරන හොඳ දේශපාලනඥයෙක්. ඒක නිසාම එතුමාට කිහිප වාරයක් පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම ලැබුණා. පියාගේ ගමන් මඟත්, එතුමාගේ දක්ෂතාවත් සහ හැකියාවත් නිසා එතුමාට මේ ගමන එන්න පුළුවන් වෙලා තිබෙනවා. වරුණ ලියනගේ මන්ත්‍රීතුමා වාගේ පුතෙක් දේශපාලනයට යොමු කිරීම ගැන අපි හීන්මහත්මයා ලියනගේ මැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

හීන්මහත්මයා ලියනගේ මැතිතුමා කලක් ශ්‍රී ලංකා කප් සංස්ථාවේ සභාපති විධියටත් කටයුතු කළා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් දේශපාලන කාර්යයන් කිහිපයක් ඉෂ්ට කරලා තිබෙනවා.

හීන්මහත්මයා ලියනගේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එම මැතිනියටත්, වරුණ ලියනගේ මන්ත්‍රීතුමා ඇතුළු එතුමාගේ අනෙක් දරුවන්ටත් සමගි ජන බලවේගයේ අපේ කනගාටුව, ශෝකය පිරිනමනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අභාවප්‍රාප්ත චූල බණ්ඩාර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මගේ හොඳ මිත්‍රයෙක්. එතුමා ජනතා සේවයට කැප වුණ පවුලක සාමාජිකයෙක්. එතුමාගේ පියා මේ රටේ 1977 දේශපාලන විප්ලවයේ සාමාජිකයෙක් වුණා; පඬුවස්නුවර මන්ත්‍රීවරයා වුණා. ඒ වාගේම එතුමාගේ සහෝදරයා, වයඹ පළාතේ මහ ඇමති විධියට කලක් සේවය කළ නිමල් බණ්ඩාර මැතිතුමාත් මගේ බොහොම කිට්ටු මිත්‍රයෙක්. මා එතුමාත් සිහිපත් කරන්න ඕනෑ. චූල බණ්ඩාර මැතිතුමා දෙවරක් මේ පාර්ලිමේන්තුවේ අප සමඟ එකට කටයුතු කළා. නීතිඥ වෘත්තියට ප්‍රධාන තැන දුන් එතුමා මේ රටේ නීතිඥ ක්ෂේත්‍රයේ හිටපු බොහොම දක්ෂ නීතිඥයෙක් වුණා. මම හිතන විධියට දේශපාලනය තුළ හීන්මහත්මයා ලියනගේ මැතිතුමාගේත්, චූල බණ්ඩාර මැතිතුමාගේත් පවුල්වලට කළු පැල්ලම් නැහැ. එතුමන්ලා බොහොම වැදගත්, ගෞරවනීය දේශපාලනයක් කළේ. චූල බණ්ඩාර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ දයාබර මැතිනිය වන රෝහිණී පුෂ්පා බණ්ඩාර මැතිනියට, දරුවන්ට මාගේත්, අපේ පක්ෂයේත් -සමගි ජන බලවේගයේ- කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලොහාන් රත්වත්තේ මැතිතුමා ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ පුත්‍රයා. ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා මේ රට තිස් අවුරුදු යුද්ධයෙන් බේරා ගන්න කටයුතු කළ ගෞරවනීය ඇමතිවරයෙක්. එතුමාගේ පුත්‍රයා විධියට තමයි ලොහාන් රත්වත්තේ මැතිතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. එතුමා බොහොම පෙරළිකාර මන්ත්‍රීවරයෙක්. එතුමාට ශක්තියක් තිබුණා, ඕනෑ දෙයක් වෙනුවෙන් ඉදිරිපත් වෙන්න. එතුමාගේ පක්ෂය වෙනුවෙන්, නායකයා වෙනුවෙන් එතුමා කොයි වෙලාවේත් කැප වුණා. එතුමා මහාමාර්ග සංවර්ධන රාජ්‍ය ඇමති ධුරය, මැණික් හා ස්වර්ණාභරණ කටයුතු රාජ්‍ය ඇමති ධුරය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමේ රාජ්‍ය ඇමති ධුරය වාගේ ඇමතිකම් කිහිපයක් දැරුවා. නමුත් එතුමා තරුණ වයසේදීම අප අතරින් වෙන් වුණා. එතුමාගේ අභාවය වෙනුවෙන් අපි ඒ පවුලට, ඒ මැතිනියට, දරුවන්ට අපේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා බොහොම උගත් දේශපාලනඥයෙක්. එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන කටයුතුවලට එතුමා බොහොම තරුණ කාලයේදීම සම්බන්ධ වෙලා, ඒවාට අනුගත වුණා. එතුමා දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේ සභිකයකු විධියට කටයුතු කළා. 1989දී එතුමාත් අප සමඟ පාර්ලිමේන්තුවට තේරී පත්

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

වුණා. අපි අතර බොහොම කිට්ටු මිත්‍රත්වයක් තිබුණා. මන්ත්‍රීකම නැති වුණාට පසුවත් කොතැනදී දැක්කත් එතුමා අප සමඟ බොහොම සහෝදරත්වයෙන් කටයුතු කළා. අවුරුදු 10කට අධික කාලයක් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විධියට එතුමා කටයුතු කළා. එතුමා කොච්චර දක්ෂයෙක්ද කිව්වොත්, විදේශීය තානාපති සේවයේ නිලධාරියකු විධියටත් අවුරුදු ගණනක් කටයුතු කළා. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ මැතිනියටත්, දරුවන්ටත්, මාගේත්, අපේ පක්ෂයේත් කනගාටුව ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා 1989දී මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. මම හිතන හැටියට එතුමා පාර්ලිමේන්තුවට ආවේ ජාතික ලැයිස්තුවෙන්, උගත් පුද්ගලයකු විධියට. එතුමා කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූලික උපාධියත්, ඇමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියත් හිමි කර ගත්තා. එතුමා අප සමඟ එකට කටයුතු කළා. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ අයටත්, බිරිඳටත්, දරුවන්ටත් අපේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වයි.ජී. පද්මසිරි මැතිතුමා ගමේ ජනතාවත් එක්ක හිටපු දේශපාලනඥයෙක්. වමේ දේශපාලනය මේ රටින් අයින් වෙලා යද්දී, වමේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට පත් නොවුණු වෙලාවක එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයෙන් මන්ත්‍රීවරයකු විධියට පාර්ලිමේන්තුවට තේරී පත් වුණා.

එතුමා ගමේ මිනිස්සුත් එක්ක හිටපු මනුෂ්‍යයකු විධියට මා හඳුන්වනවා. එතුමා ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රධාන නායකයෙක්. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ අයට අපේ පක්ෂයේත්, මගේත් කනගාටුව ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභාවප්‍රාප්ත ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්ද්‍රන් මැතිතුමා එතුමා නියෝජනය කළ ජනතාව වෙනුවෙන්, ඒ වාගේම රටේ සියලුදෙනා වෙනුවෙන්, ජාතික සමඟිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු මන්ත්‍රීවරයෙක්. එතුමා කොයි පක්ෂයේ හිටියත්, අපිත් එක්ක එකට කටයුතු කළා.

එතුමාගේ දයාබර බිරිඳටත්, දරුවන්ටත් අපේ ශෝකය ප්‍රකාශ කරමින්, අභාවප්‍රාප්ත මේ සියලු මන්ත්‍රීවරුන්ට අපේ ආගම අනුව නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි ඇමතිතුමා.

[අ.භා. 2.28]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ අභාවප්‍රාප්ත හිටපු ගරු මන්ත්‍රීවරුන් හත්දෙනෙකු වෙනුවෙන් ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන මේ අවස්ථාවේ මටත් කථා කරන්න අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අභාවප්‍රාප්ත ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා, ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා, ගරු ආර්.එම්.ආර්. වුල බණ්ඩාර මැතිතුමා සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්ද්‍රන් මැතිතුමා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අභාවය වෙනුවෙන් තමයි අද මේ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ මන්ත්‍රීවරු හත්දෙනාගේම පවුල්වල අයටත්, ඥාතීන් සියලුදෙනාටත් රජය හැටියට අපගේ ශෝකය ප්‍රකාශ කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මම මෙය අවස්ථාවක කර ගන්නවා කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ආසනය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ, අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා සම්බන්ධයෙන් කෙටි සඳහනක් කරන්න. එතුමා 2010 අප්‍රේල් මාසයේ පැවැති මහ මැතිවරණයෙන් තේරී පත්ව මන්ත්‍රීවරයෙකු හැටියට මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා 2013 වර්ෂයේ සිට කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයා හැටියටත් කටයුතු කළා. ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා රුවන්වැල්ල ආසනය නියෝජනය කරමින්, කෑගල්ල දිස්ත්‍රික්කයට, කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල වැඩ කොටසක් කරන්න මැදිහත් වූ කෙනෙක්. ඒ වාගේම, එතුමා ලංකා සමසමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක්.

එතුමාගේ විශේෂ ගුණාංගය වුණේ මේකයි. එතුමා කුඩා කළ සිටම වාමාංශික දේශපාලනයට ප්‍රවේශ වෙලා, ප්‍රගතිශීලී දේශපාලනයට ප්‍රවේශ වෙලා එතුමාගේ ස්ථාවරය රැක ගනිමින් ජනතාවට සේවය කිරීමේ වුවමනාව වෙනුවෙන්, ප්‍රගතිශීලී සමාජයක්, සමානාත්මතාව සහිත සමාජයක් ගොඩ නැඟීමේ වුවමනාව වෙනුවෙන් කටයුතු කළා. එතුමා විශ්වාස කළ, ඒ මොහොතේ සාධාරණ යැයි හිතුණු දේශපාලනයත් සමඟ ඒ සඳහා එතුමා මැදිහත් වුණා. විශේෂයෙන්ම අපි දකින එතුමාගේ ගුණාංගය මේකයි. එතුමාගේ දේශපාලන ස්ථාවරය තුළ රැඳී සිටීමට එතුමාගේ ප්‍රතිපත්තිය වෙච්ච සාධාරණ සමාජයක් ගොඩනැඟීම වෙනුවෙන් එතුමා ගත්ත ප්‍රතිපත්තිමය තීරණය කිසි විටෙක වෙනස් කළේ නැහැ. එතුමා පොතක් පළ කළා. ඒ තමයි, "පළාත් සභාවෙන් පාර්ලිමේන්තුවට ආ ගිය ගමනේ කළ කී දෑ" කියන පොත. ඒ ග්‍රන්ථයේ "පිදුම" යන කොටසේ එතුමාගේ ආරම්භක දේශපාලනය සම්බන්ධ කරුණු සඳහන් කරනවා.

"පිදුම" යටතේ මෙසේ සඳහන් වනවා:

"මා දේශපාලනයට යොමු කළ
නව හැවිරිදි වියේ වූ මා ලවා රුවන්වැල්ල ආසනයට
ලංකා සමසමාජ පක්ෂයෙන් ඉදිරිපත් වූ අපේක්ෂක
එච්.ජී. සෝමබන්දු මහතාට රතු මල් මාලයක් පැලඳවීම, 1964 දී
පැවැත්වූ වාමාංශික එක්සත් පෙරමුණු මැයි රැලියට මා
කැටුවයාම ආදී දේශපාලන ඇල්මක් ඇති කිරීමට
මා පෙලඹ වූ
මාගේ ආදරණීය මෑණියන් වන ..."

කියලා. එතුමා තමන්ගේ මෑණියන්ට සහ පියාණන්ට ඒ පොත පිරිනමනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා අපේ රටේ දේශපාලන ඉතිහාසයේ ඉතාම ඓතිහාසික අවස්ථාවක් වුණු 1964 වාමාංශික එක්සත් පෙරමුණ ගොඩනඟන අවස්ථාවේදී නව හැවිරිදි වියේ දරුවෙක් හැටියට තමයි ප්‍රගතිශීලී දේශපාලනයට ප්‍රවිෂ්ට වෙලා තිබෙන්නේ. එතුමා කුඩා කාලයේ

සිටම එම දේශපාලන ධාරාවේ ගමන් කරමින් ප්‍රතිපත්ති ගරුක දේශපාලනයක යෙදීමට කටයුතු කළා.

එතුමා එම පොතේ ආරම්භයේදී මෙහෙම කියනවා:

"මා හැදී වැඩුණේ රුවන්වැල්ල මංසන්ධියේ පොල් අතු සෙවිලි කළ ලැලිබිත්තිවලින් සැදි කුඩා නිවසක ය. එම නිවසේ වහලය මත 1936 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයේදී ඇන්.එම්. පෙරේරා මැතිතුමා වෙනුවෙන් රතු කොඩියක් ලෙළදුන් ස්ථානයකි. එදා ඒ රතු කොඩිය එසවූයේ මගේ පියාගේ මෑණියන් වූ දුප්පත් එඩිතර කාන්තාවකි. ඇය නමින් 'එලිසහාමිය'.

අපේ තාත්තා වෘත්තියෙන් රියදුරෙකි. ලොරි රියදුරෙකි. එතුමා වැඩ කළ ලොරිවලින් යාපනය, ත්‍රිකුණාමලය, පුත්තලම, ගාල්ල ආදී දුර බැහැර ප්‍රදේශ දැක බලා ගැනීමට ළමා අවධියේ දීම මට අවස්ථාව ලැබුණා. තාත්තා සමසමාජ නායකයින් හා ඔවුන්ගේ ක්‍රියාවන් ඇලුම් කළ අයෙකි. ඡන්ද කාලවලදී උද්යෝගිමත්ය. තාත්තාගේ සහෝදර පිරිස ද එසේමය."

එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ආසනය නියෝජනය කළේ. අපි දන්නවා, වාමාංශි දේශපාලනයේ තිඹිරි ගෙය තමයි රුවන්වැල්ල ආසනය. එම ආසනයේ වාමාංශික පවුලක හැදී වැඩිලා, ඒ ආභාෂය සහිතව දේශපාලනයට පිවිසුණු පුද්ගලයෙක් තමයි ගරු වයි.ජී. පද්මසිරි මහතා. එතුමා ප්‍රභූ දේශපාලන පවුලක නොවෙයි, සාමාන්‍ය පවුලක ඉපදී තමන් දැකපු ඒ දැක්ම අනුව මේ රට වෙනුවෙන්, සමාජය වෙනුවෙන් දේශපාලනයට පිවිසිලා පාර්ලිමේන්තුව දක්වා අවිල්ලා, නියෝජ්‍ය ඇමති ධුරයක් දක්වා ගමන් කළ දේශපාලනඥයෙක්.

එතුමා මැතිවරණ දේශපාලනයට ආවේ කොහොමද කියන එක සම්බන්ධයෙන් මේ පොතේ විග්‍රහ කරනවා. එහි මෙසේ සඳහන් වනවා:

"මා මැතිවරණ දේශපාලනයට අවතීර්ණය වූයේ කෙසේද? යන්න වැදගත් වේ.

සමාජවාදී සමාජයක් පිළිබඳ සිහිනය සැබෑ කර ගැනීම සඳහා මිස වෙනත් දෙයක් ගැන අපේක්ෂා නොකළෙමි. සමසමාජ පක්ෂයෙන් ගම් සභා, සුළු නගර සභා හෝ මැතිවරණ තරග කරන අවස්ථාවලදී පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන් කළ හැකි දේ කිරීම, තරුණ, කාන්තා, ශිෂ්‍ය සංවිධානය පිහිටුවීම, සමසමාජ ජන දින පත්තරවලට ලිපි ලිවීම, ප්‍රාදේශීය වාර්තා ලිවීම, ඉතා කැමැත්තෙන් ඉටු කළෙමි. ලේඛන ක්ෂේත්‍රයේදී මාගේ ප්‍රථම අත්දැකීම වූයේ 1966දී පමණ සාමාන්‍ය පෙළ පන්තියේදී 'රණබිම' නමින් අතින් ලියූ දේශපාලන පුවත්පතක් සහෝදර ශිෂ්‍යයන් අතරේ බෙදා හැරීමයි. එය පිටපත් 05ක් පමණ පාසැල් දෙකක ශිෂ්‍ය සහෝදරයින්ගේ ඉල්ලුමට භාජනය විය. එක්සත් ජාතික පක්ෂ විරෝධී ආණ්ඩු විරෝධී මත ප්‍රකාශ කිරීමට ප්‍රථම හුරුව ලැබුණේ එම රණබිම පුවත්පත තුළිනි."

එතුමා කුඩා කාලයේ ඉඳලාම වාමාංශික දේශපාලනයට පිවිසිලා ඔහුගේ දැක්ම අනුව, ඔහුගේ ප්‍රතිපත්තිය තුළ ඉතාම දුෂ්කර අවස්ථාවන්වලදී පවා රැඳී සිටිමින් කටයුතු කළා. විශේෂයෙන් මේ අවස්ථාව අපි වයි.ජී. පද්මසිරි මැතිතුමාගේ පවුලේ අයටත්, විශේෂයෙන් ඔහුගේ බිරිඳට සහ ඔහුගේ දියණියටත් අපගේ ශෝකය ප්‍රකාශ කරන්න අවස්ථාවක් කර ගන්නවා.

රුවන්වැල්ල ආසනය, කෑගල්ල දිස්ත්‍රික්කය කියන්නේ ප්‍රගතිශීලී දේශපාලනයේ නිජබිම; තිඹිරිගෙය. අද ඒ අඩුව පිරවීම සඳහා ඒ වාමාංශික දේශපාලනයේ ගමන්මඟ, ප්‍රගතිශීලී දේශපාලනයේ ගමන්මඟ අරගෙන යාම සඳහා වයි.ජී. පද්මසිරි මැතිතුමාගෙන් හිස් වුණු ඒ ප්‍රගතිශීලී දේශපාලනය නියෝජනය කරන්න අවශ්‍ය කරන කටයුතු අපි කරමින් ඉන්නවා. ඒ ජනතාව සඳහා අවශ්‍ය කරන සියලු සේවාවන් සිදු කර මේ රට තුළ සාධාරණ සමාජයක්, යහපත් සමාජයක් ගොඩනඟන්න මැදිහත් වෙන්න කටයුතු කරන බවට අපි පොරොන්දු දෙනවා. නැවත වතාවක් එතුමන්ලාගේ පවුල්වල අයට සහ ඥාතීන්ට අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, මගේ කෙටි වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා.

[අ.භා. 2.37]

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දිනයේදී විශේෂයෙන් මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරපු ගරු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් හත්දෙනෙකු පිළිබඳව ශෝක ප්‍රකාශ කරන විවාදයේ දී මට කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා පිළිබඳව ප්‍රථමයෙන් වචනයක් කථා කරන්න ඕනෑ. එතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරලා අද අපි අතර නොහිටියත් එතුමා ගෙනාපු වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා අද රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ඊට අවශ්‍ය කරන හයිය, ශක්තිය එකතු කිරීම පිළිබඳව අපි විශේෂයෙන් සතුටු වෙනවා.

එතුමා ගුරුවරයෙකු හැටියට අවුරුදු 13ක කාලයක් රාජ්‍ය සේවයේ ඉඳලා ඒ වාගේම රක්වාන ආසනය, පැල්මඩුල්ල ආසනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය -වාමාංශික බලකොටුව- නියෝජනය කරමින් වසර ගණනාවක් පුරා ඒ ආසනවලට, දිස්ත්‍රික්කයට නායකත්වය දෙන්න කටයුතු කළා. එතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරපු අවුරුද්දක කාලයේදී වුණත් තමන් නියෝජනය කරන ජනතාවට, රත්නපුර දිස්ත්‍රික්කයට ඊට අවශ්‍ය කරන හයිය, ශක්තිය එකතු කරන්න සෘජුව මැදිහත් වෙලා කටයුතු කළා. අද දිනයේදී එතුමාට දක්වන්න පුළුවන් ලොකුම ගෞරවය තමයි, ඒ කළා වූ ශ්‍රේෂ්ඨ කාර්යභාරය තවදුරටත් ඉදිරියට, නිවැරැදිව, ශක්තිමත්ව අරගෙන යන එක. ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා එතුමා නියෝජනය කරනවා හා සමානවම මේ පාර්ලිමේන්තුව දෙවන වරටත් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්.

අද දිනයේදී එතුමා නියෝජනය කරමින් මේ ස්ථානයට පැමිණි ඥාති හිතමිත්‍රාදීන් සහ අපේ වරුණ ලියනගේ සහෝදරයාට අපේ කනගාටුව ප්‍රකාශ කරන ගමන්, හීන්මහත්මයා ලියනගේ මැතිතුමාට නිවන් සුව ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා නියෝජනය කරන්නේත් මහනුවර දිස්ත්‍රික්කය. ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න කලින් දේශපාලන ගමන ආරම්භ කළේ මධ්‍යම පළාත් සභාව නියෝජනය කරමින්. මධ්‍යම පළාත් සභාව නියෝජනය කරමින් දේශපාලනයට පිවිසි ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා 2010දී පාර්ලිමේන්තුවට තේරී පත්ව, තුන් වතාවක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් මහනුවර දිස්ත්‍රික්කයට විශාල වැඩ කොටසක් ඉටු කළා. එතුමාගේ පියා වන අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාත්, මගේ පියා වන දි.මු. ජයරත්න මැතිතුමාත් දේශපාලනය කළේ සමකාලීනව. අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා කියන්නේ මහනුවර දිස්ත්‍රික්කයට -කන්ද උඩරටට- සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරපු නායකයෙක්. එතුමා ඉටු කළා වූ එම කාර්යභාරය එතැනින් ඉදිරියට ගෙන යමින්, මහනුවර දිස්ත්‍රික්කය වෙනුවෙන් ඒ වගකීම භාර ගෙන කටයුතු කරන්න ඉදිරිපත් වෙච්ච මන්ත්‍රීවරයා තමයි, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා.

[ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා]

විශේෂයෙන්ම කියනවා නම්, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා ඇතුළු අපි ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කරපු කණ්ඩායමක්. සමහර වෙලාවට ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාව සමාජයේ ඇතැම් පිරිස් විවිධ විධියට දැකපු අවස්ථා තිබුණා. හැබැයි, ඒකට හේතුවකුත් තිබුණා. ඒකට හේතුව තමයි, එතුමා යම් අදහසක් ප්‍රකාශ කළා නම්, ඒ අදහසට කවුරු කැමැති වුණත්, අකැමැති වුණත් එය සෘජුව ප්‍රකාශ කිරීම. එතුමාට කිසිම තැනකදී අනෙක් අය මොන විධියටද හිතන්නේ, කින්ද-මන්ද කියන කාරණය නොවෙයි වැදගත් වුණේ. එතුමා දැරූ මතවාදය නිවැරදියි කියා හිතුවා නම්, ඒක කෙළින්ම කියන්න ඕනෑම සභාවකදී, ඕනෑම තැනකදී එතුමා ඉදිරිපත් වුණා.

ඒ වාගේම අපි හැම දාම වාමාංශික කඳවුර ආරක්ෂා කරන්න, වාමාංශික කඳවුරේ නායකයන් ආරක්ෂා කරගන්න, ඔවුන්ව ආරක්ෂා කරගෙන දේශපාලන වශයෙන් ඉහළට ගෙනෙන්න අවශ්‍ය කටයුතු කළා. ඒ හැම අවස්ථාවකදීම කැපවීමෙන් කටයුතු කළ කෙනෙක් තමයි, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා. අපි දේශපාලන වශයෙන් මහනුවර දිස්ත්‍රික්කය තුළ ශක්තිමත් වැඩ පිළිවෙළක් ගෙන ගියා පමණක් නොවෙයි, 2019 වසර වෙනකොට ලංකාව පුරා යම් වැඩ පිළිවෙළක් ගෙන ගියා නම්, ඒ හැම කටයුත්තකදීම නායකත්වය අරගෙන ඊට අවශ්‍ය ශක්තිය එකතු කරපු පුද්ගලයෙකු තමයි ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා. අපි රජයක් හැදුවා නම්, අපි යම් ශක්තියක් ගොඩනැඟුවා නම්, ඒ වාගේම මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ බලය ලබා ගෙන මේ රට මෙහෙය වන යම් වගකීමකට අපි ගියා නම් ඒ කාර්යභාරය තුළ හැම දාමත් ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා මූලිකත්වය ගෙන කටයුතු කළා.

එතුමා බොහොම දරදඬු නායකයෙක් කියලා සමහර අවස්ථාවලදී සමහරුන්ට හිතෙන්න පුළුවන්. මොකද එතුමා ගත් තීන්දුවක්, මතවාදයක්, අදහසක් කිසිම වෙලාවක ආවට ගියාට වෙනස් කළේ නැහැ. අභ්‍යන්තරිකව මොන ප්‍රශ්න දැක්කත්, විවේචන එල්ල වුණත්, හිතපු කාරණා ඉටු කරගන්න බැරි වුණත්, ඒ හැම අවස්ථාවකදීම ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා එතුමා දරපු මතය වෙනුවෙන්, අදහස වෙනුවෙන් -අනෙක් අය කැමැති වුණත්, අකැමැති වුණත්- සෘජුව සිටිමින් කටයුතු කළා, ඒ දීර්ඝ දේශපාලන ගමන තුළ.

මේ අවස්ථාවේදී මම එතුමාගේ සහෝදරයන් දෙපළ වන චානුක රත්වත්තේ මැතිතුමාත්, මහේන් රත්වත්තේ මැතිතුමාත් සිහිපත් කරන්න ඕනෑ. මහේන් රත්වත්තේ මැතිතුමා අද වෙනකොට මහනුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ නිලමේවරයා හැටියට කටයුතු කරනවා. පසුගිය කාල වකවානුව තුළ එතුමා මහනුවර මහ නගර සභාවේ නගරාධිපතිවරයා හැටියටත් කටයුතු කළා. ඒ කාලය තුළ නගරය තුළ බොහෝ වෙනස්කම් සිදු කරන්න, බස් නැවතුම්පොළවල වෙනස්කම් කරන්න, වැඩිදියුණු කිරීම් කරන්න එතුමා කටයුතු කළා. එදා අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා මහනුවර දිස්ත්‍රික්කය මූලික කරගෙන වැඩ කටයුතු කළා හා සමානවම මෙතුමන්ලාත් එම වැඩ කටයුතු කළා. මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කණ්ඩායමක් හැටියට කටයුතු කළ අපට ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා ශ්‍රේෂ්ඨ නායකත්වයක් ලබා දෙමින් ලොකු වැඩ කොටසක් ඉටු කළා. ඒ කණ්ඩායම නියෝජනය කරන අපට එතුමා නැති අඩු පාඩුව අද වන විට දැනෙනවා කියන එකත් විශේෂයෙන්ම මේ වෙලාවේදී මා සඳහන් කළ යුතුයි.

ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් එතුමාගේ දයාබර මැතිනියටත්, ඒ වාගේම දියණියන් දෙපළටත්, ජොහාන් රත්වත්තේ පුතණුවන්ටත් මේ අවස්ථාවේදී අප සියලුදෙනාගේ ශෝකය පළ කරන ගමන්, එතුමා සිදු කළා වූ ඒ සුවිශාල වැඩ කොටස, සේවය තවදුරටත් ඉදිරියට ගෙන යන්න අපේ ජොහාන් රත්වත්තේ සහෝදරයාට වගකීමක් තිබෙන බවත් මා කියා සිටිනවා. මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපි ඒ වෙනුවෙන් හැම දාමත් ඒ අවශ්‍ය සහයෝගය, ශක්තිය එකතු කරනවා කියන පණිවුඩයත් මේ වෙලාවේදී ලබා දෙමින්, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ පවුලේ සියලු ඥාතීන්ට නැවත වතාවක් අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, අප සමඟ දීර්ඝ කාලීන දේශපාලන ගමනක් පැමිණි මහනුවර දිස්ත්‍රික්කයටත්, රටටත් ශක්තියක් ලබා දුන් අභාවප්‍රාප්ත ගරු ලොහාන් රත්වත්තේ අපේ සහෝදරයාට නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ ශෝක යෝජනාවට අමතරව ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා, ගරු ආර්.එම්.ආර්. වුල බණ්ඩාර මැතිතුමා සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අභාවයන් සම්බන්ධවත් අද දිනයේදී පාර්ලිමේන්තුවේදී ශෝක යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. අද දින මෙතැනට පැමිණ සිටින එම පවුල්වල ඥාති හිතමිත්‍රාදීන් සියලුදෙනාට, අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් අපගේ ශෝකය පළ කර සිටිනවා. ඒ වාගේම මා අදහන ආගම අනුව එම මන්ත්‍රීතුමන්ලාට නිවන් සුව අත්වේවා කියාත් ප්‍රාර්ථනා කරනවා.

[පි.ව. 2.45]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாடாளுமன்றத்தில் உறுப்பினர்களாக இருந்து மக்களுக்குப் பணியாற்றி மறைந்த ஏழு உறுப்பினர்களை நினைவுகூர்ந்து, அனுதாப உரை ஆற்றிக்கொண்டு இருக்கின்றோம். இந்த வேளையில், என்னால் 50 ஆண்டுகளாக நன்கு அறியப் பெற்றவரும் நண்பருமாகிய மா.க. ஈழவேந்தன் அவர்கள் பற்றி முதலில் பேசலாமென்று நினைக்கின்றேன்.

மாணிக்கவாசகர் கனகசபாபதி கனகேந்திரன் என்னும் இயற்பெயர் கொண்ட அமரர் ஈழவேந்தன் அவர்கள், 1932ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 14ஆம் நாள் யாழ்ப்பணத்தில் உள்ள கொழும்புத்துறை என்னும் ஊரில் கனகசபாபதி, சிவயோகம் இணையருக்கு மூத்த மகனாகப் பிறந்தார். இவருக்கு யோகேந்திரா, பாலேந்திரா என்னும் இரண்டு தம்பியரும் இந்திராணி, விஜேந்திரராணி என்னும் இரண்டு தங்கையருமாக நான்கு உடன் பிறப்புகள் உளர். இவர் தனது தொடக்கக் கல்வியை கொழும்புத்துறை மகா வித்தியால யத்திலும், இடைநிலைக் கல்வியை யாழ்ப்பாணம் பரியோவான் கல்லூரியிலும், உயர்நிலைக் கல்வியை கொழும்பு வெஸ்லிக் கல்லூரியிலும் பயின்றார். தமிழ், ஆங்கிலம் என இருமொழிகளிலும் புலமை மிக்கவராக அவர் விளங்கினார். தனது கல்வியை முடித்த பின்னர் இலங்கை மத்திய வங்கியில் இணைந்து பணியாற்றினார். பின்னர் பொருளாதார ஆய்வுத் திணைக்களத்தில் தமிழ் மொழி பெயர்ப்பாளராக இணைந்து தமிழ் மொழிபெயர்ப்புப் பிரிவின் தலைவராக பதவியுயர்வு பெற்று 1980ஆம் ஆண்டில் ஓய்வு பெற்றார்.

மாணிக்கவாசகர் கனகசபாபதி கனகேந்திரன் அவர்கள் தமிழ்மீது கொண்ட காதலால் தனது பெயரை தூய தமிழில் 'ஈழவேந்தன்' என மாற்றிக்கொண்டார். இவர் யாழ்ப்பாணம் மண்டைதீவு முன்னாள் ஊராட்சி மன்றத் தலைவர் கைலாசபிள்ளை அவர்களின் மகளான அருளாம்பிகை அம்மையாரைத் திருமணம் செய்தார். தமிழ்மீது கொண்ட காதலால் இலங்கைத் தமிழரசுக் கட்சியின் நிறுவநர் தந்தை செல்வநாயகம் அவர்களின் தலைமையில் ஐயர் இல்லாது, சமஸ்கிருதம் ஒலிக்காது திருக்குறள் ஓதித் திருமணம் செய்து கொண்டார். அவரது திருமண விழாவில் அமரர் அப்பாப்பிள்ளை அமிர்தலிங்கம் உள்ளிட்ட அன்றைய இலங்கைத் தமிழரசுக் கட்சியின் தலைவர்கள் கலந்துகொண்டு சிறப்பித்தனர். அமரர் ஈழவேந்தன், அருளாம்பிகை இணையருக்கு யாழினி, எழிலினி என இரண்டு புதல்வியர்கள் உளர். அமரர் ஈழவேந்தன் அவர்கள் 1952ஆம் ஆண்டிலே இலங்கைத் தமிழரசுக் கட்சியில் உறுப்பினராக இணைந்தார். இக்கட்சி நடத்திய 'சுதந்திரன்' பத்திரிகையில் ஈழவேந்தன் என்ற புனைப் பெயரில் அரசியல் கட்டுரைகளை எழுதத் தொடங்கியதுடன், அதே பெயரிலேயே அரசியல் கூட்டங்களிலும் உரையாற்றினார்.

அமரர் ஈழவேந்தன் அவர்கள் தமிழர் விடுதலைக் கூட்டணியின் கொழும்புக் கிளைத் தலைவராகப் பணியாற்றினார். இலங்கைத் தமிழ் அரசுக் கட்சி மற்றும் தமிழர் விடுதலைக் கூட்டணியின் கொழும்புக் கிளையின் பணிமனை யானது, கொள்ளுப்பிட்டி, அல்பிரட் ஹவுஸ் கார்டினில் அமைந்திருந்த தமிழரசுக் கட்சியின் தலைவர் தந்தை செல்வநாயகத்தின் வீட்டில் இயங்கியது. தனது அலுவலகப் பணி முடிந்ததும் அமரர் ஈழவேந்தன் அவர்கள் நேரே தந்தை செல்வநாயகத்தின் வீட்டுக்குப் போய் விடுவார். அங்கு கட்சிப் பணிகளை ஆற்றிய பின்பே வீடு திரும்புவார். 1977ஆம் ஆண்டில் இடம்பெற்ற இனக் கலவரத்தில் இவரும் இவரது குடும்பத்தினரும் கடுமையாகப் பாதிக்கப்பட்டனர். இவரது வீடு தீக்கிரையாக்கப்பட்டது.

அமரர் ஈழவேந்தன் அவர்கள், 1980ஆம் ஆண்டில் தமிழரசுக் கட்சியில் இருந்து விலகி, தமிழீழ விடுதலை முன்னணி என்ற கட்சியைத் தொடங்கி, அக்கட்சியின் செயலாளராகப் பணியாற்றினார். 'சுதந்திரன்' பத்திரிகையின் முன்னாள் ஆசிரியர் மறைந்த கோவை மகேசன் இந்தக் கட்சியின் தலைவராகப் பணியாற்றினார். 1983ஆம் ஆண்டு நாட்டில் இடம்பெற்ற இன வன்முறையைத் தொடர்ந்து உயிர்ப் பாதுகாப்புக் கருதி இந்தியாவின் தமிழ் நாட்டுக்குப் புலம்பெயர்ந்து, 2000ஆம் ஆண்டின் இறுதிவரை தமிழகத்திலேயே வாழ்ந்து வந்தார். 2000ஆம் ஆண்டின் இறுதியில் இலங்கை திரும்பிய அமரர் ஈழவேந்தன் அவர்கள், 2004ஆம் ஆண்டில் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தேசியப்பட்டியல் உறுப்பினராக நாடாளுமன்றம் வந்தார். இவர் நாடாளுமன்றத்தில் சிறப்பான உரைகளை ஆற்றியுள்ளதை நாடாளுமன்ற விவாதப் பதிவேடுகளில் இருந்து நாம் அறிந்து கொள்ளலாம்.

தனது நண்பரும் ஊராருமான நக்கீரன் என்று அழைக்கப்படும் வே. தங்கவேல் எழுதிய "சோதிடப் புரட்டு" நூல் வெளியீட்டு விழாவுக்கு அமரர் ஈழவேந்தன் அவர்கள் சிறப்பு விருந்தினராகக் கனடா சென்று கலந்துகொண்டார். விழாவில் நூலாசிரியரைவிட சிறப்பு விருந்தினராகக் கலந்து கொண்ட அமரர் ஈழவேந்தன் அவர்களுக்குத்தான் மாலை, மரியாதைகள் அதிகம் கிடைத்தன. இந்த வெளியீட்டு விழாவின் பின்னர், அங்கு பல நிகழ்ச்சிகளில் அவர் கலந்து கொண்டார். அரசியல், சமூக மேடைகளில் மட்டுமல்லாமல், சைவ சமய மேடைகளிலும் உரையாற்றினார். இரண்டு மொழிகளிலும் புலமைவாய்ந்த அவரது உரைகளைப் பலர் கூடிநின்று கேட்டு மகிழ்ந்தனர். மூன்று மாதங்களுக்கும் மேலாக நாடாளுமன்றத்துக்கு வருகை தராததையடுத்து, 2007ஆம் ஆண்டு நவம்பர் மாதம் இவரது நாடாளுமன்ற உறுப்பினர் பதவி வறிதானது.

அமரர் ஈழவேந்தன் அவர்கள் ஒரு புரட்சியாளர். தனது இனத்தின் உரிமை மீட்புக்கு ஓய்வின்றி, தொய்வின்றிப் போராடியவர். தான்கொண்ட நிலைப்பாட்டில் இருந்து மருந்தளவுக்கும் விட்டுக்கொடுக்க மாட்டார். அவர் தனிக்கட்சி தொடங்கியதற்கும் அதுவே முதன்மையான காரணியாகும். அமரர் ஈழவேந்தன் அவர்கள் அன்றைய தமிழ்த் தலைவர்களோடு மட்டுமன்றி, இடதுசாரித் தலைவர்களான என்.எம். பெரேரா, கொல்வின் ஆர்.டி. சில்வா, பீட்டர் கெனமன் முதலியவர்களோடும் மோதியிருக்கிறார். அவர்கள் எங்கே கூட்டம் வைத்தாலும் அங்கே கேள்வி கேட்பதற்காகச் சென்று விடுவார். தனக்குப் பின்னால் யார் இருக்கிறார்கள் என்பதையிட்டு அவர் கவலைப்படமாட்டார். இடம், பொருள், ஏவல் பற்றியும் பொருட்படுத்த மாட்டார்.

அமரர் ஈழவேந்தன் அவர்கள் மேடையில் பேசும்போது தனிநாயக அடிகளார் போலவே திருமூலரின், "என்னை நன்றாய் இறைவன் படைத்தனன்; தன்னை நன்றாய் தமிழ் செய்யுமாறே" என்ற வரிகளைக் கூறிக்கொண்டே தொடங்குவார். "நாமார்க்கும் குடியல்லோம் நமனை அஞ்சோம்" என்ற திருநாவுக்கரசரின் வரிகளையும் மேற்கோள்காட்டிப் பேச மறக்கமாட்டார். அவர் எங்கே போனாலும் தோளில் ஒரு பையுடன்தான் செல்வார். அதற்குள் அவரது அறிக்கைகள், கட்டுரைகள் இருக்கும். யாரைக் கண்டாலும் படிக்கக் கொடுப்பார். அமரர் ஈழவேந்தன் அவர்கள் தமிழ் நாட்டில் இருந்த காலத்தில் காலை எழுந்தவுடன் அன்று வெளிவந்த 'இந்து', 'தினமணி' முதலிய செய்தித்தாள்களை வாசிப்பார். அவற்றில் இலங்கைத் தமிழர் பற்றிய செய்திகள் இருந்தால், அவற்றைப் படித்து தனது பக்க நியாயங்களை அறிக்கைகள் வாயிலாக வெளியிடுவார். அந்த ஏடுகளின் அலுவலங்களுக்கு நேரே சென்று தனது அறிக்கையைப் பிரசுரிக்க வைத்தும் விடுவார். அமரர் ஈழவேந்தன் அவர்கள் தமிழிலும் ஆங்கிலத்திலும் சில நூல்களை எழுதி வெளியிட்டுள்ளார். அதில் அவர் எழுதிய "தமிழ் மண் காப்போம், தாயகம் மீட்போம்" என்ற தலைப்பிலான நூலும் "தமிழால் உலகாண்ட தனிநாயக அடிகளார்" என்ற நூலும் முதன்மையானவை ஆகும்.

இவர் கனடாவில் வாழ்ந்த காலத்தில், அவர் எழுதிய கட்டுரைகள், நாடாளுமன்றத்தில் ஆற்றிய உரைகள் போன்றவை தொகுக்கப்பட்டு "தமிழ்த் தேசியத்தின் பாதையில் ஈழவேந்தனின் பதிவுகள்" என்ற பெயரில் நூலாக கனடாவில் வெளிவந்தது. தனது வாழ்நாள் முழுவதும் தமிழ்மொழி, தாயகம், தேசியம், தன்னாட்சி என்பதே அவரது பேச்சும் மூச்சுமாக இருந்தது. அமரர் ஈழவேந்தன் அவர்கள் ஈழத் தமிழரின் உரிமை மீட்புக்கு அல்லும் பகலும் உழைத்த ஓர் அரசியலாளராவார். இளமைக் காலம் முதல் தமிழ்மொழி, தமிழினம் என்பதே அவரது பேச்சாகவும் மூச்சாகவும் இருந்தது. அவர் பேசாத மேடையும் இல்லை; தொடாத பொருளும் இல்லை; போகாத நாடும் இல்லை. இந்தியாவின் பிரதமர் இந்திராகாந்தி அம்மையார் தொடக்கம் தமிழக முதல்வர்

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

கலைஞர் மு. கருணாநிதி வரை எல்லோரையும் சந்தித்து இலங்கைத் தமிழர் உரிமை மீட்புப் பற்றி அவர் பேசியிருக்கிறார்.

புலம்பெயர்ந்து கனடாவில் வாழ்ந்து வந்த காலத்தில் அமரர் ஈழவேந்தன் அவர்களின் உடல் நலம் குன்றி ரொறண்டோ மருத்துவமனையில் அனுமதிக்கப்பட்டு சிகிச்சை பெற்றுவந்த நிலையில், 2024ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 28ஆம் திகதி தனது 91ஆவது அகவையில் காலமானார். அவரது பணிகள் என்றும் நினைவில் கொள்ளப்படும். அன்னாரின் பிரிவால் வாடும் அவரது புதல்வியரான யாழினி, எழிலினி, மருமக்களான பேராசிரியர் அரசேந்திரன், திரு. சம்பத்குமார், பேரர்களான உத்தமசோழன், தமிழ்க்காவிரி, தமிழழகன், பொழிலன் உள்ளிட்ட அவரது உற்றார் உறவினர் அனைவருக்கும் எனது சார்பிலும் திருகோணமலை மக்கள் சார்பிலும் இலங்கைத் தமிழ் அரசுக் கட்சி சார்பிலும் துயர் தோய்ந்த இரங்கலைத் தெரிவித்துக்கொள்கிறேன்.

அத்தோடு, இந்த நாட்டுக்கு அரும் பணியாற்றி மறைந்த முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான அமரர் லொஹான் ரத்வத்தே, அமரர் ஹீன்மகத்மயா லியனகே, அமரர் டிக்சன் ஜே. பெரேரா, அமரர் (கலாநிதி) மேர்வின் டி த சில்வா, அமரர் வை.ஜீ. பத்மசிறி, அமரர் ஆர்.எம்.ஆர். சூலபண்டார ஆகியோரின் உறவினர்களுக்கும் எனது இரங்கலையும் துயரத்தையும் தெரிவித்துக்கொண்டு, அவர்களுடைய ஆத்மா சாந்தியடைய வேண்டுமெனவும் பிரார்த்தித்து விடைபெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 2.54]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු මන්ත්‍රීතුමන්ලා හත් දෙනෙකුගේ අභාවය පිළිබඳ ශෝක යෝජනා අද මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු වශයෙන් කටයුතු කරමින් තමන් නියෝජනය කළ ප්‍රදේශවලට විශාල සේවාවක් ඉටු කරලා තමයි ඒ සියලුදෙනාම අද වනකොට අප අතරින් වෙන් වෙලා ගොස් තිබෙන්නේ.

මම ජීවත් වන රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ අභාවප්‍රාප්ත ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමෙකු හැටියට වාගේම නියෝජ්‍ය ඇමතිවරයෙකු වශයෙනුත් කටයුතු කළා. 1942දී උපත ලැබූ එතුමා වසර 82ක් පමණ කාලයක් ජීවත් වෙලා, 2024 ඔක්තෝබර් මාසයේ 14වැනි දා මිය ගියා. එතුමා 1982දී රත්නපුර දිස්ත්‍රික්කයෙන් දේශපාලනයට පිවිස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් රක්වාන සහ පැල්මඩුල්ල ආසනවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් පත් වුණා. එතුමා ගුරුවරයෙකු ලෙස විවිධ ප්‍රදේශවල තිබෙන පාසල් කිහිපයකම සේවය කළා. එතුමා සිංහල භාෂාව උගන්වමින් දරුවන්ගේ නැණ පහන දියුණු කිරීම සඳහා විශාල කැපවීමක් කළා. 1980 වසරේදී පැවති ජූලි වර්ජනයට සම්බන්ධ වීම නිසා එතුමාට රැකියාව අහිමි වුණා. රැකියාව අහිමි වීමත් සමඟ එතුමා 1982දී ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධ වුණා. ඉන්පසුව 1989දී පාර්ලිමේන්තුව නියෝජනය කරමින් එතුමා රක්වාන සහ පැල්මඩුල්ල ඇතුළුව රත්නපුර දිස්ත්‍රික්කයටම විශාල සේවාවක් ඉටු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන්නේ රක්වාන ආසනය. එම නිසා ඒ ආසනයට ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා කරපු සේවාව අපි දන්නවා. එතුමා මංමාවත් ඉදි කරලා, ඒ ප්‍රදේශවලට විදුලිය ලබා දුන්නා. ඒ වාගේම රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ආරම්භ කරන්න එවකට අමාත්‍යවරයෙකු වශයෙන් හිටපු ජෝන් සෙනෙවිරත්න අමාත්‍යතුමා එක්ක සම්බන්ධ වෙලා පුරෝගාමීව කටයුතු කළා. ඒ වාගේ විශාල වැඩ කොටසක් එතුමා රක්වාන ආසනයටත්, රත්නපුර දිස්ත්‍රික්කයටත් ඉටු කළා. එතුමා නියෝජ්‍ය ඇමතිවරයෙකු වශයෙනුත්, ලංකා කජු සංස්ථාවේ සභාපතිවරයා වශයෙනුත් විශාල වැඩ කොටසක් ඉටු කළා. එතුමා තමන්ගේ පුත්‍රයා වන වරුණ ලියනගේ මැතිතුමාවත් දේශපාලනයට යොමු කළා. වරුණ ලියනගේ මැතිතුමා ප්‍රාදේශීය සභාවෙන් පළාත් සභාවටත්, පළාත් සභාවෙන් පාර්ලිමේන්තුවටත් තේරී පත් වුණා. එතුමා අපේ සහෝදර මන්ත්‍රීවරයෙකු වශයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් අද වනකොට විශාල වැඩ කොටසක් ඉදිරියට කරගෙන යනවා. මම එතුමාගේ පවුලේ අය පිළිබඳව දන්නවා. වරුණ ලියනගේ මැතිතුමාගේ මැණියන්, සහෝදරයා සහ නැඟණිය ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා රෝගාතුර වුණු අවස්ථාවේදී එතුමාට ඇප උපස්ථාන කරමින්, එතුමා ජීවත් කරවීමට ඉතා විශාල වෙහෙස මහන්සියක් දැරුවා.

එතුමා මිය යාමට සතියකට පෙර මම ගිහිල්ලා එතුමාත් සමඟ කථා කළා. එතුමා බොහොම සතුටින් හිටියේ. මොකද, එතුමා රත්නපුර දිස්ත්‍රික්කය තුළ නාස්තිය, හොරකම, දූෂණය පිටු දකිමින් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවාවක් ඉටු කරපු මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක්. ඒ කටයුතු ඉදිරියට ගෙන යෑම සඳහා එතුමාගේ පුත්‍රයා අද වනකොට රත්නපුර දිස්ත්‍රික්කයෙන් සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු

මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වෙලා විශාල වැඩ කොටසක් කරමින් සිටිනවා. අද වනකොට ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා මිය ගොස් තිබුණත්, එතුමා ජීවත් වුණු කාලය තුළ මේ සමාජයට, මේ රටට කරපු සේවාව, ඒ ගුණ සුවඳ සමාජයෙන් නැති වෙලා යන්නේ නැහැ. රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා සහ වැඩිමහලු ඕනෑම කෙනෙකුගෙන් එතුමා ගැන ඇහුවොත් එතුමා කරපු සේවාව තමයි ඔවුන් කියන්නේ. මම රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ අවස්ථාවේදී අපේ සහෝදර මන්ත්‍රීතුමා වන වරුණ ලියනගේ මැතිතුමාටත්, එතුමාගේ සහෝදරයාටත්, සහෝදරියටත්, ඒ මැණියන්ටත්, පවුලේ ඥාතීන්ටත්, ඒ වාගේම රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවටත් එතුමාගේ අභාවය වෙනුවෙන් බලවත් ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඊළඟට කථා කරන්න කැමැතියි, අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා ගැන. මා සබරගමුව පළාත් සභාව තුළ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළා. ඒ වාගේම, අවුරුදු 20ක් පමණ ප්‍රාදේශීය සභාවේ කටයුතු කළා. ඒ කාලයේ ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ දේශපාලන කටයුතු කළත්, විශේෂයෙන් සබරගමුව පළාත් සභාවේ කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් පත් වෙලා සිටි අවස්ථාවේදී -මම කොලොන්න ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරනකොට- රත්නපුර දිස්ත්‍රික්කයේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. එතුමාගේ දේශපාලන ජීවිතය තුළට කළු පැල්ලම් එකතු කර ගන්නේ නැතිව ප්‍රදේශයේ ජනතාවට උපරිම සේවාවක් කරලායි එතුමා මිය ගියේ. එතුමාගේ දියණිය වන වත්සලා මන්ත්‍රීතුමිය පළාත් සභා මන්ත්‍රීවරියක් වශයෙන් පත් වෙලා පසුගිය පළාත් සභාව දක්වාම විශාල වැඩ කොටසක් කරගෙන ආවා. එතුමියටත්, එම පවුලේ සියලු ඥාතීන්ටත් ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මගේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා. ඒ වාගේම අද දින ශෝක ප්‍රකාශ යෝජනාවලට ඇතුළත් අභාවප්‍රාප්ත හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම වෙනුවෙන් එතුමන්ලාගේ පවුල්වල අය වෙත මගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආචාර්ය නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා.

[අ.භා. 3.01]

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනකු වෙනුවෙන් අද දවසේ මේ ගරු සභාවේ ශෝකය පළ කෙරෙනවා. ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා, ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා, ගරු ආර්.එම්.ආර්. වුල බණ්ඩාර මැතිතුමා, ගරු මානික්කවාසගර් කනගසභාපති ඊලවේන්ද්‍රන් මැතිතුමා යන සියලුදෙනා විවිධ කාලවල, විවිධ දිස්ත්‍රික්ක නියෝජනය කරමින්, විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට ඇවිල්ලා මැති ඇමතිවරුන් විධියට, මහජන නියෝජිතයන් විධියට තම දිස්ත්‍රික්කවලට වාගේම පොදුවේ මේ රටටත්, මේ රටේ ජනතාවටත් යම් සේවාවක්, මෙහෙවරක් ඉටු කළ අය. එතුමන්ලා මහජන නියෝජිතයන් විධියට මේ රටට සිදු කරන ලද යහපත්, සාධනීය සේවාවන් හා කාර්යභාරයන් අගයමින්, ඒ සඳහා මේ උත්තරීතර සභාවේ කෘතවේදීත්වය පළ කරමින්, විවිධ ආගම් නියෝජනය කළ එතුමන්ලාගේ භවගාමී ජීවිතවලට සැනසීම ලැබේවායි කියා මූලික වශයෙන් මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අද දවසේ මේ ශෝක ප්‍රකාශ ගෙන එන අවස්ථාවට සම්බන්ධව සිටින එතුමන්ලාගේ පවුල්වල සියලු ඥාති හිතමිත්‍රාදීන්ට අභාවප්‍රාප්ත ඒ මහජන නියෝජිතයින් වෙනුවෙන් අපගේ හෘදයංගම ශෝකය, කනගාටුව හා සංවේගය පළ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු විධියට මා මුලින්ම කැමැතියි, අද දින ශෝක ප්‍රකාශ යෝජනාවට පාත්‍ර වන කෑගල්ල දිස්ත්‍රික්කයේ හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මෙන්ම හිටපු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යවරයෙකු ද වූ ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න. එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණි මහජන නියෝජිතයෙක්.

වයි.ජී. පද්මසිරි මැතිතුමා 1950දී කරවනැල්ල මූලික රෝහලේදී උපත ලැබුවා. ප්‍රාථමික අධ්‍යාපනය රුවන්වැල්ල මහා විද්‍යාලයෙනුත්, කණිෂ්ඨ අධ්‍යාපනය ශ්‍රී වික්‍රම කණිෂ්ඨ විද්‍යාලයෙනුත්, ද්විතීයික අධ්‍යාපනය රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයෙනුත් ලබාගෙන එතුමා නොතාරිස්වරයෙකු විධියට කටයුතු කළා. විශේෂයෙන් තුන් කෝරලයේ දේශපාලනයේ පතාක යෝධයෙකු විධියට කටයුතු කරපු ඒ වාගේම වාමාංශික දේශපාලනයේ මෙරටේ නොමැකෙන සලකුණක් තබන්නට සමත් වෙච්ච ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා සමඟ එතුමා යොවුන් වියේ ඉඳන්ම දේශපාලන කටයුතු කළා. ඒ වාගේම එතුමා 1970දී ලංකා සම සමාජ පක්ෂයේ රුවන්වැල්ල තරුණ බල මණ්ඩලයේ ලේකම් විධියටත්, ඒ වාගේම කලක් එහි සභාපතිවරයා විධියටත් කටයුතු කරලා ඉන්පසුව දිස්ත්‍රික් බල මණ්ඩලය, දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාව මෙන්ම සම සමාජ පක්ෂයේ ජාතික සංවිධායකවරයා විධියටත් කටයුතු කරමින්, වාමාංශික දේශපාලනයේ විශාල මෙහෙවරක් ඉටු කරන්න සමත් වෙච්ච මහජන නියෝජිතයෙක් විධියට මා හඳුන්වා දෙන්න කැමැතියි.

එතුමා දේශපාලනයට පිවිසෙන්නේ 1970 දශකයේ වුවත්, එතුමා මහජන නියෝජිතයෙක් විධියට 1988දී පළමු පළාත් සභා මැතිවරණයට තරග කරලා ජයග්‍රහණය කරනවා. 1988 ඉඳන් 2010 වෙනතුරු වසර 22ක් පමණ සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් විධියට විශාල අත්දැකීම් සම්භාරයක් ලබා ගනිමින් සබරගමුව පළාතටත්, විශේෂයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයටත් සේවාවන් සපයන්න එතුමා සමත් වෙනවා. සාමාන්‍යයෙන් දේශපාලනඥයෙක් වුණාට පස්සේ ඔහු සැබෑ වශයෙන්ම මහජන මෙහෙවරට, සේවාවට කැපවෙන අයෙක් නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝ විට නිර්මාණශීලී දැක්මක් සහිතව ඒ තමන්ගේ දේශපාලන කටයුතු මෙහෙයවන්න ඔහුට හැකියාව තිබෙන්න ඕනෑ. එවැනි නිර්මාණශීලී දැක්මක් සහිතව දේශපාලන කටයුතු කරපු, මහජන සේවාවේ නිරත වෙච්ච සැබෑ දේශපාලනඥයෙකු විධියට අපට ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමාව හඳුන්වන්න පුළුවන්.

එක් අවස්ථාවක මාධ්‍යය මඟින් මෙහෙයවනු ලැබූ සම්මුඛ සාකච්ඡාවකදී එතුමා තමන්ගේ දේශපාලන භාවිතාව පිළිබඳව දෙන උත්තරයක සඳහන් වෙනවා, "My most significant achievement is the 'Jana sabha' concept. Pre-school teachers' charter is yet another concept that I introduced in Sabaragamuwa. " යනුවෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

එතුමා මෙහිදී කාරණා දෙකක් පිළිබඳව කියනවා. එකක් තමයි, "මගේ දේශපාලන ජීවිතය තුළ මම වඩාත් කැමැති වුණේ, ජන සභා සංකල්පයට" කියන එක. එතුමා ගමෙන් ආපු, ගමේ අත්දැකීම් තිබුණු, නිර්ධන පාන්තික ආභාසය තිබුණු දේශපාලනඥයෙකු විධියට සබරගමුව පළාත් සභාවට හඳුන්වා දුන්නා, මේ ජන සභා ක්‍රමය. ඒ ජන සභා ක්‍රමය හඳුන්වා දෙමින්, ගම් සංවිධානය කරමින් මෙන්න මේ විධියට අපි ගම් දියුණු කිරීම සඳහා කටයුතු කරමු කියන යෝජනාව එතුමා ඉදිරිපත් කළා.

ඒ වාගේම එතුමා පෙර පාසල් -preschool- සඳහා ප්‍රඥප්තියක් ඉදිරිපත් කළා, සබරගමුව පළාත් සභාවට. එසේ ඉදිරිපත් කරමින්, පෙර පාසල් අවධියේ සිටම මේ රටේ ජනතාව, අනාගත පරම්පරාව ගොඩනැගීම සඳහා විශාල මෙහෙවරක් කරන්න අවශ්‍ය කරන අණපනත්, ප්‍රතිපත්ති ඉදිරිපත් කරපු දේශපාලනඥයෙක්, එතුමා.

ඒ වාගේම, එතුමා තමන් කටයුතු කළ තුන් කෝරළයට අදාළව තිබෙන යම් යම් ගැටලු ඉතා හොඳින් හඳුනා ගත්තා. අපි එවැනි අයෙකුට කියනවා, ජන විඥානය හොඳින් හඳුනා ගත් දේශපාලන භාවිතාවක් සහිත දේශපාලනඥයෙක් කියලා. ඒ නිසා තුන් කෝරළයට ආවේණික යම් යම් ගැටලු, අර්බුද පිළිබඳව එතුමා අවධානය යොමු කළා. එතුමා එක් අවස්ථාවක "හෙණයට හෙණයක්" කියා ව්‍යාපෘතියක් ගෙනාවා මට මතකයි. ඒ ව්‍යාපෘතිය මඟින් එතුමා හඳුන්වා දෙන්න උත්සාහ කළේ අකුණු විපත් වළකා ගැනීම සඳහා වූ වැඩසටහනක්. විශේෂයෙන් තුන් කෝරළය කියා කියන්නේ කඳු, ගිරි ශිඛරවලින් ගහන වූ ප්‍රදේශයක්. ඒ නිසා ඒ ප්‍රදේශයේ අකුණු විපත් වැඩියි. එතුමා, ඒ අකුණු විපත් වළකා ගැනීම සඳහා වූ අකුණු සන්නායක සවි කිරීම සඳහා වෙනම ව්‍යාපෘතියක් ගෙනැල්ලා එය ක්‍රියාත්මක කළා.

තුන් කෝරළය කියන්නේ විවිධ ඇළ, දොළ, ගංගාවලින් එතෙර මෙතෙර යන්න තිබෙන, ගිරි දුර්ග, ජල දුර්ග ආදියෙන් ද ගහන වූ ප්‍රදේශයක්. ඒ නිසා එතුමා හැම විටම තමන්ගේ විමධ්‍යගත ප්‍රතිපාදන වෙන් කළා ඒ ගිරි දුර්ග; එහෙම නැත්නම් කඳු ප්‍රදේශ එකට යා කරන්න, ඒ ජල දුර්ග තරණය කිරීම සඳහා පාලම් ඉදිකරන්න. ඒ පාලම් අතරින් රුවන්වැල්ල නගරයේ සිට නිකවලමුල්ල, පාලංගමුව ගම්මානය තෙක් ගමනාගමන පහසුව සඳහා ගුරුගොඩ ඔය හරහා ඉදි කර තිබෙන අඩි 550ක් දිගින් යුක්ත පාලම හැදුවා. ඒ the longest suspension bridge එක අද මේ රටේ සලකුණක් විධියට හඳුන්වමින් කථා කරනවා. ඒ වාගේ සංගිලි පාලම්, කම්බි පාලම් ආදි විශාල ප්‍රමාණයක් ඉදි කරන්න එතුමා දේශපාලනඥයෙකු විධියට මූලිකත්වය අරගෙන කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, පාර්ලිමේන්තුව තුළ වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ, පරිසර හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ වැනි උපදේශක කාරක සභා තුළ තමන්ගේ දේශපාලන ඥානය, දැනුම ආයෝජනය කරන්න එතුමා කටයුතු කර තිබෙනවා. එතුමා 2010 සිට 2015 වනකල් හත්වන පාර්ලිමේන්තුවේ වසර 5ක් වාගේ කාල සීමාවක් කටයුතු කළා. ඒ කාලය තුළ තමන් පළාත් සභා මන්ත්‍රීවරයෙකු, ඇමතිවරයෙකු විධියට කටයුතු කරමින් ලැබූ අත්දැකීම් පාර්ලිමේන්තුවටත් යොදා ගනිමින් පාර්ලිමේන්තුව තුළ තමන්ගේ ප්‍රදේශයේ ගැටලු සාකච්ඡා කරමින් සුවිසල් සේවාවක් ඉටු කරන්න කටයුතු කළ දේශපාලනඥයෙකු විධියට අපට එතුමාව අගය කරන්න පුළුවන්.

එතුමාගේ දේශපාලන භාවිතාව ඇතුළේ මූලික කාරණා දෙකක් මම දකිනවා. එකක් තමයි, කණ්ඩායමක් ලෙස කටයුතු කරන විට බහුතර මතය වෙනුවෙන් ඍජු ලෙස පෙනී සිටිමින් කටයුතු කිරීම. බොහොම නිර්භය විධියට එතුමා එසේ කටයුතු කළා. දෙවැනි කාරණාව විධියට මා දකිනවා, ආරම්භයේ සිට අවසානය දක්වා වාමාංශික දේශපාලනය තුළ, විශේෂයෙන් ලංකා සම සමාජ පක්ෂය විධියට විවිධ සන්ධානවලට ගියත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් පාර්ලිමේන්තුවට තරග කළත්, එතුමා සම සමාජ පක්ෂයේ අනන්‍යතාව එක්ක කටයුතු කරන්න උත්සාහ කිරීම. ඒ නිසා අඛණ්ඩව සම සමාජ පක්ෂය තුළ පෙනී සිටිමින්, ඒ පිළිබඳ අපේක්ෂා දල්වාගෙන දේශපාලනයේ නිරත වෙන්න එතුමා සමත් වුණා. අපේ සාමාන්‍ය ව්‍යවහාරයේ කියමනක් තිබෙනවා, "ගෞරවනීය ලෙස ජීවත් වීමෙන් පූජනීය මරණයක් අත්පත් කරගන්න පුළුවන්" කියලා. එතුමා අප කියන, "සැබෑ වශයෙන්ම කෘතහස්ත දේශපාලනඥයෙක්" කියන ගණයට වැටෙන පුද්ගලයෙකු විධියට අගය කරන්න පුළුවන්.

අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා දේශපාලනඥයෙකු විධියට වාගේම, ගැමි ප්‍රදේශවල ගැමියන්ගේ හිතවතෙකු විධියට ද කටයුතු කරමින් මේ රටට යම්කිසි යහපත් සේවාවක්, සාධනීය සේවාවක් ඉටු කිරීමට සමත් වුණා. එතුමා බෞද්ධයෙකු විධියට බොහෝ විහාරස්ථාන සහ දහම් පාසල්වලට විශාල සේවාවක් සැපයුවා.

අවසාන වශයෙන්, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමාට නිර්වාණ අවබෝධය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතරම, එතුමාගේ බිරිඳ, දියණිය ඇතුළු පවුලේ සැමට මේ උත්තරීතර සභාවේ ශෝකය; සංවේගය පළ කරමින් මාගේ ශෝක ප්‍රකාශය අවසන් කරනවා. මාහට අවස්ථාව සලසා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

[අ.භා. 3.13]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඒ පළාත්වලින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු, පාර්ලිමේන්තුවට වාගේම රටට විශාල සේවයක් කරලා අභාවප්‍රාප්ත වූ දේශපාලනඥයන් කිහිපදෙනෙකු වෙනුවෙන් අපි අද ශෝකය ප්‍රකාශ කරනවා.

අපත් එක්ක සමකාලීනව දේශපාලනයේ යෙදී සිටි, මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු, අනුරුද්ධ රත්වත්තේ මැතිතුමාගේ පුත්‍ර රත්නය වන ලොහාන් රත්වත්තේ මැතිතුමා ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මම මුලින්ම කථා කරන්න කැමැතියි. මගේ පක්ෂයේ ජාතික සංවිධායක හැටියට අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා කටයුතු කළා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ; සිරිමාවෝ රත්වත්තේ මැතිනියගේ ඥාති පරම්පරාවෙන් එන පවුලක අයෙකු හැටියටත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ඥාති සහෝදරයෙකු හැටියටත් කටයුතු කළ, දේශපාලනයේදී මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා එක්ක දීර්ඝ කාලයක් ළඟින් ඉඳන් කටයුතු කරපු මහනුවර දිස්ත්‍රික්කයට නැතුවම බැරි චරිතයක් ලෙස ලොහාන් රත්වත්තේ මැතිතුමාව හඳුන්වන්න පුළුවන්. ලොහාන් රත්වත්තේ මැතිතුමා නැති පාඩුව අද ජනතාවට දැනිලා තිබෙනවා. මොකද, තැන් තැන්වල එතුමා ගැන කථා කරනවා. ලොහාන් රත්වත්තේ මැතිතුමා කියන්නේ නායකත්වයත් එක්ක වැඩ කරපු, පක්ෂයත් එක්ක වැඩ කරපු, ඍජු තීන්දු ගත්තු, කෙළින් වැඩ කරපු,

ඕනෑම දේකට නොබියව මුහුණ දීපු නායකයෙක්. එතුමා පසුගිය දවසක අප අතරින් සමුගත්තා. මම එතුමාගේ අවසන් කටයුතුවලටත් සම්බන්ධ වුණා. ලොහාන් රත්වත්තේ මැතිතුමා වෙනුවෙන් එතුමාගේ පවුලේ අයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකයත්, මාගේ පෞද්ගලික ශෝකයත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, අභාවප්‍රාප්ත හීන්මහත්මයා ලියනගේ මැතිතුමා ගැනත් මම කථා කරන්න ඕනෑ. එතුමාගේ පුත්‍ර රත්නය වන වරුණ ලියනගේ මැතිතුමා මේ වෙනකොටත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. හීන්මහත්මයා ලියනගේ මැතිතුමා රත්නපුර දිස්ත්‍රික්කය තමයි නියෝජනය කළේ. 1989දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් මන්ත්‍රීවරු 66දෙනායි පාර්ලිමේන්තුවට ආවේ. ඒ 66දෙනාගෙන් එක්කෙනෙක් විධියට තමයි හීන්මහත්මයා ලියනගේ මැතිතුමා 1989දී මේ පාර්ලිමේන්තුව නියෝජනය කළේ. 1989දී පාර්ලිමේන්තුවට පැමිණි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 66දෙනා අතර හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්, හීන්මහත්මයා ලියනගේ මැතිතුමා. එතුමා 1994 ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයකු හැටියටත් රත්නපුර දිස්ත්‍රික්කයට විශාල සේවයක් කරපු කෙනෙක්. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් තාත්තලා ඇවිල්ලා තිබෙනවා, තාත්තලාගෙන් පස්සේ දරුවෝ ඇවිල්ලා තිබෙනවා. රත්නපුරයේ ජනතාව වෙනුවෙන් හීන්මහත්මයා ලියනගේ මැතිතුමා කළ කාර්යභාරය ඉටු කරන්න, එතුමා නැති පාඩුව මකන්න අද වරුණ ලියනගේ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ තමයි හීන්මහත්මයා ලියනගේ මැතිතුමා කටයුතු කළේ. එතුමාගේ අභාවය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකයත්, මාගේ ශෝකයත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභාවප්‍රාප්ත ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා ගැනත් මම කියන්න ඕනෑ. කැස්බෑව කියන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ, වමේ ආසනයක්. එතුමා 1989දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් කොළඹ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට ආවා. ඒ කාලයේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වමේ අපේක්ෂකයෙකුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පහසුවෙන් එන්න පුළුවන් වුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉස්සර කොළඹ දිස්ත්‍රික්කය කියන්නේ වමේ අයට අවාසි දිස්ත්‍රික්කයක්. නමුත් කොළඹ දිස්ත්‍රික්කයෙන් තුන්වැනියට තමයි එදා ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා කැස්බෑව ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට ආවේ. එතුමා 1975දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානයේ සභාපතිවරයා හැටියටත් කටයුතු කළා. ඒ වාගේම, එතුමා මිය යනතුරු අපේ පක්ෂයට විශාල සේවයක් කළා. එතුමා අපේ පක්ෂය අතහැරලා ගියේ නැහැ. එතුමා හැම දාම අපිත් එක්ක හිටියා. පසුගිය දවසක දෙහිවල එතුමාගේ නිවසේ පැවැති එතුමාගේ අවසාන කටයුතු වෙනුවෙන් මම සහභාගි වුණා. එතුමා අපේ පක්ෂයටත්, මේ රටටත්, කොළඹටත්, කැස්බෑවටත් විශාල සේවයක් කරපු කෙනෙක්. ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකයත්, මගේ පෞද්ගලික ශෝකයත් ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභාවප්‍රාප්ත වයි.ජී. පද්මසිරි මැතිතුමා ගැනත් මම කියන්න ඕනෑ. එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසය නියෝජනය කළා. එතුමා ලංකා සමසමාජ පක්ෂයේ කෙනෙක්.

සාමාන්‍යයෙන් කෑගල්ල දිස්ත්‍රික්කය කොමියුනිස්ට් පක්ෂයට, ලංකා සමසමාජ පක්ෂයට බර දිස්ත්‍රික්කයක්. එතුමා ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට ආවා. එතුමා සම සමාජ පක්ෂය නියෝජනය කළාට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක සන්ධාන ගතවෙලා එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට තමයි පාර්ලිමේන්තුව නියෝජනය කළේ. එතුමා දීර්ඝ කාලයක් පළාත් සභාව නියෝජනය කළා. පළාත් සභා ඇමතිවරයකු හැටියටත් කටයුතු කළා. ගමේ ජනතාවත් එක්ක එකට හිට ගත්ත වයි. ජී. පද්මසිරි මැතිතුමා රුවන්වැල්ල, යටියන්තොට වාගේ දුෂ්කර ප්‍රදේශවලට විශාල සේවයක් කරපු දේශපාලනඥයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ අභාවය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකයත්, මගේ පෞද්ගලික ශෝකයත් මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කැමැතියි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමා ගැන කථා කරන්න. එතුමා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර ආසනයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. 1977 ජේ.ආර්. ජයවර්ධන රජයේ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පළමුවෙනි වප්මඟුල තිබුණේ පඩුවස්නුවර. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්.එම්. කලුබණ්ඩා රත්නායක මැතිතුමාගේ පුත්‍රරත්නය තමයි ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමා. නිමල් බණ්ඩාර මහත්මයා ප්‍රධාන අමාත්‍යවරයා හැටියට වයඹ පළාතේ කටයුතු කළා. චූල බණ්ඩාර මහත්මයා පාර්ලිමේන්තුව නියෝජනය කළා. 1977දී පැවැති ආණ්ඩුවෙන් ඒ පළාතට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඩුවස්නුවර, කුලියාපිටිය වාගේ ප්‍රදේශවලට විශාල සේවයක් කරපු පවුලක් තමයි චූල බණ්ඩාර මහත්මයාගේ පවුල. දේශපාලන වශයෙන් නිමල් බණ්ඩාර මහත්මයා, චූල බණ්ඩාර මහත්මයා, කළු බණ්ඩාර මහත්මයා විශාල සේවාවක් කරපු දේශපාලනඥයන්.

චූල බණ්ඩාර මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එම පවුලේ සියලු දෙනාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකයත්, මගේ ශෝකයත් ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන අභාවප්‍රාප්ත ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා, ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමා වැනි පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරුන්ටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශෝකයත්, මගේ ශෝකයත් ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. ගරු සුජිත් සංජය පෙරේරා මහතා.

[අ.භා. 3.20]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා මේ රටට විශාල සේවාවක් කරපු මැති ඇමතිවරු 7 දෙනෙකුගේ අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ ගෙනෙන මේ මොහොතේ, ඒ වෙනුවෙන් අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මම මුලින්ම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ, රත්නපුර දිස්ත්‍රික්කයේ නියෝජනය කරපු අභාවප්‍රාප්ත ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා ගැන. මොකද, එතුමාගේ පුතා ගරු වරුණ ලියනගේ මැතිතුමා

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

වර්තමානයේ අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. අපි දන්නා තරමින් හීන්මහත්මයා ලියනගේ මැතිතුමා රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල මැතිවරණ කොට්ඨාසයත්, මුලින්ම රක්වාන මැතිවරණ කොට්ඨාසයත් නියෝජනය කරලා තමයි පාර්ලිමේන්තුවට ආවේ. අපි එතුමා ගැන දන්නා හැටියට, එතුමා පාසල් අධ්‍යාපනය හමාර කරලා දීර්ඝ කාලයක් තිස්සේ ගුරුවරයකු හැටියට, රත්නපුර ප්‍රදේශයේත්, ඉතාම දුෂ්කර ප්‍රදේශවලත් පාසල් දරුවන්ට සේවය ලබා දුන්නාය කියන එකත් මේ අවස්ථාවේ මම සිහිපත් කරන්න ඕනෑ. පසුව එතුමා වෘත්තියේ ඉන්නකොට වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරපු දේශපාලන නායකයකු හැටියට කටයුතු කළා. 1980දී පැවැති ජූලි වැඩ වර්ජනය අවස්ථාවේදී ඒ වැඩ වර්ජනයට සම්බන්ධ වෙලා තමන්ගේ සේවයත් එතැනින් හමාර කර ගත්ත කෙනෙක්, එතුමා. ඊට පස්සේ තමයි එතුමා දේශපාලනයට සහ සමාජ සේවයට සම්බන්ධ වුණේ. ඒ කටයුතු සියල්ල කරලා තමයි 1989දී එතුමා පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වුණේ. එතුමා 1989 මැතිවරණයට ඉදිරිපත් වෙනකොට, ඒ වෙලාවේ හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ලොකු වාසිදායක තත්ත්වයක් රත්නපුර දිස්ත්‍රික්කයේ තිබුණේ නැහැ. ඒ වාගේම භීෂණය වැනි නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න මැද්දේ තමයි එතුමා ඒ මැතිවරණයට ඉදිරිපත් වෙලා ඒ ජයග්‍රහණය ලබා ගත්තේ. මම හිතන හැටියට ඒ වෙලාවේ රත්නපුර දිස්ත්‍රික්කයෙන් මන්ත්‍රීවරු තුන් දෙනෙක් පත් වුණා. ඒ තමයි ගරු ජෝන් සෙනෙවිරත්න මැතිතුමා, අපේ ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා සහ ගරු නන්ද එල්ලාවල මැතිතුමා. එතැන් සිට තමයි හීන්මහත්මයා ලියනගේ මැතිතුමා දේශපාලන කටයුතු ආරම්භ කරලා පාර්ලිමේන්තුව හරහා විශාල වැඩකොටසක් ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉටු කිරීමට කටයුතු කළේ.

එතුමා නියෝජනය කළේ රක්වාන මැතිවරණ කොට්ඨාසය. ඒ ප්‍රදේශය වතු කම්කරුවන්, මැණික් කර්මාන්තයේ නියැළෙන විශාල පිරිසක් හා නොයෙකුත් ආකාරයේ සේවාවල යෙදෙන අය නියෝජනය කරන ප්‍රදේශයක්. එතුමා වතු කම්කරුවන් වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් කළා.

ඒ හේතුව නිසාම වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරන්නත් එතුමාට අවස්ථාව ලැබුණා. ඒ තුළින් විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයට විශාල සේවාවක් ඉටු කරන්න එතුමා කටයුතු කළා. 1994දීත් එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත් වුණා. එතුමා අවුරුදු 13ක් වාගේ දීර්ඝ කාලයක් රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ප්‍රදේශයට සුවිශේෂී සේවාවක් කළා. ඒ හේතුව නිසාම, එතුමාගේ පුත්‍ර රත්නය වන අපේ හිතවත් වරුණ ලියනගේ මහත්මයාටත් පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණා. එතුමා කාලයක් පළාත් සභාව නියෝජනය කළා. ඊට පසුව පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වෙච්ච අවස්ථාවේදී එතුමා ජයග්‍රහණය කළා. එතුමා අද රත්නපුර දිස්ත්‍රික්කයේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරයකු හැටියට එතුමාගේ පියා ගෙන ගිය සුවිශේෂී සමාජ සේවාව ඉදිරියටත් ගෙනියනවා. මම ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ අවස්ථාවේදී වරුණ ලියනගේ මහත්මයාටත්, ඒ පවුලේ සියලුදෙනාටත් අපේ ශෝකය, පාර්ලිමේන්තුවේ ශෝකය මා ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම බලාපොරොත්තු වෙන්නේ, රුවන්වැල්ල මැතිවරණ කොට්ඨාසය කේන්ද්‍ර කරගෙන කෑගල්ල දිස්ත්‍රික්කයට තවත් සුවිශේෂී සේවාවක් කරපු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් වූ වයි.ජී. පද්මසිරි මැතිතුමා ගැනත් වචනයක් කියන්න. පද්මසිරි මැතිතුමා පළාත් සභාවට මුලින්ම පත් වුණේ 1988 වසරේදී. එතුමා පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙච්ච අවස්ථාවේදී නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න තිබුණා. 1988දී පළාත් සභා මැතිවරණයට අපේක්ෂකයන් ඉදිරිපත් වුණේ මරණ වරෙන්තුව අරගෙන. ඒ තරම් භීෂණයක් තිබුණා. ඒ පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්න එපා කියලා නොයෙකුත් ආකාරයේ තර්ජන ගර්ජන තිබුණා. ඒ සියල්ලම පැත්තකට දමලා ජනතාව වෙනුවෙන් අපි දේශපාලනය කරන්න ඕනෑ කියලා ඉදිරියට ඇවිල්ලා තමයි වයි.ජී. පද්මසිරි මැතිතුමා එදා පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණේ. ඒත් එක්කම මට මතකයි, එතුමාගේ සොහොයුරා, වයි.ජී. ලෙස්ලි මැතිතුමාත් පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණා. ඒ කාලයේ හිටපු සන්නද්ධ කණ්ඩායම් විසින්, ත්‍රස්තවාදී කණ්ඩායම් විසින් එතුමාව ඝාතනය කළා. පළාත් සභාවට පත් වෙලා මාස තුනක්වත් එතුමාට ඉන්න හම්බ වුණේ නැහැ. 1988-1989 කාල සීමාවේ එතුමා නිවසේදීම ඝාතනය කළා. ඊට පසුව වයි.ජී. පද්මසිරි මැතිතුමා බොහොම අමාරුවෙන් ජීවිතය බේරාගෙන පළාත් සභා මන්ත්‍රීවරයකු වශයෙන් දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කළා. එතුමාත් එක්ක වැඩ කටයුතු කරන්න මටත් අවස්ථාවක් ලැබුණා. මම ඒ පළාත් සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කරද්දී එතුමා පළාත් සභාවේ අමාත්‍යවරයකු හැටියට කටයුතු කළා.

කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල, යටියන්තොට, දැරණියගල ප්‍රදේශ කියන්නේ, ඉතාම දුෂ්කර ප්‍රදේශ. ඒ දුෂ්කර ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කරන්න, මාර්ග පහසුකම් දියුණු කරන්න, පාලම් ඉදිකරන්න එතුමා විශාල කාර්යභාරයක් කළා. කෘෂිකර්මය පැත්තෙන් ගත්තත්, අනෙකුත් දේවල් පැත්තෙන් ගත්තත් එතුමා සුවිශේෂී කාර්යභාරයක් කළා. පළාත් සභාව තුළින් විශාල වැඩ කොටසක් කරපු ඇමතිවරයෙක් හිටියා නම්, ඒ වයි.ජී. පද්මසිරි මැතිතුමාය කියන එක මම මේ අවස්ථාවේදී පක්ෂ, පාට භේදයෙන් තොරව කියන්න ඕනෑ. එතුමා ඒ තරම් ජනතාවට සමීපව කටයුතු කරපු නායකයෙක්. ඒ වාගේම එතුමාගේ පක්ෂයත් ආරක්ෂා කරන්න කටයුතු කළා. මොකද, සමසමාජ පක්ෂය නියෝජනය කරපු විශාල පිරිසක් ඒ අවස්ථාවේදී වෙනත් වෙනත් පක්ෂවලට ගියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් සම්බන්ධ වුණා. එදා එන්.එම්. පෙරේරා මැතිතුමාත් එක්ක ආරම්භ කරපු ගමන -ඒ දේශපාලන මග- වෙනස් නොකර එතුමාත් එක්කම දිගින් දිගටම යන්න, එතුමාගේ පක්ෂය ආරක්ෂා කරන්න, විවිධ තනතුරු අරගෙන සමසමාජ පක්ෂය නඟා සිටුවන්න විශාල වැඩ කොටසක් කරපු දේශපාලන නායකයෙක් තමයි වයි.ජී. පද්මසිරි මැතිතුමා.

ඒ වාගේම, එන්.එම්. පෙරේරා මැතිතුමාගේ නම ගෙනියන්න එතුමා නොයෙකුත් අවස්ථාවල විශාල වැඩ කොටසක් කළා. විශේෂයෙන්ම එන්.එම්. පෙරේරා නාමය සදාකල් ඒ ප්‍රදේශයේ බබළවන්න අවශ්‍ය පියවර ගණනාවක් එතුමා ගත්තා. එන්.එම්. පෙරේරා අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කරන්න එතුමා විශාල වශයෙන් මැදිහත් වුණාය කියන එකත් අපි සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේ සුවිශේෂී කාර්යභාරයන් කරපු නිසා 2010 පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වෙච්ච වෙලාවේ වයි.ජී. පද්මසිරි මැතිතුමාට පාර්ලිමේන්තු වරම් ලැබුණා. එහිදී ජනතාව සුවිශේෂී ඡන්ද ප්‍රමාණයක් ලබා දෙමින් එතුමා දිස්ත්‍රික්කයෙන් හතරවෙනි ස්ථානයට පත් කළා. ඊට පසුව එතුමා පාර්ලිමේන්තුවේ අවුරුදු හතරක්, හතරහමාරක කාල සීමාවක් හිටියා. ඒ කාල සීමාව තුළ එතුමා කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට පත් වුණා. කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කළ කාලයේ එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේත්, පොදුවේ ලංකාවේත් කෘෂිකර්මය නඟා සිටුවීම සඳහා විශාල වැඩ කොටසක් කරපු නායකයෙක්.

එතුමා විශාල සේවාවක් කරලා තමයි අපෙන් සමු අරගෙන ගියේ. අද එතුමාගේ සේවාව ඉදිරියට ගෙන යන්න එතුමාගේ දියණිය දේශපාලනයේ සිටිනවා. ඒ තමයි, පළාත් සභා මන්ත්‍රීවරියක් වශයෙන් කටයුතු කරපු වත්සලා ජනාදරී මහත්මිය. එතුමා, මමත් එක්ක පළාත් සභාව නියෝජනය කරපු අවස්ථාවේදී හිටියා. ඒ වාගේම, එතුමාගේ දියණියත් පළාත් සභාවේ මමත් එක්ක කෙටි කාල සීමාවක් කටයුතු කළා. එතුමිය පළාත් සභාවේ සිටියදී විශේෂයෙන්ම තම පියාගේ වැඩ කටයුතු ඉදිරියට අරගෙන යන්න විශාල මෙහෙවරක් කළා. හොඳ අනාගතයක් තිබෙන තරුණ නායිකාවක් හැටියට එතුමිය ඒ ප්‍රදේශයේ අදටත් දේශපාලන කටයුතුවල නියැළෙනවා. තමන්ගේ පියා ගෙනගිය වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයන්න එතුමියට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා කියලා අපි මේ අවස්ථාවේදී එතුමියට සුබ පැතුම් එක් කරමින් ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම, මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ අයටත්, එම දියණියටත් අපේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන තවත් මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. ඒ අය අතරින් කිහිප දෙනෙක් ගොඩක් දුරට අපට ඇසුරු කරන්න හම්බ වුණේ නැහැ. ලොහාන් රත්වත්තේ මැතිතුමා කාලයක් අපිත් එක්ක පාර්ලිමේන්තුවේ එකට වැඩ කටයුතු කළා. විශේෂයෙන්ම එතුමා නියෝජනය කළ පක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රකාශ කළා, ලොහාන් රත්වත්තේ මැතිතුමා කොයි වාගේ දේශපාලනයක් ද කළේ කියලා. අපි දන්නා තරමින් එතුමා පෙරළිකාර චරිතයක්. ඒ වාගේම, ආන්දෝලනාත්මක දේශපාලනයක නියැළුණු මන්ත්‍රීවරයෙක් හැටියට තමයි එතුමා අපේ රටේ ප්‍රසිද්ධ වෙලා තිබුණේ. එතුමාගේ පියා වන අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා විශේෂයෙන්ම යුද සමයේ මේ රට බේරා ගන්න, ත්‍රස්තවාදී සමයේදී ඒකට මුහුණ දෙන්න විශාල වැඩ කොටසක් කරපු දේශපාලන නායකයෙක්. ඊට පසුව එතුමාගේ ඇවෑමෙන් තමයි ලොහාන් රත්වත්තේ මැතිතුමා දේශපාලනයට එන්නේ. යම් යම් අය එතුමාව නොයෙකුත් ආකාරයෙන් විවේචන කළා වුණත්, එතුමාගේ වැඩ පිළිවෙළ අනුමත කරපු විශාල පිරිසක් හිටපු බව අපි දන්නවා. මම හිතන විධියට එතුමා ඉදිරිපත් වුණු අවසන් මහ මැතිවරණයේදී මනාප ඡන්ද 100,000ක් විතර ලබා දෙන්නත් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව කටයුතු කර තිබුණා. එතුමා නිර්භීතව ඉදිරියට ඇවිල්ලා තමන්ගේ සේවය ජනතාව වෙනුවෙන් ලබා දෙන්න නොබියව ඉදිරිපත්වීම නිසා, එතුමාගේ වැඩ පිළිවෙළ අගය කළ පිරිසක් සිටින බව අපි දන්නවා. ඒ සියලුදෙනා වෙනුවෙන් එතුමා පෙනී සිටියා. ඒ වාගේම, දේශපාලනයට සම්බන්ධ පවුලේ අනෙකුත් අයත් එතුමාත් එක්කම කටයුතු කළා කියන එකත් මේ අවස්ථාවේදී අපි සඳහන් කරන්න ඕනෑ. රාජ්‍ය අමාත්‍ය ධුර ගණනාවක් හොබවමින් එතුමා කටයුතු කළා. ඒ තුළින් මහනුවර දිස්ත්‍රික්කයටත්, පොදුවේ ලංකාවේ අනෙකුත් ප්‍රදේශවලටත් තමන්ට හැකි පරිදි සේවය කරන්න එතුමාට අවස්ථාව යෙදුණා කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා. මම මේ වෙලාවේදී එතුමාගේ පවුලේ අයටත් ශෝකය ප්‍රකාශ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම, ඩික්සන් ජේ. පෙරේරා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ගැනත් අද දවසේ මේ සභාවේදී කථා කළා. අපට එතුමාව ඇසුරු කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. අපට දැනගන්න තිබෙන විධියට, එතුමා හොඳ දේශපාලනඥයෙක්. එතුමා සම්බන්ධයෙන් කාටවත් ඇඟිල්ලක් දිගු කරන්න, චෝදනාවක් ඉදිරිපත් කරන්න පුළුවන් ආකාරයට එතුමා වැඩ කටයුතු කළේ නැහැ. තමන්ගේ දේපළ දේශපාලනය වෙනුවෙන් පරිත්‍යාග කරලා දේශපාලනය කරපු දේශපාලන නායකයකු හැටියට තමයි එතුමාව මේ සමාජය පිළිගෙන තිබෙන්නේ. කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ආසනය නියෝජනය කරමින් විශාල වැඩ කොටසක් කරලා, තමන්ගේ දේවල් නැති කරගෙන දේශපාලනය කරපු නායකයකු හැටියට තමයි එතුමාව හඳුන්වා තිබෙන්නේ. අපි මේ අවස්ථාවේදී එතුමාටත් නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

මේ අවස්ථාවේදී ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මන්ත්‍රීතුමා ගැනත් මම කථා කරන්න ඕනෑ. එතුමා 1989දී තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත් වෙන්නේ. ඊට ඉස්සෙල්ලා එතුමාගේ පියා වන කළුබණ්ඩා රත්නායක මැතිතුමා 1977දී මන්ත්‍රීවරයකු විධියට පත් වෙනවා. එතුමා 1977දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට පත්වෙලා 1989 වෙනකම්ම පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඩුවස්නුවර ආසනය කේන්ද්‍ර කරගෙන කුරුණෑගල දිස්ත්‍රික්කයේ කෘෂිකර්මය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් නඟා සිටුවන්න විශාල වැඩ කොටසක් කළාය කියන එක කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව අදටත් ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමාගේ ඇවෑමෙන් තමයි එතුමාගේ පුතා වන චූල බණ්ඩාර මැතිතුමා දේශපාලනයට සම්බන්ධ වෙන්නේ. එතුමා 1989 මහ මැතිවරණයට ඉල්ලපු පළමුවැනි අවස්ථාවේදීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරී පත් වුණා. එතුමා නීතිඥවරයෙක් වශයෙනුත් විශාල ප්‍රසිද්ධියක් ඒ ප්‍රදේශයේ ඉසිලුවා. අවුරුදු 4ක්, 5ක් වාගේ කෙටි කාලසීමාවක් තමයි එතුමාට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ලැබුණේ. ඒ කටයුතු කළ කෙටි කාලසීමාවේදී එතුමා තමන්ට කරන්න පුළුවන් ආකාරයේ විශාල වැඩ කොටසක් කළාය කියන එකත් අපි මතක් කරනවා. ඒ වාගේම, එතුමාගේ සොහොයුරා වන නිමල් බණ්ඩාර මැතිතුමා වයඹ පළාතේ මහ ඇමතිවරයා වශයෙන් කෙටි කාලයක් කටයුතු කළා. වයඹ පළාතේ මහ ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු නිමල් බණ්ඩාර මහත්මයාත් ඒ වාගේම සුවිශේෂී සේවාවක් වයඹ පළාතට කරන්න කටයුතු කළාය කියන එකත් මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. අපේ ගරු චූල බණ්ඩාර මැතිතුමාගේ පුතණුවන් වන සිදත් බණ්ඩාර මහත්මයා ඇතුළු එම පවුලේ සියලු දෙනාට අපේ කනගාටුවත්, අපේ ශෝකයත් මේ අවස්ථාවේදී දන්වා යවන හැටියට ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මන්ත්‍රීතුමා ගැනත් මම යමක් කියන්න ඕනෑ. අපි දන්නා හැටියට ජාතික ලැයිස්තුවෙන් තමයි එතුමා පාර්ලිමේන්තුවට පත් වෙන්නේ.

එතුමා බොහොම උගත් මන්ත්‍රීවරයෙක්. එතුමාට ආචාර්ය උපාධියක් තිබෙනවා. එතුමා දේශපාලනයට එන්න ඉස්සෙල්ලා රාජ්‍ය සේවකයකු වශයෙන්, ඒ කියන්නේ අමාත්‍යාංශ ලේකම්වරයෙක් සහ තවත් නොයෙකුත් ආකාරයේ ඉහළ තනතුරු දැරූ කෙනෙක්. එතුමා රාජ්‍ය සේවයේ යෙදී සිටියදී රජයේ වැඩ කටයුතුවලට, ඒ වාගේම අනෙකුත් සංවර්ධන කටයුතුවලට විශාල දායකත්වයක් ලබා දී තිබෙනවාය කියන එකත් අපට දැන ගන්නට ලැබී තිබෙනවා. මේ අවස්ථාවේදී එතුමාගේ අභාවය වෙනුවෙන් අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කැමැතියි, ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂය නියෝජනය කළ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්ද්‍රන් මන්ත්‍රීතුමා පිළිබඳව කථා කරන්න. එතුමා ජාතික ලැයිස්තුවෙන් තමයි පාර්ලිමේන්තුවට තේරී පත් වෙන්නේ. ඒ කාලයේ හැටියට නොයෙකුත් අභියෝග තිබෙන අවස්ථාවකයි එතුමා පාර්ලිමේන්තුවට එන්නේ. විශේෂයෙන්ම ත්‍රස්තවාදී කලබල තිබෙන කාලයේ. එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ රටේ සාමය ඇති කරන්න, ඒ වාගේම අපි අතර අවබෝධයක් ඇති කරන්න උත්සාහ කළා වාගේම, ජාති භේදයෙන් තොරව වැඩ කටයුතු කරන්න අවශ්‍යයි කියලා යම් කිසි හඬක් නැඟූ දේශපාලන නායකයකු හැටියටත් අපි එතුමාව හඳුනාගෙන තිබෙනවා. එතුමා

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

කෙටි කාලයක් තමයි පාර්ලිමේන්තුව නියෝජනය කළේ. එතුමා නියෝජනය කළ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම සේවාව ඉෂ්ට කරන්න එතුමා කටයුතු කළාය කියන එකත් අපි මේ අවස්ථාවේ එතුමාට ගෞරවයක් හැටියට සඳහන් කරන්න කැමැතියි.

අද දින ශෝක යෝජනා ඉදිරිපත් කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හත්දෙනාගේම අභාවය වෙනුවෙන් අපේ ශෝකය පළ කරන අතර, ඔවුන්ගේ පවුල්වල සියලු දෙනාට අපේත්, මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාගේත් ශෝකය දන්වා යවන ලෙස අවසාන වශයෙන් ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා.

[பி.ப. 3.34]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற அனுதாபப் பிரேரணையில், பாராளுமன்ற உறுப்பினர்களாக இருந்து மக்களுக்குச் சேவையாற்றிய மறைந்த முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ லொஹான் ரத்வத்தே, கௌரவ ஹீன்மகத்மயா லியனகே, கௌரவ டிக்சன் ஜே. பெரேரா, கௌரவ (கலாநிதி) மேர்வின் டி த சில்வா, கௌரவ வை.ஜீ. பத்மசிரி, கௌரவ ஆர்.எம்.ஆர். சூலபண்டார, கௌரவ மாணிக்கவாசகர் கனகசபாபதி ஈழவேந்தன் ஆகியோர் சம்பந்தமாக நாங்கள் பேசிக்கொண்டு இருக்கின்றோம். இவர்களில் சிலர் பாராளுமன்ற உறுப்பினர்களாகவும் இன்னும் சிலர் பிரதி அமைச்சர்களாகவும் இன்னும் சிலர் அமைச்சர் களாகவும் இருந்து மக்களுக்குப் பணியாற்றி இருக்கிறார்கள். குறிப்பாக, தத்தமது தேர்தல் தொகுதியிலுள்ள மக்களுக்கு இவர்கள் சேவை செய்திருக்கிறார்கள். இவர்களுடைய சேவைகளை நான் பாராட்டுகின்றேன். தற்பொழுது இவ்வுலகை விட்டு மறைந்திருக்கின்ற இவர்களுக்கு எனது அஞ்சலியைச் செலுத்துவதுடன், இவர்களுடைய மனைவிமார், பிள்ளைகள் உட்பட குடும்பத்தவர்களுக்கு எனது அனுதாபங்களையும் தெரிவித்துக் கொள்கின்றேன்.

எமது கட்சி சார்பாக இச்சபையைப் பிரதிநிதித்துவப்படுத்தி சேவையாற்றிய கௌரவ மாணிக்கவாசகர் கனகசபாபதி கனகேந்திரன் என்ற இயற்பெயர் கொண்ட 'ஈழவேந்தன்' அவர்களைப் பற்றியும் அவருடைய பணிகளைப் பற்றியும் இங்கு பேசவேண்டிய கடமை எனக்கு இருக்கின்றது. 'ஈழவேந்தன்' என்று புனைப்பெயரால் அழைக்கப்பட்ட கனகேந்திரன் அவர்கள், உண்மையிலேயே பாதிக்கப்பட்ட தனது இனத்துக்காகச் சேவை செய்ய வேண்டுமென்ற அடிப்படையில், சலுகை சார்ந்திருக்காமல் உரிமை சார்ந்து செயற்பட்ட ஓர் உயர்ந்த மனிதர் ஆவார். இவர் ஆங்கிலத்திலும் தமிழிலும் புலமை கொண்டவர். இவர் ஆரம்பத்தில் இலங்கை மத்திய வங்கியில் மொழிபெயர்ப் பாளராக இருந்திருக்கிறார். எனினும், அவர் அதில் திருப்தியடையவில்லை. 1949ஆம் ஆண்டு தமிழரசுக் கட்சி உருவாக்கப்பட்டது. அதன் தலைவராக தந்தை செல்வநாயகம் அவர்கள் காணப்பட்டார். அவரோடு இணைந்து பாதிக்கப்பட்ட தமிழ் மக்களுக்குப் பணியாற்ற வேண்டும் என்ற அடிப்படையில் உண்மையிலேயே செயற்பட்ட உணர்வுள்ள ஓர் மனிதராக இவர் இருந்திருக்கிறார். இவர் ஏறத்தாழ 70 ஆண்டுகள் தமிழ்த் தேசிய அரசியலோடு பின்னிப்பிணைந்து பயணித்து இருக்கின்றார். எந்தவொரு சந்தர்ப்பத்திலும் சலுகை சார்ந்த அல்லது பணம் சார்ந்த அரசியலை விரும்பாமல், உரிமை சார்ந்த தமிழ்த் தேசிய அரசியலையே இவர் செய்திருக்கிறார்.

இவர் ஆரம்பத்தில் இலங்கை தமிழரசுக் கட்சியில் இருந்திருக்கிறார். பின்னர், தமிழர் விடுதலைக் கூட்டணியில் இருந்திருக்கிறார். அதற்குப் பின்னர், தமிழ்த் தேசியக் கூட்டமைப்பில் இருந்திருக்கிறார். இவர் 70 ஆண்டுகள் அரசியல் பயணத்தில் ஈடுபட்டாலும், 70 வயதுக்குப் பின்னர்தான் பாராளுமன்ற உறுப்பினராகப் பதவி வகித்தார். அதாவது, 2004ஆம் ஆண்டு நடைபெற்ற பாராளுமன்றத் தேர்தலில் தமிழ்த் தேசியக் கூட்டமைப்பானது 22 ஆசனங்களைக் கைப்பற்றியது. அதில் தேசியப்பட்டியல் ஆசனங்கள் இரண்டு காணப்பட்டன. அவற்றுக்கு, வட பகுதியைச் சேர்ந்த ஈழவேந்தன் அவர்களும் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த யோசப் பரராஜசிங்கம் அவர்களும் நியமிக்கப்பட்டார்கள். இவர்களில் ஒருவர் இயற்கை மரணமடைந்தார்; மற்றையவர் படுகொலை செய்யப்பட்டார் என்பதை நான் இந்த இடத்தில் நினைவூட்ட விரும்புகின்றேன். அரசியல்வாதியான ஈழவேந்தன் அவர்கள், ஒரு பேச்சாளன், எழுத்தாளன் மாத்திரமல்ல, ஓர் இலக்கியவாதியும்கூட. அவருக்கு இரண்டு பிள்ளைகள் இருக்கிறார்கள். இன்று அந்தப் பிள்ளைகள் அவருடைய பெயர் சிறக்கக்கூடிய விதத்தில் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள்.

ஈழவேந்தன் அவர்கள் பாராளுமன்ற உறுப்பினராக இருந்த காலத்தில் நாடு மிகவும் மோசமான நிலையிலே காணப்பட்டது. அதாவது, படுகொலைகள், சித்திரவதைகள், கடத்தல், காணாமலாக்கல் போன்ற செயற்பாடுகள் தாராளமாக நடைபெற்றுக்கொண்டு இருந்தன. அந்த வேளையில், தனது மக்கள் படுகின்ற வேதனையை உணர்ந்து, அந்த மக்களுக்காக உரிமைக் குரல் கொடுத்தவர்தான் ஈழவேந்தன் அவர்கள்! நான் மாணவனாக இருந்த 1977ஆம் ஆண்டு காலப் பகுதியில் தேர்தலொன்று நடைபெற்றது. அந்தத் தேர்தல் மிகவும் உணர்வுபூர்வமான தேர்தலாக அமைந்திருந்தது. அந்தக் காலத்தில் எமது கட்சியின் தலைவராக இருந்த மாவை சேனாதிராஜா அவர்கள், கோவை மகேசன் அவர்கள், வன்னி ஆனந்தன், காசி ஆனந்தன் என முக்கியமான பிரமுகர்கள் காணப்பட்டார்கள்.

அவர்களில் ஒருவராக ஈழவேந்தனும் காணப்பட்டார். அவருடைய பேச்சாக இருக்கட்டும், எழுத்தாக இருக்கட்டும், ஆலோசனைகளாக இருக்கட்டும், அவை தமிழ்த் தேசிய அரசியலில் மிகவும் காத்திரமாக அமைந்திருந்தன. அவர் பதவிகளை வகிப்பதைவிட, சாதாரண ஒரு மனிதராக இருந்து மக்களுக்குப் பணியாற்ற வேண்டும் என்பதில் மிகவும் அக்கறையாகச் செயற்பட்ட ஒருவர். அந்த வகையில், அவர் நீண்ட காலமாக கட்சித் தொண்டனாகவும் கட்சிக்கு வழிகாட்டியாகவும் இருந்தார். அவர் பாராளுமன்ற உறுப்பினராவதற்கு 2004ஆம் ஆண்டு வரை காத்திருந்திருக்கிறார். 1932ஆம் ஆண்டு பிறந்த அவர், கிட்டத்தட்ட 72 வருடங்கள் காத்திருந்திருக்கிறார். அந்தக் காலத்தில் பல்வேறுபட்ட படுகொலைகள் நடைபெற்றன.

குறிப்பாக, தமிழ்த் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த ரவிராஜ், சிவநேசன், ஜோசப் பரராஜசிங்கம், அம்பாறை மாவட்ட முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சந்திரநேரு ஆகியோர் படுகொலை செய்யப்பட்டார்கள். அப்பொழுது ஈழவேந்தன் அவர்கள் 70 வயதைக் கடந்திருந்தும்கூட, எந்தவொரு சந்தர்ப்பத்திலும் பயப்படாமல் துணிச்சலுடன் செயற்பட்டார்; மக்களுக்காகக் குரல் கொடுத்தார்; தன்னுடைய பணியை ஆற்றினார். இவர், தமிழரசுக் கட்சியின் தந்தை செல்வா அவர்கள் நடாத்திய அறவழிப் போராட்டத்தில் பங்குதாரியாக இருந்து உரிமைக்காக உழைத்தவர். அந்த அறவழிப் போராட்டம் 30 ஆண்டுகளாகியும் வெற்றி பெறாத நிலையில், வடக்கு, கிழக்கில் ஆயுதப் போராட்டம் ஆரம்பமானது. அதில் காணப்பட்ட நியாயத்தை உணர்ந்து, அவர் அதில் ஈடுபடாது அதற்கான பங்களிப்பைச் செய்திருந்தார் என்பது குறிப்பிடத் தக்கது.

அவர் வாழுகின்ற காலத்தில் எவருக்கும் பாரமில்லாமல், மக்களுக்காக உழைக்கின்ற சிறப்பான ஒரு சமூக செயற்பாட்டாளராக, ஓர் அரசியல்வாதியாகச் செயற்பட்டு இருக்கின்றார். அவரிடம் தலைமைத்துவத்துக்குரிய பண்புகள் காணப்பட்டன. அவர் நினைத்திருந்தால் வாழ்நாள் முழுவதையும் வெளிநாட்டில் சௌகரியமாகக் கழித்திருக் கலாம். அதனை விடுத்து, மக்களுக்காகப் பணியாற்ற வேண்டுமெனச் செயற்பட்ட அந்த உத்தமர் தனது 91வது வயதில் கனடாவில் காலமானார். "குமுறுகின்ற குமரிக்கடல் தமிழகத்தைக் கொஞ்சுகின்றவரை, வானில் வெண்மதியும் தண்மதியும் பவனி வருகின்றவரை, கங்கையும் காவேரியும் கலக்கின்றவரை, தமிழ் கூறும் நல்லுலகம் உள்ளவரை, தமிழுக்காய் தமிழருக்காய் உழைத்தவர்கள் சாவதில்லை" என்ற கருத்து காசி ஆனந்தன் அவர்களால் தெரிவிக்கப்பட்டது. அந்த வகையில், ஈழவேந்தன் அவர்கள் தான் வாழ்ந்த காலத்தில் சரியாகச் செயற்பட்டார்; மக்களுக்காகக் குரல் கொடுத்தார். அவர் வயோதிபக் காலத்திலும்கூட ஓய்ந்திருக்காமல் பணிகளை ஆற்றினார்.

யாழ்ப்பாணத்தைப் பிறப்பிடமாகக் கொண்ட அவர், கனடாவில் காலமானார். அன்னாருடைய பணிகளைப் பாராட்டுவதோடு, அவரை எமக்களித்த அவரது தாய், தந்தையையும் நினைவுகூர்கின்றேன். அவருடைய இழப்பால் துயருறும் அவருடைய பிள்ளைகள், பேரரர்கள் உட்பட குடும்ப உறுப்பினர்களுக்கு இந்த இடத்தில் எனது அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்றைய தினம் அனுதாபப் பிரேரணை கொண்டுவரப்பட்டு இருக்கின்ற ஏனைய ஆறு முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களும் அவர்கள் சார்ந்த பிரதேசங்களுக்கும் மக்களுக்கும் பணியாற்றி இருக்கிறார்கள். அவர்கள் செய்த சேவைகளைப் பாராட்டி, அவர்களுடைய குடும்பத்தவர்களுக்கும் எனது அனுதாபங்களைத் தெரிவித்து, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා. 3.43]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් මහජන නියෝජිතයන් හැටියට කටයුතු කළ ගරු මන්ත්‍රීවරුන් හත් දෙනෙකුගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ අවස්ථාව දැන් එළඹ තිබෙනවා. අපෙන් සමුගත් ඒ මන්ත්‍රීවරුන් හත් දෙනාටම ආණ්ඩුව වෙනුවෙන් මේ අවස්ථාවේදී මා පොදුවේ සාතිශය සංවේගය පළ කරනවා.

ඒ අය අතරින් මම ආශ්‍රය නිශ්‍රය කරපු කෙනෙක් තමයි, ගරු ඩික්සන් ජේ. පෙරේරා මහතා. එතුමා ඇත්තටම මහත්මයෙක්. මොකද, එතුමා දේශපාලකයින් අතර ඉතා සාමාන්‍ය මිනිහෙක් හැටියට කටයුතු කරපු කෙනෙක්; ඇත්ත මහජන නියෝජිතයෙක්. එතුමා 1980 ගණන්වල දේශපාලනය කරනකොට අපි දේශපාලන ක්‍රියාකාරිත්වයේ හිටපු අය නොවෙයි. නමුත් අපි කුඩා කාලයේදීම එතුමන්ලාගේ දේශපාලන කටයුතු දිහා බලාගෙන හිටියා. 1970 ගණන්වල සිදුවූ දේවල් මට මතකයි. එතකොට අපි ළමයි. කැස්බෑව ආසනයේ අතුරු මැතිවරණයක් තිබුණු වෙලාවේ එතුමා අපේක්ෂකයෙකු හැටියට කටයුතු කළා. ඒ අතුරු මැතිවරණයේදී එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් තමයි කටයුතු කළේ. අපි දේශපාලන කටයුතු කරන්න පටන් ගත්තාට පස්සේ, අපව දැන හඳුනා ගත්තාට පස්සේ ඕනෑම තැනකදී ඇවිල්ලා බොහොම සුහදශීලීව එතුමා අප සමඟ කථා කළා. ඇත්තටම එතුමා මට කථා කරන්නේ, "සහෝදරයා" කියලා. එහෙම කෙනෙක් තමයි ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා. එතුමා කැස්බෑව ආසනය තමයි නියෝජනය කළේ. එතුමා උපන්නේත් මාම්පේ ප්‍රදේශයේ. නමුත් එතුමා අවසාන කාලයේ ජීවත් වුණේ දෙහිවල ප්‍රදේශයේ. කාලයකට පසුව හමු වුණත් ඒ තිබිච්ච ළෙන්ගතුකම එතුමාගේ හදවතේ තිබුණා. අපිත් ඇත්තටම එතුමාට ආදරය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර මහජන නියෝජිතයන්ට මිනිස්සු ආදරෙයි කියලා පෙන්වන්නේ බොරුවට; ගෞරව කරනවා කියලා පෙන්වන්නේ බොරුවට. හැබැයි එහෙම නොවෙයි, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාට මිනිස්සු ඇත්තටම ආදරය කළා; ඇත්තටම ගෞරව කළා. එතුමා ඇති තැනත්, නැති තැනත් එකම විධියට එතුමාට ඒ ගෞරවය ලැබුණා. එහෙම මහජන නියෝජිතයන් ඉන්නේ බොහොම ටිකදෙනායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාසනාව තිබෙන්නේ දේශපාලනයේ හිටපු බොහොම ටිකදෙනෙකුට විතරයි. හැබැයි, ගරු ඩික්සන් ජේ. පෙරේරා මහත්මයා ඒ ආදරයට, ගෞරවයට පාත්‍ර වෙච්ච කෙනෙක්. මම විශ්වාස කරන විධියට එතුමාට එහෙම වෙන්න තව හේතුවක් තිබුණා.

එක කාල වකවානුවක් තිබුණා, දේශපාලනය කරන්න නම් චණ්ඩිකම තිබිය යුතු. කවුරුත් දන්නවා, කැස්බෑව වාගේ ප්‍රදේශයක හැප්පෙන්න නම් චණ්ඩියෙක් වෙන්න ඕනෑය කියලා. ඒ කාලයේ එහෙම අදහසක් තිබුණා. ඒ නිසා බොහෝ වෙලාවට බලාපොරොත්තු වෙන්නේ චණ්ඩියෙක්. හැබැයි, ගරු ඩික්සන් ජේ. පෙරේරා මහතා එහෙම චණ්ඩියෙක් නොවෙයි. එතුමා හොඳ අහිංසක මනුස්සයෙක්. ඒ අහිංසක මනුස්සයාට පුළුවන්කම තිබුණා, චණ්ඩිකමින් තොරව මිනිසුන්ව දිනාගන්න; මිනිසුන්ගේ ඇත්ත ආදරය ලබාගන්න. එතුමා මහජන නියෝජිතයෙකු හැටියට කටයුතු කළ කාලය ඇතුළත එතුමාට කරන්න පුළුවන් දේවල් එතුමා කළ බව මා විශ්වාස කරනවා. සමහර අයට සාපේක්ෂව බැලුවොත්, ඒ ප්‍රදේශයට එතුමාට කළ හැකි ලොකු දෙයක් කරලා තිබෙනවා.

ඊට පසු කාල වකවානුවකදී එතුමාට දේශපාලනය තුළ විවිධ හැල හැප්පීම්වලට මුහුණ දෙන්න සිදු වුණා. අපි දන්නවා, සමහර පෞද්ගලික සිදුවීම්වලට එතුමා මුහුණ දුන්නු බව. ඉන්පසුව එක මොහොතක මට එතුමා හමු වුණා. ඒ, නියෝජ්‍ය තානාපතිකමකට විදෙස්ගත වෙන්න සතියකට කලින් ඒ ප්‍රදේශයේ පැවති මළ ගෙදරකදී. එතුමාගේ වචනවලින්ම කිව්වොත්, "මල්ලී, මම පොඩ්ඩක් වැඩකට යනවා, මට අවස්ථාවක් ආවා" කියලා එතුමා ඒ

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

අවස්ථාවේදී මට කිව්වා. විදෙස්ගත වෙලා ආවට පසුවත් මට කිහිප සැරයක් එතුමාව හමු වුණා. කවදත් මම අර කියපු ළෙන්ගතුකම, ආදරය සහ ගෞරවය එතුමා සතුව තිබුණා. එක පැත්තකින් ගත්තොත්, මේ දේශපාලන ක්ෂේත්‍රය තුළ අපට භය නැතුව හිතේ යමක් තියා ගන්නේ නැතුව කෙළින්ම හොඳ කියන්න පුළුවන් දේශපාලනඥයෙක්, එතුමා. ඒ වාගේම තමන්ට හැකි ආකාරයෙන් තමන්ගේ වගකීම් ඉෂ්ට කරපු දේශපාලනඥයෙක්. ඒ නිසා මම විශ්වාස කරනවා, අද ඉන්න සමහර දේශපාලනඥයන්ට එතුමා ආදර්ශයක් කියලා. එතුමාගේ මතය අපේ මතය නොවුණත්, එතුමා හිටපු කාලවුරේ මිනිසුන්ට එතුමා ආදර්ශයක් කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන් කැස්බෑව ආසනය නියෝජනය කළ, ප්‍රගතිශීලී නායකයෙක් වුණු ගරු ඩික්සන් ජේ. පෙරේරා මහත්මයාට ආදරය කළ, ගෞරව කළ සියලු මිනිසුන් වෙනුවෙන් මම එතුමාගේ පවුලේ සියලුදෙනාට සාතිශය සංවේගය ප්‍රකාශ කර සිටිනවා, දේශපාලන භේදයකින් තොරව. ඒ වාගේම එතුමා අදහපු ආගම වන බෞද්ධ ආගමේ හැටියට එතුමාට නිවන් සුව අත් වේවා කියාත් මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 3.50]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා, ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා, ගරු ආර්.එම්.ආර්. වුල බණ්ඩාර මැතිතුමා සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ වියෝව පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී මම පළමුවෙන්ම එම ගරු මන්ත්‍රීතුමන්ලා හත්දෙනාගේම පවුල්වල සාමාජිකයන් වෙත මාගේ බලවත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම මන්ත්‍රීතුමන්ලා අතරින් මම මුලින්ම කැමැතියි ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා ගැන කථා කරන්න. එතුමා ගුරුවරයෙක් වශයෙන් දීර්ඝ කාලයක් සේවය කළා. ඉන් පසුව සුප්‍රකට 1980 වසරේදී පැවති වැඩ වර්ජනයේදී තමන්ගේ රැකියාව අහිමි වීමෙන් පසුව එතුමා ක්‍රියාකාරී දේශපාලනයට පිවිසියා. එතුමා රත්නපුර දිස්ත්‍රික්කය වාගේම විශේෂයෙන්ම පැල්මඩුල්ල ප්‍රදේශය මූලික කරගෙන දේශපාලනය කරමින්, පාර්ලිමේන්තුව නියෝජනය කරමින් රත්නපුර දිස්ත්‍රික්කයටත්, නියෝජ්‍ය ඇමතිවරයෙක් වශයෙන් මුළු රටටත් ඉමහත් සේවයක් ඉටු කළා. එතුමාගේ දේශපාලනය ආදර්ශවත් එකක්. ගුරුවරයෙක් හැටියට දේශපාලනය ආරම්භ කළ නිසාත්, එතුමාට තිබුණු වාමාංශික දේශපාලන නැඹුරුව නිසාත් එතුමා අනෙක් දේශපාලනඥයන් අතර කැපී පෙනුණා. අපි එවකට එතුමාගේ දේශපාලන කාලවුරේ නොසිටියත් එතුමා ගරු කටයුතු, පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට සුදුසුකම් ලැබූ ආදර්ශවත් මන්ත්‍රීවරයෙක් හැටියට ලොකු ප්‍රසිද්ධියක් ඉසිලූ බව දැනගෙන හිටියා. සිරිමා ඉන්ද්‍රානි මැතිනියත් සමඟ විවාහ වූ එතුමා අපේ හිතවත් මිත්‍ර, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී වරුණ ලියනගේ මැතිතුමා වාගේම දමිත මහේෂ් ලියනගේ සහ තුෂාරි නිර්මිතා ලියනගේ යන දරුවන් තිදෙනා මේ රටට දැයට දායාද කළා. ගරු කටයුතු පාර්ලිමේන්තු සේවය අවසන් කළ එතුමා සිය දිවිමඟ අවසන් කළේ, ශ්‍රී ලංකාවේ උපත ලැබූ පුරවැසියෙකුට ගමට, රටට කරන්න පුළුවන් උපරිම සේවය ඉෂ්ට කරලා.

එවැනි ආදර්ශවත් දේශපාලන චරිතවල වැදගත්කම අද දවසේ අපට හොඳින් වැටහෙනවා. දේශපාලනය තුළ හිටපු ඒ ආදර්ශවත් චරිතවල දුර්ලභ බව අද අපට දැනෙනවා. එවැනි පරිසරයක් තුළ අභාවප්‍රාප්ත ගරු හීන්මහත්මයා ලියනගේ හිටපු නියෝජ්‍ය ඇමතිතුමාට නිවන් සැප ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරන්නේ, අපේ ආදරණීය මිත්‍ර, අද සමගි ජන බලවේගය යටතේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන වරුණ ලියනගේ මැතිතුමාට එතුමාගේ තාත්තා කළ සේවය ඒ ආකාරයෙන්ම වැදගත් වූ, ගෞරවාන්විත වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට තවදුරටත් කරගෙන යෑමට ආශීර්වාද ලැබේවා කියන ප්‍රාර්ථනයත් සමඟයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා ගැන කථා කරන්න කැමැතියි. 1978 වර්ෂයේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කරලා ජාතික ලැයිස්තුව නිර්මාණය කළේ, පාර්ලිමේන්තු මැතිවරණයකට ඉදිරිපත් වීමට හැකියාවක් නැති, නමුත් රටේ විද්වතුන්, උගතුන්, ශ්‍රේෂ්ඨයන් ව්‍යවස්ථාදායක කාර්යයට සහභාගි කරවා ගැනීමේ අරමුණින්. එම අරමුණ පෙරදැරි කර ගැනීමට තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් කළේ. එතුමා වසර 5කට ආසන්න කාලයක් එම ධුරය දැරුවා. ඉතාම ගෞරවාන්විත ලෙස පාර්ලිමේන්තුවේ කටයුතුවලට සහභාගි වෙමින් එතුමා ව්‍යවස්ථාකරණයට ද දායක වුණා.

ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් එතුමාගේ පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අපේක්ෂා කළ අරමුණ රට වෙනුවෙන් ඉටු කරන්නට සමත් වෙච්ච උගතෙක්, ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදියෙක් වාගේම පක්ෂ, පාට භේදයක් නැතුව රටම පිළිගත්, වියත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට අපගේ මතකයේ එතුමා සදා රැඳෙනවා.

ඊළඟට, අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා ගැන කථා කළොත්, එතුමා 2010දී මා සමඟම තමයි මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. එතුමා ඒ වනකොට අවුරුදු 22ක් සබරගමුව පළාත් සභාව නියෝජනය කරලා තිබුණා. රුවන්වැල්ල ප්‍රදේශයේ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙක් හැටියට ගරු කටයුතු, වගකිව යුතු සේවයක් ඉටු කරමින්, ලංකා සමසමාජ පක්ෂයෙන් ලැබුණු ආභාසය සහ ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා එක්ක දේශපාලනය කිරීමෙන් ලැබුණු ඒ ආභාසය සමඟ, වමේ දේශපාලනයේ අපේ කාලයේ සලකුණක් හැටියට අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා කටයුතු කළා අපට මතකයි. මේ පාර්ලිමේන්තුව තුළ එතුමාත්, මාත් අතර හිතවත්කමක්, මිත්‍රත්වයක් ගොඩනැඟුණා. එතුමා මට වඩා වයසින් සෑහෙන්න වැඩියි. නමුත්, එතුමාත්, මමත් එකවර පාර්ලිමේන්තුවට තේරී පත් වෙච්ච අය. එතුමා ආණ්ඩු පක්ෂයේ, අපි විපක්ෂයේ. ඒ කාලයේත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩියි, මන්ත්‍රීවරුන් 113ට වැඩිය හිටියා. ඒ නිසා අපේ පිටුපස ආසනවලත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හිටියා. අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මන්ත්‍රීතුමාත් මගේ පිටුපස ආසනයක තමයි හිටියේ. අපි එදිනෙදා මුණ ගැහුණා; කථා කළා; දූ දරුවෝ ගැන කථා කළා. එතුමා තමන්ගේ දියණිය වන වත්සලා ජනාදරී මන්ත්‍රීතුමිය ගැන බොහොම ආදරයෙන් මතක් කරමින්, එතුමියගේ ජීවිතය ඉදිරියට ගෙන යෑම ගැනත්, එතුමියගේ අධ්‍යාපනය ගැනත් මාත් එක්ක බොහෝ දේවල් කථා කළ ආකාරය මට හොඳට මතකයි. අපි වත්සලා ජනාදරී මන්ත්‍රීතුමිය ඇතුළු ඒ පවුලේ සියලුදෙනාට, අපේ ආදරය,

හිතවත්කම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි. අප අතරින් වියෝ වුණු ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා හොඳ, වැදගත්, අහිංසක, රටට අවශ්‍ය විධියේ දේශපාලනයක් කරපු වියත් මන්ත්‍රීවරයෙක් හැටියට අපේ මතකයේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභාවප්‍රාප්ත ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමා රජයේ අධිනීතිඥවරයෙක් වශයෙන් තමන්ගේ ධුරයේ රාජකාරි පටන් ගත්තා. ඉන්පසුව එතුමා පෞද්ගලිකව නීතිඥවරයෙක් වශයෙන් කුරුණෑගල ප්‍රදේශය මූලික කරගෙන රට පුරාම ශ්‍රේෂ්ඨ විධියට තමන්ගේ නීතිඥ වෘත්තියේ නිරත වුණා. එතුමා ඉතා දක්ෂ නීතිඥවරයෙක්. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින්, තමනේග් මතය වෙනුවෙන් කටයුතු කරමින්, තමන්ගේ දක්ෂතාව මේ ව්‍යවස්ථාදායකය තුළ සැහෙන කාලයක් කැප කරපු, වැදගත්, උගත් මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාව අපේ මතකයේ තිබෙනවා. ඒ වාගේම එතුමා තානාපතිවරයෙක් හැටියටත් කාලයක් කටයුතු කළා. එමෙන්ම නීතිඥ වෘත්තියේ යෙදුණු අවස්ථා ගණනාවකදී එතුමා මට මුණගැහිලා තිබෙනවා. එතුමා මට කලින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වුණේ. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටියදී එතුමා පෞද්ගලික නීතිඥවරයෙක් වශයෙන් එතුමාගේ වෘත්තියේ යෙදුණා. එවන් අවස්ථා ගණනාවකදී අපි මුණගැහිලා තිබෙනවා. එවකට රටේ දේශපාලනය ගැන, එක්සත් ජාතික පක්ෂය ගැන, රටේ දේශපාලන ඉතිහාසය ගැන, අනාගතයේ විය යුතු දේවල් ගැන, එතුමා වැඩිහිටි, උගත් නීතිඥවරයෙක් හැටියට වාගේම පළපුරුදු දේශපාලනඥයෙක් හැටියට මා සමඟ බොහෝ දේ කථා කර තිබෙනවා. ඒ වාගේම එතුමා මට අවවාද අනුශාසනා ලබා දීලා තිබෙනවා. ඒවා මට අද වාගේ මතකයි. ඒ නිසා අභාවප්‍රාප්ත ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමාගේ පවුලේ සාමාජිකයන් සියලුදෙනා වෙත අපගේ ආදරය, ගෞරවය පිරිනමන්නට මම කැමැතියි. එතුමා පාර්ලිමේන්තුවට ගැළපෙන, මේ ව්‍යවස්ථාදායකයේ රාජකාරි හඳුනා ගත්ත, රටේ දේශපාලනයේ සිටිය යුතු ආකාරයේ උගත්, වියත් මන්ත්‍රීවරයෙක්.

ඒ වාගේම, මහ බැංකුවේ සේවය කරලා, ඉන් පස්සේ දේශපාලනයේ ඉතා දුෂ්කර කාලයක, උතුරේ ත්‍රස්තවාදය ක්‍රියාත්මක වෙද්දී, ITAK පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණි අභාවප්‍රාප්ත ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමාත් අපි මේ අවස්ථාවේදී ආදරයෙන් මතක් කරමින් එතුමාගේ වියෝව පිළිබඳවත් අපගේ බලවත් වූ ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේම ශෝක යෝජනාවක් මීට මාස තුනකට කලින් ඉදිරිපත් වෙච්ච අවස්ථාවේදී, මේ රටේ නීතියේ ආධිපත්‍යය පිළිබඳව, නීතියේ ආධිපත්‍යය වෙනුවෙන් කැප කිරීම් කරපු මන්ත්‍රීවරුන් පිළිබඳව වාගේම නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමට මේ පාර්ලිමේන්තුවට තිබෙන වගකීම පිළිබඳව මම මේ පාර්ලිමේන්තුවේදී කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, ඒ ශෝක ප්‍රකාශ යෝජනා අවස්ථාවේදී නීතියේ ආධිපත්‍යය වෙනුවෙන් කැප කිරීම් කරපු මන්ත්‍රීවරයෙක් ගැන මතක් කරන අවස්ථාවේදී, එදා ඇති වුණු තත්ත්වයක් ගැන මම කිව්වා.

එදා දවසේ, ජනාධිපති සමාව ව්‍යාජ ලෙස උපයෝගී කරගෙන බන්ධනාගාරය තුළ ඉන්න සිරකරුවන් මුදා හැරීම පිළිබඳ කරුණක් මේ සභාවේ අවධානයට ලක් කළා. ඒ අවස්ථාවේ මම හෙළිදරව් කරපු තොරතුරු මත පදනම් වෙලා පොලිස් පරීක්ෂණ කෙරුණා. ඒ සම්බන්ධයෙන් මේ රටේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා අත්අඩංගුවට ගත්තා, ඔහුගේ වැඩ තහනම් කළා. නමුත්, ශෝක යෝජනා ඉදිරිපත් කළ එදා දවසේ ඉඳලා අද වන විට මාස 3ක් ගත වෙලා තිබුණත්, ජනාධිපති සමාව වැරදි විධියට උපයෝගී කරගෙන බන්ධනාගාරයෙන් මුදා හැරපු එකම එක සිරකරුවෙකුවත් තවම අත්අඩංගුවට අරගෙන නැහැ. ඒ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක විධිමත් පරීක්ෂණයක් කරලාත් නැහැ. ඒ වාගේම, එතරම් බරපතළ ආකාරයකට ජනාධිපති සමාව අවිධිමත් ලෙස පාවිච්චි කිරීම සිද්ධ වෙලා නීතියේ ආධිපත්‍යය පිළිබඳ බරපතළ සැකයක් ඇති වෙලා තිබෙද්දීත් අද වනකල් ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වෙච්ච නිලධාරින්ට විරුද්ධව නඩුත් නැහැ, ඔවුන්ට විරුද්ධව විනය පරීක්ෂණත් නැහැ. ඒ වාගේම වැරදි ලෙස බන්ධනාගාරයෙන් එළියට ගියා කියන සිරකරුවන්ගේ නම් ඇත්තෙත් නැහැ. ඔවුන් කවුද කියලා කියන්නෙත් නැහැ. ඒ සම්පූර්ණ කථාව අද යට ගහලා තිබෙනවා. මෙක ඉතා කනගාටුදායක තත්ත්වයක්. මේ මන්ත්‍රීවරු එදා ව්‍යවස්ථාදායකය තුළ නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්න කැප වුණා. එතුමන්ලා අපි මතක් කරන මොහොතේ, එදා ශෝක යෝජනා අවස්ථාවේදී, රටේ ඒ මොහොතේ මතු වෙලා තිබුණු බරපතළ තත්ත්වය පිළිබඳව මම කරුණු දැක්වුවා. අදත් එවැනි ශෝක යෝජනා අවස්ථාවකදී නීතියේ ආධිපත්‍යය පිළිබඳ, මේ රටේ බන්ධනාගාරවල තිබෙන තත්ත්වය පිළිබඳ, ජනාධිපති සමාව පිළිබඳ තිබෙන තත්ත්වයේ වෙනසක් නැහැ. අලුත් පාලනයක්, අලුත් ආණ්ඩුවක් යටතේ අලුත් වෙනසක් ඇති වුණා කිව්වාට එ් ආකාරයෙන්ම ඒ කටයුත්ත තිබෙනවාය කියන එකත් මම කනගාටුවෙන් කියන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

[අ.භා. 4.02]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම, අපේ හිටපු රාජ්‍ය අමාත්‍ය ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේත්, මගේත් ශෝකය ප්‍රකාශ කරන්න මම කැමැතියි. එතුමා රාජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් වාගේම, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය නිර්මාණය වෙච්ච වෙලාවේ ඉඳන්ම හිටපු පස්වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක පක්ෂය ගොඩ නැඟීමේ කාර්යයේදී වාගේම, පොහොට්ටුව පක්ෂයේ ආණ්ඩුවක් බිහි කරන්න විශාල කාර්යභාරයක් ඉටු කළා. "මැණික් කුලුන" වැනි සංවර්ධන යෝජනා ගෙනැල්ලා රට වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළ රාජ්‍ය අමාත්‍යවරයෙක්, ලොහාන් රත්වත්තේ මැතිතුමා. ඒ වාගේම එතුමා මහනුවර දිස්ත්‍රික්කයටත්, ආසනයටත් විශාල කාර්යභාරයක් ඉටු කළා. එතුමාගේ අභාවය වෙනුවෙන් එම පවුලේ සියලු දෙනා වෙත අපගේ ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා පිළිබඳවත් අද දවසේ ශෝක යෝජනා ගෙනැවිත් තිබෙනවා. ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා අපේ පක්ෂය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළ දේශපාලනඥයෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් පක්ෂයටත්, ඒ වාගේම ගුරුවරයෙකු වශයෙන් රටටත් විශාල කාර්යභාරයක් ඉටු කළ පුද්ගලයෙක්. එතුමා අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ගරු වරුණ ලියනගේ මැතිතුමාගේ ආදරණීය පියාණන්. ගරු හීන්මහත්මයා මැතිතුමාගේ අභාවය වෙනුවෙන්

[ගරු ඩී.වී.චානක මහතා]

ගරු වරුණ ලියනගේ මැතිතුමාටත්, එම පවුලේ සියලුදෙනාටත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙනුවෙන් මම ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභාවප්‍රාප්ත ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා ගැනත් මම වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. එතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක එකට දේශපාලනය කළේ. එතුමා අපේ පක්ෂයට වාගේම, කැස්බෑව ආසනයට විශාල සේවාවක් කළ මන්ත්‍රීවරයෙක්. පළාත් සභාවේ අමාත්‍යවරයකු වශයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමා කැස්බෑව ආසනයට වාගේම ලංකාවටම විශාල කාර්යභාරයක් ඉටු කළා. එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ භාර්යාව, දුව, පුතා ඇතුළු පවුලේ සියලුදෙනාට අප පක්ෂයේත්, පෞද්ගලිකව මාගේත් ශෝකය ප්‍රකාශ කරනවා.

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු ආචාර්ය මර්වින් ඩී.ද සිල්වා මැතිතුමාගේ අභාවය වෙනුවෙනුත් අද දවසේ මෙම ගරු සභාවේ ශෝකය පළ කෙරෙනවා. ගරු මර්වින් ඩී. ද සිල්වා මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් දෙවතාවක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් රට වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළ මහජන නියෝජිතයෙක්. එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ සියලුදෙනා වෙත අප පක්ෂයේ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

අභාවප්‍රාප්ත ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා ගැනත් මම කථා කරන්න ඕනෑ. එතුමා කෑගල්ල දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. එතුමා ලංකා සමසමාජ පක්ෂය, එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් රුවන්වැල්ල ආසනයට වාගේම කෑගල්ල දිස්ත්‍රික්කයට විශාල කාර්යභාරයක් ඉටු කළා. රුවන්වැල්ල කියන්නේ, ඒ කාලයේ නොදියුණු ආසනයක්. එම ආසනය සංවර්ධනය කරන්න එතුමා විශාල කාර්යභාරයක් කළා. එතුමා අප පක්ෂය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රී ගරු වත්සලා මන්ත්‍රීතුමියගේ පියාණන්. ගරු වයි.ජී. පද්මසිරි මහතාගේ අභාවය පිළිබඳව එතුමිය ඇතුළු පවුලේ සියලුදෙනාට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ශෝකය මා ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ගරු ආර්.එම්.ආර්. වූල බණ්ඩාර මහතා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිස, රට වෙනුවෙන් විශාල සේවයක් කළ මන්ත්‍රීවරයෙක්. එතුමාගේ අභාවය පිළිබඳවත් එතුමාගේ පවුලේ සියලුදෙනාට අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ඒ වාගේම, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මහතාගේ අභාවය වෙනුවෙනුත් අද දවසේ ශෝකය පළ කෙරෙනවා. එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ සියලුදෙනාට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සහ පෞද්ගලිකව මාගේත් ශෝකය ප්‍රකාශ කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 4.05]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා, ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා, ගරු ආචාර්ය මර්වින් ඩී.ද සිල්වා මැතිතුමා, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා, ගරු ආර්.එම්.ආර්. වූල බණ්ඩාර මැතිතුමා හා ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමා කියන ගරු මන්ත්‍රීතුමන්ලාගේ අභාවය වෙනුවෙන් අද දින අපි ශෝකය ප්‍රකාශ කරනවා.

මම මුලින්ම කථා කරන්න කැමැතියි, රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු හීන්මහත්මයා ලියනගේ මන්ත්‍රීතුමා ගැන. එතුමා පාර්ලිමේන්තුවේ අප මිත්‍ර ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමාගේ පියතුමා. හීන්මහත්මයා ලියනගේ මැතිතුමා කියන්නේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් රත්නපුර දිස්ත්‍රික්කයට විශිෂ්ට කාර්යභාරයක් ඉෂ්ට කළ මන්ත්‍රීවරයෙක්. එතුමා රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් කළ එම සමාජ සේවය ඉදිරියට ගෙන යාම සඳහා ඉතා යහපත්, ගුණවත් පුද්ගලයෙකු වන තම පුත්‍රයා ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් තමන්ගෙන් ඉටු විය යුතු කාර්යභාරය සහ යුතුකම නිසියාකාරව ඉෂ්ට කළ මහජන නියෝජිතයෙකු හැටියට තමයි අපි එතුමාව හඳුන්වන්නේ. එතුමාගේ සේවාව දිගින් දිගටම ඉස්සරහට ගෙන යන්න එතුමාගේ පුතාට පළමුව පළාත් සභාව නියෝජනය කරන්නත්, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට සේවය කරන්න තුන්වෙනි වතාවට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නත් අවස්ථාව සලසා දීලා තිබෙනවා. අපි හිතනවා ඒක හීන්මහත්මයා ලියනගේ මැතිතුමා රත්නපුර ජනතාවට ලබා දුන් හොඳ අවස්ථාවක් කියලා.

හීන්මහත්මයා ලියනගේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පුත්, අප හිතවත් වරුණ ලියනගේ මන්ත්‍රීතුමා ඇතුළු ඒ පවුලේ සියලුදෙනාටත්, රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවටත් අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සුව අත් වේවායි මා ප්‍රාර්ථනය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් වූල බණ්ඩාර මැතිතුමා මේ පාර්ලිමේන්තුවට පිවිසුණේ පඬුවස්නුවර ආසනයෙන්. එතුමාගේ පියාත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු ලෙස මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජය යටතේ. වූල බණ්ඩාර මැතිතුමා මුලින්ම කථිකාචාර්යවරයකු හැටියටත්, ඉන් පසුව නීතිඥවරයකු හැටියටත් එතුමාගේ සේවය ජනතාවට ලබා දුන්නා. ඉන් පසුව එතුමා එක්සත් ජාතික පක්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු ලෙස ඒ දිස්ත්‍රික්කයට විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. එතුමා උපන් ප්‍රදේශය වන පඬුවස්නුවර ප්‍රදේශයේ, ඒ දුෂ්කර ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළට නැංවීමේ කාර්යභාරය වෙනුවෙන් තම වෘත්තීය ජීවිතයත් පසෙක තියලා විශාල කැප කිරීම් ගණනාවක් කළා. එතුමා දක්ෂ නීතිඥවරයකු හැටියට කටයුතු කරමින් සිටින අතරතුර තමයි පාර්ලිමේන්තුව නියෝජනය කරන්න මහජන නියෝජිතයෙකු හැටියට පත් වුණේ. ඒ හරහා එතුමා මහ ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. එතුමාගේ සහෝදරයා වන නිමල් බණ්ඩාර මැතිතුමාත් වයඹ පළාත් සභාවේ මහ ඇමතිවරයා හැටියට ඒ වකවානුව තුළම විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. පියාගෙන් ලැබූ ආදර්ශය අනුව ඉස්සරහට යමින් කුරුණෑගල දිස්ත්‍රික්කයට විශාල කාර්යභාරයක් ඉෂ්ට කළ මන්ත්‍රීවරයකු හැටියට අපට වූල බණ්ඩාර මැතිතුමාව හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියට ඒ ජනතාව වෙනුවෙන් වූල බණ්ඩාර මැතිතුමා කළ සේවය මා අගය කරන අතර, එතුමාගේ අභාවය පිළිබඳව ඒ පවුලේ ඥාතීන්ට සහ කුරුණෑගල දිස්ත්‍රික් ජනතාවට අපගේ ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව අත් වේවායි ප්‍රාර්ථනය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලොහාන් රත්වත්තේ මැතිතුමා මන්ත්‍රීවරයකු හැටියත්, නියෝජ්‍ය ඇමතිවරයකු හැටියටත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. අප

පාර්ලිමේන්තුව නියෝජනය කරන කාල වකවානුවේදීම මහනුවර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු ලෙස එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමාගේ අභාවය වෙනුවෙනුත් එතුමාගේ පවුලේ සියලුදෙනාට අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා ගැන කිව්වොත්, එතුමා මන්ත්‍රීවරයකු හැටියටත්, නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියටත් මේ පාර්ලිමේන්තුවේ කටයුතු කළා. එතුමා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ජනතාවට විශාල කාර්යභාරයක් ඉටු කළා. එතුමාගේ අභාවය පිළිබඳව ඒ පවුලේ සියලුදෙනාටත්, කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවටත් ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනය කරනවා.

ඊළඟට, අභාවප්‍රාප්ත වයි.ජී. පද්මසිරි මැතිතුමා ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. එතුමා මන්ත්‍රීවරයකු හැටියටත්, නියෝජ්‍ය ඇමතිවරයකු හැටියටත් මේ සභාව නියෝජනය කරමින් තම කාර්යභාරය හොඳින් ඉෂ්ට කළ මන්ත්‍රීවරයකු බව මතක් කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් ඒ පවුලේ සියලුදෙනාටත් අපගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ඒ වාගේම මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්ද්‍රන් මැතිතුමාගේ අභාවය වෙනුවෙනුත් අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, අද දින ශෝක ප්‍රකාශ යෝජනා ගෙන එන ලද සියලු මන්ත්‍රීතුමන්ලාගේ පවුල්වල ඥාතීන් වෙත අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 4.12]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ මහජන නියෝජිතයන් හත්දෙනෙකුගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කිරීමේ අවස්ථාවට අද පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලා සම්බන්ධ වෙලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන්නේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු ලොහාන් රත්වත්තේ, ගරු හීන්මහත්මයා ලියනගේ, ගරු ඩික්සන් ජේ. පෙරේරා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා, ගරු වයි.ජී. පද්මසිරි, ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්ද්‍රන් යන මැතිතුමන්ලාගේ අභාවය වෙනුවෙන්. පාර්ලිමේන්තුව නියෝජනය කරපු ඒ මන්ත්‍රීවරුන් පිළිබඳව නවක මන්ත්‍රීවරුන් වන අප බොහෝ කරුණු අසා තිබෙනවා. අපි එතුමන්ලා පෞද්ගලිකව ආශ්‍රය නොකළත්, එතුමන්ලා සතුව පැවැති සුවිශේෂී ගුණාංග පිළිබඳව අපට දැන ගන්න ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු මන්ත්‍රීතුමෙකු වන ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා පිළිබඳව මම මේ අවස්ථාවේදී කථා කරන්න කැමැතියි. 1980 වැඩ වර්ජනයේදී රැකියාවත් අහිමි වුණු එතුමා, ඊට පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තෝරා ගනිමින් 1982දී දේශපාලනයට පිවිස, 1989දී පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඊට පසුව තුන්වතාවක්; 1994දීත්, 2000දීත්, 2010දීත් එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වුණා.

අද ශෝක යෝජනා ඉදිරිපත් කරන අනෙකුත් ගරු මන්ත්‍රීතුමන්ලා පිළිබඳව, එතුමන්ලාගේ චරිත පිළිබඳව බොහෝ කරුණු කාරණා ඉදිරිපත් කළත්, රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා පිළිබඳව කොහේවත් එහෙම සටහනක් ලියැවී නැහැ. නමුත්, 1988 -1989දී රාජ්‍ය මර්දනය තිබුණු කාලය තුළ එතුමා බොහෝ පිරිසකට උදවු කළ විත්තිය අපි දන්නවා. ඒ වාගේම වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන අපේ මන්ත්‍රීතුමන්ලාට පවා එතුමා යම් යම් අවස්ථාවලදී ඒ මොහොතේ හැටියට බොහෝ සෙයින් උදවු උපකාර කළ විත්තිය අපි දන්නවා. එතුමා ඉතා නිහතමානි පුද්ගලයෙක්. වෙනත් දේශපාලන කණ්ඩායම් රාජ්‍ය බලය හොබවද්දී එතුමා ඒ අයත් සමඟ එකතු වෙලා ගමට, ප්‍රදේශයට සේවාවක් සිදු කළ විත්තිය අපි හැමෝම දන්නවා. ඒ වාගේම එතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අවසන් වුණාට පසුවත් ඒ ගම් ප්‍රදේශයේ තරුණයන් එක්ක, හිතවත් අය එක්ක එකතු වෙලා කටයුතු කරමින් සාමාන්‍ය ජීවිතයක් ගත කළ විත්තිය තමයි බොහෝදෙනා පවසන්නේ. ඒ ආකාරයට නිහතමානිව, අනුන්ට ආදර්ශයක් ලබා දෙමින් කටයුතු කළ ගෞරවනීය මන්ත්‍රීවරයෙක් තමයි ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරන වරුණ ලියනගේ මැතිතුමා ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමාගේ පුත්‍ර රත්නයයි. පාර්ලිමේන්තුව නියෝජනය කරපු එතුමාගේ පියාණන් වෙනුවෙන් අද මේ පාර්ලිමේන්තුව තුළ ශෝක ප්‍රකාශ යෝජනාවක් ඉදිරිපත් කරමින් ලබා දෙන මේ ගෞරවය දැක ගන්න ලැබීම ගරු වරුණ ලියනගේ මැතිතුමාටත් ගෞරවයක් ලබා දෙන කාරණයක්.

අපි දන්නවා, දේශපාලනයේ නියැළෙන සෑම කෙනෙක් ගැනම සමාජය තුළ හොඳ සාධනීය ලක්ෂණ වාගේම, වැරදි පිළිබඳවත් කථා වෙන බව. එහෙම තමයි දේශපාලනය කරනකොට. එතුමන්ලාගේ හොඳ, නරක ගැන එක එක කාලවලදී කථා වුණත්, එතුමන්ලා දේශපාලනයෙන් සමු ගත්තාට පසුව තමයි එතුමන්ලා තුළ තිබුණු ගුණ ධර්ම පිළිබඳව හැමෝම කථා කරන්නේ. එතුමන්ලා සමාජයට කරපු සේවයේ වටිනාකම ගැන දේශපාලනයෙන් සමු ගත්තාට පසුව කථා කරනවා. කුමන පක්ෂයක් නියෝජනය කළත්, කුමන දේශපාලන මතයක් දැරුවත් අවසානයේදී එතුමන්ලා කළ හොඳ පිළිබඳව තමයි ගොඩක් අය කථා කරන්නේ. අද ශෝක යෝජනා ගෙනෙන මේ ගරු මන්ත්‍රීතුමන්ලා හත් දෙනාගේ ජීවිත පිළිබඳව, එතුමන්ලා දීපු ආදර්ශ පිළිබඳව, එතුමන්ලා කරපු කැප කිරීම් පිළිබඳව මේ සමාජයේ ඉන්න ගොඩක් දෙනා දකින්නේ සාධනීය විධියට. මම හිතන විධියට, ඒක තමයි අපි දේශපාලනයෙන් සමු ගත්තාට පස්සේ ලබාගත යුත්තේ. දේශපාලනය කළ කාලය තුළ මිනිස්සුන්ට, සමාජයට, රටට දක්වපු දායකත්වය පිළිබඳව යම් ප්‍රසාදයක් ලැබෙනවා නම්, ඒ පිළිබඳව දීර්ඝ කාලීනව කථා කරනවා නම් ඒක තමයි අපි දේශපාලනයේදී ලබා ගත යුතු සහ ලබා ගන්න ඕනෑ දේ. සමාජයට, ජනතාවට යම් ආදර්ශ ගත හැකි චරිත විධියට තමයි අපි මේ හැම චරිතයක්ම දකින්නේ.

රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරපු හීන්මහත්මයා ලියනගේ හිටපු ගරු මන්ත්‍රීතුමාගේ පවුලේ අයට -ආදරණීය බිරිඳට, වරුණ ලියනගේ හිතවත් මන්ත්‍රීතුමා ඇතුළු ඥාතීන්ට- මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ශෝකය, කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අද ශෝක යෝජනා ගෙනෙන ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාට, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාට,

[ගරු උපුල් කිත්සිරි මහතා]

ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමාට, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමාට, ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමාට සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමාට අපගේ ගෞරවය සහ උපහාරය පුද කරමින් මා නිහඬ වෙනවා, බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වරුණ ප්‍රියන්ත ලියනගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.20]

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද, හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හත් දෙනෙකු වෙනුවෙන් ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් වෙනවා. ඒ අතර, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා, මාගේ පියා වන ගරු තීන්මහත්මයා ලියනගේ මැතිතුමා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා, ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමා සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මැතිතුමාගේ නම් සඳහන් වෙනවා.

අද මන්ත්‍රීතුමන්ලා 23දෙනෙකුට ආසන්න පිරිසක් එතුමන්ලා ගැන කථා කළා. මම, ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා ගැන වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. මේ, මම පාර්ලිමේන්තුව නියෝජනය කරන තුන්වැනි අවස්ථාව. එතුමා මා සමඟ අවස්ථා දෙකකදී දේශපාලනය කළා. එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් නුවර දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල වැඩ කොටසක් කළා. මට මතකයි, එතුමායි මමයි කුණු අප්‍රිකාවේ තිබිච්ච තරුණ සම්මේලනයකට සහභාගි වුණා. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්නකොට එතුමාත් එක්ක සහෝදරයන් විධියට තමයි දේශපාලන කටයුතුවල යෙදුණේ. ඒ වාගේම එතුමා යහළුවකු විධියටත් ආශ්‍රය කළා. ඒ වාගේම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ළඟින්ම ඉඳලා දේශපාලන ජීවිතය සාර්ථක කර ගන්න විශාල වැඩ කොටසක් කරපු, දැඩි තීන්දු ගත්ත, පක්ෂයට ළැදි නායකයෙක් තමයි ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා. එතුමාගේ වියෝව පොදුජන පෙරමුණටත්, එතුමාගේ පවුලේ අයටත්, නුවර දිස්ත්‍රික්කයේ ජනතාවටත් විශාල පාඩුවක් කියලා මම විශ්වාස කරනවා. මේ අවස්ථාවේදී මගේත්, මගේ පවුලේ අයගේත් ශෝකය ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමාගේ පවුලේ අයට ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා 201දී මා සමඟ පළාත් සභාවේ අමාත්‍යවරයකු වශයෙන් විශාල වැඩ කොටසක් ඉටු කළා. ඒ වාගේම එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යවරයෙකු විධියටත් විශාල වැඩ කොටසක් කරපු නායකයෙක්. මට මතකයි මගේ පියා කියනවා, වයි.ජී. පද්මසිරි ඇමතිතුමා පළාත් සභාවේ අමාත්‍යවරයකු විධියට වැඩ කටයුතු කරන අවස්ථාවේ කටයුතු කළ ආකාරය. රක්වාන ආසනයේ රන්වල කියලා වැවක් තිබෙනවා. රන්වල වැවේ පිටවාන කඩාගෙන යනකොට වයි.ජී. පද්මසිරි ඇමතිතුමා තමයි ඒ වෙලාවේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යතුමා විධියට කටයුතු කළේ. ඒ වෙලාවේ වයි.ජී. පද්මසිරි ඇමතිතුමා ඒ පිටවාන කඩා ගෙන යන්න නොදී, ගමේ ජනතාවට රන්වල වැව හදා දුන්නා කියලා පියා කියා තිබෙනවා මට මතකයි. එතුමා කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළත්, රත්නපුර දිස්ත්‍රික්කයේ කෙළවරක තිබෙන වැවක් සංවර්ධනය කරන්න කටයුතු කළා. එවකට රුපියල් ලක්ෂ 15ක් කියන්නේ විශාල මුදලක්. මම හිතන විධියට, දැන් නම් ඒ මුදල කෝටි 5ක් විතර වෙනවා. එතුමා ඒ මුදල ලබා දීලා ඒ වැව හදන්න කටයුතු කරපු නිසා අද රන්වල ජනතාවට මේ වැව විශාල වශයෙන් ප්‍රයෝජනවත් වෙලා තිබෙනවා. වයි.ජී. පද්මසිරි මැතිතුමා කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල වැඩ කොටසක් කරපු අමාත්‍යවරයෙක්. එතුමා වාමාංශික ව්‍යාපාරයේ, මහජන එක්සත් පෙරමුණේ නායකයකු විධියට එන්.එම්. පෙරේරා මැතිතුමාත් එක්ක ළඟින් ඇසුරු කරලා වාමාංශික දේශපාලනය තුළින් ඉතාම නිහතමානීව, ඉතාම අවංකව විශාල වැඩ කොටසක් කරපු නායකයෙක්. එතුමා තුන්කෝරළය ප්‍රදේශයේ ජනතාවට කරන්න පුළුවන් උපරිම ශක්ති ප්‍රමාණයෙන් සේවය කළා. එපමණක් නොවෙයි එතුමාගේ එකම දියණිය වන අපේ වත්සලා ජිනාදරී මන්ත්‍රීතුමිය පළාත් සභාවට යවලා, පළාත් සභාව තුළිනුත් ඒ ජනතාවට විශාල සේවයක් කරන්න එතුමා කටයුතු කළා.

මම දෙසැරයක් පළාත් සභාව නියෝජනය කළා. අපේ වත්සලා මන්ත්‍රීතුමිය මාත් සමඟ දේශපාලනය කරනකොට ජනතාව වෙනුවෙන්ම වැඩ කරමින් විශාල වැඩ කොටසක් කළ නායිකාවක්. වයි.ජී. පද්මසිරි මැතිතුමා සමාජයට විශාල වැඩ කොටසක් කළ නායකයකු විධියට හඳුන්වන්න පුළුවන්. එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන ගමන් එතුමාගේ පවුලේ සියලුදෙනාටම මගේ ශෝකය ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පියාත් සමඟ දේශපාලනය කරපු අනෙක් සියලු නායකයන් අතරින් ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමා ගත්තොත්, එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් දේශපාලනය කරලා, කැස්බෑව ආසනය මූලික කරගෙන සහ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල වැඩ කොටසක් කරපු නායකයෙක්. ඩික්සන් ජේ. පෙරේරා මැතිතුමාගේ පවුලේ සියලුදෙනාටත් එතුමාගේ අභාවය වෙනුවෙන් මේ වෙලාවේ මගේ ශෝකය පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පියාත් සමඟ හිටපු මේ මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම සමාජයට විශාල වැඩ කොටසක් කරපු නායකයන්. මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා, චූලා බණ්ඩාර මැතිතුමා, කනගසබාපති ඊලවේන්දන් මැතිතුමාගේ අභාවය වෙනුවෙනුත් මා ඇතුළු මගේ පවුලේ සියලුදෙනාගේ ශෝකය මේ වෙලාවේ ප්‍රකශ කරන්න කැමැතියි.

මම අද ඉතාම සන්තෝෂ වෙනවා, මගේ පියා ගැන කථා කරන්නට ලැබීම ගැන. ඇත්තටම පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය තමයි මගේ පියාගේ ශෝක යෝජනාව ගෙනෙන්න ඕනෑ කියලා නිතරම යෝජනා කළේ. නමුත්, ඕනෑ නැහැ කියන තැන තමයි මම නිතරම හිටියේ. හැබැයි, පසුගිය මාසයේ සිකුරාදා දවසක මම මේ සභාවේ ඉන්නකොට ශෝක ප්‍රකාශ ඉදිරිපත් කරන අවස්ථාවේ මේ වාගේ කථා මටත් අහන්න ලැබුණා. ඒ කථා අහනකොට තමයි මට තේරුණේ මේකේ තිබෙන වැදගත්කම. ඒ නිසා තමයි අවුරුද්දකට පස්සේ මේ ශෝක යෝජනාවට තාත්තාගේ නම ඇතුළත් කළේ. අද වෙනකොට තාත්තා මිය ගිහිල්ලා හරියටම අවුරුද්දයි දවස් හතක් වෙනවා. මට තාත්තාගේ ශෝක යෝජනාව ගෙනෙන්න ඕනෑය කියලා හිතුණේ පසුගිය මාසයේ කරපු කථා ඇහුවාමයි. ඊට කලින් පාර්ලිමේන්තුවේ සියලුදෙනාම මට කථා කරලා කිව්වා, තාත්තාගේ යෝජනාව ගේන්න කියලා. නමුත්, මම ඒකට එකඟ වුණේ නැහැ. මොකද, එතුමා ගැන නිතරම කථා කරන එකටත් තාත්තා කැමැති වුණේ නැහැ. එතුමා නිශ්ශබ්ද නායකයෙක්.

මම පළමුවැනියටම ප්‍රාදේශීය සභාවට තමයි ඡන්දය ඉල්ලුවේ. මගේ තාත්තා කියලා නොවෙයි මම ප්‍රාදේශීය සභාවට ඡන්දය ඡන්දය ඉල්ලුවේ. ඒ වෙලාවේ මට ඡන්දය ඉල්ලන්න කිව්වේ පවිත්‍රා වන්නිආරච්චිගේ මැතිනියගේ පියා වන ධර්මදාස වන්නිආරච්චි මැතිතුමා. එතුමා පාර්ලිමේන්තුවේ හිටපු අමාත්‍යවරයෙක්. ධර්මදාස වන්නිආරච්චි මැතිතුමා තමයි අපේ තාත්තාත් දේශපාලනයට ගෙනාවේ. මට මතකයි, මම ප්‍රාදේශීය සභාවට ගිය පළමුවැනි දවසේ පිළිගැනීමේ උත්සවයට මගේ පියාත් ආවා. ඊට පස්සේ නැවතත් ඒ සම්බන්ධයෙන් කථා කළේ නැහැ. ඒ වාගේම මම පළාත් සභාවට දෙසැරයක් තේරුණා. දෙසැරයක් තේරිලා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. කවදාවත් තාත්තා පළාත් සභාවට ඇවිල්ලා තිබුණේ නැහැ. ඒ වාගේම මම පළමු සැරේ පාර්ලිමේන්තුවට එන දවසේ තාත්තා පාර්ලිමේන්තුවට ආවා. ඊට පස්සේ ආපසු දෙසැරයක් මම ජයග්‍රහණය කළා. නමුත් නැවත එතුමා ආවේ නැහැ. ඉතින් එතුමාට වුවමනාවක් තිබුණේ නැහැ, ප්‍රසිද්ධියක් ගන්න, එහෙම නැත්නම් නම ඉස්සරහට ගෙනියන්න. ඒ වාගේම එතුමා ගැන කථා කරනවාට කවදාවත් කැමති වුණේ නැහැ. එතුමා වැඩ කළා පමණයි. අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමා කිව්වා වාගේ, අපේ ගරු විපක්ෂ නායකතුමාත් කිව්වා වාගේ එතුමා පාර්ලිමේන්තුව තුළ විශාල වැඩ කොටසක් කළා. පක්ෂයක් විධියට ගත්තොත්, තාත්තා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙලා බණ්ඩාරනායක මැතිනියගෙන් ලබපු දේශපාලන අත්දැකීම් එක්කයි දේශපාලනය කෙරුවේ. ඒ නිසාම විශාල වැඩ කොටසක් කළා.

ඒ වාගේම, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟත් එතුමා හිතවත්. එතුමාව ළඟින් ආශ්‍රය කළා. මම හිතන විධියට, තාත්තා විතාරන්දෙණිය ඉස්කෝලේ වැඩ කරපු කාලයේ ඉඳලා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක ළඟින් දේශපාලනය කළා; ආශ්‍රය කළා. ඒ නිසා රක්වාන ආසනයේ ජනතාවට එතුමාගෙන් විශාල වැඩ කොටසක් කරගන්න පුළුවන් වුණා.

මගේ තාත්තා මිය ගිය වෙලාවෙත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ අවසන් කටයුතුවලට සහභාගි වුණා. මම එතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. අපේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාත් අවසන් කටයුතු සිදු කරන අවස්ථාවට සහභාගි වුණා. ඒ වාගේම රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩු පක්ෂයේ දැන් සිටින සියලු මන්ත්‍රීවරුත්, - එදා ඡන්දය පැවැති ඒ වෙලාවේ එතුමන්ලා අපේක්ෂකයෝ - අපේ සුනිල් සෙනෙවි ඇමතිතුමාත් ඒ අවසන් කටයුතු පැවැති අවස්ථාවට සහභාගි වුණා. අද දවසේ කථා කරපු ආණ්ඩු පක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලා එම අවස්ථාවට සහභාගි වුණා. ඒ වාගේම විපක්ෂයේ එදා කෑගල්ල නියෝජනය කරපු හිටපු ගරු දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමාත් අවසන් කටයුතුවලට සහභාගි වුණා. ඒ වාගේ විශාල මන්ත්‍රීවරු පිරිසක් එම අවස්ථාවට සහභාගි වුණා. සමහර දෙනෙකුට සහභාගි වෙන්න වුණේ නැහැ, ඡන්දය නිසා. නමුත් මගේ ඒ ගැන කිසිම කනගාටුවක් නැහැ. අද දවසේ ශෝක යෝජනාවේදී මගේ තාත්තා ගැන විසිතුන්දෙනෙක් කථා කරලා ශෝකය ප්‍රකාශ කළා. අපේ විපක්ෂ නායකතුමා, ඒ වාගේම ගයන්ත කරුණාතිලක හිටපු අමාත්‍යතුමා, ඒ වාගේම අපේ පක්ෂයේ මහ ලේකම්තුමා, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා ප්‍රධාන ඒ සියලු දෙනාටම මේ වෙලාවේදී මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන අභාවප්‍රාප්ත ගරු ලොහාන් රත්වත්තේ මහතා, ගරු හීන්මහත්මයා ලියනගේ මහතා, ගරු ඩික්සන් ජේ. පෙරේරා මහතා, ගරු ආචාර්ය මර්වින් ඩී. ද සිල්වා මහතා, ගරු වයි.ජී. පද්මසිරි මහතා, ගරු ආර්.එම්. චූල බණ්ඩාර මහතා සහ ගරු මානික්කවාසගර් කනගසබාපති ඊලවේන්දන් මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින්, ගරු කථානායකතුමා සමඟ මම ද ඊට එකතු වීමට කැමැත්තෙමි.

අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුල්වල අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරියට මම නියෝග කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

## දියවඩන නිලමේ තනතුර සඳහා වන ඡන්ද විමසීමේදී කාන්තා ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඡන්ද අයිතිය ලබා දීම
## தியவடன நிலமே பதவிக்கான வாக்கெடுப்பில் பெண் பிரதேச செயலாளர்களுக்கு வாக்களிக்கும் உரிமையை வழங்குதல்
## GRANT OF VOTING RIGHTS TO FEMALE DIVISIONAL SECRETARIES AT ELECTION OF DIYAWADANA NILAME

[අ.භා. 4.32]

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "වසර 2500ක ශ්‍රේෂ්ඨ ඉතිහාසයකට හිමිකම් කියන රටක් ලෙසත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බුදු දහම පෝෂණය කොට පවත්වාගෙන යාමත්, සෙසු ආගම්වලට ගරු කරන බවටත්, නීතියෙන් සහතික කර ඇති පසුබිමක කාන්තාවන්ට සිදුව ඇති අසාධාරණයක් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

[ගරු චතුර ගලප්පත්ති මහතා]

ඒ අතර, දළදා මාලිගාවේ දියවඩන නිලමේ තනතුර සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේ ඡන්ද විමසීමට සම්බන්ධ විය හැකි බල ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරියන්ට ඡන්ද බලය නොලැබීම මින් ප්‍රධාන ගැටලුවකි. එසේම, දියවඩන නිලමේ තනතුර දැරීමේ කාල සීමාව සහ ධුරය දැරීම සඳහා වූ අවස්ථාවන් පිළිබඳව මතුව ඇති කතිකාව ද මෙහිදී අවධානයට යොමු කළ යුතු කරුණකි.

එසේ හෙයින්, මෙවන් උතුම් සිද්ධස්ථාන සඳහා පාලන අධිකාරින් තෝරා ගැනීමේදී නීතිය පමණක්ම නොව ඉන් ඔබ්බට බැඳුණු සංස්කෘතික කාරණා සම්බන්ධයෙන් ද සුවිශේෂී අවධානයක් යොමු කරමින් හා මල්වතු -අස්ගිරි උභය පාර්ශ්වයේ මහානායක හිමිපාණන් වහන්සේලාගේ ආශිර්වාදයෙන් යුතුව වර්තමානයට ගැළපෙන පරිදි අවශ්‍ය නීති සංශෝධනය විය යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සතිය විශේෂයෙන්ම කාන්තාවන් ගැන වැඩියෙන්ම කථා කරපු සතියක් බව අපි දන්නවා. ඒ වාගේම, ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ තේරීම සඳහා වන ඡන්ද විමසීම ලබන මාසයේ මුල් සතියේ පවත්වන්නට නියමිතයි. මා මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ එළඹෙන නිලවරණය සඳහා නොව ඉන් පසුව පවත්වන නිලවරණය සඳහා යම් සංශෝධනයක් කිරීමේ අරමුණින්. 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 40වන වගන්තියේ තමයි දියවඩන නිලමේවරයකු තෝරා පත් කර ගැනීමේ ඡන්ද අයිතිය හිමිවන්නන් ගැන සඳහන් කර තිබෙන්නේ. මේ පනත ප්‍රකාරව දළදා මාළිගාවේ දියවඩන නිලමේ තේරීමේ නිලවරණයේදී පමණක් නොව, සෙසු සිද්ධස්ථානවලද -උදාහරණයක් ලෙස රුහුණු මහා කතරගම දේවාලය, සබරගමු මහ සමන් දේවාලය හා දෙවිනුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලය- බස්නායක නිලමේවරුන් තේරීමේ නිලවරණවලදී ද කාන්තා නියෝජනය බැහැර කර ඇති බව දක්නට ලැබෙනවා.

ඇත්තටම අපි බැලුවොත්, ඉතිහාසයට අනුව විශේෂයෙන්ම ඉන්දියාවේ සිට ලංකාවට දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීමේදී හේමමාලා කුමරිය තමයි ආරක්ෂිතව තම කේශ කලාපය තුළ සඟවාගෙන දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩම කළේ. ඒ වාගේම, අටමස්ථානවලින් ප්‍රධාන ස්ථානයක් ගන්නා ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරන්නට කටයුතු කළේ සංඝමිත්තා තෙරණියයි. ඒ අනුව, බෞද්ධයන් විධියට දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීම සඳහාත්, ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම සඳහාත් එදා කාන්තාවන් තමයි කටයුතු කර තිබෙන්නේ. ඇයි, එතකොට මේ වාගේ හේතුවක් ඇවිල්ලා තිබෙන්නේ? කාන්තාවට ඡන්ද අයිතියක් නොලැබෙන්න හේතුව මොකක්ද? 1948ට පෙර, එනම් ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර අධිරාජ්‍යවාදීන් විසින් සම්මත කරගන්නා ලද පනතක් තමයි මේකට හේතු වෙලා තිබෙන්නේ. ඇතැම් විට බුද්ධ දර්ශනය සහ බෞද්ධ සංස්කෘතිය ගැන නිවැරදි අදහසක් නැති අය තැන් තැන්වල විවේචනයට ලක් කරනවා, කාන්තාවට ඡන්ද අයිතිය නැත්තේ හුදෙක් බෞද්ධ සංස්කෘතියත් එක්ක ගැට ගැහුණු කාරණාවක් නිසා කියලා. නමුත්, ඒක සාවද්‍ය කාරණාවක්. ඒකට හේතුව, මේ වාගේ අපට නිදහස ලැබීමටත් පෙර සම්මත වෙච්ච පනතක් නිසා තමයි මේ කාරණාව මේ විධියට ඇවිත් තිබෙන්නේ. අද වන විට දළදා වහන්සේ වැඩ සිටින ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ තෝරා ගැනීමේ නිලවරණය සඳහා ඡන්ද බලය හිමි ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ලේකම්වරුන් 176දෙනාගෙන් 100ක් පමණ කාන්තාවන් වීම නිසා ඔවුන්ට එම නිලවරණයේදී ඡන්ද බලය අහිමි වී තිබෙනවා. එදා සිට අද දක්වා ගත්තොත්, ඇත්තටම කාන්තාවන් ප්‍රාදේශීය ලේකම් ධුරවලට පත් වීම ශීඝ්‍රයෙන් වර්ධනය වෙලා තිබෙනවා. ඉදිරියට ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අඩුවීමත්, ප්‍රාදේශීය ලේකම්වරියන්ගේ වැඩිවීමත් තුළ අදට වඩා එදාට මෙම යෝජනාව අවශ්‍ය වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම, ශ්‍රී දළදා මාළිගාවේ මෙන්ම අනෙකුත් සිද්ධස්ථාන ගැන කථා කළොත්, රුහුණු මහා කතරගම දේවාලයේ කතරගම දෙවියන් වැඩ සිටින්නේ ඇත්තටම තමන්ගේ බිරින්දෑවරුන් දෙදෙනාත් සමඟයි; තේවානි මාතාව සහ ශ්‍රී වල්ලි මැණියන් සමඟ තමයි වැඩ සිටින්නේ. එසේ වැඩ සිටින දේවාලයේ බස්නායක නිලමේ තේරීමේ නිලවරණයේදී මා කලින් සඳහන් කළ ආකාරයට අදාළ බලප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරියන්හට ඡන්ද අයිතිය අහිමි වෙලා තිබෙනවා.

ඒ වාගේම, දෙවිනුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලය ගැනත් කථා කළොත්, හින්දු දේව සාහිත්‍යයේ සඳහන් වන ආකාරයට ශ්‍රී ක්‍රිෂ්ණා කියන්නෙත් විෂ්ණු දෙවියන් හඳුන්වන්නට පාවිච්චි කරන වෙනත් නමක්. ඒ වාගේම, හින්දු ධර්මයේ ශ්‍රී ක්‍රිෂ්ණා කියා කියන්නේ ශ්‍රී විෂ්ණු දෙවියන්ගේ ප්‍රධානම අවතාරය බව එම ධර්මය අධ්‍යයනය කරනකොට අපට දැනගන්නට පුළුවන්. මට කියන්න අවශ්‍ය වුණේ, ඇත්තටම හින්දු දේව සාහිත්‍යයේ වටිනාම කෘතියක් වන ගීත ගෝවින්දයේ රාධා-ක්‍රිෂ්ණා කියන පෙම් යුවල යමුනා ගංතෙර අසල ගායනා කළ ඒ පෙම් ගී එවැනි සාහිත්‍යමය වටිනාකමක් තිබෙන කෘතියකට ඇතුළත් කරන්න සුදුසුකම් ලැබුවා නම්, ශ්‍රී විෂ්ණු දේවාලයේ බස්නායක නිලමේ තෝරන ඡන්දයේදී විශේෂයෙන්ම ඒ බලප්‍රදේශය නියෝජනය කරන ප්‍රාදේශීය ලේකම්තුමියලාට සහ ග්‍රාම නිලධාරිනියන්ට කාන්තාවක් වීම තුළ ඡන්ද අයිතිය අහිමි වෙලා තිබෙන්නේ ඇයි?

අපි තේරුම් ගන්න ඕනෑ, ඇත්තටම අපි මේ තෝරන්නේ දේවාලවලට දෙවියන් නොවෙයි, බස්නායක නිලමේවරුන් කියන එක. ඒ නිසා මම විශ්වාස කරනවා, මේ කාරණාවේදී කාන්තාවන්ට ඒ නිසි තැන හිමි විය යුතුයි කියලා.

බොහෝ අයට අමතක වෙච්ච තව කාරණාවක් තිබෙනවා. ඒ තමයි, 1998 ජනවාරි 25වැනි දා කිලෝග්‍රෑම් 400කට වඩා වැඩි අධිබලැති පුපුරණ ද්‍රව්‍ය රැගත් ලොරි රථයක් දළදා මාලිගාව ඉදිරිපිට පුපුරා ගිය සිද්ධිය. එදා වයස අවුරුදු 23ක් වුණු තරුණ පොලිස් නිලධාරිනියක් නොසිටින්න සන්නද්ධ ත්‍රස්තවාදීන් දළදා මාලිගාව තුළට ඇවිල්ලා තේවා භාර නායක හාමුදුරුවරුන් ඇතුළු බොහෝ පිරිසක් ඝාතනය කරලා දළදා කරඬුවටත් විශාල විපතක් කරන්න තිබුණා. එහෙම විපතක් කරන්න හදපු අවස්ථාවක් වළක්වා ගත්තේ නිර්භීත තරුණ පොලිස් නිලධාරිනියක් වූ අංක 1176, ගීතානි ජයවර්ධන මහත්මියගේ ක්ෂණික තීරණ අනුව බව මේ අවස්ථාවේ මා සිහිපත් කරන්න ඕනෑ. ඒ අනුව අපට පැහැදිලියි, දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩම්මවාගෙන ආවේත්, ඒ වාගේම දළදා මාලිගාවට එල්ල කළ ත්‍රස්ත ප්‍රහාරයේදී දන්ත ධාතූන් වහන්සේ ආරක්ෂා කළේත් කාන්තාවක්ය කියන කාරණය.

ඒ වාගේම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වැනි පරිච්ඡේදයේ 12 (1) සහ 12 (2) අනුව්‍යවස්ථා ප්‍රකාරව සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම තහවුරු කරලා තිබෙනවා. ඒ වාගේම සේවා විභජන පත්‍රය - duty list - අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරින් කිසිදු විශේෂත්වයකට ලිබිතව භාජන කර නැහැ. ඒ වාගේම 1948.12.10 දින සම්මත කළ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය තුළද කාන්තාවන්ට සම තැන ලබා දී තිබෙනවා. ඇත්තටම මම කලින් කිව්වා වාගේ බෞද්ධ දර්ශනය තුළ හා බෞද්ධ සංස්කෘතිය තුළ කාන්තාවන්ට සම තැන මෙන්ම නිසි තැන ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඒ අනුව යම් අදහසක් පළ කළොත්, බුදු දහමෙන් කාන්තාවන්ට ලැබුණු නිදහස එවකට පැවති සමාජ තත්ත්වය හා සසඳන විට ඉතා වැදගත් හා විප්ලවීය වෙනසක් ඇති කර තිබෙන බව පෙනී යනවා.

බුද්ධ කාලීන භාරතීය සමාජය තුළ විශේෂයෙන්ම බ්‍රාහ්මණ චින්තනය තුළ කාන්තාවන්ට නිදහසක්, සමාජ තත්ත්වයක් හෝ

ආගමික අයිතියක් තිබුණේ නැහැ. ඔවුන් අධ්‍යාපනයෙන්, ආගමික කටයුතුවලින් බැහැර කර තිබූ අතර, දැහිල්ලක ප්‍රමාණයක නුවණ ඇති අය ලෙස පහත් කොට සැලකුවා. එවැනි සමාජ පසුබිමක් තුළ බුදුරජාණන් වහන්සේ කාන්තාවන්ට ලබා දුන් නිදහස ප්‍රධාන අංශ 4ක් ඔස්සේ අපට විග්‍රහ කරන්න පුළුවන්. ඉන් පළමුවැනි විග්‍රහය තමයි, කාන්තාවන්ට ලබා දුන් ආධ්‍යාත්මික නිදහස හා භික්ෂුණී ශාසනය පිහිටුවීම. ඒ අනුව බුදුරජාණන් වහන්සේ ප්‍රථම වරට කාන්තාවන්ටද ධර්මය අවබෝධ කරගෙන අරහත්භාවය ලබා ගැනීමට හැකියාව ඇති බව දේශනා කළා. ඒ වාගේම උන්වහන්සේගේ සුළු මව වන මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු කුල කාන්තාවන් 500කට පැවිදිවීමට අවසර ලබා දී භික්ෂුණී ශාසනය පිහිටුවීමත් ඓතිහාසික සිදුවීමක්. එය ලෝකයේ ආගමික ඉතිහාසයේ කාන්තාවන්ට පැවිදිවීමට ලැබුණු පළමුවැනි අවස්ථාව ලෙස සැලකෙනවා. ඒ වාගේම ඛේමා, උප්පලවණ්ණා වැනි භික්ෂුණීන් වහන්සේලාට අග්‍ර ශ්‍රාවිකා තනතුරු ලැබීමෙන් කාන්තාවන්ගේ ප්‍රඥාව හා හැකියාව උසස් ලෙස ඇගැයීමට ලක් වුණා. ඒ වාගේම ථේරී ගාථාවන්හි ද කාන්තාවන් ලද ආධ්‍යාත්මික විමුක්තිය හා සතුට මනාව විදහා දක්වා තිබෙනවා.

ඒ වාගේම දෙවැනි විග්‍රහය විධියට කාන්තාවන්ට ලබා දුන් සමාජයීය හා බුද්ධිමය නිදහස ගත්තොත්, "න සෝ සබ්බේසු ඨානෙසු, පුරිසෝ හෝති පණ්ඩිතෝ; ඉත්ථීපි පණ්ඩිතා හොන්ති, තත්ථ තත්ථ විචක්ඛනා" යනුවෙන් බුදු දහමේ සඳහන් වනවා. ඒ කියන්නේ, "සෑම ස්ථානයකදීම, සෑම අවස්ථාවකදීම පුරුෂයාම පණ්ඩිත නොවේ, ඒ ඒ ස්ථානවලදී විචක්ෂණ බුද්ධියෙන් යුක්තව කාන්තාවන්ද පණ්ඩිත වේ" යන්නයි. එවැනි දේශනා මඟින් කාන්තාවන්ගේ ප්‍රඥා මහිමය හා බුද්ධිමය හැකියාව අගය කර තිබෙනවා. දියණියක් ලැබීම ගැන කනගාටු වූ කොසොල් රජුට බුදුරජාණන් වහන්සේ උපදෙස් දෙමින් කාන්තාව පවා පිරිමියෙකුට වඩා ශ්‍රේෂ්ඨ විය හැකි බව එදා පෙන්වා දුන්නා.

තුන්වැනි විග්‍රහය තමයි, කාන්තාවන්ට ලබා දුන් ගෘහ ජීවිතයේ ගෞරවය. මවක් ලෙස කාන්තාවට ඉහළම ගෞරවය ලබා දුන් අතර මව්පියන් "බ්‍රහ්ම" ලෙස එදා හඳුන්වා දුන්නා. ගරු කිරීම, අවමන් නොකිරීම, සම්පත් පැවරීම, වස්ත්‍රාභරණ ලබා දීම ස්වාමියා විසින් බිරිඳට ඉටු කළ යුතු යුතුකම් ලෙස සිඟාලෝවාද සූත්‍රය මඟින් පෙන්වා දුන්නේ ඇයට ගෘහ ජීවිතය තුළ සමාන අයිතිවාසිකමක්, ගෞරවයක් ඇති බව තහවුරු කරමිනි.

ඒ වාගේම අවසාන විග්‍රහය තමයි, කාන්තාවක් උපාසිකාවක් ලෙස ලැබූ නිදහස. භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා ලෙස සිවුවනක් පිරිස ඇති කරමින් ගිහි කාන්තාවන්ටද ධර්මය පුරුදු කරමින් දාන, සීල, භාවනා කියන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වෙමින් මාර්ග ඵල අවබෝධය සඳහා අවස්ථාව ලබා දුන්නා. ඊට ලබා දෙන්න පුළුවන් හොඳම උදාහරණය තමයි, විශාඛා සහ සාමාවතී වැනි උපාසිකාවෝ බුද්ධ ශාසනයේ ප්‍රමුඛ තැනක් ගැනීම. ඒ අනුව බුදු දහම පැමිණීම නිසා එවකට පැවති සමාජයේ කාන්තාවට අහිමි වී තිබූ ආධ්‍යාත්මික, සමාජයීය හා බුද්ධිමය ආර්ථික නිදහස නැවත ලබා ගැනීමට හැකි වුණා. ඒ ආකාරයෙන් තමයි බුදුරජාණන් වහන්සේ බුදු දහම -බුද්ධ දර්ශනය- අනුව කාන්තාවන්ට සම තැන සහ නිසි තැන දෙන්න කටයුතු කළේ.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියනවා. 1931දී ගෙන එනු ලැබූ බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත මේ වන විට හය වතාවක් සංශෝධනය කර තිබුණත්, එහි 40වැනි වගන්තිය යටතේ කාන්තාවන් සඳහා ඡන්දය ලබා දීමේ අයිතිය බැහැර කිරීම මෙතෙක් සංශෝධනය කර නැහැ. මේ යෝජනාව ඉදිරිපත් කරමින් මා බලාපොරොත්තු වන්නේ සභාව කල්තබන අවස්ථාවේ තවත් යෝජනාවක් බවට මෙම යෝජනාව හැන්සාඩ් වාර්තාවට එකතු කරන්නට හෝ ජනමාධ්‍යට ප්‍රවෘත්තියක් වන්නට නොවෙයි.

මෙම යෝජනාවේ හරය යථාර්ථයක් බවට පත් කරමින් හා සැබෑ බෞද්ධ දර්ශනය මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරලීම වෙනුවෙන්, දියවඩන නිලමේවරයා තෝරා පත් කර ගැනීමේ නිලවරණයේදී මෙන්ම අනෙකුත් බස්නායක නිලමේවරුන් තෝරා පත් කර ගනු ලබන නිලවරණවලදී කාන්තාවන්ට ඡන්දය භාවිත කිරීමට අවස්ථාව ලබා ගැනීම සඳහා බෞද්ධ විහාර දේවාලගම් පනත සංශෝධනය කිරීමට යෝජනා කරන අතර, එය විෂය භාර අමාත්‍යවරයා විසින් කඩිනමින් සිදු කරනු ඇතැයි ද මා බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව මම ස්ථිර කරනවා. මම හිතන විධියට, චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා බොහොම කාලෝචිත මාතෘකාවක් යටතේයි මෙම යෝජනාව ඉදිරිපත්කොට තිබෙන්නේ. මොකද, කාන්තාව දෙවැනිකොට සැලකීම සම්බන්ධව කාන්තාවක් වීම නිසාම මම මේ අවස්ථාවේ කරුණු දක්වමින් එතුමාගේ යෝජනාවේ අවස්ථා දෙකක් ගැන කථා කරන්න කැමැතියි. එකක්, මේ සඳහා ඡන්දය දෙන කණ්ඩායම පිළිබඳව. දෙක, ධුර කාලය හා ධුරය දරන්න පුළුවන් අවස්ථා ගණන සම්බන්ධයෙන්.

ගරු ඇමතිතුමනි, මම මෙහිදී පළමුවෙනි අවස්ථාව ගැන ටිකක් කථා කරන්න ඕනෑ. මේක 1931දී වැරදුණු තැනක්. එහි සඳහන්ව තිබෙනවා, "රටේ මහත්තුරු" කියලා. ඒ කාලයේ රටේ නෝනලා හිටියේ නැහැ. ඒ නිසා මේක සම්ප්‍රදාය ද, බුද්ධ දර්ශනය ද කියන එක අද පටලවා ගෙන දුරදිග යමින් තිබෙනවා. මේක නිවැරදි කරන්න නම් මම එතුමා ගෙනාපු උදාහරණම නැවත වතාවක් කියන්නේ නැහැ. අපි දන්නවා, අපේ මුදුන් මල්කඩ වූ ශ්‍රී දන්ත ධාතූන් වහන්සේත්, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේත් අපට ලැබෙන්නේ ශ්‍රේෂ්ඨ කාන්තාවන් දෙදෙනෙකු නිසාය කියලා. එහෙමනම් මේ කටයුත්ත මෙහෙම වෙන්නේ අර කියන සම්ප්‍රදායානුකූල වචනයක් වන "කිල්ල" නිසා නම්, හද්‍ර යෞවනියෝ දෙදෙනෙක් තමයි මේ රටට ඒ උතුම් දළදා වහන්සේ සහ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වඩම්මවා ගෙන ආවේ. ඒ නිසා ඒ මතය එතැනින් බිඳිලා යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ සප්ත අපරිහානීය ධර්මවල ලිච්ඡවී රජ දරුවන්ට දේශනා කර තිබෙනවා, "වජ්ජීහු කුල ස්ත්‍රීන් හා කුමාරිකාවන්ට උසස්කොට සලකන තාක්කල් ඔවුන්ගේ දියුණුව මිස පරිහානිය සිදු නොවන බව". ඒ වාගේම ක්‍රි.පූ. හය වන සියවසේ උන්වහන්සේ පහළ වන විට භාරතයේ තිබුණු සමාජ තත්ත්වය වෙනස් කරන්න, සමාජ විමුක්තිය ලබා දෙන්න සාමකාමී විප්ලවයක් කරපු ශාස්තෘවරයෙක් හැටියට බුදුරජාණන් වහන්සේව අපට මෙතැනදී හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම "කවර දඬු කඳකින් වුවත් ගිනි ඉපදවිය හැකි වන්නා සේම, කවර පුද්ගලයෙකුට වුවත් නුවණ ගුණධර්ම වඩවා ගත හැකි බව"

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

උන්වහන්සේ දේශනා කර තිබෙනවා. උන්වහන්සේ දේශනා කළේ බුදු දහම ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයටම පොදු බවත්, ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර පවතින වෙනස ලිංග භේදය පමණක්ය කියන එකයි. ඒ නිසා තමයි මහා ප්‍රජාපතී ගෝතමී දේවියට, යශෝධරාවට පමණක් නොවෙයි, පුණ්ණා දාසියටත්, රජ්ජුමාලාටත්, පටාචාරාවන්ටත් බුද්ධ ශාසනයේ දොර ඇරුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙතැනදී මතක් කරන්න ඕනෑ, ඉංග්‍රීසීන් 1815දී උඩරට රාජ්‍යය අල්ලා ගන්නා වෙලාවේ උඩරට රාජධානිය හැටියට නම් කරපු ප්‍රදේශවලින් පමණක් මෙම ඡන්ද විමසීම කළ බව. ඒ අනුව වර්තමානයේ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 177කින් තමයි මෙම ඡන්ද විමසීම කරන්නේ. එහිදී ඡන්ද බලය හිමි වෙන්නේ 85දෙනෙකුටයි. ඒ කියන්නේ පිරිමි ඉන්නේ 85දෙනායි. එහෙම නැත්නම්, මෙතැන ඡන්ද බලය අහිමි අය 92ක් ඉන්නවා. එක්කෝ ඒ අය කාන්තාවෝ, නැත්නම් අන්‍යාගමිකයින්. එතැනදී මට හොඳ විශ්වාසයක් තිබෙනවා, මේ 92නුත් බහුතරය කාන්තාවෝ කියලා.

මම උදාහරණයක් කියන්නම්, මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20යි; 13ක ඉන්නේ කාන්තා ප්‍රාදේශීය ලේකම්වරුන්. මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11යි; 6ක ඉන්නේ කාන්තා ප්‍රාදේශීය ලේකම්වරුන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 339ක් තිබෙනවා. මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 339යි, උප කාර්යාල දෙකයි එක්ක ඔක්කෝම 341යි. මේවායෙන් 164ක ඉන්නේ කාන්තාවෝ. මේ යන ප්‍රවණතාව අරගෙන බලනකොට පෙනෙනවා, ඉදිරියේදී මේ කාන්තාවන් සංඛ්‍යාව තවත් වැඩිවන බව. වර්තමානයේදී රාජ්‍ය පරිපාලනයත් කාන්තාව විසින් අතික්‍රමණය කරලා ඉවරයි. ඉදිරියේදී මේ බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ සඳහන් මහත්තුරුන් නැතිව යනවා, ප්‍රාදේශීය ලේකම්වරුන් විධියට ඡන්දය දෙන්න. එහෙම වුණොත් ඉතිරි පිරිස ස්වාමීන් වහන්සේලා පමණක් බවට පත් වනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම කියනවා, ඔබතුමා මේකට මැදිහත් වෙන්න කියලා. මැදිහත් වෙලා මේ කටයුත්තේදී මහත්තුරුන්ට පමණක් තිබුණු මේ අයිතිය කාන්තාවටත් ලබා දෙන්න. බුද්ධ ශාසනයේ කොතැනකවත්, බුද්ධ දේශනයේ කොතැනකවත් කාන්තාව දෙවැනිකොට සලකලා නැහැ. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොතැනකවත් කාන්තාව දෙවැනි කොට සලකා නැහැ. ඒ නිසා මේ බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ මේ තිබෙන කොටස සංශෝධන කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මේ සංශෝධනයේදී තම මවට, සහෝදරියට ගරු කරන අපේ මල්වතු -අස්ගිරි උභය පාර්ශ්වීය ගරුතර නායක ස්වාමීන් වහන්සේලා දෙපළගේත්, ගරුතර අනුනායක ස්වාමීන් වහන්සේලා දෙපළගේත්, ගරුතර කාරක සභා සභික ස්වාමීන් වහන්සේලාගේත් අනුමැතියෙන්, අනුශාසනාවෙන්, ආශීර්වාදයෙන් මෙම බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සුදුසුයි කියා මා යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.48]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனூர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද සභාව කල් තැබීමේ යෝජනාව ගත්තොත්, විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියටත්, මහජන නියෝජිතයෙක් විධියටත් මම දන්නවා, මේ රටේ විය යුතු වෙනස්කම් සම්බන්ධයෙන් මල්වතු-අස්ගිරි උභය පාර්ශ්වීය මහනායක හිමිපාණන් වහන්සේලා, අනුනායක හිමිපාණන් වහන්සේලා වාගේම ගෞරවනීය ස්වාමීන් වහන්සේලා සමඟ විශාල වශයෙන් සාකච්ඡා කර තිබෙන බව. ඒ සම්බන්ධයෙන් උන්වහන්සේලාටත් ඉතාම ප්‍රගතිශීලී යෝජනා තිබෙනවා. පොදුවේ ගත්තොත්, අපේ රටේ විශාල පනත් ප්‍රමාණයක්, නීති ප්‍රමාණයක් තිබෙන බව අපි පිළිගන්නවා. ඒ වාගේම අද කාලයට ගැළපෙන විධියට වෙනස් කළ යුතු දේවල් තිබෙනවා. ඒ නිසා පොදුවේ ගත්තොත්, අලුත් විය යුතු, වෙනස් විය යුතු අණපනත් සම්බන්ධයෙන් අපේ එකඟතාවක් ද තිබෙනවා.

විශේෂයෙන්ම අපේ අනුනායක ස්වාමීන් වහන්සේලා සහ මහනායක ස්වාමීන් වහන්සේලාගේ අවවාද, උපදෙස් එක්ක මේ සම්බන්ධයෙන් හොඳ සාකච්ඡාවක් ආරම්භ කරන්න පුළුවන් කියලා අපි හිතනවා. සිරි දළදා වන්දනා වෙලාවේදී වාගේම සිරි දළදා පෙරහැර පවත්වන වෙලාවේදී අපි නිතරම උන්වහන්සේලා එක්ක සම්බන්ධ වෙනවා. එය ජාතික වශයෙන් ලංකාවටම පොදු තත්ත්වයක් වුණත් මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් නිසා මම නිරන්තරයෙන්ම උන්වහන්සේලා මුණ ගැසී සාකච්ඡා කරනවා. උන්වහන්සේලා ඉතා ප්‍රගතිශීලි ලෙස අපේ රටේ සිදු විය යුතු වෙනස්කම් දකිනවා; ඒ දෙස බලනවා. ඒ වෙනුවෙන් උන්වහන්සේලාගේ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ඇමතිතුමාත් උන්වහන්සේලා මුණ ගැහුණා. බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සම්බන්ධයෙන් ගරුතර කාරක සංඝ සභාවල සාකච්ඡා කර, මහනායක ස්වාමීන් වහන්සේලා සහ අනුනායක ස්වාමීන් වහන්සේලා ඇතුළු මේ හා සම්බන්ධ සංඝ රත්නය සමඟත් සාකච්ඡා කරනවා. ඒ වාගේම අපි එක්කත් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කර බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් ප්‍රගතිශීලි යෝජනා විශාල ප්‍රමාණයක් උන්වහන්සේලා ඉදිරිපත් කර තිබෙනවා. මම හිතන විධියට, ඉතා හොඳම ප්‍රවේශය තමයි, අපේ මහනායක හිමිපාණන් වහන්සේලා එක්කත් සාකච්ඡා කරමින් උන්වහන්සේලාගේ ආශීර්වාදයත් සමඟ කටයුතු කිරීම.

අපි විවෘතව පිළිගන්නවා, ඔබතුමන්ලාගේ යෝජනාව පොදුවේ ගත්තොත් හොඳයි කියන එක. නීති වෙනස් වෙන්න ඕනෑ; අලුත් වෙන්න ඕනෑ. නමුත්, සංස්කෘතික සහ ආගමික වශයෙන් පුළුල්ව කථා බහ කරගත යුතු අවස්ථා ගණනාවක් තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම හිතනවා, අපේ ස්වාමීන් වහන්සේලාගේ ආශීර්වාදයත් එක්ක මේ ගමන ඉදිරියට යන එක සුදුසුයි කියලා. ඒ සම්බන්ධයෙන් මට තිබෙන්නේ ඒ වාගේ අදහසක්. අපි නිරන්තරයෙන්ම උන්වහන්සේලා මුණ ගැසී කථා කරනවා. උන්වහන්සේලා ඉතාම ප්‍රගතිශීලී ලෙස හැම දෙයක් දිහාම බලනවා. ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව ගරු රෝහිණී කවිරත්න මැතිනිය විසින් ස්ථිර කළා. අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ මන්ත්‍රීවරියන් විසිදෙදෙනෙක් පමණයි. මේ කාරණය ගැන විතරක් නොවෙයි, මේ රටේ සමස්ත කාන්තාවන් වෙනුවෙන්, ඔවුන්ට ලබා දිය යුතු තැන වෙනුවෙන් සටන් කරන මන්ත්‍රීවරියන් විසිදෙදෙනාගෙන් එක්කෙනෙක් තමයි, රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය. අපි හිතනවා, අපේ ස්වාමීන් වහන්සේලා

සමඟ අදාළ සාකච්ඡා ආරම්භ කරන්න පුළුවන් වෙයි කියලා. උන්වහන්සේලාගේ ආශීර්වාදයත් එක්ක ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද, රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරියට ගෙනියන්න පුළුවන් වෙයි කියමින් මගේ අදහස් දැක්වීම මම සමාප්ත කරනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.53]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කෙනෙකුට හිතෙන්න පුළුවන්, නැඟෙනහිර පළාතේ කල්මුණේ ඉඳලා ආපු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා මේ දියවඩන නිලමේ සම්බන්ධයෙන් කථා කරන්නේ මොකද කියලා. එහෙම අහිතක් හිතන්න එපා. අපේ සීයලා, මීමුත්තලා ගැනත් කථාව මම පසුව කියන්නම්. හජ්ජි මරික්කාර් මඩිහේ මුහන්දිරම් මගේ සීයාගේ සීයා; මගේ මී මුත්තා. ඒ කෙසේ වෙතත්, මේක හරිම වැදගත්. මොකද, අපගේ පරම්පරාවෙන් පවා උඩරට රාජධානියත් එක්ක එකට වැඩ කටයුතු කරපු මුස්ලිම්වරුන් රාශියක් හිටියා. නමුත්, මෙතැන ගැටලු ඇති වෙලා තිබෙන්නේත් යම්කිසි නීති ප්‍රශ්නයක් තිබෙන නිසායි. බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත යටතේ "රටේ මහත්වරු" කියලා කිව්වාට ඒක office එකක්, නිලයක් පමණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනිවාර්යයෙන්ම මේකේ සංශෝධනයක් තිබිය යුතුයි. නමුත්, සංශෝධනයක් වෙනකම් ඉන්නේ නැතුව වුණත් ඒ නිල ධුරය හරහා තමාට ඡන්දය භාවිත කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් මහත්මීන්ට තිබුණා නම් හොඳයි. එක කාලයක තිබුණා නේ, දිසාවේ collectorsලා, එහෙම නැත්නම් government agentsලා කියලා. දැන් ඒක ප්‍රාදේශීය මට්ටමට ඇවිල්ලා තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කාන්තාවක් වූ පලියට ඒ ධුරයෙන් ලැබෙන අයිතිය නැති වෙන්නේ නැහැ කියන එකයි මගේ නිහතමානී මතය. ඒක නිසා අපට මෙය සංශෝධනය කිරීම වඩාත් සුදුසුයි. නමුත්, සංශෝධනයකින් තොරව පවා ප්‍රාදේශීය ලේකම් කාන්තාවක් වීම හේතු කොටගෙනම ඡන්දය අහිමි වීම මම හිතන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12වන ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාවට විරෝධී කටයුත්තක්. එම නිසා ඒක Constitutional right එකක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ. ඒ පුද්ගලයන්ටත් පුළුවන් වෙන්න ඕනෑ, ඒ ඡන්ද අයිතිය පාවිච්චි කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී ඇති ඒ විනාඩියක කාලය ඇතුළත උම්මග්ග ජාතකයේ කථාවක් කියලා මම නවත්වන්නම්. උම්මග්ග ජාතකයට අනුව රජතුමාට අවශ්‍ය වෙලා තිබුණා, බිසවගේ විඥානය -දැනුම- පිළිබඳව පරීක්ෂා කර බලන්න. එක්තරා වැසි කාලයක මනුස්සයෙක් තොටුපොළේ ඉඳන් ඔරුවක් පදවාගෙන යද්දී පෙනෙනවා, තව මනුස්සයෙක් එක අතක මසුරන් සහ අනෙක් අතේ කෑම ටිකක් තියාගෙන ගඟට වැටිලා ඉන්නවා. ඒ මනුස්සයා ඔරුව පැදගෙන යන මනුස්සයාට කිව්වා ලු, "මෙයින් යමක් මට රුචි වෙයි ද, එය ඔබට දෙමි. මාව බේරා ගන්න." කියලා. එහෙම කිව්වාම අර මනුස්සයා ගිහිල්ලා ඒ පුද්ගලයාව බේරා ගත්තා ලු. ඊට පස්සේ ඒ මනුස්සයා බේරා ගත්ත මනුස්සයාට කිව්වා ලු, "හරි, මාව බේරා ගත්ත සන්තෝෂයට මම ඔබට කෑම ටික දෙන්නම්" කියලා. නමුත්, ඔහු ඔරුව පදවාගෙන ඇවිත් තමන් බේරා ගත්ත මනුස්සයාට මසුරන් ටික දුන්නේ නැහැ. ඊට පස්සේ ඔරුවේ ආපු මනුස්සයා කිව්වා ලු, "එහෙම හරියන්නේ නැහැ. මම ඔයාගේ පණ බේරලා තිබෙනවා. මට මසුරන් ටික දෙන්න" කියලා. ඊට පස්සේ මේ ප්‍රශ්නය රජතුමාගේ රජ වාසල දක්වාම ගියා. රජතුමා බිසවට කිව්වා, "මේ ප්‍රශ්නය විසඳලා දෙන්න" කියලා. ඊට පස්සේ බිසව ඇවිල්ලා වතුරේ හිටපු මනුස්සයාට අඬගහලා ඔහු අතේ තිබුණු මසුරන් සහ කෑම ටික පැත්තකින් තියන්න කියලා ඇහුවා ලු, "මේ ඔරුවේ ආපු මනුස්සයා ඔයාගේ පණ බේරා ගත්තා නේ. ඔයා මොනවාද ඔරුවේ ආපු මේ මනුස්සයාට කිව්වේ?" කියලා. ඊට පස්සේ ඒ මනුස්සයා කිව්වා, "මෙයින් මට යමක් රුචි වෙයිද, මම එය දෙමි" කියලා තමයි කිව්වේ කියා. ඊට පස්සේ රජ බිසව කිව්වා ලු, "හරි, එහෙම නම් ඔයාට රුචි දේ අරගෙන ඔයා යන්න" කියලා. රජතුමාගේ බිසව මට මේක අරගෙන යන්න කිව්වා කියලා, අර මනුස්සයා මසුරන් ටික අරගෙන යන්න හැදුවා. ඉන් පසුව රජ බිසව ඒ මනුස්සයාට අඬගහලා ඇහුවා ලු, "එහෙම නම් මේක ද ඔබට රුචි?" කියලා. ඔහු කිව්වා ලු, "ඔව්" කියලා. ඊට පස්සේ රජ බිසව ඔහුට කිව්වා, ඔබ කිව්වේ, "මට යමක් රුචි වෙයිද, මම එය ඔබට දෙමි" කියලා නේ, ඒක නිසා ඒ මසුරන් ටික මේ පණ බේරා ගත්ත මනුස්සයාට දෙන්න කියලා. මම මේ කියන්න හදන්නේ මේකයි. සිංහල, දෙමළ, මුස්ලිම් කියලා භේදයක් නැතුව ඒ කාලයේ ඉඳලාම කාන්තාවන්ටත් මේ වාගේ තීන්දු තීරණ ගැනීම සඳහා සම්පූර්ණ අයිතිය ලබා දී තිබුණා. ඔවුන් ඓතිහාසිකවත් ලොකු සේවයක් කර තිබෙනවා. ඒ පිළිබඳ විඥානයක් ඔවුන්ට තිබුණා. එම නිසා අනිවාර්යයෙන්ම සංශෝධන සහිතව හෝ රහිතව ඒ ප්‍රාදේශීය ලේකම් නෝනාවරුන්ටත් මේ වෙනුවෙන් ඡන්දය ලබා දීම සඳහා අවස්ථාව ලබා දිය යුතු බව මම කියා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.57]

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විධියට මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් රජය වෙනුවෙන් මම පිළිතුරු කථාව

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගෙනෙන යෝජනාව, කාලීන, උචිත, ශිෂ්ටසම්පන්න, උසස් තර්කනයක් ගැබ් වුණු අදහසක් බව කිව යුතුයි. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. මට පෞද්ගලිකවත් විශාල සතුටක් දැනුණා, ඔබේ අදහස් දැක්වීම්වල තිබුණු පෝෂිත බව නිසා. ගීත ගෝවින්දය ගැන ඇසෙන පාර්ලිමේන්තුවක් තමයි අපි ප්‍රාර්ථනා කරමින් හිටියේ. *[බාධා කිරීමක්]* උම්මග්ග ජාතකය විශේෂයෙන්ම. ස්තුතියි.

ඔබතුමා ඉදිරිපත් කළ කරුණු, ඒවායේ තිබුණු දත්ත මම නැවත වතාවක් කියන්නට යන්නේ නැහැ, කාලය ඉතිරි කරගත යුතු නිසා. 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත ඉතාම පැරණි ආඥාපනතක්. මේක ආඥාපනතක් හැටියට සම්මත වුණේ 1931දී වුවත්, ඊට පදනම් වන ලියවිල්ල සහ භාවිතය 1905 අවුරුද්ද දක්වාම යනවා. එම නිසා මූලික වශයෙන් ගත්තාම මේක අවුරුදු 120ක් විතර පැරණි ආඥාපනතක්.

මම මේ අමාත්‍යාංශය භාර ගත් දවසේ සිට පසුගිය වසර පුරාම ප්‍රධාන පනත් 5ක් හෝ 6ක් සංශෝධනය සඳහා කෙටුම්පත් කිරීමේ කටයුතුවලට අත තබලා ඒවායේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා වාගේම, අමාත්‍ය මණ්ඩලයෙන් ඒවා සංශෝධනය සඳහා අනුමැතියද ලැබී තිබෙනවා. නිතර දෙවේලේ අපේ විෂය පථයට අදාළව සාකච්ඡා කෙරෙන සහ මතුවන කරුණු සමාජගත වන පනතක් තමයි මේ බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත. ඔබතුමා කිව්වා වාගේ මෙම ආඥාපනත 1973, 1980, 1981, -1981දී දෙවතාවක්- 1992 සහ 2013 වර්ෂවල සංශෝධනය වෙලා තිබෙනවා. එම නිසා බෞද්ධ විහාර දේවාලගම් පනත සංශෝධනය වෙනවා කියන එක අලුත් දෙයක් නොවෙයි. එය දැනටමත් සිද්ධවෙලා තිබෙනවා. ඒ වාගේම ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා කිව්වා වගේ මල්වතු-අස්ගිරි උභය මහා විහාරයීය ශ්‍රීමත් මහානායක ස්වාමීන් වහන්සේලාගේ මහ පෙන්වීම, ත්‍රෛනිකායික මහා සංඝරත්නයේ අනුදැනුම සහ මහපෙන්වීම මත මේ වනවිටත් බෞද්ධ විහාර දේවාලගම් පනතේ 41 සහ 42 වගන්ති සංශෝධනය වෙමින් පවතිනවා. ඒ පිළිබඳ සාකච්ඡාව, සංවාදය අවසන් වෙලා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කරලා තිබෙනවා. ඇත්තටම එම වගන්තිවලින් උද්ධරණය වෙන්නේ ශ්‍රී දළදා මාළිගාව පිළිබඳව හෝ ඒ ඡන්ද විමසීම ගැන නොව, භික්ෂූන් වහන්සේලාගේ ඇවතුම් පැවතුම් සම්බන්ධ තත්ත්වයක්. ගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීමත් එක්ක අප නිතර දෙවේලේ මහනුවරට ගිහිල්ලා මෙම සාකච්ඡාව කරලා තිබෙනවා. අධිකරණ අමාත්‍යතුමා, ඒ වාගේම විෂය භාර අමාත්‍යවරයා හැටියට මම, දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු ජනාධිපතිතුමා විසින් කැඳවලා, මහානායක හාමුදුරුවන් වහන්සේලා සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා.

ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමනි, අපි දැන් ඔබේ ප්‍රධාන කාරණා දෙකට එළැඹුණොත්, ඔබේ එක් පෙන්වා දීමක් තමයි කාන්තාවන්ට ඡන්ද බලය හිමි විය යුතු පරිදි මේක සංශෝධනය විය යුතුයි කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි කිසිදු විවාදයක් නැහැ. කාන්තාවන් කියන්නේ අද අපේ සමාජයේ පරිසමාප්ත ගෞරවනීය පුරවැසි ප්‍රජාව, පුරුෂ පාර්ශ්වයේ ඉතිරි අර්ධය. එහි කිසිදු අඩු වැඩියක් නැහැ, ඒක ඉතාම ගෞරවනීය තත්ත්වයක්. මාතෘත්වයත් එක්ක බලනකොට මම හිතන විධියට ලොව කිසිවක් එතැනට දෙවැනි වෙන්නේ නැහැ. එම නිසා සම තැන හෝ නිසි තැන පිළිබඳ විවාදයක් නොවෙයි තිබෙන්නේ.

ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා මතු කළේ, සංශෝධනයකින් තොරව වුණත් ප්‍රාදේශීය ලේකම් කියන තනතුරත් එක්ක ඒ අයිතිය තිබිය යුතු බවයි. නීතිමය තර්කයක් එක්කයි ඔබතුමා ඒක පෙන්වා දුන්නේ. නමුත්, පනතේ V වැනි භාගයේ "නා නා කරුණු" කියන කොටසේ, "පනත යටතේ බලපැවැත්වීමට ඇති සාමාන්‍ය සුදුසුකම්" යටතේ තමයි 40වැනි වගන්තිය තිබෙන්නේ. එය පටන් ගන්නේම "පිරිමියෙක්ද, බුද්ධාගම්කාරයෙක්ද, වයසින් 21 සම්පූර්ණ වූවෙක්ද.." විධියටයි. එම නිසා එතැන ව්‍යතිරේකයක් තිබෙනවා. එම නිසා ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා පෙන්වූ කාරණයම තමයි මේ සම්බන්ධව අපේ රජයේ ස්ථාවරය වන්නේත්. ඔබ ඔබේ යෝජනාවේ පවා ඉතාම ව්‍යක්ත විධියට සඳහන් කර තිබෙනවා, මේවා සම්බන්ධ තීරණ ගැනීම් සිදු විය යුත්තේ නීතියෙන්, කඩදාසියෙන්, අධිකරණයෙන් පමණක් නොවන බව. ඉන් ඔබ්බට බැඳුණු සංස්කෘතික කාරණා සම්බන්ධයෙන්ද සුවිශේෂී අවධානයක් යොමු කරමින් සහ මල්වතු-අස්ගිරි උභය මහා විහාර පාර්ශ්වයීය මහානායක ස්වාමීන් වහන්සේලාගේ ආශීර්වාදය සහිතව කටයුතු කළ යුතුයි කියන එක ඔබ ඔබේ යෝජනාවේත් ඉදිරිපත් කරනවා. රජයේ ස්ථාවරය වෙන්නේත් ඒකම තමයි. ඒකට හේතුව තමයි, පනත් සංශෝධනයට තිබෙන සාමාන්‍ය ප්‍රතිපාදන හැම තිස්සේම සමාන වෙන්නේ නැහැ. මෙබඳු විශේෂිත ස්ථානවලදී අපට සිද්ධ වෙනවා, කාලාන්තරයක් තිස්සේ, ශත වර්ෂයකට එහා කාලයක් තිස්සේ එතැන හැදුණු සංස්කෘතිය, ඒ වාගේම පරාමිතීන්, පුරුෂාර්ථ ගැන සලකන්න.

ඒ සැලකීම තුළ වුණත් ඒක ප්‍රගතිශීලී තැනකට පරිවර්තනය වේවි කියන විශ්වාසය අපට තිබෙන්නේ, ශ්‍රීමත් මහා නාහිමිවරු අප සමඟ නිතර කරන සාකච්ඡාවේදී මේ සමාජයේ යහ පැවැත්ම, මේ සමාජයේ ප්‍රගතිශීලීත්වය, මේ සමාජය ශිෂ්ට සම්පන්න දිහාවට පරිවර්තනය විය යුතුයි කියන ඉල්ලීම සහ මහ පෙන්වීම උන්වහන්සේලාත් අපට නිතර කරන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආඥාපනතේ නිතර දෙවේලේ සඳහන් වෙනවා, "සිද්ධස්ථාන", "දේවාල" වැනි වචන. ඒ අතරේ ස්ථාන තුනක් විශේෂයෙන් සඳහන් කරනවා. ඒ තමයි ශ්‍රී දළදා මාළිගාව, අටමස්ථානය සහ ශ්‍රී පාදස්ථානය. නම්න්ම ඒ ස්ථාන තුන සඳහන් කරනවා. ඒ සඳහා තිබෙන තත්ත්වයන් වෙනම විග්‍රහ කරලා තිබෙනවා. ඒ නිසා අපි ඉතාම ප්‍රවේසමට තමයි මේ ආඥාපනත විග්‍රහ කර ගත යුත්තේ.

ඊළඟට ඔබ ඔබගේ යෝජනාවේ විමසනවා දියවඩන නිලමේ ධුර කාලය පිළිබඳව. ඒ ගැන කියා තිබෙන්නේ, "භාරකාරකමේ කාලසීමාව" යන පැති සටහන ඇතුළත් 12 වන වගන්තියේ. පිටිසරබද හෝ පළාත්බද අනෙක් දේවාල ගැන කියමින් කියා තිබෙනවා, "... තමා පත් වූ දින පටන් පස් අවුරුද්දක කාලයක් එම නිලය දරා ඒ කාලය අවසානයේදී නැවත පත් කරනු ලැබීමට යෝග්‍ය වන්නේය..." යනුවෙන්. එහි "(අ)" හැටියට ව්‍යතිරේකයක් පෙන්වනවා. එය සඳහන් වෙනවා, "(අ) එසේ වුවද දියවඩන නිලමේ කෙනෙකුගේ ධුර කාලය අවුරුදු 10ක් විය යුතුය" යනුවෙන්. ඒ වාගේම නැවත පත්විය හැකි වාර ගණන විශේෂකොට දක්වා නොතිබීමත් එක්තරා තත්ත්වයක්. හැබැයි, ඒක වෙන විධියකට සීමා වෙනවා. ඒ තමයි "භාරකාරයින්ගේ සුදුසුකම්" කියන පැති සටහන ඇතුළත් 14වැනි වගන්තියේ උප ඡේද ඇතුළේ තිබෙනවා, වයස අවුරුදු 70 කියන සීමාව. වයස අවුරුදු 70ක් සම්පූර්ණ වුණොත් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාගේ අභිමතය විමසිය යුතුයි කියලා එතැන නැවත සඳහන් කරනවා. මෙන්න මේ වාගේ තමයි ආඥාපනත සම්බන්ධ නීතිමය තත්ත්වය තිබෙන්නේ. මා නැවතත් කියනවා, ඔබගේ යෝජනාව අනිවාර්යයෙන් ශිෂ්ටසම්පන්න, කාලීන යෝජනාවක් බව. නමුත් මේ යෝජනාව බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ, ශ්‍රී දළදා මාළිගාව හා සම්බන්ධව බැඳී තිබෙනවා. ඒ හා සම්බන්ධ සම්ප්‍රදායන්, දීර්ඝ කාලයක් පැවතුණු විශ්වාසයන් තිබෙනවා. ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය දන්නවා, ඒ සම්ප්‍රදායන් සහ විශ්වාසයන් කොච්චර

ප්‍රබල තැනක තිබෙනවාද, ඒක ජනතාව කොච්චර විශ්වාස කරනවාද, ගරු කරනවාද කියන කාරණය. ඒ නිසා අනිවාර්යයෙන්ම ගෞරවනීය ශ්‍රීමත් මහ නාහිමිවරුන්, ත්‍රෛනිකායික මහා සංඝරත්නයේ මහ පෙන්වීම සහිතව මේ සාකච්ඡාව සිදුකරගෙන, කළ යුතු වෙනස්කම් ඉතාම සාවධානව කළ යුතුයි කියන එකයි රජය පැත්තෙන් අපේ විශ්වාසය වෙන්නේ.

මෙහි තිබෙන 41, 42 වගන්ති සංශෝධනය ඇත්තටම ගෞරවනීය මහ නාහිමිවරුන්ගේ ඉල්ලීමක් අනුව පැමිණි යෝජනාවක්. ඒක ඉතාම හොඳ තත්ත්වයක්. ඒක අද සසුන සම්බන්ධව සමාජයේ ජනිත වෙලා තිබෙන යම් තත්ත්වයන් පාලනය කරගැනීමට උන්වහන්සේලා ඉදිරිපත් කළ ප්‍රගතිශීලි යෝජනාවක්. ඒක රජය සහ මහ නාහිමිවරුන් අතර හත් අට වාරයක් ගමන් කරලා, යම් කාලයක් අරගෙන ඉතාම හොඳින් පිරිපහදු වෙලා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව දක්වා යොමු වෙලා තිබෙන්නේ. ඒ නිසා එබඳු පුළුල් මහජන සංවාදයක් එක්ක අනාගතයේ ඉතාම බුද්ධිමත්ව, ඥානාන්විතව මේ සංශෝධනවලට යොමු විය යුතුයි කියන විශ්වාසය අපට තිබෙනවා. රජයේ අදහස වෙන්නේ ඒක. ගරු මන්ත්‍රීතුමාටත්, ගරු මන්ත්‍රීතුමියටත් මා ස්තුතිවන්ත වෙනවා, යෝජනාව ගෙන ඒම සහ ස්ථිර කිරීම පිළිබඳවත්, මාතෘත්වය මුල්තැන් ගත්ත මේ විශිෂ්ට අදහස් දැක්වීමට පාර්ලිමේන්තුවේ අවස්ථාව ලබා දීම පිළිබඳවත්.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.07ට, අද දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 07වන සිකුරාදා අ.භා. 1.30 වන තෙක් කල් ගියේ ය.***

*அதன்படி பி. ப. 5.07 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 07, வெள்ளிக்கிழமை பி.ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.07 p.m. until 1.30 p.m. on Friday, 07th November, 2025, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.